# තලාව නගර සංවර්ධන සැලැස්ම
# 2023-2033



නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# තලාව නගර සංවර්ධන සැලැස්ම

## 2023 - 2033

නාගරික සංවර්ධන අධිකාරිය

උතුරු මැද පළාත් කාර්යාලය

අනුරාධපුර

2023 - 2033

# තලාව නගර සංවර්ධන සැලැස්ම

@ නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාව - 2023

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම,බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදා හැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා ගැනීම සිදු නොකල යුතුය. පිට කවරයේ ඡායාරූපය අත්තර් ජාලය ඇසුරිනි.

**ප්‍රකාශය**

නාගරික සංවර්ධන අධිකාරිය,
6 වන 7 වන සහ 9 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල - ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය:- www.uda.gov.lk
විද්‍යුත් තැපෑල:- info@uda.gov.lk
දුරකථන අංකය:- +94112873637
ප්‍රකාශනය: 2023

තලාව නගර සංවර්ධන සැලැස්ම 2023 – 2033 1 වන කොටස 11 කොටස සහ 111 කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමු කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූළික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සැලැස්ම වන අතර, දෙවන කොටස 2023 – 2033 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීය නියමතා වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාප සීමා මායිම් බණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ. තලාව නගර සංවර්ධන සැලැස්ම 2023 -2033 සකස් කර ඇත්තේ උතුරු මැද පළාත් කාර්යාලය විසිනි.

## අධික්ෂණය

නිමේෂ් හේරත් - (සභාපති) නාගරික සංවර්ධන අධිකාරිය, වරලත් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර (අධ්‍යක්ෂ ජනරාල්) - නාගරික සංවර්ධන අධිකාරිය, වරලත් වාස්තු විද්‍යාඥ මහින්ද විතානආරච්චි (අතිරේක අධ්‍යක්ෂ ජනරාල්) - නාගරික සංවර්ධන අධිකාරිය, වරලත් නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග - (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප 1) - නාගරික සංවර්ධන අධිකාරිය, වරලත් නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න - (වැ.බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප 11) - නාගරික සංවර්ධන අධිකාරිය, වරලත් නගර නිර්මාණ ශිල්පී රූපා රංජනී - අධ්‍යක්ෂ (උපාය මාර්ගික සැලසුම්) නාගරික සංවර්ධන අධිකාරිය.

## සැලසුම් කණ්ඩායම

වරලත් නගර නිර්මාණ ශිල්පී එච්.ඩබ්.සෝමරත්න, (අධ්‍යක්ෂ (උතුරු මැද පළාත) වරලත් නගර නිර්මාණ ශිල්පී ඩබ්.ඒ.එම්.කේ.චන්ද්‍රසේන, (සහකාර අධ්‍යක්ෂ (නගර සැලසුම්) අනුරාධපුර), වරලත් නගර නිර්මාණ ශිල්පී හසිත ප්‍රභාත් ජයරත්න, (නගර නිර්මාණ ශිල්පී, අනුරාධපුර) -ශ්‍රියානි දහනායක, (බලාත්මක සැලසුම්කරු, අනුරාධපුර), පුෂ්පිණී ඉන්දිකා, (බලාත්මක සැලසුම්කරු, අනුරාධපුර) කුමාරි තලගුනේ (බලාත්මක සැලසුම්කරු, අනුරාධපුර) රේණුකා ධනපාල (බලාත්මක සැලසුම්කරු, අනුරාධපුර) වානිකා නවරත්න (බලාත්මක නිලධාරී, අනුරාධපුර).

### සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය

උපාය මාර්ගික සැලසුම් අංශය - නාගරික සංවර්ධන අධිකාරිය (අධික්ෂණය, නියාමනය හා ගැසට් කිරීම) පරිසර හා භූ දර්ශන අංශය (PORS, DDR, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම), භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නාගරික සංවර්ධන අධිකාරිය (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම).

# ප්‍රණාමය

තලාව නගර සංවර්ධන සැලැස්ම 2023 – 2033 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ උතුරු මැද පළාත් කාර්යාලයේ මූලික අධීක්ෂණය යටතේ සිදු විය.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධි විධාන යටතේ තලාව සංවර්ධන සැලැස්ම 2023 – 2033 සඳහා අනුමැතිය ලබාදීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමන්ට අපගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිමු.

තවද, මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මඟපෙන්වීම හා සහාය ලබාදුන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.එස්.සත්‍යානන්ද මහතා වෙත අපගේ ස්තූතිය පුද කර සිටිමු.

තලාව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා මන්ත්‍රීවරුන් මෙන්ම එහි නිළධාරීන්, ප්‍රාදේශීය ලේකම් හා එම කර්යාලයේ සියළුම නිලධාරීන්ට සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

විශේෂයෙන්ම මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්යය හා මඟපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති නිමේෂ් හේරත් මහතාට, අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර මහතාට, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ගෘහ නිර්මාණ ශිල්පී එම්.චිතානආරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප 1) නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග මහතාට, උතුරු මැද පළාත් අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී එච්.ඩබ්.සෝමරත්න මහතාට, උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ඩබ්.ආර්.රංජනී මහත්මියට, පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ.කළුපහණ මහත්මියට, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්.සෝමසේකර මහත්මියට අපගේ ස්තූතිය පුද කර සිටිමි.

එමෙන්ම උපාය මාර්ගික සැලසුම් අංශයේ සියළුම නිලධාරීන්, පාරිසරික හා භූ දර්ශන අංශයේ සියළුම නිලධාරීන්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ සියළුම නිලධාරීන්ටත් සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තූතිය පුද කරමි.

අවසාන වශයෙන් කොවිඩ් 19 හා රට තුල ඇති වූ හදිසි තත්ත්වයන් තුලදී වුවද මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමට සහාය ලබාදුන් සියළුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල කාර්යය මණ්ඩල වලට හා සිවිල් සංවිධාන සාමාජික සාමාජිකාවන්ටද, නන් අයුරින් උපකාර කල සියළුදෙනාට ද විශේෂ ස්තූතිය පුද කර සිටිමි.

# ගරු ඇමතිතුමාගේ පණිවිඩය



"තලාව" නගර සංවර්ධනය යථාර්ථයක් කරා .....

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවන් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කර ගැනීම පිණිස නිවැරැදි දිශානතියක් කරා රාජ්‍යය යොමු කිරීම යටතේ තලාව නව සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත් නගර 30 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර, තවත් නගර 50 ක සංවර්ධන සැලැසුම් මෙම වසර තුල සකස් කර නිමාගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. "තලාව" නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලැසුම් වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම් කර ඇත.

"තලාව" නගර සංවර්ධන සැලැස්ම තුළින් ප්‍රමුඛත්වය හිමිවන්නේ තලාව, තඹුත්තේගම, එප්පාවල නගර වල සේවා ලබාගන්නා හා එහි නේවාසික ජනතාව සඳහා වන අතර, එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදි වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර, එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලෙස යොදා ගන්නා ලදී.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියළු නිළධාරින්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් "තලාව" නගර සංවර්ධන සැලැස්ම (2023 – 2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මහ සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

# නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූළික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශ වල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව, 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ (11 අ කොටස) 8 අ (1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන තලාව නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගි කර ගනිමින් තලාව නගර සංවර්ධන සැලැස්ම 2023 – 2033 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. තලාව නගර සංවර්ධන සැලැස්මේ සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනාගැනීම තුලින් ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර, තවදුරටත් සංවර්ධන සැලැස්ම තුලින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුලින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියළුම පාර්ශවකරුවන් ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

**තලාව නගර සංවර්ධන සැලැස්ම** නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද, මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර, සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලුදෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබාදෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**නිමේෂ් හේරත්**
**සභාපති**
**නාගරික සංවර්ධන අධිකාරිය**

# තලාව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාගේ පණිවිඩය



තලාව නාගරික බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී කොට්ඨාශ 59 කින් සමන්විත වර්ග කිලෝමීටර් 309.69 ක භූමි ප්‍රමාණයක පැතිර යන අතර, තලාව සහ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඒ්කාබද්ධ කරමින් පොදු සැලැස්මක් සකස් කිරීමට ගෙන ඇති ප්‍රයත්නය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියට මාගේ ප්‍රණාමය පුද කර සිටිමි. මෙම ප්‍රදේශය නීත්‍යානුකූල වූ සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීමෙන් ඉදිරි දශකයක කාලය තුල විධිමත් සංවර්ධනයක් කරා ගමන් කිරීමට හා නාගරික ලක්ෂණ සහිත සුවපහසු නගරයක් තැනීමට මහත් පිටිවහලක් වනු ඇති බවට විශ්වාස කරමි.

සංවර්ධන සැලැස්ම සඳහා මෙම සභාව හා අනෙකුත් ආයතන, මහජනතාව විටින් විට ලබාදී ඇති යෝජනා සහ විවේචන ඇතුලත් කරමින් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ නගර සංවර්ධන සැලැස්ම සහයෝගී සහ සහභාගීත්ව ව්‍යායාමයක් බවට පත් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරණ ලද ප්‍රයත්නය නැවත වරක් ස්තූති පූර්වකව අගය කර සිටිමි. තවද, මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කල සංවර්ධන සැලැස්ම ලෙස මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ සහයෝගය සහතික කර සිටිමි. එසේම තලාව නාගරික සංවර්ධන සැලැස්ම 2023 – 2033 මගින් අපේක්ෂා කරන පරිදි එහි දැක්ම වෙත නගරය මෙහෙයවීම සඳහා තනි පුද්ගල, ආයතනික, විවිධ සංවිධාන වශයෙන් අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස තලාව, තඹුත්තේගම, එප්පාවල නගර වල සියලුම පුරවැසියන්ගෙන් සහ පාර්ශවකරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**ලේකම්**

**ප්‍රාදේශීය සභාව**

**තලාව**

# පෙරවදන

**1961** වර්ෂයේදි ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් මහවැලි ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූල්‍ය සහාය සඳහා ඉල්ලීම් කරනු ලැබූ අතර, එකී ඉල්ලීම මත **1964** දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එකී ව්‍යාපෘතියේ ආභාෂය ලබා ගනිමින් මෙම ප්‍රදේශයේ ජනාවාසීකරණය ආරම්භ වූ අතර, මහවැලි අධිකාරිය විසින් සැලසුම්ගත ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කරන ලදී.

**2001** අප්‍රේල් **10** වන දින අංක **1179/11** දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් **1978** අංක **41** දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන බල ප්‍රදේශ අටක් නාගරික සංවර්ධන බල ප්‍රදේශ ලෙස නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කිරීම හා ඒ යටතේ, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය මතු විය. ඒ අනුව, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා මෙම සැලැස්ම සකස් කරනු ලබන අතර, නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරනු ලබන මෙම නගර සංවර්ධන සැලැස්ම මගින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන්ගෙන් සමෘද්ධිමත් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය කරනු ලබන කටයුතු සිදු කරනු ලබයි.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා **2001** සිට **2022** වර්ෂ වලට අදාළ දත්ත හා ක්ෂේත්‍ර සමීක්ෂණවලින් ලබාගත් දත්ත යොදා ගන්නා ලද අතර, එම එකතු කරන ලද දත්ත විශ්ලේෂණය කිරීම හා නිගමන වලට එළඹීම සඳහා විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගන්නා ලදී. ඒ අනුව **2023 - 2033** කාල පරිච්ඡේදය සඳහා තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට මෙම සංවර්ධන සැලැස්ම සකස් කළ අතර එහි විද්‍යානුකූල ප්‍රතිඵල උපයෝගී කර ගනිමින් සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය නිරණය කර ඇත. මෙම සංවර්ධන සැලැස්ම **1, 11** සහ **111** කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමු කොටස සමන්විත වන්නේ මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, **SWOT** විශ්ලේෂණය සහ සැලැස්ම යන අංශයන්ගෙන්ය. දෙවන කොටස සැලසුම් හා ගොඩනැගිලි සඳහා වන නියමතා සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. **111** කොටස බණ්ඩාංක සහ සියලු ඇමුණුම් සමඟ කලාපීකරණ සීමාවන්ගෙන් සමන්විත වේ.

සැලැස්මේ **1** වන පරිච්ඡේදය මගින් සංවර්ධන සැලැස්ම පිළිබඳ, එහි නෛතික සන්දර්භය, සැලැස්මේ පාර්ශවකරුවන්, එහි සන්දර්භය සහ සැලසුම් ක්‍රියාවලිය විස්තර කර ඇත. **2** වන පරිච්ඡේදය සහ **3** වන පරිච්ඡේදය පිළිවෙලින් සැලසුම් ප්‍රදේශය, ප්‍රදේශයේ ඉතිහාසය, ප්‍රදේශයේ මායිම් විස්තර කිරීම සහ සැලැස්මේ අවශ්‍යතාවය විස්තරාත්මකව ඇතුළත් කර ඇත. **4** වන පරිච්ඡේදයේ දැක්ම, අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් ඇතුළත් වන අතර **5** වන පරිච්ඡේදයේ එක් එක් ඉලක්කය සඳහා වන මූලික **SWOT** විශ්ලේෂණය

පිළිබඳ කෙටි විස්තරයක් ඇතුළත් වේ. එමෙන්ම සැලැස්මේ **6** වන පරිච්ඡේදයේ සංකල්පිත සැලැස්ම සහ යෝජිත ඉඩම් පරිහරණ සංවර්ධන සැලැස්ම පිළිබඳ විස්තර කෙරේ. ඒ යටතේ මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග, තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග, ආර්ථික සංවර්ධන උපාය මාර්ග, යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග වැනි තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන උපාය මාර්ගික සැලසුම් හා එහි උප අංශ සවිස්තරව දක්වා ඇත.

# තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම.

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ බලතල ප්‍රකාරව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 දෙසැම්බර් මස 14 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමේෂ් හේරත්,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින.

EOG 12 - 0338/3

## ගැසට් නිවේදනය


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2363/80 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලපත්‍රය ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග විසා කර 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් මෙවරි ඇති බලතල ප්‍රකාර, 2023 දෙසැම්බර් මස 21 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (ජා. මි.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 14 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අම්පර - II,
බත්තරමුල්ල.

EOG 12 - 0338/1


IA - GP 6585 — 21 (2023/12)
*මෙම අති විශෙෂ පනතේ පසුව www.documents.gov.lk මෙහි අවධීයෙන් බාගත කළ හැක.*

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව පිළියෙළ කරන ලද, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2023 ක් වූ දෙසැම්බර් මස 14 වන දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (මෙ. මැ.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"අයෙන්සිටිපය" අදියර - II,
තිස්සමහාරාමය.

EOG 12 - 0338/2

---

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමාත් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 දෙසැම්බර් මස 14 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමල් හේරත්,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින.

EOG 12 - 0338/3

## පටුන

**ප්‍රණාමය ---------- IV**

**ගරු ඇමතිතුමාගේ පණිවිඩය ---------- V**

**නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය ---------- VI**

**තලාව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාගේ පණිවිඩය ---------- VII**

**පෙරවදන ---------- VIII**

**තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම. ---------- X**

**ගැසට් නිවේදනය ---------- XI**

**පළමු පරිච්ඡේදය ---------- 2**

**සංවර්ධන සැලැස්මේ පසුබිම ---------- 2**

1.1 හැඳින්වීම ---------- 2
1.2 සැලැස්මේ පාර්ශවකරුවන් ---------- 3
*1.2.1 සම්බන්ධිත ප්‍රධාන ආයතන ---------- 3*
*1.2.2 ප්‍රධාන උපදේශක ආයතන ---------- 3*
*1.2.3 අනෙකුත් පාර්ශවකරුවන් ---------- 3*
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය ---------- 4
1.4 සැලසුම් ක්‍රියාවලිය ---------- 7
*1.4.1 පසුබිම් අධ්‍යයනය ---------- 7*
*1.4.2 මූලික හැඩගැස්වීම ---------- 8*
*1.4.3 සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම ---------- 8*
*1.4.4 දැක්ම හා අරමුණු සැකසීම ---------- 8*
*1.4.5 සවිස්තරාත්මක විශ්ලේෂණය ---------- 8*
*1.4.6 පරමාර්ථ සකස් කර ගැනීම ---------- 8*
*1.4.7 උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම ---------- 9*
*1.4.8 ව්‍යාපෘති හඳුනාගැනීම ---------- 9*
*1.4.9 නීති හා රෙගුලාසි සකස් කිරීම ---------- 9*
*1.4.10 ලේඛනගත කරන සැලැස්ම සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම ---------- 9*
*1.4.11 මහජන අදහස් ලබාගැනීම සඳහා සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම ---------- 9*
*1.4.12 සංවර්ධන සැලැස්ම නීත්‍යානුකූල සැලැස්මක් බවට පත් කිරීම ---------- 10*
*1.4.13 බලාත්මක කරවීම. ---------- 10*

**දෙවන පරිච්ඡේදය ---------- 11**

**මූලික අධ්‍යයනයන් ---------- 11**

2.1 අධ්‍යයන ප්‍රදේශය ---------- 11
2.2 සැලසුම් සීමාව නිර්ණය කිරීම ---------- 12
*2.2.1 හැඳින්වීම ---------- 12*
*2.2.2 ක්‍රියාකාරී සීමාව ---------- 13*
*2.2.3 භූගෝලීය සීමාව ---------- 16*
*2.2.4 පරිපාලන සීමාවන් ---------- 19*
*2.2.5 සැලසුම් සීමාව ---------- 22*
2.3 සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය ---------- 24

**තෙවන පරිච්ඡේදය ---------- 72**

**සංවර්ධන සැලසුමේ අවශ්‍යතාව ---------- 72**

3.1. හැඳින්වීම ---------- 72
3.2 හඳුනාගත් විභවතා ---------- 73
*3.2.1 කෘෂි කර්මාන්තයට උචිත පාරිසරික තත්ත්වයන් පැවතීම ---------- 73*
*3.2.2 එප්පාවල පොස්පේට් නිධිය ---------- 83*
*3.2.3 විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ සහ අවට පැවතීම ---------- 90*
3.3 හඳුනාගත් ගැටලු ---------- 93
*3.3.1 කෘෂිකර්මාන්තයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නොහැකි වීම ---------- 93*
*3.3.2 වන අලි තර්ජන ---------- 100*
*3.3.3 පාරිසරික සංවේදී ප්‍රදේශ තර්ජනයට ලක්වීම ---------- 104*

**හතරවන පරිච්ඡේදය ---------- 106**

**සංවර්ධන සැලසුම් රාමුව ---------- 106**

4.1 දැක්ම ---------- 106
4.2 දැක්මේ ප්‍රකාශය ---------- 106
4.3 ඉලක්ක ---------- 107
*4.3.1 පළමු ඉලක්කය ---------- 107*
*4.3.2 දෙවන ඉලක්කය ---------- 107*
*4.3.3 තෙවන ඉලක්කය ---------- 107*
4.4 අභිමතාර්ථ ---------- 108
*4.4.1 කෘෂි සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ආර්ථිකය වර්ධනය කර ගනු ලබන ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වන අභිමතාර්ථ ---------- 108*
*4.4.2 නේවාසිකයින්ට හා නගරයට පිටතින් පැමිණෙන පුද්ගලයන්ට සුවපහසු හා ආරක්ෂාකාරී ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වන අභිමතාර්ථ ---------- 108*
*4.4.3 පාරිසරික උරුමයන් ආරක්ෂාකාරී වූ ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වූ අභිමතාර්ථ ---------- 108*

**පස්වන පරිච්ඡේදය ---------- 109**

**ශ.ඳු.අ.ත. විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය ---------- 109**

5. 1 පළමු ඉලක්කය :- ශ.ඳු.අ.ත. විශ්ලේෂණය ---------- 109
5. 2 දෙවන ඉලක්කය :- ශ.ඳු.අ.ත. විශ්ලේෂණය ---------- 111
5. 3 තෙවන ඉලක්කය :- ශ.ඳු.අ.ත. විශ්ලේෂණය ---------- 112

**හයවන පරිච්ඡේදය ---------- 113**

**සැලැස්ම ---------- 113**

6.1 සංකල්පිත සැලැස්ම ---------- 113
6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම ---------- 115
6.3 සමාජයීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග ---------- 117
*6.3.1 සමාජයීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම ---------- 117*
*6.3.2 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම ---------- 122*
6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ග ---------- 139
*6.4.1 හැඳින්වීම ---------- 139*
*6.4.2 වෙළඳ හා වාණිජ සංවර්ධන සැලැස්ම ---------- 139*
*6.4.3 කර්මාන්ත සංවර්ධන සැලැස්ම ---------- 142*
*6.4.4 කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම ---------- 147*
6.5 තිරසර පාරිසරික උපාය මාර්ගික සැලැස්ම ---------- 149
*6.5.1 පාරිසරික සංවේදී ප්‍රදේශ ---------- 149*
*6.5.2 භූ දර්ශන සැලැස්ම ---------- 159*
*6.5.3 ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම ---------- 160*
*6.5.4 පොදු එළිමහන් විවේක , විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම ---------- 163*
6.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග ---------- 168

*6.6.1 හැඳින්වීම* ----------*168*
*6.6.2 ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම*----------*168*
*6.6.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර*----------*171*

**හත්වන පරිච්ඡේදය** ----------**220**

**සංවර්ධන කලාප හා කලාප නියමතා** ----------**220**

7.1 හැඳින්වීම ----------220
7.2 සංවර්ධන කලාප ----------221
7.3 කලාප සංගුණකය ----------222
*7.3.1 කලාප සංගුණකය තීරණය වන ආකාරය* ----------*223*
*7.3.2 සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන්*----------*224*
7.4 කලාපීකරණ පොදු නියමතා----------225
7.5 සංවර්ධන කලාප නියමතා ----------235
*7.5.1 නේවාසික කලාපය සඳහා කලාපීකරණ නියමතා* ----------*235*
*7.5.2 නේවාසික කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන්*----------*236*
*7.5.3 අධි ඝනත්ව වාණිජ කලාපය සඳහා වූ කලාපීකරණ නියමතා* ----------*242*
*7.5.4 අධි ඝනත්ව වාණිජ කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන්* ----------*243*
*7.5.5 මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය සඳහා වූ කලාපීකරණ නියමතා )තලාව(-----**Error! Bookmark not defined.***
*7.5.6 මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය )තලාව - (ඉඩදෙනු ලබන භාවිතයන්* ----------*250*
*7.5.7 මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය )එජ්පාවල (සඳහා වූ කලාපීකරණ නියමතා* ----------*256*
*7.5.8 මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන් - (එජ්පාවල)* ----------*257*
*7.5.9 මිශ්‍ර සංවර්ධන කලාපය සඳහා වූ කලාපීකරණ නියමතා* ----------*263*
*7.5.10 මිශ්‍ර සංවර්ධන කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන්*----------*264*
*7.5.11 කර්මාන්ත කලාපය සඳහා වූ කලාපීකරණ නියමතා*----------*270*
*7.5.12 කර්මාන්ත කලාපය සඳහා ඉඩ දෙනු ලබන භාවිතයන්*----------*271*

**ඇමුණුම් 02 කලාපීකරණ සීමා**----------**324**

**සිතියම්**

**සිතියම් අංක 1 අධ්‍යයන ප්‍රදේශය** .....11
**සිතියම් අංක 2 ජනගහනය**.....14
**සිතියම් අංක 3 සංවර්ධන පීඩක දර්ශකය**.....15
**සිතියම් අංක 4 පාරිසරික සංවේදී ප්‍රදේශ** .....17
**සිතියම් අංක 5 ජලජ ප්‍රදේශ** .....18
**සිතියම් අංක 6 පරිපාලන ප්‍රදේශය**.....20
**සිතියම් අංක 7 තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය** .....21
**සිතියම් අංක 8 සැලසුම් බල ප්‍රදේශය** .....23
**සිතියම් අංක 9 තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය** .....28
**සිතියම් අංක 10 භූමි පරිහරණ රටාව - 2022** .....34
**සිතියම් අංක 11 පාසැල් පෝෂක ප්‍රදේශ - 2022** .....36
**සිතියම් අංක 12 රෝහල් ව්‍යාප්තිය - 2022**.....38
**සිතියම් අංක 13 ප්‍රවාහන පද්ධතිය**.....39
**සිතියම් අංක 14 මාර්ග පද්ධතිය ඔස්සේ ප්‍රදේශය සංවර්ධනය වීමට ඇති විභවතාවය**.....41
**සිතියම් අංක 15 නල ජල පහසුකම් සපයා ඇති හා නොමැති ප්‍රදේශ**.....45

**සිතියම් අංක 16** පාරිසරික සංවේදී ප්‍රදේශ.....52
**සිතියම් අංක 17** ආපදා තත්ත්වයන් .....53
**සිතියම් අංක 18** පවතින ක්‍රීඩා පිටි සහ උද්‍යාන.....57
**සිතියම් අංක 19** ආගමික, සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක ස්ථාන.....67
**සිතියම් අංක 20** භූමියේ උන්නතාංශය .....76
**සිතියම් අංක 21** ජල බැස්ම සහිත ප්‍රදේශ.....78
**සිතියම් අංක** 22 වැඩි වශයෙන් ජලය එකතු වන ප්‍රදේශ.....81
**සිතියම් අංක 23** ප්‍රදේශයේ ජල වහන රටාව .....94
**සිතියම් අංක 24** සංවර්ධන පීඩක දර්ශකය.....98
**සිතියම් අංක** 25 නේවාසික ප්‍රදේශ වල ව්‍යාප්තිය.....99
**සිතියම් අංක 26** වනාන්තර ප්‍රදේශ.....103
**සිතියම් අංක 27** සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන රෝහල්.....119
**සිතියම් අංක 28** සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන පාසැල්.....121
**සිතියම් අංක 29** මලාපවහන හා අපජලය කළමනාකරණ සැලැස්ම සඳහා යෝජිත ප්‍රදේශ.....134
**සිතියම් අංක 30** සංරක්ෂණ කලාපීකරණ සැලැස්ම.....156
**සිතියම් අංක 31** විවෘතභූමි ලෙස සංවර්ධනය කිරීම සඳහා සුදුසු ස්ථාන.....167
**සිතියම් අංක 32** සංවර්ධන කලාප.....221

වගු

වගුව **1** පානීය ජල හිඟයෙන් සිදු වූ හානිය ..... 46
වගුව **2** ගංවතුර ආපදා තත්ත්වයන්ගෙන් හානි වූ ප්‍රදේශ ..... 49
වගුව **3** ගංවතුර ආපදා තත්ත්වයෙන් සිදු වූ හානිය ..... 49
වගුව **4** ස්වභාවික පාරිසරික තර්ජනයන් හා ඒවායේ බලපෑම ..... 50
වගුව **5** පාරිසරික සංවේදී ප්‍රදේශ ..... 51
වගුව 6 බල ප්‍රදේශයේ පවතින ක්‍රීඩා පිටි සහ උද්‍යාන ..... 54
වගුව **7** පවතින ඉතා කුඩා උද්‍යාන ..... 54
වගුව **8** පවතින ක්‍රීඩාංගන ..... 55
වගුව 9 පවතින අසල උද්‍යාන - EXISTING LOCAL PARKS (ELP) ..... 56
වගුව **10** පවතින කලාපීය උද්‍යාන - EXISTING REGIONAL PARKS (ERP) ..... 56
වගුව **11** ගෝලීය පොල් නිෂ්පාදනය ..... 89
වගුව **12** නවීන තාක්ෂණය භාවිතය මඟින් අස්වනු වැඩි කර ගැනීමට ඇති හැකියාව ..... 96
වගුව **13** යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති ..... 129
වගුව **14** කසළ වර්ගීකරණයට අදාල විස්තර ..... 136
වගුව **15** තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යෝජිත පොදු එළිමහන් විවේක විනෝද කටයුතු ..... 163
වගුව **16** වියලි කාලයේදී පමණක් ක්‍රීඩා කල හැකි කුඩා උද්‍යාන ..... 164
වගුව **17** වියලි කාලයේදී පමණක් ක්‍රීඩා කල හැකි අසල උද්‍යාන ..... 164
වගුව **18** යෝජිත රේඛීය උද්‍යාන ..... 165
වගුව **19** යෝජිත රුක් රෝපණ ස්ථාන ..... 166
වගුව **20** නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021.07.08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් ගෙබිම් අනුපාතයන් ..... 277
වගුව **21** නාගරික සංවර්ධන අධිකාරිය විසින් **2021.07.08** දින අංක **2235/54** දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් මහල් ප්‍රමාණයන් ..... 278
වගුව 22 නාගරික සංවර්ධන අධිකාරිය විසින් **2021.07.08** දින අංක **2235/54** දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති විවෘත අවකාශයන් ..... 279

රූප සටහන්

රූපසටහන් අංක **1** නගරයේ කලාපීය සම්බන්ධතා.....4
රූපසටහන් අංක 2 ජාතික භෞතික සැලැස්ම - 2050 .....5
රූපසටහන් අංක 3 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාගරික ධූරාවලිය.....6
රූපසටහන් අංක 4 තලාව නගරය .....42
රූපසටහන් අංක **5** තඹුත්තේගම නගරය.....42
රූපසටහන් අංක 6 අතුරු මාර්ගයන්වල අබලන් තත්ත්වය.....43
රූපසටහන් අංක 7 විදේශ විනිමය උපයන කර්මාන්ත ප්‍රදේශය තුළ පිහිටා තිබීම.....46
රූපසටහන් අංක 8 කාර්මික ඇඟළුම් නිෂ්පාදන කාර්මාන්තශාලා.....47
රූපසටහන් අංක 9 විවේකී ස්ථාන ලෙස සංවර්ධනය කිරීමට සුදුසු ස්ථාන .....58
රූපසටහන් අංක 10 ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන.....59
රූපසටහන් අංක 11 ශ්‍රී බෝධිරුක්ඛාරාමය .....61
රූපසටහන් අංක 12 ගල්කන්ද පුරාණ විහාරය .....62
රූපසටහන් අංක 13 කුඩා ගල් විහාරය .....63
රූපසටහන් අංක **14** මකුලැව පුරාණ රජමහා විහාරය.....63
රූපසටහන් අංක 15 නවගල රජ මහා විහාරය.....64
රූපසටහන් අංක 16 වෙහෙරගොඩැල්ල පුරාණ විහාරය.....65
රූපසටහන් අංක 17 වෙහෙරගල රජමහා විහාරය .....66
රූපසටහන් අංක 18 කසළ කළමනාකරණය .....70
රූපසටහන් අංක **19** මිශ්‍ර කෘෂිකාර්මික ප්‍රදේශ.....74
රූපසටහන් අංක 20 කුඹුරු ජලජ ප්‍රදේශ.....74
රූපසටහන් අංක **21** පාර්ශවකරුවන් ප්‍රකාශ කරන අදහස් .....75
රූපසටහන් අංක 22 ශ්‍රී ලංකාවේ පාංශු ස්ථරවල පිහිටීම.....83
රූපසටහන් අංක **23** සංචාරක කර්මාන්තය හා බැඳි කුරුම්බා හා තැඹිලි නිෂ්පාදනයන් .....88
රූපසටහන් අංක 24 දඹුල්ල හා තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන අතර දුර .....90
රූපසටහන් අංක 25 තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය.....92
රූපසටහන් අංක 26 අලි ගමන් කරන ප්‍රදේශ - තලාව ප්‍රදේශීය සහා බල ප්‍රදේශය.....102
රූපසටහන් අංක **27** පාරිසරික සංවේදී ප්‍රදේශ..... රූපසටහන් අංක **28** සංවර්ධන ඊඩක දර්ශකය
.....104
රූපසටහන් අංක 29 පාර්ශවකරුවන් ප්‍රකාශ කරන අදහස්.....105
රූපසටහන් අංක 30 සංකල්පිත සැලැස්ම .....115
රූපසටහන් අංක **31** යෝජිත භූමි පරිහරණ සැලැස්ම .....116
රූපසටහන් අංක **32** සංවර්ධනය කිරීමට යෝජිත ප්‍රධාන මාර්ග.....124
රූපසටහන් අංක **33** සංවර්ධනය කිරීමට යෝජිත අතුරු මාර්ග.....124
රූපසටහන් අංක **34** යෝජිත රථගාල් සංවර්ධන ස්ථාන .....125
රූපසටහන් අංක **35** සංවර්ධනය කිරීමට යෝජිත තඹුත්තේගම බස්නැවතුම්පල.....126
රූපසටහන් අංක 36 සංවර්ධනය කිරීමට යෝජිත තලාව බස්නැවතුම්පල.....127
රූපසටහන් අංක 37 යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය - තලාව .....127
රූපසටහන් අංක **38** යෝජිත බස් නැවතුම්පල - එප්පාවල .....128
රූපසටහන් අංක **39** ආර්ථික මධ්‍යස්ථානයේ යෝජිත නව කඩ පෙළ.....139
රූපසටහන් අංක **40** ආර්ථික මධ්‍යස්ථානය තුළ යෝජිත භූගත මළ අපවහන පද්ධතිය.....140
රූපසටහන් අංක **41** යෝජිත නව ආර්ථික මධ්‍යස්ථානය හා මූල්‍ය මධ්‍යස්ථානය .....140

රූපසටහන් අංක **42** මහජන පොළ ප්‍රතිසංවර්ධනය කිරීම - තලාව.....141
රූපසටහන් අංක **43** මහජන පොළ ප්‍රතිසංවර්ධනය කිරීම - එප්පාවල.....142
රූපසටහන් අංක **44** යෝජිත පොහොර නිෂ්පාදන කර්මාන්ත ශාලාව.....143
රූපසටහන් අංක **45** යෝජිත සල්පියුරික් අම්ල නිෂ්පාදන කර්මාන්ත ශාලාව හා කහඳේගම වැව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.....144
රූපසටහන් අංක 46 යෝජිත මධ්‍යසාර නිෂ්පාදන කර්මාන්ත ශාලාව.....145
රූපසටහන් අංක **47** තැඹිලි වතුර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාව.....146
රූපසටහන් අංක **48** ප්‍රතිසංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන ඇළ මාර්ග හා වැව් පද්ධතිය...147
රූපසටහන් අංක **49** යෝජිත කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානය.....148
රූපසටහන් අංක **50** එල්ලෙන විදුලි වැට හඳුන්වා දීම.....160
රූපසටහන් අංක **51** මී මැසි වැට හඳුන්වා දීම.....161
රූපසටහන් අංක **52** ජීව වැට හඳුන්වා දීම.....161
රූපසටහන් අංක **53** අගල් කැපීම.....161

ප්‍රස්ථාර

ප්‍රස්ථාර **1** ප්‍රදේශයේ උෂ්ණත්වය **2013 - 2017** .....29
ප්‍රස්ථාර **2** වාර්ෂික උෂ්ණත්වය - **2022** .....30
ප්‍රස්ථාර **3** වර්ෂාපතනයේ වෙනස්වීම **2013 - 2017** .....30
ප්‍රස්ථාර **4** වාර්ෂික වර්ෂාපතනය - **2022** .....31
ප්‍රස්ථාර **5** වාර්ෂික සුළඟේ වේගය - **2022** .....32
ප්‍රස්ථාර **6** වාර්ෂික වළාකුළු ආවරණය - **2022** .....32
ප්‍රස්ථාර **7** වන අලි හානි සිදුවීම් **2012 – 2021** .....50
ප්‍රස්ථාර 8 වගා කරන ලද බිම්වල ප්‍රමාණයන් .....80
ප්‍රස්ථාර **9** එප්පාවල පොස්පේට් නිධියේ ආදායම .....85
ප්‍රස්ථාර **10** පොහොර භාවිතය (මෙ.ටො).....86
ප්‍රස්ථාර **11** පොහොර සහනාධාර සඳහා වෙන් කළ මුදල රාජ්‍ය වියදමෙන් ප්‍රතිශතයක් ලෙස .....86
ප්‍රස්ථාර 12 පොහොර සහනාධාර සඳහා වෙන් කළ මුදල (රු. බි).....87
ප්‍රස්ථාර **13** ආර්ථික මධ්‍යස්ථානයේ වාර්ෂික මුදල් සංසරණය (රු.මි).....92
ප්‍රස්ථාර 14 දිස්ත්‍රික්කයේ වන අලින්ගේ ජීවිත හානි වීම්.....100
ප්‍රස්ථාර **15** වන අලි තර්ජන ප්‍රමාණයන් 2012 - 2021.....101
ප්‍රස්ථාර **16** අලි මිනිස් ගැටුම 2003 - 2021.....101

# 1 වන කොටස

## දත්ත විශ්ලේෂණය හා සැලැස්ම

# පළමු පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මේ පසුබිම

## 1.1 හැඳින්වීම

2023-2033 වර්ෂ සඳහා තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පාදක කරගනිමින් නගර සංවර්ධන සැලැස්මක් සකස් කරනු ලබන අතර, එමගින් ප්‍රදේශයේ භෞතික, සමාජයීය, පාරිසරික යන අංශයන්හි මනා සංවර්ධනයක්, වර්ෂ 2033 වන විට ඇති කිරීම උදෙසා අවශ්‍ය උපාය මාර්ග සකස් කර ඇත. මෙම නගර සැලසුම සකස් කිරීමේදී ලොව බහුල ලෙස භාවිතා කරනු ලබන නවීන තාක්ෂණික මෙවලම්, ක්‍රමෝපායන් හා විශ්ලේෂණයන් යොදා ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම උපාය මාර්ගික සැලැස්මක් ලෙස සකස් කර ඇත.

සංවර්ධන සැලැස්මක් යනු, ඉතා පුළුල් වූ දැක්මක් සහිත ප්‍රදේශයක සංවර්ධනය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන් යටතේ මනා ලෙස සංවර්ධනය කිරීමට සකස් කරනු ලබන්නාවූ මෙවලමකි.

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ ප්‍රමුඛතම ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරන අතර, ඉහත අංශයන්හි ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කර ගනිමින් නාගරික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත මගින් බලතල පවරා ඇත.

ඒ අනුව, 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 “අ” වගන්තියේ බලතල ප්‍රකාරව එම පනතේ 3 (1) වගන්තියට අනුව, 2001/04/10 වන දින අංක:1173/11 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් විසල් අනුරාධපුර සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මෙම විසල් අනුරාධපුර සංවර්ධන බල ප්‍රදේශය හෙක්ටයාර 192538 ක් පමණ භූමි ප්‍රමාණයකින් සමන්විත වේ. මධ්‍යම නුවරගම් පළාත, නැගෙනහිර නුවරගම් පළාත, මිහින්තලය, තිරප්පනේ, රඹෑව, තලාව තඹුත්තේගම, නාච්චාදූව, නොච්චියාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල විවිධ ප්‍රමාණයන්ගෙන් කොටස් එකතුව මෙම බල ප්‍රදේශය සකස් වී ඇති අතර, ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම, භෞතික වශයෙන් සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා විධිමත් කිරීම යනාදි කාර්යයන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ප්‍රදේශයන් සඳහා ඉටු කරනු ලබයි.

ඉහත සඳහන් කල පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම

ප්‍රදේශය තුල භෞතික, ආර්ථික,සමාජයීය හා පාරිසරික යන අංශයන් සමෘද්ධිමත් ආකාරයෙන් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වෙමින් තිබේ. මෙකී අංගයන් මනා ලෙස කළමනාකරණය කරමින් මෙම ප්‍රදේශය සමෘද්ධිමත් ලෙස සංවර්ධනය කිරීම උදෙසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම නගර සංවර්ධන සැලැස්ම 2023-2033 කාල පරාසය දක්වා සකස් කරනු ලබන අතර, එහිදී තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පරිබාහිරෙන් වූ ප්‍රදේශ ද අධ්‍යයනය කරන ලදී.

## 1.2 සැලැස්මේ පාර්ශවකරුවන්

මෙම සැලැස්ම සකස් කිරීමේදි පහත සඳහන් සැලසුම් කණ්ඩායමේ දායකත්වය ලබාගන්නා ලදී.

### 1.2.1 සම්බන්ධිත ප්‍රධාන ආයතන

තලාව ප්‍රාදේශීය සභාව

### 1.**2.2** ප්‍රධාන උපදේශක ආයතන

තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා පොස්පේට් සමාගම
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
ජාතික ගමනාගමන මණ්ඩලය
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
මාර්ග සංවර්ධන අධිකාරිය
උතුරු මැද පළාත් සභාව
ශ්‍රී ලංකා පොලිසිය
ලංකා විදුලි බල මණ්ඩලය
පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
වනජීවී දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### 1.**2.**3 අනෙකුත් පාර්ශවකරුවන්

වෙළඳ සංගමය - තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය
ගොවි සංවිධාන

## 1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

**රූපසටහන් අංක 1 නගරයේ කලාපීය සම්බන්ධතා**





මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙනි - 2021

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අනුරාධපුර නගරයට කිලෝමීටර් 15ක් පමණ දුරින් පිහිටියා වූ ප්‍රාදේශීය වශයෙන් පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස පවතින ප්‍රදේශයකි. අනුරාධපුරය, කැකිරාව ගල්ගමුව ආදී නගර සමඟ සෘජුව මාර්ග පද්ධතිය ඔස්සේ මනා සම්බන්ධතාවයක් පවතින මෙම ප්‍රදේශය දුම්රිය මාර්ග පද්ධතිය ඔස්සේ ද අනෙකුත් නගර හා සම්බන්ධ වේ. උතුරු දුම්රිය මාර්ගය ගමන් කරනු ලබන්නේ මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හරහා වන අතර, මෙම දුම්රිය මාර්ගයේ තලාව හා තඹුත්තේගම දුම්රිය ස්ථාන පිහිටා ඇත.

මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට දුම්රිය මාර්ග ඔස්සේ ද බොහෝ පිරිසක් තම අවශ්‍යතා සඳහා පැමිණේ. තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය හේතුවෙන් ප්‍රාදේශීය වශයෙන් වැදගත් මෙම පරිපාලන මධ්‍යස්ථානයට ජාතික තලයේ වැදගත්කමක් උරුම වී ඇත. එප්පාවල පොස්පේට් නිධිය එම වටිනාකමට වැඩි වටිනාකමක් එකතු කර ඇත. මෙම සංවර්ධන සැලැස්ම මගින් එකී සම්බන්ධතාවයන් හා සංවර්ධන විභවතාවයන් මනා ලෙස උපයෝගී කර ගනිමින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන්ගෙන් සමෘද්ධිමත් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය නීති හා රෙගුලාසි සකස් කරනු ලබයි.

තවද, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් 2050 වසර දක්වා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම තුලින් අනුරාධපුර නගරය හා ඒ අවට ඇති ප්‍රදේශයන් අධි නාගරික ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර, මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, හඳුනාගත් එම ප්‍රදේශයට ආසන්නයෙන් පිහිටා ඇත.

**රූපසටහන් අංක 2 ජාතික භෞතික සැලැස්ම - 2050**





මූලාශ්‍රය: ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - 2017

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් වර්ෂ 2017 - 2050 දක්වා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්මට අනුව මෙම අධි නාගරික ප්‍රදේශය සඳහා ලක්ෂ5ක ජනගහනයක් බලාපොරොත්තු වන අතර, මෙම ජනගහනයට අවශ්‍ය සේවා ලබාදිය හැකි ප්‍රදේශයක් ලෙස තලාව ප්‍රදේශය සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරනු ලබයි. ජාතික භෞතික සැලැස්ම මගින් අඩු නාගරීකරණ වේගයක් සහිතව සංවර්ධනය විය හැකි ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති මෙම ප්‍රදේශය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන්ගෙන් සමෘද්ධිමත් සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කරනු ලබයි.

එමෙන්ම ප්‍රදේශය පුරා පැතිර ඇති ජල පෝෂක ප්‍රදේශ වල මැයි මස සිට අගෝස්තු මස දක්වා ජලය අඩුවීම හා ඒ තත්ත්වය මත ප්‍රදේශයේ ආර්ථිකයට හා ජන ජීවිතයට පීඩා කරනු ලබන තත්ත්වයන් මඟහරවා ගැනීමටත්, මනා ලෙස භූමි පරිහරණ රටාවක් ඇති කරමින් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් ප්‍රදේශය පුරා පැතිරී ඇති පවතින වල් අලි තර්ජනයෙන් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථික තත්ත්වය ආරක්ෂා කිරීමට හා වර්ධනය කිරීමටත්, අවශ්‍ය කටයුතු මෙම සංවර්ධන සැලැස්ම මගින් සකස් කරනු ලබයි.

ප්‍රදේශයේ ආර්ථිකයේ ජීවනාලිය බඳු වූ කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීමටත්, කෘෂිකර්මාන්තයෙන් ජීවත්වන ජනතාවගේ ආර්ථිකය වර්ධනය කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු මෙම සංවර්ධන සැලැස්ම මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, ප්‍රදේශය පුරා පැතිරී පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කරමින් ඒ සඳහා ඉහළ දායකත්වයක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි.

**රූපසටහන් අංක 3 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාගරික ධූරාවලිය**





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2021

නාගරික ධූරාවලිය අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් දෙවන මට්ටමේ උප නගරයක් වන තඹුත්තේගම නගරය හා තුන්වන මට්ටමේ උප නගර වන එප්පාවල හා තලාව යන නගරයන්හි පවතින්නාවූ පහසුකම් වර්ධනය කිරීමටත්, මෙම සංවර්ධන සැලැස්ම මගින් අවශ්‍ය අඩිතාලම සකස් කරනු ලබයි.

ඉහත සඳහන් කරන ලද සියළු සංවර්ධන විභවතාවයන් සංවර්ධනය කර ගනිමින් හා ප්‍රදේශය තුළ හඳුනාගන්නා ලද දුර්වලතාවයන් මහහරවා ගනිමින් මෙම ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන් සමෘද්ධිමත් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය වන පරිදි ඒකාබද්ධ සැලසුම් සකස් කිරීමත්, ඊට අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමෙන් හා භෞතික සංවර්ධනයට අදාල නීති හා රෙගුලාසි බලාත්මක කිරීමෙන් වර්ෂ 2033 වන විට තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන්හි මනා සංවර්ධනයක් තුළින් කාර්යක්ෂම, සුවපහසුමත් හා ආරක්ෂාකාරී ප්‍රදේශයක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරනු ලබයි.

## 1.4 සැලසුම් ක්‍රියාවලිය




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2021

### 1.4.1 පසුබිම් අධ්‍යයනය

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා ඊට පරිබාහිර ප්‍රදේශ අධ්‍යයනය කර අවශ්‍ය භූගෝලීය දත්ත ඒකරාශී කරමින් සිතියම් සකස් කිරීම මූලිකව සිදු කරන ලදී. මෙම කාර්යයට 2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස සිට මාස 03 ක පමණ කාලයක් යොදා ගැනුනි. මෙහිදී තලාව ප්‍රාදේශීය සභාව, තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පොස්පේට් සමාගම, තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, ජන සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ආදී විවිධ ආයතනයන් මගින් අවශ්‍ය කරන දත්ත ලබාගනිමින් විද්‍යානුකූල ක්‍රමවේදයන්ට අනුව විශ්ලේෂණයන් සිදු කරන ලදී.

### 1.4.2 මූලික හැඩගැස්වීම

නාගරික ධූරාවලියට අනුව නගරයේ ස්ථානගත වීම, ජාතික මට්ටමේ සැලසුම් මගින් ප්‍රාදේශීය සහ බල ප්‍රදේශයට ඇති අවශ්‍යතාවයන් හා දැනට ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන හා යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරන ලදී.

### 1.4.3 සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම

මෙහිදී නගරය තුළ පවතින එක් එක් ආයතනයන් නගරයේ ඇති සංවර්ධන විභවතාවයන් වැඩිදියුණු කිරීම සඳහා දායක වී ඇති ආකාරය ද පැන නැගී ඇති ගැටළුකාරී ස්වභාවයන් හා ඒවා මහඟරවා ගනිමින් නගරය දියුණු කිරීමට ඇති හැකියාව පිළිබඳව සම්පත් දායකයින්, රාජ්‍ය හා පෞද්ගලික අංශයන් මෙන්ම සමිති සමාගම් හා එක් එක් අංශයන්හි පාර්ශවකරුවන්ගේ අදහස් 2021 ජනවාරි මස 21 දින පවත්වනු ලැබූ වැඩ සටහනේදී ලබා ගන්නා ලදී. මෙහිදී පාරිසරික සංවේදී ප්‍රදේශ, භූමි පරිහරණ රටාවන් වෙනස්වීම, සංවර්ධන ක්‍රියාකාරකම් වලින් බලපෑමක් සිදුවන ප්‍රදේශ සහ තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ බලපෑම, යන කරුණු හා තවත් කරුණු පිළිබඳව කරනු ලැබූ දත්ත විශ්ලේෂණයන් අධ්‍යයනය කිරීමෙන් ප්‍රදේශයේ පවතින්නා වූ සංවර්ධන විභවතා හා ගැටළු හඳුනාගැනීම 2021 ඔක්තෝම්බර් මස සිට 2022 පෙබරවාරි දක්වා කාලය තුළ සිදු කරන ලදී.

### 1.4.4 දැක්ම හා අරමුණු සැකසීම

මෙහිදී නගරය තුල පවතින සංවර්ධන විභවතාවයන්ගෙන් මනා ලෙස ප්‍රයෝජන ගනිමින්, නගරය තුල ඇති සංවර්ධනයේ ගැටළුකාරී තත්ත්වයන් මහඟරවා ගැනීමට භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශයන්ගේ සමබර සංවර්ධනය තුළින් නගරය දියුණුව කරා රැගෙන යාම සඳහා අවශ්‍ය දැක්ම හා අරමුණු සකස් කරනු ලැබීය.

### **1.4.5** සවිස්තරාත්මක විශ්ලේෂණය

මෙහිදී නගරය සඳහා දැක්ම හා එම දැක්ම ලභා කර ගැනීම සඳහා පරමාර්ථයන් සකස් කර ගැනීමෙන් අනතුරුව, එම පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා තිබෙන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජනයන් ඉතා සවිස්තරාත්මකව හඳුනා ගනිමින් එම තත්ත්වයන්ට අදාල නැඹුරුතාවයන්, වර්ධනයවීම් සහ පසුබැසීම් මෙන්ම, විද්‍යානුකූලව කරනු ලැබූ බොහෝ විශ්ලේෂණයන් මගින් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අදාල කටයුතු කරනු ලැබීය. මේ සඳහා 2022 පෙබරවාරි සිට මාස තුනක පමණ කාලයක් යොදා ගන්නා ලදී.

### 1.4.6 පරමාර්ථ සකස් කර ගැනීම

ඉහත සඳහන් කරන ලද සවිස්තරාත්මක විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල ප්‍රමුඛතාගත කරමින් සංවර්ධන සැලැස්මේ අරමුණු ලභා කර ගැනීම සඳහා පරමාර්ථ හඳුනා ගන්නා ලදී. එම පරමාර්ථ මගින්

ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවයන් නියමිත කාලයක් තුලදී නියමිත ප්‍රමාණයන්ගෙන් වැඩිදියුණු කර ගැනීමටත්, ප්‍රදේශය තුළ පවතින ගැටළුකාරී තත්ත්වයන් මහහරවා ගනිමින් අපේක්ෂිත කාලය තුළ ප්‍රදේශය සංවර්ධනය කරා ගෙන යාම සඳහාත් පරමාර්ථ සකස් කරනු ලැබීය.

### 1.4.7 උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම

මෙහිදී අරමුණු ලඟා කර ගැනීම සඳහා භෞතික, ආර්ථික, සමාජයීය, පාරිසරික යන ආකාරයට යෝජිත භූමි පරිහරණ සැලැස්ම, යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම, යෝජිත වැසිජල අපවහන පද්ධති සැලැස්ම, යෝජිත ආර්ථික ප්‍රවර්ධන සැලැස්ම, යෝජිත මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම යනාදී ලෙස අවශ්‍ය සැලසුම් සකස් කරන ලදී.

### 1.4.8 ව්‍යාපෘති හඳුනාගැනීම

උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමෙන් පසු සංවර්ධන සැලැස්මේ අරමුණු කරා ලඟා වීම සඳහා ශක්‍යතා වාර්තා අධ්‍යයනය කිරීම මගින් ක්‍රියාකාරී ව්‍යාපෘති හඳුනාගනිමින් එම ව්‍යාපෘති සඳහා පිරිවැය, ව්‍යාපෘතියේ කාල රාමුව, එම ව්‍යාපෘතියේ ප්‍රයෝජන හා ප්‍රතිලාභීන් ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද පිළිබඳවද විශ්ලේෂණය කරනු ලැබීය.

### 1.4.9 නීති හා රෙගුලාසි සකස් කිරීම

සංවර්ධන සැලැස්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ නීති රෙගුලාසි, ඉඩම් පරිහරණයන් සම්බන්ධයෙන් වන නීති හා රෙගුලාසි, සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ලඟා වීම සඳහා දැනට හඳුනාගත් ගැටළු හා ඉදිරියේදී උද්ගත වේ යැයි විශ්ලේෂණයන් මගින් තහවුරු කරගනු ලැබූ ගැටළු, අවම කර ගැනීම සඳහා නීත්‍යානුකූල රාමුවක් ඇති කිරීමට මෙහිදී කටයුතු කරන ලදී.

### 1.4.10 ලේඛනගත කරන සැලැස්ම සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම

ලේඛනගත කරන සංවර්ධන සැලැස්ම තවදුරටත් නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.4.11 මහජන අදහස් ලබාගැනීම සඳහා සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම

සංවර්ධන සැලැස්ම සකස් කිරීමෙන් පසු එම සැලැස්මට අදාලව මහජනතාවගේ අදහස් හා යෝජනා ලබාගැනීමට තලාව ප්‍රාදේශීය සභාව වෙත යොමු කරන ලදී.

### 1.4.12 සංවර්ධන සැලැස්ම නීත්‍යානුකූල සැලැස්මක් බවට පත් කිරීම

මහජන අදහස් ලබාගැනීමෙන් පසු ඒ පිළිබඳව අවධානය යොමු කරමින්, සංශෝධිත සැලැස්මේ කෙටුම්පත නීත්‍යානුකූල සැලැස්මක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබීය.

### 1.4.13 බලාත්මක කරවීම


ප්‍රකාශයට පත් කරන සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන වලට බලතල පවරන ලදී.

# දෙවන පරිච්ඡේදය

# මූලික අධ්‍යයනයන්

## 2.1 අධ්‍යයන ප්‍රදේශය

**සිතියම් අංක 1** අධ්‍යයන ප්‍රදේශය




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී 2001 අප්‍රේල් මස 10 වෙනි දින අංක 1179/11 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද විසල් අනුරාධපුර සංවර්ධන සැලසුම් යෝජනා ක්‍රමයට ඇතුලත් වූ ප්‍රදේශයන් අධ්‍යයනය කරමින්, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට සැලසුම සකස් කිරීම සඳහා අවශ්‍ය අධ්‍යනයන් සකස් කරනු ලැබිය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙවන මට්ටමේ නගරයක් වන තඹුත්තේගම නගරයද ඇතුලත් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ යටතේ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් මෙමගින් සකස් කරනු ලබයි. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අධ්‍යයන ප්‍රදේශය ලෙස, 2001 වසරේදී අංක: 1179/11 දරණ ගැසට් පත්‍රය මගින් විසල් අනුරාධපුර සැලැස්ම යටතේ ප්‍රකාශයට පත් කර ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත, නැගෙනහිර නුවරගම් පළාත, මිහින්තලය, තිරප්පනේ, රඹෑව, නාච්චාදුව, තලාව, තඹුත්තේගම, නොච්චියාගම යන ප්‍රදේශ ආවරණය වන පරිදි වර්ග කිලෝමීටර් 1925.4 න් සමන්විත වන ප්‍රදේශය තෝරා ගැනුනි. ඉහත කී ප්‍රදේශයන්හි ජීවත්වන ජනගහනය, ජනගහනයේ වර්ධන වේගය, නාගරික ලක්ෂණ, භූමි පරිහරණ රටාවන් ආදී තොරතුරු සැලකිල්ලට ගනිමින් හා විශ්ලේෂණය කරමින් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට සංවර්ධන කටයුතු උදෙසා බලපෑමක් එල්ල කල හැකි ප්‍රදේශයන්, විශ්ලේෂණයන් මගින් තහවුරු කර ගනු ලැබීය.

## 2.2 සැලසුම් සීමාව නිර්ණය කිරීම

මෙහිදී සංවර්ධන සැලැස්ම බලාත්මක කළ යුතු, ක්‍රියාත්මක කල යුතු ප්‍රදේශය තීරණය කරනු ලබයි. මෙම සැලසුම් සීමාව නිර්ණය කිරීමේදී ජනගහනය, ජනගහන වර්ධන වේගය, ජන ඝනත්වය, නිවාස, පාරිසරික සංවේදී ප්‍රදේශ, යටිතල පහසුකම් වල ඝනත්වය හා ව්‍යාප්තිය යනාදී ලෙස විවිධ අංශ පිළිබඳ අවධානය යොමු කරමින් සිදු කරනු ලැබීය.

### 2.2.1 හැඳින්වීම


සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සැලසුම් සීමාව නිර්ණය කිරීම ඉතා අත්‍යවශ්‍ය සාධකයකි. මෙහිදී පරිපාලන වශයෙන්, භූගෝලීය වශයෙන් හා ක්‍රියාකාරී සීමාවක් ලෙස යන අංශ 03 යටතේ මෙම සීමාව නිර්ණය කිරීම කරනු ලබයි. මෙම ප්‍රදේශය හඳුනා ගැනීම සඳහා විවිධ දත්ත විශ්ලේෂණය කරමින් අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදී. සංවර්ධන පීඩක දර්ශකය, පාරිසරික සංවේදී ප්‍රදේශ

පිළිබඳ කරනු ලැබූ විශ්ලේෂණය, ප්‍රවාහන පද්ධතිය පිළිබඳ කරනු ලැබූ විශ්ලේෂණය ආදී නොයෙකුත් විශ්ලේෂණ මගින් ලබාගත් තොරතුරු හා සංවර්ධන ක්‍රියාකාරකම් අනාගතයේදී කුමන දිශාවකට යොමුවේදැයි මෙහිදී අවධානය යොමු කරනු ලබයි.

### 2.2.2 ක්‍රියාකාරී සීමාව


කලාපීය වශයෙන් පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරනු ලබන තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා මෙම සැලැස්ම සකස් කිරීමේදී ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව මනා ලෙස අධ්‍යයනය කරන ලදී. මෙයට විශේෂ හේතුව වූයේ ජාතික මට්ටමේ වැදගත් කමක් ඇති තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, එප්පාවල පොස්පේට් නිධිය ආදි සුවිශේෂී ස්ථාන පිහිටා තිබීමයි. ඊට අමතරව අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙවන මට්ටමේ නගරයක් වන තඹුත්තේගම නගරය මෙම ප්‍රදේශය තුළ පිහිටා තිබෙන බැවින්, පරිපාලන වශයෙන් විශාල මෙහෙයක් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඉටු කරනු ලබයි. එමෙන්ම තඹුත්තේගම රෝහල මගින් අනුරාධපුර රෝහලේ පවතින තදබදය අවම කිරීමට හැකි වන පරිදි සේවා ලබාදෙන බැවින්, එහි සේවාවන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පමණක් සීමා නොවී ඊට පරිබාහිරින් පවතින ප්‍රදේශ කරාද ව්‍යාප්ත වන බැවින්, එකී ප්‍රදේශයන්ද මෙම සැලසුම් බල ප්‍රදේශය තීරණය කිරීමේදී අධ්‍යයනය කෙරුණි. විශේෂයෙන්ම, සංවර්ධන පීඩක දර්ශකය සහ ක්‍රියාකාරී ප්‍රදේශය හඳුනාගැනීමට අදාළ වන අනෙකුත් අදාල විශ්ලේෂණයන් මගින් තහවුරු කර ගැනීමට හැකිවූයේ මෙහි ක්‍රියාකාරී සීමාව තලාව ප්‍රදේශය කේන්ද්‍රකරගනිමින් පවතින බවත්, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පරිබාහිරව එම ක්‍රියාකාරී සීමාවේ පැතිරීම අවම බවත්ය. මෙහි දැක්වෙන්නේ ඊට අදාළ විශ්ලේෂණයන් වේ.

**සිතියම් අංක 2 ජනගහනය - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**සිතියම් අංක 3 සංවර්ධන පීඩක දර්ශකය - 2022**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 2.2.3 භූගෝලීය සීමාව


භූගෝලීය ලක්ෂණ දෙස අවධානය යොමු කිරීමේදී අවබෝධ වන්නේ මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා ඊට පරිබාහිරින් වූ ජනාවාස ප්‍රදේශයන් පාරිසරික සංවේදී ප්‍රදේශයන්ගෙන් ආවරණය වී ඇති බවයි. විශේෂයෙන්ම තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම තත්ත්වය දැකගත හැකිය. ප්‍රදේශයේ භූමි පරිහරණ රටාවෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් පාරිසරික සංවේදී ප්‍රදේශ වන අතර, මෙම ප්‍රදේශ වලට පිටතින් ජනාවාස ව්‍යාප්ත වී ඇති බවට පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳව කරනු ලැබූ විශ්ලේෂණයන් මගින් තහවුරු කර ගන්නා ලදී. එකී සියළු භාවිතයන් තීරණය කර ගනිමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා ඊට පිටතින් වර්ග කිලෝමීටර් 75 ක පමණ ප්‍රදේශයක් භූගෝලීය ලක්ෂණ යටතේ අධ්‍යයනය කරමින් සැලසුම් බල ප්‍රදේශය තීරණය කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කරන ලදී.

**සිතියම් අංක 4 පාරිසරික සංවේදී ප්‍රදේශ**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**සිතියම් අංක 5 ජලජ ප්‍රදේශ - 2022**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 2.2.4 පරිපාලන සීමාවන්

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ජනාවාසීකරණයට ලක්වූ තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී ඊට පරිබාහිරින් වූ පරිපාලන ප්‍රදේශ පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශය, කැකිරාව, රාජාංගනය ආදී ප්‍රදේශ පරිපාලන ප්‍රදේශ ලෙස අධ්‍යයනය කරන ලදී. විශේෂයෙන්ම තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙන් ප්‍රදේශයට ලබාදෙන සේවාවන් හා තඹුත්තේගම රෝහල මගින් ප්‍රදේශයේ ජනතාවට ලබාදෙන සේවාවන් හේතු කොටගෙන මෙම ප්‍රදේශය පරිපාලන ප්‍රදේශය ලෙස අධ්‍යයනය කරන ලදී. ඊට අමතරව භූමි පරිහරණ කටයුතු වල ක්‍රියාකාරිත්වය, ඉඩම් මිළෙහි වෙනස්වීම්, යටිතල පහසුකම් වල ව්‍යාප්තිය හා ඝනත්වය ආදි අංශද මෙහිදී සැලකිල්ලට භාජනය කරන ලදී.

**සිතියම් අංක 6 පරිපාලන ප්‍රදේශය - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**සිතියම් අංක 7 තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 2.2.5 සැලසුම් සීමාව

ඉහත සඳහන් කරන ලද සියලුම අංශ විද්‍යානුකූල විශ්ලේෂණයන් මගින් එනම්, පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳව කරනු ලැබූ විශ්ලේෂණයත්, පාරිසරික සංවේදී ප්‍රදේශ ව්‍යාප්ත වී ඇති ආකාරයත්, එම සංවේදී ප්‍රදේශවල සීමා මායිම් පිළිබඳ තහවුරු කර ගැනීමත්, සංවර්ධන පීඩක දර්ශකය මඟින් ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලියේ තීව්‍රතාවය හා ව්‍යාප්තියත්, පාරිසරික සංවේදී ප්‍රදේශ වලට එම සංවර්ධන ක්‍රියාකාරකම් මඟින් එල්ලවන බලපෑමේ ස්වභාවයත්, පරිපාලන ප්‍රදේශ පිළිබඳ කරනු ලැබූ අධ්‍යනයන් මඟින් පරිපාලන සීමා මායිම් පිළිබඳ තහවුරු කර ගැනීමත් සිදු කරන ලදී. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද සියළු හේතු සාධක පාදක කරගනිමින් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සමස්ත සැලසුම් බල ප්‍රදේශය ලෙස තීරණය කරන ලදී.

**සිතියම් අංක 8 සැලසුම් බල ප්‍රදේශය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

## 2.3 සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය

අතීතයේදී මෙම ප්‍රදේශයේ ජීවත් වූ ජනතාව ප්‍රදේශය තුළ පැවතියා වූ කුඩා වැව් පාදක කර ගනිමින් තමාගේ ජීවිකාව රැගෙන ගියහ. නමුත් නියඟ තත්ත්වයක් ඇතිවීම හා සොලී ආක්‍රමණ නිසා මෙහි ජීවත්වූ ජනතාව වෙනත් ප්‍රදේශ කරා යොමු විය. කාලය ගත වීමත් සමඟම නැවත එම ජනතාව මෙම ප්‍රදේශය කරා පැමිණ, එහි පැවතියා වූ කුඩා වැව් විශාල වැව් ලෙස සකස් කර නියං කාලයට මුහුණ දෙමින් ජීවිකාව රැගෙන යාමට හැකි වන පරිදි පරිසරය සකස් කර ගන්නා ලදී.

සශ්‍රීක ප්‍රදේශයක් ලෙස පැවති මෙම ප්‍රදේශ ඉංග්‍රීසි ආක්‍රමණ සමඟ විනාශයට පත් විය. සරුසාර කෙත් බිම් පොකුණු මතින් මංමාවත් ඉදිකිරීම හේතුවෙන් කෘෂිකර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වී තිබේ. කෙසේ වුවද, උතුරු - දකුණු දුම්රිය මාර්ගය ඉදිවීම මෙම ප්‍රදේශයේ විශේෂ සංවර්ධන උපනතියක් ලෙස සැලකිය හැකි අතර, එය නාගරීකරණයේ ආරම්භය ලෙසද දැක්විය හැකිය.

ඒ අනුව, 70 දශකය අවසානය වන විට මෙම ප්‍රදේශය නාගරීකරණයට අදාල සුවිශේෂී කඩඉමක් පසු කර ඇති බවටත්, විශේෂ සන්ධිස්ථාන රාශියක් පසුකරමින් වර්තමානයේ පවතින තත්ත්වයට සංවර්ධනය වී ඇති බවටත් ප්‍රදේශයේ ඓතිහාසික විකාශය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වේ. එහිදී විශේෂයෙන්ම,ශ්‍රී ලංකාවේ රාජ්‍ය පෙළපතෙන් ලද ආභාෂය ද මනා පිටිවහලක් වී ඇත.

ධාතුසේන රජතුමා විසින් කලාඔයේ හා මල්වතු ඔයේ පෝෂක ප්‍රදේශ මනා ලෙස උපයෝගී කර ගනිමින් ක්‍රිස්තු වර්ෂ 459 පමණ වන විට යෝධ ඇළ සංවර්ධනය කරන ලද අතර, එය ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල ප්‍රමුඛතම හැරවුම් ලක්ෂය බව ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. එම සුවිශේෂී අවස්ථාව සමඟ වාරි ශිෂ්ටාචාරය මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් මෙම ප්‍රදේශය තුළ අනාදිමත් කලක සිට ජීවත් වූ මිනිසුන් කෘෂිකර්මාන්තය හා ඒ ආශ්‍රිත කර්මාන්ත ආර්ථික කටයුතු වල ප්‍රධාන කොටසක් බවට පත් කර ගනිමින් ජීවත් වූ බව ඉතිහාසය විසින් සාක්ෂි සහ සාධක සපයනු ලබයි. යෝධ ඇල සංවර්ධන කටයුතු වලදී සැතපුමකට අඟලක බැස්මක් සහිතව එය නිර්මාණය කරනු ලැබුවේ කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය කරනු ලබන ජලය ජලාශ වලටත්, කෘෂි බිම් වලටත් නිසි පරිදි සැපයීම අරමුණු කර ගෙනය.

මෙවැනි සුවිශේෂී අවස්ථා තුලින් කෘෂිකර්මාන්තය ක්‍රමයෙන් ප්‍රදේශය පුරා ව්‍යාප්ත වන්නට පටන් ගත් අතර, එහිදී කෘෂිබිම් ආවරණය කරගනිමින් එම බිම් ආසන්නයෙන් ජනාවාස ආරම්භ වීම ද සිදු වුණි. එහිදී ඉංග්‍රීසි පාලන සමය තුළ වැදගත් සහ කැපී පෙනෙන අවස්ථා හඳුනාගත හැකි අතර, උතුරු දුම්රිය මාර්ගය 1900 වසරේදී පමණ ප්‍රදේශය හරහා ඉදිකිරීම මගින් ප්‍රදේශයේ ප්‍රවාහන ජාලයට මනා පිටිවහලක් ද විය. තලාව සහ තඹුත්තේගම දුම්රිය ස්ථාන මෙම ප්‍රදේශය තුළ පිහිටා තිබීමෙන් මෙම ප්‍රදේශයේ ජනතාවට ආර්ථික වශයෙන් මෙන්ම ප්‍රවාහන අංශයෙන්ද විශාල සේවාවක් සපයනු ලබන අතර, ප්‍රදේශයේ සංවර්ධන දිශානතිය හා සංවර්ධන වේගයට අදාල ඉතා විශාල බලපෑමක් දුම්රිය මාර්ගය මගින් ප්‍රදේශයට ලැබී ඇත.

යෝජිත ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු කර ගැනීම සඳහා උචිත පාරිසරික පද්ධති ඇතිවීමත්, ප්‍රදේශය ආවරණය වන පරිදි ප්‍රවාහන කටයුතු වලට අදාල යටිතල පහසුකම් ප්‍රදේශය තුළ සංවර්ධනය වීමත් හේතු කොට ගෙන 1940-1960 වසර පමණ වන විට ජනාවාසිකරණය ක්‍රමයෙන් වේගවත් විය. විශේෂයෙන්ම ප්‍රධාන මාර්ග ඔස්සේ (A 28, B 213, B 117) ජනතාව ඉතා වේගයෙන් පදිංචි වූ අතර, ක්‍රමයෙන් ප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශ කරා ඔවුන් ව්‍යාප්ත විය. එයට මූළික හේතුව ලෙස ප්‍රධාන මාර්ග තුන සම්බන්ධ කරමින් ප්‍රදේශයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය වීමත්, එම අභ්‍යන්තර මාර්ග පද්ධතිය කේන්ද්‍ර කර ගනිමින් එම ප්‍රදේශ කරා ජනතාව ඇදී ඒමත් දැක්විය හැකිය.

එමෙන්ම 1961 වර්ෂයේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන මූල්‍ය සහයෝගය ඉල්ලා සිටි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 1964 දී මහවැලි ව්‍යාපෘතිය ආරම්භ විය. එහි ප්‍රධාන අරමුණ වූයේ රටේ සමස්ත කෘෂි නිෂ්පාදනයන් වැඩි කිරීම, රැකියා අවස්ථා බිහි කිරීම, බලශක්තිය උත්පාදනය, වියළි කලාපය ජනාවාසකරණය ආදී ඉලක්ක සපුරාගැනීම වේ. මහවැලි H කලාපය ස්ථාපිත කිරීමත් සමඟ තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ද, සමාජයීය, සංස්කෘතික, පාරිසරික වශයෙන් විශේෂ බලපෑමක් ඇති කරන ලදී. වර්ෂ 1980 වන විට මහවැලි ව්‍යාපාරය යටතේ ජනතාවට අවශ්‍ය කරනු ලබන ඉඩම් හා අනෙකුත් අපරව්‍යුහ පහසුකම් ලබා දෙන ලදී. එහිදී ක්‍රමවත් නගර සැලසුමක් යටතේ මෙම සමස්ත ප්‍රදේශයම සැලසුම්කරණයට ලක්වූ අතර, එමගින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු උදෙසා යහපත් බලපෑමක් ඇති විය.

මෙම නගර සැලසුම් තවදුරටත් වැඩිදියුණු කිරීම සහ ක්‍රමවත් ආකාරයට සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2001/04/10 දින අංක 1179/11 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් විසල් අනුරාධපුර සැලැස්ම තුලින් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මේ ආකාරයට ප්‍රකාශයට පත් කිරීම තුලින් මෙම ප්‍රදේශයට අවශ්‍ය කරනු ලබන සේවා පහසුකම් වර්ධනය කිරීම අරමුණු කරගනිමින් කලාපීකරණ සැලැස්මක් යටතේ ප්‍රදේශයේ සැලසුම්කරණය ක්‍රමවත් කර ගන්නා ලදී.

ඒ තුළින් ඉලක්කගත අරමුණු කරා ළඟාවීම සඳහා ව්‍යාපෘති රාශියක් හඳුනා ගත් අතර, එමගින් ආර්ථික වර්ධනය, පාරිසරික සුරක්ෂිතතාවය, සමාජයීය සංවර්ධනය හා භෞතික සංවර්ධනය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම අපේක්ෂා කරන ලදී.

තවද, ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රදේශය තුළ සහ ප්‍රදේශයට පරිබාහිරව ජීවත් වන ගොවි ජනතාවගේ කෘෂි ආර්ථිකය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් වර්ෂ 2005 වන විට තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. එමගින් ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය කැපී පෙනෙන ආකාරයට සංවර්ධනය විය.

**විසල් අනුරාධපුර නගර සංවර්ධන සැලැස්ම - 2001**

2001 අංක: 1179/11 දරණ ගැසට් පත්‍රය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටර් 1925.4 ක් පමණ වූ භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ගැසට් කරනු ලැබීය. රඹෑව, මධ්‍යම නුවරගම් පළාත, නැගෙනහිර නුවරගම් පළාත, මිහින්තලය, තිරප්පනේ, නාච්චාදූව, තලාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ද, තඹුත්තේගම හා නොච්චියාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් කොටසක් ද ඇතුලත් ග්‍රාම නිළධාරී කොට්ඨාශ 278 ක් නාගරික සංවර්ධන බල ප්‍රදේශය ලෙස මෙම සැලැස්මේදී ප්‍රකාශයට පත් කරනු ලැබීය. මෙමගින් අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයට අමතරව තවත් ප්‍රදේශයන් භෞතික, ආර්ථික, සමාජයීය, පාරිසරික යන අංශයන් පාදක කරගනිමින් සමෘද්ධිමත් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කරන ලදී.

**ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්ම 2011 – 2030**

මෙම සංවර්ධන සැලැස්ම මගින් අනුරාධපුර නාගරික ප්‍රදේශය හා එහි තදාසන්න ප්‍රදේශය අධිනාගරික ප්‍රදේශයක් ලෙස හඳුනා ගැනුණු අතර, මිලියන 1.5 ක ජනගහනයක් නාගරික ප්‍රදේශය අවට වර්ධනය වේ යැයි මෙහිදී අපේක්ෂා කර ඇත. එම ජනගහනයට අවශ්‍ය වන පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය නේවාසික ප්‍රදේශ හා ආර්ථික කටයුතු උදෙසා සුදුසු ප්‍රදේශ මෙහිදී හඳුනාගෙන ඇති අතර, එම ප්‍රදේශ සංවර්ධනය උදෙසා අවශ්‍ය වන සංවර්ධන ව්‍යාපෘතීන්ද හඳුනාගෙන ඇත. ඒ අතර, මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම, දුම්රිය මාර්ග පුළුල් කිරීම හා නව දුම්රිය මාර්ග යෝජනා කිරීම, පොස්පේට් නිධියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම, තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම යන ව්‍යාපෘතීන් වැදගත් ස්ථානයක් ගනු ලබයි. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද මෙම නාගරික ප්‍රදේශයට අයත් වන බැවින්, එම සංවර්ධන ව්‍යාපෘති වල බලපෑම මෙම ප්‍රදේශයටද ලැබෙනු ඇත.

**ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්ම 2017 - 2050**

මෙම සංවර්ධන සැලැස්ම මගින්ද ශ්‍රී ලංකාවේ අධිනාගරික ප්‍රදේශ දෙකක් හඳුනා ගන්නා ලද අතර, එහි එක් අධිනාගරික ප්‍රදේශයක් වන්නේ අනුරාධපුර නාගරික සීමාව හා එහි තදාසන්න ප්‍රදේශයයි. 2050 වර්ෂය වන විට මෙම අධිනාගරික ප්‍රදේශය තුල මිලියන 0.5 ක පමණ ජනගහනයක් අපේක්ෂා කරනු ලබන අතර, එම ජනගහනයට නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා සුදුසු ප්‍රදේශද ඒ සඳහා අනෙකුත් පහසුකම් ලබාදීමට අවශ්‍ය ව්‍යාපෘතින් ද හඳුනාගෙන ඇත. මෙම ජාතික භෞතික සැලැස්මට අනුව අඩු වේගයක් සහිතව නාගරීකරණය විය යුතු ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය හඳුනාගෙන ඇතත්, ක්‍රියාත්මක කළ යුතු යැයි හඳුනාගත් ව්‍යාපෘති රාශියකි.

වර්තමානය වන විට මෙම ප්‍රදේශය තුල පවතින්නා වූ භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික තත්ත්වයන් පහත පරිදි විස්තර කල හැකිය.

**තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**

කලාපීය පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, අනුරාධපුර නගරයේ සිට කි.මී 15 ක පමණ දුරකින් පිහිටා ඇති අතර, එය ව.කි.මී. 309.69 (හෙක්.030969) වපසරියකින් හා මුහුදු මට්ටමේ සිට මීටර් 110 ක උන්නතාංශයකින් පිහිටා ඇත. රාජාංගනය, නොච්චියාගම, නාච්චාදුව, මධ්‍යම නුවරගම් පළාත, තිරප්පනේ, ඉපලෝගම, ගල්නෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ආවරණය වී ඇති තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තලාව සහ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ එකතුවකින් සීමා වී ඇත. තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 20 ක් හා තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 39 ක් ඇතුලත් වූ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 59 කින් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සමන්විත වී ඇත.


**සිතියම් අංක 9 තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - 2022**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

මෙම ප්‍රදේශයේ වියළි කලාපීය සහ පහතරට සර්ම කලාපීය දේශගුණික ලක්ෂණ දක්නට ලැබෙන අතර, මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 30 - 33 ක් වේ. එය පසුගිය වසර කිහිපයක උෂ්ණත්වය පිළිබඳ වාර්තා වූ දත්ත පිළිබඳව විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිව හඳුනාගත හැක. එමෙන්ම මෙම උෂ්ණත්ව ප්‍රමාණයන් නොවෙනස්වන මට්ටමක තිබෙන බව විශ්ලේෂණයන් මගින් පැහැදිලි වේ.

**ප්‍රස්ථාර 1 ප්‍රදේශයේ උෂ්ණත්වය 2013 - 2017**





මූලාශ්‍රය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - 2022

මෙහිදී විශේෂයෙන්ම ප්‍රදේශයේ උෂ්ණත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී වර්ෂය පුරාම සැලකිය යුතු මට්ටමින් ඉතා හොඳ උෂ්ණත්වයක් සහ ප්‍රමාණවත් සූර්ය තාපයක් මෙම ප්‍රදේශයට ලැබෙන අතර, එය කෘෂිකර්මාන්තයට ඉතා යෝග්‍ය වේ. ඵලදාව නෙලන කාලසීමාව තුළ සැලකිය යුතු මට්ටමේ උෂ්ණත්වයක් ලැබීම තුළින් සාර්ථකව අස්වනු නෙලා ගත හැකි අතර, වර්ෂාව නිසා වන අස්වනු හානිය ඒ තුලින් අවම වේ.

තවද, මෙම සූර්යතාපය භාවිතා කරමින් විදුලිබල නිෂ්පාදනය සඳහා ද මනා විභවතාවයක් පවතින බව අවබෝධ කර ගත හැකිය. විශේෂයෙන්ම ප්‍රදේශය පුරා තැනිතලා භූමි ප්‍රදේශයක් පැවතීමත් වසරේ මාස 09 ට අධික කාලයක් සඳහා නොකඩවා ලැබෙන සූර්යය තාපයක් මෙම ප්‍රදේශයට ලැබීමත් එයට හේතු වේ. මෙම විභවතාවයන් මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශයේ විදුලි බල අවශ්‍යතාවය සඳහා මෙම සූර්ය තාපය යොදා ගැනීමේ හැකියාවක් පවතින අතර, එය ප්‍රදේශයේ සංවර්ධනයේ වැදගත් සංධිස්ථානයක් ලෙස හඳුන්වා දිය හැකිය.


**ප්‍රස්ථාර 2 වාර්ෂික උෂ්ණත්වය - 2022**




මූලාශ්‍රය: https://www.weather-atlas.com - 2022

මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1000 - 1500 පමණ වන අතර, උපරිම වර්ෂාපතනය ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් එනම්, සැප්තැම්බර් - දෙසැම්බර් කාලය තුලදී ද අප්‍රේල්, ජූනි අතර සංවහන වැසි මගින්ද වර්ෂාව ලැබේ.

**ප්‍රස්ථාර 3 වර්ෂාපතනයේ වෙනස්වීම 2013 - 2017**




මූලාශ්‍රය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - 2022


සමස්තයක් ලෙස ගත් විට වසරේ මාස 09 ක් පමණ වියළි කාලගුණයක් දක්නට ලැබුනද, මෝසම් කාලය සක්‍රිය වීමත් සමඟම මෙම ප්‍රදේශයට වර්ෂාපතනය ලැබේ. ප්‍රදේශයේ ආර්ථිකයේ ජීවනාලිය බඳු කෘෂිකර්මාන්තයට මෙම පරිසර තත්ත්වයන්ගේ ස්වභාවය හිතකර වන අතර, ප්‍රදේශයේ

ජනතාවගේ ආර්ථික මට්ටම වැඩිදියුණු කිරීමට මෙය ප්‍රබල ලෙසම බලපානු ලබයි. ප්‍රදේශය හරහා ගලා බසිනු ලබන යෝධ ඇළ ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයට හා ඒ හා බැඳුණු ජීවන රටාවට සෘජු ලෙසම දායකත්වය දක්වනු ලබයි. රාජාංගනය ජලාශය හා ප්‍රදේශය පුරා පැතිරී පවතින වැව් පද්ධතිය කෘෂිකර්මාන්තයේ උන්නතියට මනා පිටිවහලක් ලබාදෙයි. නමුත් වර්තමානය වන විට මෙම ප්‍රාදේශීය සහා බල ප්‍රදේශය පුරා පැතිර පවතින වැව් පද්ධතිය ක්‍රමයෙන් ගොඩවීමේ තර්ජනයට ලක්වීමත්, එම නිසා වැව් පද්ධතිය තුළ ගබඩා කළ හැකි ජල ධාරිතාව අඩු වීමත්, ප්‍රදේශයේ ආර්ථිකය හා ජන ජීවිතයට විශාල බලපෑමක් එල්ල කරනු ලබයි.

එමෙන්ම ප්‍රදේශයේ වර්ෂාපතනය, සුළඟේ වේගය සහ වළාකුළු ආවරණය යන අංශ පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය ඉතා සාර්ථක ආකාරයට කරගෙන යාමට අවශ්‍ය පරිදි ස්වාභාවික සංසිද්ධීන් සකස් වී ඇති බව පැහැදිලි වේ. එහිදී යල සහ මහ කන්න සඳහා අවශ්‍ය වන පාරිසරික වටපිටාව මෙන්ම, මාස් කන්නය සඳහා අවශ්‍ය කරනු ලබන වර්ෂාපතනය ඔක්තෝම්බර් සිට ජනවාරි දක්වාත් යල කන්නය සඳහා අවශ්‍ය කරනු ලබන අවම වර්ෂාපතනය මාර්තු සිට අගෝස්තු දක්වා කාලසීමාව තුළත් නිසි පරිදි ලැබීමෙන් ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය ඉතා සශ්‍රීක ලෙස පවත්වා ගැනීමට මනා පිටිවහලක් වී ඇත.


විශේෂයෙන්ම සුළඟේ වේගය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ද එය මනා ලෙස පැහැදිලි වේ. එහිදී මැයි සිට සැප්තැම්බර් දක්වා කාලසීමාව තුළ යල කන්නය සඳහා අවශ්‍ය කරනු ලබන පරිසරයේ වියළි බව මෙම සුළඟේ වේගය මගින් මනා ලෙස පවත්වාගනු ලබන අතර, එය ගොඩ බෝග සඳහා ඉතා සුදුසු පරිසරයක් නිර්මාණය කරයි. මෙම කාලසීමාව තුළ අධික වර්ෂාපතනය මගින් ගොඩ බෝග වගාවන්ගෙන් සාර්ථකව ඵල නෙළා ගැනීමට නොහැකි වන අතර, ප්‍රදේශයේ කෘෂි ආර්ථිකයටද එය දැඩි බලපෑමක් සිදු කරයි.

**ප්‍රස්ථාර 4 වාර්ෂික වර්ෂාපතනය - 2022**





මූලාශ්‍රය: https://www.weather-atlas.com - 2022

**ප්‍රස්ථාර 5 වාර්ෂික සුළඟේ වේගය - 2022**




මූලාශ්‍රය: https://www.weather-atlas.com - 2022

**ප්‍රස්ථාර 6 වාර්ෂික වළාකුළු ආවරණය - 2022**




මූලාශ්‍රය: https://www.weather-atlas.com - 2022

ප්‍රදේශයේ ජනගහනය දෙස අවධානය යොමු කිරීමේදී, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා වලට අනුව 2011 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 856 004 ක් වන අතර, එයින් 10% ක් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වේ. ජන සංගණනයන්ට අනුව 2001 හා 2011 වර්ෂ සංසන්දනය කිරීමේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනගහනය ක්‍රමිකව වැඩි වීමක් දක්නට ලැබෙන අතර, 2001 වර්ෂයේදී ජනගහනය 80 471 කි. එය 2011 වර්ෂය වන විට 89 502

දක්වාද 2018 වර්ෂය වන විට 116 861 දක්වා ද ක්‍රමයෙන් වැඩි වී ඇත. ගණනය කිරීම් වලට අනුව ජනගහන වර්ධන වේගය දළ වශයෙන් 1.08 ක පමණ අගයක් ගනු ලබයි.


2018 වර්ෂය වන විට ජනගහනය හෙක්ටයාරයට පුද්ගලයින් 04 ක් වන අතර, 2018 වර්ෂයේ ජනගහනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී වැඩිම ජනගහනය ඉකිරිවැව (419) හා තම්මැන්නාගම (424) කෝනගොල්ලෑව (431) යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලින් වාර්තා වේ. අඩුම ජනගහනයක් වාර්තා වන්නේ කටියාව යාය 02 (237) දළදාපුර (408) කොරකහවැව (402) යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලිනි. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් 48% ක් පිරිමි වන අතර, 52% ක් ස්ත්‍රීන් වේ. ශ්‍රම බලකාය දෙස අවධානය යොමු කිරීමේදී මුළු ජනගහනයෙන් 67% ක් එනම්, 77 676 ක පමණ පුද්ගලයන් ප්‍රමාණයක් ශ්‍රම බලකායට අයත් වන අතර, ප්‍රදේශයේ යැපෙන්නන්ගේ ප්‍රමාණය 33% කි. වයස අවුරුදු 0 - 14 අතර ජනගහනය 27 055 (23%) හා වයස අවුරුදු 60 ට වැඩි ජනගහනය 12 010 (10%) ක් ලෙසිනි. මේ අනුව, ප්‍රදේශයේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් ශ්‍රම බලකාය තුළ රැඳී සිටීම ප්‍රදේශය ආර්ථික අංශයෙන් සංවර්ධනය වීමට බලපා ඇත. මෙම ශ්‍රම බලකායෙන් 45% ක ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය හා බැඳුණු ආර්ථික ක්‍රියාකාරකම් සිදු කරනු ලබන අතර, වැඩි ප්‍රතිශතයක් වී ගොවිතැන හා ගොඩ ගොවිතැන් සමඟ බැඳුණු කෘෂිකාර්මික අංශයන් වල නිරත වේ. මේ අනුව ශ්‍රම බලකායේ ක්‍රියාකාරී පිරිස ඉහළ අගයක් ගැනීම නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඉහළ දායකත්වයක් ලබාදෙන බව පැහැදිලි වේ.

එමෙන්ම ජාතීන් සහ ආගම් අනුව ජනගහනය විශ්ලේෂණය කිරීමේදි 2018 වර්ෂයේ 98% ක් සිංහල බෞද්ධාගමිකයන් බව ජන සංඛ්‍යා ලේඛන වාර්තා අනුව පැහැදිලි වන අතර, අනෙකුත් ජන කොටස් ඉතා සුළු අගයක් ගනී.

ප්‍රදේශයේ නිවාස පිළිබඳ අවධානය යොමු කිරීමේදී නිවාස ප්‍රමාණය 2018 වර්ෂය වන විට 30 330 ක් වන අතර, එම නිවාස ජීවත්වීමට සුදුසු මට්ටමක පවතී. ඊට ප්‍රධානතම හේතුව ලෙස සඳහන් කළ හැක්කේ ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් මට්ටමක පැවතීමයි.

ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව දෙස අවධානය යොමු කිරීමේදී සමස්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය හා කෘෂිකර්මාන්තය වර්ධනය කිරීමට අවශ්‍ය භූමි පරිහරණ රටාවන්ගෙන් යුක්ත බව පැහැදිලි වේ. සමස්ත භූමි පරිහරණ රටාවෙන් 41% ක ප්‍රමාණයක් වී වගාව සඳහා වෙන් වී ඇති අතර, 7% ක පමණ ප්‍රමාණයක්, එනම් හෙක්ටයාර 2291 ක් පමණ ජලජ ප්‍රදේශ සඳහා වෙන්වී ඇත. මේ අනුව ප්‍රදේශයේ ආර්ථිකයේ ජීවනාලිය සඳහා විශිෂ්ට දායකත්වයක් ලබාදෙන ඉතා ප්‍රශස්ත මට්ටමේ භූමි පරිහරණ රටාවක් මෙම ප්‍රදේශය තුල ව්‍යාප්තව ඇති බව පැහැදිළි වේ.

**සිතියම් අංක 10 භූමි පරිහරණ රටාව - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022


ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව හා බැඳී පවතින අනෙකුත් ලක්ෂණය වන්නේ ප්‍රදේශය පුරා ජනාවාස ව්‍යාප්ත වී ඇති ආකාරයයි. ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාකාරකම් හා මනා ලෙස මෙම ජනාවාස රටාව බැඳී පවතී. කුඹුරු වලින් වටකරගත් ජනාවාස රටාවක් මෙම ප්‍රදේශය පුරා දක්නට ලැබෙන අතර, එම ජනාවාස ක්‍රමයෙන් ව්‍යාප්ත වීමේ ප්‍රවනතාවය සමඟ මෙම කුඹුරු ප්‍රදේශ ගොඩවීමේ තර්ජනයට මුහුණ දෙමින් පවතී.

කලාපීය වශයෙන් පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරන මෙම ප්‍රදේශය තුල තලාව හා තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිහිටා ඇත. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මගින් ජනතාවට පරිපාලනමය සේවා සලසා දීම සිදු කරයි.

ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවට මෙන්ම ප්‍රදේශය තුළට පැමිණෙන ජනතාවට අවශ්‍ය සේවා ලබාදීම සඳහා ප්‍රධාන සේවා මධ්‍යස්ථාන රාශියක් පිහිටා ඇත. ඒ අතරින් ප්‍රධාන පෙලේ පාසැල්, රෝහල් ආදිය ප්‍රමුඛ ස්ථානයක් ගනී.

ප්‍රදේශයේ පවතින පාසැල් පද්ධතිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රදේශය පුරා පාසැල් ව්‍යාප්ත වී ඇති ආකාරය මනා ලෙස හඳුනාගත හැකි අතර, පාසැල් ළමුන්ට ඉතා පහසුවෙන් සේවා ලබාගැනීමට හැකි වන පරිදි එම ආයතන ස්ථානගත වී තිබීම අතිශය වැදගත් කරුණකි. මෙහිදී ප්‍රදේශය පුරා පාසැල් 38 ක පමණ ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර, අති විශාල ශිෂ්‍යය පිරිසක් අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම ඉදිරියේදී වර්ධනය වන ජනගහනයට අවශ්‍ය වන ආකාරයට ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින පාසැල් පද්ධතිය භෞතික වශයෙන් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි.


**සිතියම් අංක 11 පාසැල් පෝෂක ප්‍රදේශ - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022


තවද, ප්‍රදේශය තුළ පිහිටා තිබෙන රෝහල් පිළිබඳව අවධානය යොමු කිරීමේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රජයේ රෝහල්, ඇතුලු වෛද්‍ය මධ්‍යස්ථාන 04ක් දක්නට ලැබෙන අතර, එමගින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා හා බැඳුණු ගැටළු වලට විසඳුම් ලබාදෙනු ලබයි. විශේෂයෙන්ම තඹුත්තේගම රෝහල මගින් මෙම ප්‍රදේශයේ මෙන්ම අවට ප්‍රදේශ වල ජනතාවට මහඟු සේවයක් සපයයි. ප්‍රදේශය තුළ පිහිටා තිබෙන ප්‍රධාන රෝහල් 03 තුළ වෛද්‍ය වරුන් 04 දෙනෙකු සේවය කරන අතර, බාහිර රෝගී අංශය තුළ රෝගීන් 750 කට ආසන්න පිරිසකට සේවා ලබාගැනීමේ හැකියාව පවතී. මෙම සේවා සැපයීමේ හැකියාවන් හා භෞතික වශයෙන් පවතින යටිතල පහසුකම් ඉතා ඉහළ මට්ටමක පවතින බැවින් විශාල ජනතාවක් තම සෞඛ්‍ය අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා මෙම රෝහල වෙත පැමිණේ. විශේෂයෙන්ම අනුරාධපුර ශික්ෂණ රෝහලේ පවතින අධික තදබදය හේතු කොටගෙන බොහෝ පිරිසක් තඹුත්තේගම රෝහලෙන් සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන බැවින්, තඹුත්තේගම රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහලේ පවතින අධික තදබදය අවම කර ගැනීමට හැකිවන පරිදි සංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

**සිතියම් අංක 12 රෝහල් ව්‍යාප්තිය - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**සිතියම් අංක 13 ප්‍රවාහන පද්ධතිය**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

ප්‍රදේශය පුරා පැතිර පවතින මාර්ග පද්ධතිය පිළිබඳ අධ්‍යයනයේදී ප්‍රදේශය පුරා මනා සම්බන්ධතාවයක් සහිත මාර්ග ජාලයක් ව්‍යාප්තව ඇති බව පැහැදිලි වේ. සමස්තයක් ලෙස ගත් විට A කාණ්ඩයට අයත් මාර්ගයක් ද B කාණ්ඩයට අයත් මාර්ග දෙකක් ද ප්‍රදේශය හරහා ගමන් කරනු ලබයි. මෙකී මාර්ග දෙක එකිනෙකට සම්බන්ධ වීමෙන් තඹුත්තේගම තලාව, එප්පාවල යන නගර සඳහා ඉතා පහසුවෙන් ළඟා වීමේ හැකියාව පවතී. ප්‍රදේශය පුරා පැතිරී පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතියද මනා සම්බන්ධතාවයක් ගොඩ නගමින් ප්‍රධාන මාර්ග ඔස්සේ සම්බන්ධ වී ඇත. විශේෂයෙන්ම මෙම අතුරු මාර්ග පද්ධතිය ප්‍රදේශයේ කෘෂි බිම් හරහා ගමන් කරනු ලබන අතර, කෘෂි බිම් වලින් ආවරණය වූ ජනාවාස සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් මෙම අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඔස්සේ සම්පූර්ණ කරනු ලබයි. එමෙන්ම තලාව ප්‍රාදේශීය සභාව සතු මෙම අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉහළ අන්තර් සම්බන්ධතාවයක් ගොඩ නගමින් ප්‍රධාන මාර්ග සමඟ සම්බන්ධ වේ. එබැවින් ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට ඉතාමත් සුව පහසු හා ආරක්ෂාකාරී වටපිටාවක් ඇති කිරීමේ අරමුණ ඉටු කර ගැනීම සඳහා ප්‍රදේශය තුළ පවතින මාර්ග පද්ධතිය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

එපමණක් ද නොව, උතුරු දුම්රිය මාර්ගයේ ප්‍රධාන දුම්රිය ස්ථාන දෙකක් වන තලාව හා තඹුත්තේගම දුම්රිය ස්ථාන මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටීමෙන්, මෙම ප්‍රදේශයේ පදිංචි ජනතාවට මෙන්ම ප්‍රදේශයට පිටතින් පැමිණෙන ජනතාවට තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

තවද, පවතින මාර්ග පද්ධතිය විශ්ලේෂණය කිරීමේදී අවබෝධ වන්නේ, මාර්ග පද්ධතිය පාදක කර ගනිමින් මෙම ප්‍රදේශය මනා ලෙස සංවර්ධනය කිරීමේ හැකියාවක් පවතින බවයි. ඊට හේතුව ලෙස සලකා බලන ප්‍රදේශය අභ්‍යන්තරයේ පවතින මාර්ග පද්ධතීන් එකිනෙකට මනා ලෙස සම්බන්ධ වී පැවතීමත් ප්‍රධාන මාර්ග ඔස්සේ එනම්, A 28 මාර්ගයත්, B ශ්‍රේණියේ මාර්ග 2 ත් කේන්ද්‍ර කර ගනිමින් විශාල සංවර්ධන විභවතාවයක් මෙම ප්‍රදේශය තුල පැවතීමත් වේ. විශේෂයෙන්ම ප්‍රධාන මාර්ග දෙපසින් හා ප්‍රධාන මාර්ග වලට ඉතා සමීපයෙන් සම්බන්ධ වන අතුරු මාර්ග මගින්ද, මෙම ප්‍රදේශයේ සංවර්ධන විභවතාවයන් ඉහළ ගොස් ඇති බව විශ්ලේෂණ මගින් මනාව පැහැදිලි වේ.

**සිතියම් අංක 14 මාර්ග පද්ධතිය ඔස්සේ ප්‍රදේශය සංවර්ධනය වීමට ඇති විභවතාවය**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

නමුත්, ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථාන අතර මනා සම්බන්ධයක් නොමැති වීම මෙම ප්‍රදේශය තුළ දැකිය හැකි දුර්වලතාවයක් ලෙස පෙන්වා දිය හැකිය. එප්පාවල නගරය හැර, තලාව හා තඹුත්තේගම යන නගර දෙකෙහි බස්නැවතුම්පල දෙකක් සංවර්ධනය කර ඇත. එමෙන්ම උතුරු දුම්රිය මාර්ගය මෙම ප්‍රදේශය හරහා ගමන් කරන අතර, තලාව හා තඹුත්තේගම පිහිටි දුම්රිය ස්ථාන දෙක, බස්නැවතුම්පල සමඟ අන්තර් සම්බන්ධතාවයක් නොදක්වයි. තලාව බස්නැවතුම්පල හා තලාව දුම්රිය ස්ථානය අතර, මීටර් 600 ක පමණ දුරක් දක්නට ලැබෙන අතර, තඹුත්තේගම දුම්රිය ස්ථානය හා තඹුත්තේගම බස්නැවතුම්පල අතර දුර මීටර් 750 ක් පමණ වේ. උතුරු දුම්රිය මාර්ගය, තඹුත්තේගම නගරයට මීටර් 750 පමණ දුරින් ගමන් කරනු ලබන අතර, තලාව නගරයේදී එය නාගරික ප්‍රදේශයට ආසන්නයෙන් ගමන් කරනු ලබයි. ඒ අනුව, තලාව දුම්රිය ස්ථානය හා තලාව බස්නැවතුම්පල අතර දුර එම ප්‍රවාහන මාධ්‍ය භාවිතා කරන මගීන්ට පයින් ඇවිද යා හැකි දුරට වඩා වැඩි අගයක් ගනී. ඉතාමත් සුවපහසු ජීවන රටාවක් ප්‍රදේශය තුල ඇති කිරීමට මෙම තත්ත්වය බාධාවක් වේ. එබැවින් මෙම දුර්වලතාවයන් මඟ හරවා ගනිමින් මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

**රූපසටහන් අංක 4** **තලාව නගරය**




**රූපසටහන් අංක 5** **තඹුත්තේගම නගරය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය 2022

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්නා මාර්ග වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීමට අපහසු වේ. එයින් B 117 මාර්ගය එනම් තඹුත්තේගම - එප්පාවල මාර්ගය හා B 213 මාර්ගය එනම්, තලාව - එප්පාවල මාර්ගය වාහන ගමනාගමනයට අපහසු ආකාරයෙන් ඉතා අබලන් තත්ත්වයට පත්ව ඇත. ප්‍රධාන වශයෙන්ම තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය හා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සෘජු ලෙසම සම්බන්ධ කරනු ලබන මාර්ග වන්නේ මෙම මාර්ග දෙකයි. එළවළු හා පළතුරු වෙළඳ පොළට හා ආර්ථික මධ්‍යස්ථාන වලට ප්‍රවාහනය කිරීමේදී මෙම මාර්ග දෙකෙහි පවතින අබලන් තත්ත්වය නිසා එළවලු පළතුරු වලින් බොහෝ ප්‍රමාණයක් විනාශයට පත් වේ. ඒ අනුව කෘෂි සම්පත් මඟින් උපරිම ඵල ප්‍රයෝජන ලබා ගැනීමේ හැකියාව මෙම මාර්ග වල පවතින දුර්වල තත්ත්වය හේතුවෙන් මහහැරී යයි.

**රූපසටහන් අංක 6** **අතුරු මාර්ගයන්වල අබලන් තත්ත්වය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය 2022

තවද, සමස්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග ඝනත්වය වර්ග කිලෝ මීටරයට කිලෝමීටර් 4 ක් තරම් අඩු අගයක් ගනු ලබන අතර, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සියළුම අතුරු මාර්ග ඉතා අබලන් තත්ත්වයේ පවතී. මෙම අභ්‍යන්තර මාර්ග භාවිතා කරන කෘෂි මහතුන්ගේ අදහස වන්නේ නිෂ්පාදන වෙළඳපොළ කරා රැගෙන යාමේදී වැඩි ප්‍රමාණයක් විනාශ වන බවයි.

රාජාංගනය, ඔත්තප්පුව, කලාඔය, සිංහාරගම, නොච්චියාගම, හුරිගස්වැව, බුල්නෑව, කලාවැව ආදී ප්‍රදේශයන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය කර ගනිමින් පිහිටා ඇති අතර, කෘෂි නිෂ්පාදන වැඩි ප්‍රමාණයක් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය වෙත මෙම ප්‍රදේශ වලින් ප්‍රවාහනය කරනු ලබයි.


මෙම කෘෂි බෝග ප්‍රධාන වශයෙන්ම B 213 එප්පාවල - කැකිරාව මාර්ගය, B 501 සිංහාරගම - ගල්නෑව මාර්ගය ආදිය භාවිතා කරමින් ප්‍රවාහනය කලද, මෙම මාර්ග ඉතා අබලන් තත්ත්වයේ පවතී. එහිදී එළවලු හා පළතුරු තැලී විනාශයට පත් වන අතර, එය ගොවියාට මෙන්ම ආර්ථික මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වයටද දැඩි බාධා එල්ල කරනු ලබයි. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පිටතින් සම්බන්ධ වන මාර්ගයන් හි අබලන් තත්ත්වය තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාවලියට දැඩි හානියක් එල්ල කරනු ලබන අතර, ප්‍රදේශය තුළ පවතින කෘෂි සම්පත් වලින් උපරිම ඵල නෙලා ගැනීමට නම් මෙම අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

ලංකා විදුලි බල මණ්ඩලය මගින් ප්‍රදේශය ආවරණය වන පරිදි විදුලි බලය ලබාදී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති අතර, වර්ෂ 2033 වන විට බලාපොරොත්තු වන ජනගහනයට අවශ්‍ය කරනු ලබන විදුලි බලය ලබාදිය හැකි බව විදුලි බල මණ්ඩලයේ අදහසයි.

මීට අමතරව මෙම ප්‍රදේශය තුල පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ මූල්‍ය ආයතන හා බැංකු පිහිටා තිබෙන අතර, එමගින් ප්‍රදේශයේ ජනතාවට පමණක් නොව ප්‍රදේශයට පිටතින් පැමිණෙන ජනතාවට තම මූල්‍ය අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමට හැකියාව උදා වේ.

පානීය ජල පහසුකම් පිළිබඳ අවධානය යොමු කිරීමේදී, මෙම ප්‍රදේශයේ ජීවත්වන බහුතරයක් එම අවශ්‍යතාවය සපුරාගනු ලබන්නේ ළිං භාවිතා කරමිනි. නළ ජල පහසුකම් නොමැති ප්‍රදේශ වලට ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා ජල ව්‍යාපෘතින් මගින් පානීය ජල පහසුකම් ලබාදෙන අතර, වර්තමානය වන විට සමස්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය කරමින් පානීය ජල පහසුකම් ප්‍රමාණවත්ව පවතී. එමෙන්ම වසර 2030 වන විට වැඩිවන ජනගහනයට අවශ්‍ය පානීය ජල පහසුකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යෝජිත ව්‍යාපෘති මඟින් ආවරණය කර ගත හැකි බව එම දත්ත විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වේ. පානීය නල ජල පහසුකම් සපයා ඇති හා නොමැති ප්‍රදේශ පිළිබඳ සිතියම් අංක 15 මගින් පෙන්වා ඇත.

**සිතියම් අංක 15 නල ජල පහසුකම් සපයා ඇති හා නොමැති ප්‍රදේශ**





මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2022

වගුව 1 පානීය ජල හිඟයෙන් සිදු වූ හානිය

| වර්ෂය | හානියට පත් පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| 2002 | 120 |
| 2003 | 795 |
| 2004 | 86300 |
| 2005 | 270 |
| 2006 | 270 |
| 2007 | 660 |
| 2008 | 100 |
| 2012 | 0 |
| 2014 | 0 |
| 2016 | 6505 |
| 2017 | 7590 |
| 2018 | 401 |

මූලාශ්‍රය: DesInventar.lk – 2021

රූපසටහන් අංක 7 විදේශ විනිමය උපයන කර්මාන්ත ප්‍රදේශය තුළ පිහිටා තිබීම





මෙම ප්‍රදේශය සතු ඉතාම වටිනා සම්පතක් ලෙස කර්මාන්ත හඳුන්වා දිය හැකිය. මෙම නිෂ්පාදන කර්මාන්ත ශාලා මගින් වැඩබිම් සඳහා ඇඳුම් නිෂ්පාදනය කරනු ලබයි. තඹුත්තේගම නගරය තුල 2000 කට අධික පිරිසකට රැකියා අවස්ථා ලබා දී ඇති මෙම කර්මාන්ත ශාලා වන්නේ "ගස්ටන්" ලංකා පුද්ගලික සමාගම හා "කොන්කෝර්ඩ්" ලංකා පුද්ගලික සමාගමයි. මෙහිදී තලාව, තඹුත්තේගම, එප්පාවල, රඹෑව, මැදවච්චිය, නිකවැරටිය, ආදී අවට ප්‍රදේශ වලින් මෙම කර්මාන්ත ශාලාවල සේවය කිරීම සඳහා සේවකයන් පැමිණෙන අතර, ප්‍රදේශයේ ජනතාවටත්, පිටත ප්‍රදේශ වල ජනතාවටත් රැකියා අවස්ථා ලබා දීම නිසා මෙම කර්මාන්ත ශාලාවලට වැඩි වටිනාකමක් ලැබී ඇත.

ප්‍රධාන වශයෙන්ම යුරෝපය, ඇමරිකාව, කැනඩාව ආදී රටවල් සඳහා මෙම නිෂ්පාදනයන් අපනයන කරනු ලබන අතර, අති විශාල විදේශ විනිමය ප්‍රමාණයක් මෙමගින් උපයනු ලබයි. මෙම

කර්මාන්තශාලාවන් උතුරු මැද පළාතේ කාර්මික ඇඟලුම් නිෂ්පාදනය කරනු ලබන විශේෂිත කර්මාන්තශාලා ලෙස හඳුන්වා දිය හැකිය.

තවද, මෙම කර්මාන්ත ශාලා මගින් ප්‍රදේශයේ මෙන්ම රටේ ආර්ථිකය වර්ධනය කිරීමට ද ඉහළ දායකත්වයක් ලබාදී ඇති අතර, හරිත සංකල්පය පාදක කර ගනිමින් සංවර්ධන කටයුතු සිදු කර ඇත. එහිදී කර්මාන්තශාලා සඳහා අවශ්‍ය කරනු ලබන ජලය එම කර්මාන්තශාලා මගින්ම සපයා ගනු ලබන අතර, අවශ්‍ය විදුලි සැපයුම ලංකා විදුලිබල මණ්ඩලය මගින් ලබා ගනී. මෙම කර්මාන්තශාලා වල සම්පූර්ණ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය විදුලි බල ප්‍රමාණය මසකට 31 500 Kwh පමණ වේ. නමුත් සූර්ය තාපය යොදා ගනිමින් විදුලි බලය නිෂ්පාදනය කරනු ලබන බැවින්, සූර්ය පැනල භාවිතයෙන් මසකට නිෂ්පාදනය කරනු ලබන විදුලි බල ප්‍රමාණය, ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලබා ගනු ලබන විදුලි ප්‍රමාණයට වඩා වැඩි වන අතර, එය මසකට 40 500 Kwh පමණ වේ.

**රූපසටහන් අංක 8** **කාර්මික ඇඟළුම් නිෂ්පාදන කාර්මාන්තශාලා**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

මෙම අමතර විදුලි නිෂ්පාදනය ජාතික පද්ධතියට ලබා දෙනු ලබයි. එපමණක් ද නොව මෙහි ජනනය වන කැලිකසළ නිසි ආකාරයෙන් ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන බැවින්, පරිසරයට මුදා හැරීමක් සිදු නොවේ. කසළ මනා ලෙස ප්‍රතිචක්‍රීකරණය කරමින් වගාවන් පවත්වාගෙන යන අතර, පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා වීමට එය බෙහෙවින් උපකාරී වේ.

ආර්ථික වර්ධනය සඳහා සක්‍රීය දායකත්වයක් සපයන මෙම කර්මාන්තශාලා තුල පුහුණු ශ්‍රමිකයින්ගේ සේවාව කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරීත්වයට බලපානු ලබන අතර, පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟය ප්‍රාදේශීය වශයෙන් ඉහළ මට්ටමක පැවතීම මෙම කර්මාන්ත ශාලා වල උන්නතියට විශාල ගැටළුවකි. එයට පිළියම් ලබාදීම තුලින් ප්‍රදේශයේ මෙන්ම රටේ ආර්ථික සංවර්ධනය සඳහා ඉහළ බලපෑමක් ඇති කල හැකිය. පුහුණු ශ්‍රමිකයන් හිඟ වීමට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගත හැක්කේ ඔවුන්ට අවශ්‍ය සේවා පහසුකම් ප්‍රදේශය තුල නොමැති වීමයි. සේවකයන්ගේ දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසැල් වැනි අත්‍යවශ්‍ය පහසුකම් මෙම සේවා ස්ථාන අසලින්ම ලබාදීම මගින් පුහුණු ශ්‍රමිකයින් අඩුවීමේ ගැටළුව අවම කරයි.

ප්‍රදේශයට බලපානු ලබන පාරිසරික තත්ත්වයන් දෙස අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි ප්‍රධානතම තර්ජනය වන්නේ නියඟයයි. එය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2000 - 2018 දක්වා දත්ත විශ්ලේෂණය කිරීමේදී මනාව අවබෝධ කරගත හැක. 2004 වර්ෂයේ ඇති වූ නියඟ තත්ත්වය හේතුවෙන් ප්‍රදේශයේ පුද්ගලයන් 86 300 ක් පමණ පීඩාවට පත්ව ඇති බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තොරතුරු වලින් පැහැදිලි වේ.

ඊට අමතරව කාලීනව ඇතිවන ගංවතුර තත්ත්වයෙන් ද ප්‍රදේශයේ ජීවත්වන ජනතාව පීඩාවට පත්වනු ලබයි. 2014 වර්ෂයේ ඇති වූ ගංවතුර තත්ත්වයෙන් 1 640 දෙනෙකුගේ ජන ජීවිතයට හා ආර්ථිකයට බාධා පැමිණ ඇති බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහන් කරනු ලබයි. කලාඔය ශ්‍රී ලංකාවේ ගංහා ද්‍රෝණියේ මධ්‍යම ප්‍රමාණයේ ගංඟාවක් වන අතර, දකුණින් මී ඔය සහ උතුරින් අරුවි ආරු අතර පිහිටා ඇති විල්පත්තුව ජාතික වනෝද්‍යානය අසලින් මහා මුහුදට වැටේ. මෙම ගංඟාවේ ජල පෝෂක ප්‍රදේශය කිලෝමීටර් 2 526 ක් වන අතර, ජල පෝෂක ප්‍රදේශයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1 420 ක් පමණ වේ. 2016 වර්ෂයේදී ගංවතුරට ලක්වූ ප්‍රදේශ පිළිබඳ විස්තර පහත වගුව මගින් දැක්වේ.

**වගුව 2 ගංවතුර ආපදා තත්ත්වයන්ගෙන් හානි වූ ප්‍රදේශ - 2021**

| ප්‍රා.ලේ.කොට්ඨාශය | ග්‍රාම නිලධාරී වසම | වර්ග ප්‍රමාණය (ව.කි.මී) | ගංවතුරට ලක්වූ ප්‍රදේශය (ව.කි.මී) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| තලාව | කටියාව යාය 09 | | 0.39 | 5.28 |
| තලාව | කටියාව යාය 06 | 7.39 | 0.17 | 2.88 |
| තලාව | කටියාව යාය 10 | 5.87 | 0.13 | 2.62 |
| තඹුත්තේගම | මකුලෑව | 4.85 | 0.44 | 8.85 |
| තඹුත්තේගම | තම්මැන්නාව | 4.97 | 0.21 | 3.96 |
| තඹුත්තේගම | හුරිගස්වැව | 5.36 | 0.21 | 15. 42 |
| තඹුත්තේගම | ඉකිරිවැව | 1.37 | 0.20 | 2.67 |
| තඹුත්තේගම | මුදුන්ගොඩ | 7.37 | 0.04 | 1.15 |
| තඹුත්තේගම | තිස්පනේපුර | 3.34 | 0.03 | 0.87 |
| තඹුත්තේගම | තඹුත්තේගම | 3.65 | 0.01 | 0.32 |
| තඹුත්තේගම | හැලබවැව | 3.85 | 0.01 | 0.34 |

මූලාශ්‍රය: DesInventar.lk – 2021

**වගුව 3 ගංවතුර ආපදා තත්ත්වයෙන් සිදු වූ හානිය**

| වර්ෂය | හානියට පත් පුද්ගල සංඛ්‍යාව | හානියට පත් නිවාස සංඛ්‍යාව | විනාශ වූ නිවාස සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2002 | 5 | 1 | 0 | 0 |
| 2003 | 60 | 12 | 0 | 0 |
| 2005 | 5 | 0 | 1 | 0 |
| 2006 | 10 | 0 | 2 | 0 |
| 2007 | 1583 | 21 | 26 | 0 |
| 2011 | 915 | 15 | 6 | 0 |
| 2012 | 183 | 0 | 0 | 0 |
| 2014 | 1640 | 0 | 0 | 0 |
| 2016 | 0 | 0 | 0 | 2 |
| 2019 | 1109 | 0 | 0 | 0 |

මූලාශ්‍රය: DesInventar.lk – 2021

ඊට අමතරව ප්‍රදේශයේ වන අලි තර්ජන ද බහුලව පවතින අතර, වගු අංක 4 මගින් දක්වා ඇති පරිදි ගංවතුර, නියඟ, සුළි සුලං මගින් ද පාරිසරික වශයෙන් තර්ජනකාරී වටපිටාවක් නිර්මාණය කර ඇති බව පැහැදිලි වේ.

වන අලි තර්ජන පිළිබඳව අවධානය යොමු කිරීමේදී එහි කැපී පෙනෙන තත්ත්වයක් අවබෝධ කර ගත හැකි අතර, වන ජීවී දෙපාර්තමේන්තුව සඳහන් කරනු ලබන්නේ වන අලි ගමන් කරන මාර්ග වල


ජනාවාසීකරණය සිදුවීමත්, එම ජනාවාස අලිමංකඩ අවහිර කරමින් ව්‍යාප්ත වීමත් සමඟම මෙම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇති බවයි. එමෙන්ම පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ නොසලකා හරිමින් සංවර්ධන කටයුතු සිදු කිරීම ද විශාල දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

**වගුව 4 ස්වභාවික පාරිසරික තර්ජනයන් හා ඒවායේ බලපෑම**

| අවුරුද්ද | ගංවතුර (තර්ජනයට ලක්වූ පුද්ගලයන් ගණන) | නියඟය (තර්ජනයට ලක්වූ පුද්ගලයන් ගණන) | සුළිසුළං (තර්ජනයට ලක්වූ පුද්ගලයන් ගණන) |
|---|---|---|---|
| 2000 | - | - | - |
| 2001 | - | - | - |
| 2002 | 05 | 170 | 75 |
| 2003 | 60 | 795 | - |
| 2004 | - | 86300 | 50 |
| 2005 | 05 | 270 | 85 |
| 2006 | 10 | 270 | 05 |
| 2007 | 1583 | 135 | 19 |
| 2008 | - | 100 | - |
| 2010 | - | - | 60 |
| 2011 | 915 | - | - |
| 2012 | 183 | - | - |
| 2014 | 1640 | - | - |
| 2016 | - | 6505 | - |
| 2017 | - | 7590 | - |
| 2018 | - | 401 | 35 |

මූලාශ්‍රය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2022

**ප්‍රස්ථාර 7 වන අලි හානි සිදුවීම් 2012 – 2021**




මූලාශ්‍රය : වන ජීවී දෙපාර්තමේන්තුව - 2022

තවද, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය පිළිබඳ පහත අංශ යටතේ අධ්‍යයනය කළ හැකිය.

01. පාරිසරික සංවේදී ප්‍රදේශ

02. ආපදා තත්ත්වය

03. පොදු එළිමහන් විනෝද කටයුතු


**වගුව 5 පාරිසරික සංවේදී ප්‍රදේශ - තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - 2022**

| භාවිතය | ප්‍රමාණය(හෙක්ටයාර) | ප්‍රතිශතය(%) |
|---|---|---|
| වනාන්තර | 2182 | 11 |
| කුඹුරු | 14313 | 75 |
| වගුරු බිම් | 367 | 2 |
| ජල දේහ | 2331 | 12 |
| එකතුව | 19193 | 100 |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022


තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස වගුරු බිම්, වන රක්ෂිත, කුඹුරු,වැව්, ඇළ මාර්ග වැනි ප්‍රදේශ හඳුනා ගත හැකිය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් රක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති හෙක්ටයාර් 2507.89 ක ප්‍රමාණයකින් යුතු යෝධ ඇළ රක්ෂිත වනාන්තරයද, හෙක්ටයාර් 2756.46 ක ප්‍රමාණයකින් යුතු නුවරගම වන රක්ෂිතය ද මෙම ප්‍රදේශය තුල පිහිටා ඇත. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති සමස්ත පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රමාණය හෙක්ටයාර් 19 009 පමණ වන අතර, එය, වගු අංක 5 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 16 පාරිසරික සංවේදී ප්‍රදේශ - 2022**




මූලාශ්‍රය:නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**සිතියම් අංක 17 ආපදා තත්ත්වයන්**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා වෙන් වී ඇති ප්‍රදේශ පිළිබඳ සැලකීමේදී පොදු මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව පිලිබඳව ද අවධානය යොමු කර ඇත. මෙම ප්‍රාදේශීය සහා බල ප්‍රදේශයේ ප්‍රජාවට පහසුවෙන් ඇවිද යා හැකි දුරකින් ප්‍රවේශ විය හැකි විවේක සහ විනෝද කටයුතු සඳහා වූ විවෘත අවකාශ සහ හරිත ප්‍රදේශ ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුව වර්තමාන ජනගහනය වන 116 860 ක් සඳහා විවෘත භූමි හෙක්ටයාර් 116 ක් පැවතිය යුතු බවට හඳුනාගෙන ඇති නමුත්, දැනට පවතින්නේ හෙක්ටයාර 630 ක පමණ විවෘත භූමි ප්‍රමාණයකි.

එමෙන්ම පවතින පොදු එළිමහන් අවකාශ පිළිබඳ තොරතුරු සිතියම් අංක 18 මගින් සහ 6 සිට 10 දක්වා ඇති වගු මගින් පෙන්වා ඇත.

**වගුව 6 බල ප්‍රදේශයේ පවතින ක්‍රීඩා පිටි සහ උද්‍යාන**

| අනු අංකය | උද්‍යාන වර්ගය | සංඛ්‍යාව | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|
| 01 | ඉතා කුඩා උද්‍යාන (EPP) | 2 | 0.18 |
| 02 | කුඩා උද්‍යාන (EMP) | 35 | 23.95 |
| 03 | අසල උද්‍යාන (ELP) | 12 | 15.39 |
| 04 | ප්‍රාදේශීය උද්‍යාන (ECP) | 1 | 3.81 |
| | | **එකතුව** | 43.33 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2020

**වගුව 7 පවතින ඉතා කුඩා උද්‍යාන**

| අනු අංකය | වර්තමාන භාවිතය | උද්‍යාන වර්ගය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
|---|---|---|---|
| 01 | ක්‍රීඩාංගනය | EPP 01 | හැලඹවැව |
| 02 | ක්‍රීඩාංගනය | EPP 02 | මහබෙල්ලන්කඩවල |
| **එකතුව** | | | 0.18 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2020

**වගුව 8 පවතින ක්‍රීඩාංගන**

| අනු අංකය | උද්‍යාන වර්ගය | වර්තමාන භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|
| 01 | EMP1 | පලුගස්වැව ක්‍රීඩාංගනය | 0.2 | වැලියාය |
| 02 | EMP2 | ක්‍රීඩාංගනය | 0.26 | මුදුන්ගොඩ |
| 03 | EMP3 | ක්‍රීඩාංගනය | 0.34 | ඉකිරිවැව |
| 04 | EMP4 | ක්‍රීඩාංගනය | 0.46 | මහබෙල්ලන්කඩවල |
| 05 | EMP5 | සිංහ ක්‍රීඩාංගනය | 0.47 | කඩිගාව |
| 06 | EMP6 | ක්‍රීඩාංගනය | 0.48 | මකුලෑව |
| 07 | EMP7 | ක්‍රීඩාංගනය | 0.48 | මහබෙල්ලන්කඩවල |
| 08 | EMP8 | ක්‍රීඩාංගනය | 0.52 | තිස්පනේපුර |
| 09 | EMP9 | ක්‍රීඩාංගනය | 0.59 | කෝන්ගොල්ලෑව |
| 10 | EMP10 | ක්‍රීඩාංගනය | 0.62 | කෝන්ගොල්ලෑව |
| 11 | EMP11 | දිලෙන තරු ක්‍රීඩාංගනය | 0.63 | දළදාපුර |
| 12 | EMP12 | ක්‍රීඩාංගනය | 0.64 | හුරිගස්වැව |
| 13 | EMP13 | ක්‍රීඩාංගනය | 0.65 | සෝලම |
| 14 | EMP14 | සඳසිරිගම ක්‍රීඩාංගනය | 0.67 | කුඩාබෙල්ලන්කඩවල |
| 15 | EMP15 | නවහඟුරන්කෙත පොදු ක්‍රීඩාංගනය | 0.67 | නවහඟුරන්කෙත |
| 16 | EMP16 | ක්‍රීඩාංගනය | 0.68 | පහලතලාව |
| 17 | EMP17 | සිංහ ක්‍රීඩාංගනය | 0.69 | කරගහවැව |
| 18 | EMP18 | කුමාරඑලිය පොදු ක්‍රීඩාංගනය | 0.71 | හිරිගොල්ලේගම |
| 19 | EMP19 | ක්‍රීඩාංගනය | 0.72 | කෝන්වැව |
| 20 | EMP20 | ක්‍රීඩාංගනය | 0.72 | කරගහවැව |
| 21 | EMP21 | ක්‍රීඩාංගනය | 0.73 | කිරිඅමුනකොලේ |
| 22 | EMP22 | කොත්මල්පුර ක්‍රීඩාංගනය | 0.73 | තෙල්හිරියාව |
| 23 | EMP23 | ක්‍රීඩාංගනය | 0.74 | කැලෑගම |
| 24 | EMP24 | ක්‍රීඩාංගනය | 0.74 | තිස්පනේපුර |
| 25 | EMP25 | තේක්කවත්ත ක්‍රීඩාංගනය | 0.75 | නල්ලච්චිය |
| 26 | EMP26 | ක්‍රීඩාංගනය | 0.79 | තම්මැන්නාගම |
| 27 | EMP27 | ක්‍රීඩාංගනය | 0.87 | කැටකැලේ |
| 28 | EMP28 | ක්‍රීඩාංගනය | 0.88 | වෙහෙරගල |
| 29 | EMP29 | ක්‍රීඩාංගනය | 0.9 | අධිකාරිගම |
| 30 | EMP30 | ක්‍රීඩාංගනය | 0.9 | මීගස්වැව |
| 31 | EMP31 | ක්‍රීඩාංගනය | 0.92 | කටියාව ට්‍රැක් 10 |
| 32 | EMP32 | කුඹුක්ගහවත්ත පොදු ක්‍රීඩාංගනය | 0.92 | කුඹුක්ගහවැව |
| 33 | EMP33 | ක්‍රීඩාංගනය | 0.94 | මැදගම |
| 34 | EMP34 | ක්‍රීඩාංගනය | 0.96 | මහබෙල්ලන්කඩවල |
| 35 | EMP35 | ක්‍රීඩාංගනය | 0.98 | ගල්විහාරවැව |
| **එකතුව** | | | | 23.95 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2020

වගුව 9 පවතින අසල උද්‍යාන - **Existing Local Parks (ELP)**

| අනු අංකය | වර්තමාන භාවිතය | උද්‍යාන වර්ගය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| 1 | මීගස්ගම ක්‍රීඩාංගනය | ELP1 | මිගස්ගම | 1.01 |
| 2 | හිරිගොල්ලේගම ක්‍රීඩාංගනය | ELP2 | නව හඟුරන්කෙත | 1.03 |
| 3 | ක්‍රීඩාංගනය | ELP3 | කුරුඳුවැව | 1.1 |
| 4 | එලියදිවුල්වැව ක්‍රීඩාංගනය | ELP4 | එලියදිවුල්වැව | 1.12 |
| 5 | තලාව පොදු ක්‍රීඩාංගනය | ELP5 | ඉහල තලාව | 1.13 |
| 6 | ක්‍රීඩාංගනය | ELP6 | මැදියව | 1.2 |
| 7 | ක්‍රීඩාංගනය | ELP7 | කරගහවැව | 1.27 |
| 8 | සඳරැස්ගම ක්‍රීඩාංගනය | ELP8 | පලුගස්වැව | 1.3 |
| 9 | මකුලැව ක්‍රීඩාංගනය | ELP9 | තම්මැන්නාව | 1.45 |
| 10 | නල්ලච්චිය ක්‍රීඩාංගනය | ELP10 | නල්ලච්චිය | 1.45 |
| 11 | සඳරැස්ගම ක්‍රීඩාංගනය | ELP11 | පලුගස්වැව | 1.64 |
| 12 | ක්‍රීඩාංගනය | ELP12 | එලියදිවුල්වැව | 1.69 |
| **එකතුව** | | | | 15.39 |


මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2020

වගුව **10** පවතින කලාපීය උද්‍යාන - **Existing Regional Parks (ERP)**

| අනු අංකය | වර්තමාන භාවිතය | උද්‍යාන වර්ගය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| 01 | මහවැලි ක්‍රීඩාංගනය | ECP1 | තඹුත්තේගම | 3.81 |
| එකතුව | | | | 3.81 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2020

**සිතියම් අංක 18 පවතින ක්‍රීඩා පිටි සහ උද්‍යාන**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රදේශය නීල හරිත භූමි පරිහරණ රටාවකින් යුත් ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. ඊට හේතුව වන්නේ කෘෂිකාර්මික බිම් සඳහා සමස්ත භූමි පරිහරණ රටාවෙන් 42% ක තරම් වූ ප්‍රමාණයක් ද මිශ්‍ර කෘෂි කටයුතු වෙනුවෙන් 14% ක භූමි ප්‍රමාණයක් ද ජලජ ප්‍රදේශ සඳහා 7% ක පමණ භූමි ප්‍රමාණයක් ද පැවතීමයි. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යනු අනුරාධපුර නගරයට ඉතාමත් ආසන්නයෙන් පිහිටි ප්‍රදේශයකි. අනුරාධපුර නගරයට පැමිණෙන දෙස් විදෙස් ජනතාවගේ ගිමන් හැරීම සඳහා සුදුසු ස්ථානයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමේ මනා විභවතාවයක් පවතී. ඊට ප්‍රධානතම හේතුව වන්නේ අනුරාධපුර නගරයට ප්‍රධාන පිවිසුම් දොරටු කිහිපයක් මෙම ප්‍රදේශය හරහා පිහිටා තිබීමත්, එම මාර්ග කේන්ද්‍ර කර ගනිමින් අලංකාර ගොවිබිම් හා මනස්කාන්ත වැව් රාශියක් පිහිටා තිබීමත්ය.

**රූපසටහන් අංක 8 විවේකී ස්ථාන ලෙස සංවර්ධනය කිරීමට සුදුසු ස්ථාන**



මූලාශ්‍රය:අන්තර්ජාලය ඇසුරිනි - 2022

එබැවින් මෙම විභවතාවය මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් හා ප්‍රධාන මාර්ග කේන්ද්‍ර කර ගනිමින් සුදුසු ස්ථාන සංවර්ධනය කිරීම තුලින් දෙස් විදෙස් ජනතාවගේ ආකර්ෂණය ඉහළ මට්ටමකින් මෙම ප්‍රදේශයට ලබා ගත හැකි වන අතර, එම තත්ත්වය ප්‍රදේශයේ ආර්ථික වර්ධනය කිරීමේ වක්‍ර අවස්ථාවක් බවට පත් කරලීමේ හැකියාවක් ද පවතී. විවේකී ස්ථාන ලෙස සංවර්ධනය කිරීමට සුදුසු එජ්පාවල වැව, තලාව වැව, තඹුත්තේගම වැව, එලිය දිවුල්වැව යන ස්ථාන වල දර්ශන රූපසටහන් අංක 9 මගින් දක්වා ඇත.

ප්‍රදේශයේ සංස්කෘතිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී එය සුවිශේෂී ස්ථානයක් ගනු ලබන බව පෙනී යයි. සංස්කෘතිය සෑම සමාජයකටම පොදු වන අතර, එය විවිධාකාරයෙන් අර්ථ දක්වා ඇත. යම්

සමාජයක භෞතික වූත්, ආධ්‍යාත්මික වූත්, බුද්ධිමය වූත් ජීවන ක්‍රමය සංස්කෘතිය යන්නෙහි සරල අදහස වේ. එමෙන්ම සංස්කෘතිය හෝ ශිෂ්ටාචාරය යන්නට දැනුම, ඇදහීම්, කලාව, සදාචාර ධර්ම, නීතිය, සිරිත් විරිත් සහ සමාජයේ සාමාජිකයෙකු ලෙස මිනිසා විසින් ලබා දී ඇති අන් සියලුම දක්ෂතා ගති පැවතුම් ඇතුලත් සංකීර්ණ සියල්ල ඇතුලත් වේ. ඒ අනුව, ඕනෑම සමාජයක පැවැත්ම උදෙසා එහි සංස්කෘතිය ඉවහල් වන බව පැහැදිලි වේ .

**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ඓතිහාසික සංස්කෘතික වටිනාකම්වින් යුක්ත ස්ථාන අතර ඇති වෙනස**


පුරාවිද්‍යාත්මක ස්ථාන හා සංස්කෘතිකමය වටිනාකම්වින් යුක්ත ස්ථාන කිහිපයක් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතී. පුරාවිද්‍යාත්මක ස්ථාන යනුවෙන් හැඳින්වෙන්නේ භෞතිකමය සාධක එනම්, කාලනිර්ණය කිරීමෙන් හඳුනාගත් ස්මාරක (Monuments) වැනි ස්ථාන වන අතර, ඓතිහාසික හා සංස්කෘතිකමය වටිනාකම්වින් යුක්ත ස්ථාන ලෙස හඳුන්වන්නේ ලිඛිතමය සාධක වලින්, පාරම්පරිකව වාචිකව හෝ ජනශ්‍රැති ආශ්‍රයෙන් පැවත එන්නා වූ ස්ථානයන්ය .

**ප්‍රදේශයේ ඉතිහාසය**

තලාව - තඹුත්තේගම ප්‍රදේශයේ ඉතිහාසය අධ්‍යයනයේ දී එය අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි ග්‍රාමයක් වන බැවින් සමස්ත අනුරාධපුර නගරයේම ඉතිහාසය අධ්‍යයනය කිරීම කල යුතු වේ . ඒ අනුව අනුරාධපුරය උතුරු මැද පළාතේ පිහිටි ශ්‍රී ලංකාවේ පළමු අගනගරයකි. එය ශතවර්ෂ ගණනාවක් පුරා ථේරවාදී බුදු දහමේ කේන්ද්‍රස්ථානය වූ ශ්‍රී ලංකාවේ පැරණි අගනගර වලින් එකක් ද වේ.

**රූපසටහන් අංක 9 ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන**





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

ලෝකයේ ශ්‍රේෂ්ඨතම නගරයක් වන අනුරාධපුරය ක්‍රි. පූ . 377 සිට ක්‍රි. ව. 1017 රාජ්‍ය සමය අවසන් වන තෙක් එනම්, 11 වන සියවස දක්වා ශ්‍රී ලංකා රාජධානියේ විශිෂ්ටතම අගනගරය ලෙස ද පැවතුනි. ලංකාවේ ප්‍රථම සැලසුම් සහගත නගරය වූ මෙය ක්‍රි.පූ. 5 වන සියවසේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ පළමු ඓතිහාසික අගනුවර ද වේ. එය දැවැන්ත බෞද්ධ සිද්ධස්ථාන සහ ආරාම, මාළිගා, මණ්ඩප සහ උද්‍යාන වලින් සමන්විත ප්‍රෞඪ නගරයකි. තලාව ප්‍රදේශයේ පිහිටා ඇති හඳුනාගත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්ථානද මේ හා සමාන විශේෂ වැදගත්කමකින් යුක්ත වේ .

ඓතිහාසික වාර්තා වලට අනුව අනුරාධපුර නගරය ආරම්භ වී ඇත්තේ ක්‍රි. පූ . 5 වන සියවසේ දී වුවද, පුරාවිද්‍යාත්මක සාධක අනුව එය ක්‍රි. පූ. 5 වන සියවසට පෙර කාලය එනම් , ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිව යයි. ඒ අනුව, තලාව - තඹුත්තේගම නගරවල ඓතිහාසික පසුබිමද, එම වකවානුව දක්වා විකාශය වේ.

**පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන.**

පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමකින් යුක්ත ගොඩනැගිලි කිහිපයක් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හඳුනාගැනීමට ඇති අතර, එය සිතියම් අංක 19 මගින් දක්වා ඇත. දැනට තොරතුරු වාර්තාගත වී පවතින ස්ථාන පිළිබඳව පමණක් මෙම සැලැස්මෙන් ඉදිරිපත් කරනු ලැබේ.

## 01. ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය

මෙම විහාරස්ථානය තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති අතර අංක: 381 මැදගම ග්‍රාම නිලධාරී වසමට අයත් වේ. අලුත්වැව ගමේ පිහිටා ඇති මෙම විහාරස්ථානයේ ඇති "අත්ථානි ශිලාලේඛනය" පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්මාරකයකි. මෙම ශිලාලේඛනය, අංක 1586 යටතේ 2009.01. 23 වෙනි දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

**රූපසටහන් අංක 10** **ශ්‍රී බෝධිරුක්ඛාරාමය**



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

## 02. ගල්කන්ද පුරාණ විහාරය

තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක: 391 පලුගස්වැව ග්‍රාමනිලධාරී වසමට අයත් වන එප්පාවල ගමේ මෙම පුරාණ විහාරය පිහිටා ඇත. මෙහි කටාරම් සහිත ලෙන් පුරාවිද්‍යාත්මක අවශේෂයන් ලෙස සැළකේ. මෙම ස්ථානය අංක : 1612 යටතේ 2009.07.24 දින ආරක්ෂිත පුරාවිද්‍යා ස්මාරකයක් වශයෙන් ගැසට් කර ඇත.

**රූපසටහන් අංක 11 ගල්කන්ද පුරාණ විහාරය**



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 03. ජයසුන්දරාරාම විහාරය.

ජයසුන්දරාරාම විහාරය පහළ තලාව අංක: 407 ග්‍රාමයට අයත් වන අතර, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇත. පැරණි ගල්කණු, පාදම් ගල් හා නටඹුන් දැකිය හැකිය. අංක: 1739 යටතේ 2011.12.30 දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් මෙම ස්මාරකය ප්‍රකාශයට පත් කර ඇත.

### 04. කුඩා ගල් විහාරය .

තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක: 436 දෙල්නේගම ග්‍රාම නිලධාරී වසම තුළ කුඩා ගල් විහාරය පිහිටා ඇත. ඔරුගල යාය ගමේ පිහිටි මෙම විහාරස්ථානයේ ඇති සිරිපතුල හා සෙල්ලිපි සහිත ගල්තලාව පුරාවිද්‍යා අවශේෂයන් වේ. මෙම ස්ථානයන් අංක: 1586 යටතේ 2009.01.23 දින ආරක්ෂිත පුරාවිද්‍යා ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

**රූපසටහන් අංක 12 කුඩා ගල් විහාරය**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

## 05. මකුලෑව පුරාණ රජමහා විහාරය

තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මෙම විහාරය අංක: 415 මකුලෑව ග්‍රාමනිලධාරී වසමට අයත් වේ. මෙහි ඇති පැරණි දාගැබ, පිළිමගෙය හා පොකුණු හතර පුරාවිද්‍යා අවශේෂ වේ.මෙම ස්මාරකයන් අංක 1612 යටතේ 2009.07.24 දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත.

**රූපසටහන් අංක 13 මකුලෑව පුරාණ රජමහා විහාරය**






මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 06. නවගල රජ මහා විහාරය

තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කටියාව යාය 01, ග්‍රාම නිලධාරී වසමට මෙම විහාරස්ථානය අයත් වේ. මෙහි ඇති පැරණි දාගැබ් දෙක පුරාවිද්‍යා ස්මාරක වේ. මෙම ස්මාරක අංක: 1586 යටතේ 2009.01.23 වෙනි දින පුරා විද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

**රූපසටහන් අංක 14** **නවගල රජ මහා විහාරය**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 07. ශ්‍රී සුමනගිරි විහාරය

තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කටියාව යාය 07 ග්‍රාම නිලධාරී වසමට මෙම විහාරස්ථානය අයත් වේ. මෙහි ඇති කටාරම් කෙටූ ගල්ලෙන, කණු වලවල්, කාණු සහ නාගරූප සහිත ගල් තලාව, පැරණි පොකුණ යනාදිය පුරාවිද්‍යා අවශේෂයන් වේ. මේවා අංක: 1586 යටතේ 2009.01.23 වන දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත .

### 08 . වෙහෙරගොඩැල්ල පුරාණ විහාරය

තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුරුඳු වැව ග්‍රාම නිලධාරී වසමේ මෙය පිහිටා ඇත. මෙහි ඇති පැරණි දාගැබ, පැරණි ගොඩනැගිල්ල හා පොකුණු පුරාවිද්‍යා ස්මාරකයන් වේ. අංක 1486 යටතේ 2007.02.23 වන දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයන් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

**රූපසටහන් අංක 15** **වෙහෙරගොඩැල්ල පුරාණ විහාරය**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 09. කරගහවැව රජ මහා විහාරය

මෙම විහාරස්ථානය තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කරගහවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත. මෙහි ඇති පැරණි ගොඩනැගිලිවල නටඹුන් පුරාවිද්‍යා අවශේෂයන් වේ . මෙම ස්ථානයන් අංක: 1486 යටතේ 2007.02.23 දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත .

### 10. මලියදේවපුර තෙල්හිරියාව පුරාණ විහාරය .

තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙම විහාරස්ථානය පිහිටා ඇති අතර අංක 429 ගල්විහාර වැව ග්‍රාමනිලධාරී වසමට අයත් වේ. මෙහි ඇති පැරණි පියගැට පෙළ , පොකුණ හා නටබුන් පුරාවිද්‍යා ස්මාරකයන් වේ. මෙම ස්ථානය අංක: 1739 යටතේ 2011.12.30 දින ආරක්ෂිත පුරාවිද්‍යා ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

### 11. වෙහෙරගල රජමහා විහාරය

තඹුත්තේගම අධිරාණිගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මෙම රජමහා විහාරය පිහිටා ඇත. දුටුගැමුණු රජතුමාගේ කාලය තුළ ඉදි වූ විහාරයක් ලෙස මෙය ජනප්‍රවාදයේ කියවේ. එකල ඉදි වූ චෛත්‍යයක නටඹුන් අද ද එහි දක්නට ඇති අතර, එයට අමතරව ගල් කණු, සිරිපතුල් ගල්, පුරාණ සෙල්ලිපි හා ගරාවැටුණු චෛත්‍යය ආදිය ද දක්නට ඇත. මෙම විහාරස්ථානයේ විශේෂත්වය වන්නේ අක්කර 30 ක පමණ වපසරියකින් යුක්ත ගල්තලාවක් මත ඉදිකිරීම් කර තිබීමයි .

**රූපසටහන් අංක 16** **වෙහෙරගල රජමහා විහාරය**



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙනි - 2022

## 12. සීනුග්ගල දාගැබ් ගොඩැල්ල

මෙම දාගැබ් ගොඩැල්ල කුඹුරක් මධ්‍යයේ පිහිටා ඇති අතර, මේ සම්බන්ධව ඓතිහාසික හෝ සාහිත්‍යමය තොරතුරු සොයා ගැනීමට නොමැත .

**සිතියම් අංක 19 ආගමික, සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක ස්ථාන - 2020**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත උත්සව හා කලාවන්**

ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත උත්සව හා කලාවන් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී සමස්ත අනුරාධපුර යුගයේම ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කල යුතුය. ප්‍රදේශයට විශේෂිත වූ උත්සව හඳුනාගත නොහැකි අතර, වාර්ෂික කයීන පිංකම්, වෙසක් උත්සව, පොසොන් උත්සව යනාදිය දැකිය හැකිය. එසේ වුවද අනුරාධපුර යුගයට ආවේණික වූ ගෘහනිර්මාණ ශිල්පයන් හා කලාවන් හඳුනාගැනීමට හැකිය .

**ගෘහනිර්මාණ ශිල්පය**

අනුරාධපුර මුල් අවධියේ ක්‍රමික වාස්තු විද්‍යාත්මක නිර්මාණ ලක්ෂණයන් පෙරදැරි කරගත් දියුණු ගෘහනිර්මාණ කලාවක් මෙරට ව්‍යාප්තව පැවති බව සඳහන් වන අතර, ක්‍රි.ව.3 වන සියවසේ මහින්දාගමනයත් සමග එම නිර්මාණ ශෛලිය වඩාත් ඔප් නැංවුනු බව පැහැදිලි වේ. මෙලෙස වර්ධනය වූ ගෘහනිර්මාණ අතර ගල් ලෙන්, ස්ථූප, වාහල්කඩ, දොරටු, චේතියඝර, බෝධිඝර, ආසනඝර, උපෝසතාඝර, පංචාවාස, ප්‍රතිමාඝර, පධානඝර, හෙවත් පියන්ගල් දානශාලා සන්නිපාතශාලා, ජන්තාඝර හෙවත් උණු දිය ස්නාන පොකුණු, ආරෝග්‍යශාලා, රාජමාළිගා, විහාර, ප්‍රභූනිවාස, සාමාන්‍ය නිවාස, සුසානඝර යනාදී වාස්තුවිද්‍යාත්මක නිමැවුම් දක්නට ලැබේ .

ඒ අනුව, පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය සැලසුම් සහගත නගරයක් ලෙස සංවර්ධනය කිරීමෙන් අනතුරුව දෙවනපෑතිස් රජු කාලයේ සිදුවූ මහින්දාගමනයත් සමඟ ගෘහනිර්මාණ කලාවේ වර්ධනයක් සිදුව ඇති බව පැහැදිලි වේ. මෙම යුගයට අයත් ලෙන් තුල කටාරමට පහලින් ඇති ලෙන් ලිපි අනුව මෙරට මුල් වකවානුවේ වැඩ සිටි භික්ෂූන් වහන්සේලා උදෙසා පිළියෙල කල බවද පැහැදිලි වේ. මිනිස්වාසයට සුදුසු අයුරින් සකසා ගත් මෙම ලෙන් කලාව ලක්දිව උතුරු ප්‍රදේශය හැර සෙසු පලාත්වල ද විකාශය වී ඇති අයුරු අනාවරණය වී ඇත .

මීට අමතරව මෙරට බිහිවූ නිර්මාණ අතර විශේෂතම අංගය ලෙස ස්ථූපය හඳුන්වාදිය හැකිය. එය මෙරට වාස්තු විද්‍යාව ලොව සුපතල වීමටද හේතුවක් විය . ප්‍රධාන ස්ථූප සියල්ලක්ම වාගේ දක්නට ඇත්තේ අනුරාධපුර යුගය තුළදීය.

අනුරාධපුර මුල් යුගයේ මෙන්ම පශ්චාත් සමයේදී හඳුනාගත හැකි නිර්මාණයක් ලෙස උපෝසතාඝරය හඳුන්වාදිය හැකිය. දුටුගැමුණු රජු විසින් ඉදිකරන ලද ලෝවාමහාපාය, රත්නප්‍රාසාදය මෙයට උදාහරණයන්ය.

ප්‍රධානඝර හෙවත් පියන්ගල අනුරාධපුර පසු යුගයට අයත් ගොඩනැගිලි විශේෂයකි. මෙම ආරාම විශේෂය භාවනානුයෝගී භික්ෂූන් උදෙසා නගරයේ ඇතුලත නිසල පරිසරයක නිර්මාණය කර ඇත. සෑම නිර්මාණයක්ම එක ස්වරූපයෙන් යුක්ත අතර, මෙම නිර්මාණ තුළ ස්වාභාවික ගල් පුවරු මත

කල නිමැවුම්, පොකුණු චංකමන දක්නට ඇත. මෙහි ඇති විශේෂත්වය වනුයේ කැටයම් වලින් තොර නිර්මාණ තිබීමයි. .

භෝජනශාලා හෙවත් දානශාලා නම් ගොඩනැගිලි විශේෂයක් අනුරාධපුර යුගයේදී භික්ෂූන් වහන්සේලා උදෙසා නිර්මාණය කර තිබුණු අතර, භික්ෂූන් වහන්සේලාට රැස්වීමට හැකියාව ඇති සන්නිපාතශාලා ද විශේෂ වේ.

භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය උණුසුම් ජලය හා හිරුඑළිය ලබාගත හැකි ගොඩනැගිලි විශේෂයක් ලෙස ජන්ථාඝර හැඳින්විය හැකිය. අභයගිරිය, රිටිගල හා අරන්කැලේ මේ සඳහා නිදර්ශනයන්ය .

**අනුරාධපුර යුගයේ කලාවන්**

ඇතුළුනුවර නටඹුන් වූ රාජමාළිගා, සීගිරි කොටු පවුර සහිත මාළිගා සංකීර්ණ, ප්‍රභූ නිවාස හා සාමාන්‍ය ජනයා සඳහා කල ගෘහනිර්මාණයන් ද ඇතුළු ගෘහනිර්මාණ කලාවක් අනුරාධපුර යුගයේ ගොඩනැගී තිබූ බවට සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාක්ෂි ඔස්සේ හඳුනාගත හැකිය .

අනුරාධපුර යුගයේ මිනිසුන්ගේ ආධ්‍යාත්මය පිළිබිඹු කරන චිත්‍ර, මූර්ති, කැටයම් මගින් ජනතාවගේ සංයමය, සරලත්වය, අව්‍යාජත්වය පෙන්වන අතර, පසුකාලීනව එබඳු නිර්මාණයන්ට වඩා උසස් තත්ත්වයක නිර්මාණ බිහි වූ බව විචාරකයන් පවසයි. වංශ කතාවන්හි මෙන්ම පාලි අටුවා වල ද චිත්‍ර ශිල්පීන් හා චිත්‍ර පිළිබඳ සටහන් දැකිය හැකිය. මේ අතර සීගිරි බිතුසිතුවම්, හිඳගල සිතුවම් සම්ප්‍රදාය, පුල්ලිගොඩ සිතුවම් හා කරඹගල සිතුවම් නිදසුන් වේ.

බුදුපිළිමය ද අනුරාධපුර යුගයේ විශිෂ්ටතම මූර්තියක් ලෙස හැඳින්විය හැකිය. මහා කරුණාවත් ප්‍රඥාවත් පිළිබිඹු වන අයුරින් ඒවා නිරූපණය කිරීමට මූර්ති ශිල්පියා සමත්ව ඇත.හිඳි පිළිම අනුරාධපුර යුගයේ බහුල ලෙස ව්‍යාප්ත වූ පිළිම කලාවක් ලෙස හැඳින්විය හැකිය. මීට අමතරව බෝසත් පිළිම කලාව, සඳකඩපහන, කොරවක්ගල, වාමන රූප, දෙව් මිනිස් මූර්ති කලාව ද අනුරාධපුර යුගයේ කලාවන් අතර ඇති අනර්ඝ නිමැවුම් ලෙස හැඳින්විය හැකිය .

**කසළ කළමනාකරණය**

සමස්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැලිකසළ ජනනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ සාපේක්ෂව ප්‍රදේශය තුළ එතරම් කැලිකසළ ප්‍රමාණයක් ජනනය නොවන බවත්, ජනනය වන කැලිකසළ ප්‍රදේශයට ගැටළුවක් නොවන ආකාරයට කළමනාකරණය කරගැනීමට හැකි බවත්ය. ඊට හේතුව වන්නේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන නගර 03 හැරුණු විට අනෙකුත් ප්‍රදේශයන් තුළ ඉතා විශාල ඉඩකඩ ප්‍රමාණයක් තිබීමයි. මෙම හේතුව නිසා එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව

ඔවුන්ගේ නිවෙස් තුළ ජනනය වන කැලිකසළ ප්‍රමාණය එම භූමිය තුළම මනා ලෙස කළමනාකරණය කර ගනී.

**රූපසටහන් අංක 17 කසළ කළමනාකරණය**



මූලාශ්‍රය:නාගරික සංවර්ධන අධිකාරිය - 2022

සමස්තයක් ලෙස ගත් විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිනකට එකතු වන කැලිකසළ ප්‍රමාණය ටොන් 05ක් පමණ වන අතර ඉන් වැඩිපුර ප්‍රමාණයක් එකතු වනු ලබන්නේ තඹුත්තේගම ප්‍රදේශයෙන් ය. එය ආසන්න වශයෙන් ටොන් 03 පමණ වේ. දිරන කසළ සේම නොදිරන කසළ ද දිනපතා මෙම ප්‍රදේශය තුළ එකතු කරනු ලබන අතර සමස්ත ප්‍රදේශයෙන්ම එකතු වන නොදිරන කසළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 500 ක් පමණ වේ. එහිදී වැඩිපුර ප්‍රමාණයක් එකතු වන්නේ තඹුත්තේගම ප්‍රදේශයෙන් වන අතර, එය දිනකට කිලෝ ග්‍රෑම් 250 ක් පමණ වේ. එප්පාවල හා තලාව ප්‍රදේශයන් දෙක තුළින්ම එකතුවන ප්‍රමාණය දිනකට කිලෝ ග්‍රෑම් 250ක් පමණ වේ.

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු වන දෛනික කසළ වලට අමතරව ආර්ථික මධ්‍යස්ථානයේ දිනකට එකතුවන කැලිකසළ ප්‍රමාණය ටොන් 0.5 ක් පමණ වේ. මේ හේතුව නිසා ඔරුගලයාය කසළ අංගනයට දෛනිකව කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ප්‍රවාහනය කරනු ලබන දිරන කසළ ප්‍රමාණය ටොන් 5.5ක් පමණ වෙයි. මේ ආකාරයට කසළ එකතු කිරීම සඳහා ප්‍රධාන නගර තුන ආවරණය වන පරිදි ට්‍රැක්ටර් රථ 03 ක් ගමන් කරනු ලබන අතර, ආර්ථික මධ්‍යස්ථානයේ කසළ එකතු කිරීම සඳහා ද වෙනම ට්‍රැක්ටර් රථයක් ගමන් කරනු ලබයි. මෙසේ එකතු කරනු ලබන කසළ යොදාගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර, සමස්ත කොම්පෝස්ට් ප්‍රමාණය සමස්ත කැලිකසළ ප්‍රමාණයෙන් 25% ක පමණ අගයක් ගනී. මේ ආකාරයට නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් මගින් මසකට ලැබෙන ආදායම ලක්ෂ 2.5 පමණ වේ.

මෙම ක්‍රියාවලිය නිසි ආකාරයෙන් පවත්වා ගෙන යෑමට යම් යම් බාධා පවතින අතර, ප්‍රධාන වශයෙන්ම කසළ අංගනයට වහලයක් (ආවරණයක්) නොමැති වීමෙන් උපරිම ධාරිතාවෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව මඟහැරී යයි. එබැවින් මෙම කසළ අංගනයට සුදුසු ආවරණයක් ලබා දීම මගින් එහි උපරිම ඵල නෙලා ගැනීමේ හැකියාවක් පවතී.

තවද, කැලිකසළ ආහාරයට ගැනීමට දිනපතා පැමිණෙන වන අලින් හේතුවෙන් කාර්යක්ෂමව කසළ කළමනාකරණය කිරීමට ඇති හැකියාව මඟහැරී යයි. එබැවින් මෙම ප්‍රදේශය ආවරණය වන පරිදි අලි වැටක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතා කිරීම මගින් වන අලින්ගේ පැමිණීම අවම කර ගත හැකි වීමෙන් කසළ කළමනාකරණ ක්‍රියාවලිය බාධාවකින් තොරව ක්‍රමවත්ව සිදුකල හැකි වේ.

# තුන්වන පරිච්ඡේදය

# සංවර්ධන සැලසුමේ අවශ්‍යතාව

## 3.1. හැඳින්වීම

මෙම පරිච්ඡේදය මගින් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට සංවර්ධන සැලැස්මක ඇති අවශ්‍යතාවය විග්‍රහ කරනු ලබයි. මෙහිදී මූළික ලෙසම මෙම සංවර්ධන සැලැස්ම මගින් ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවයන් මනා ලෙස ප්‍රයෝජනයට ගැනීමටත්, ප්‍රදේශය තුල පවතින සංවර්ධනය හා බැඳුණු ගැටළු අවම කිරීමටත් අවශ්‍ය ක්‍රියා කලාපයන් විග්‍රහ කරනු ලබයි.

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය පාදක කර ගනිමින් ජනාවාසීකරණය ආරම්භ වූ මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හඳුනාගත හැකි ගැටළු හා සංවර්ධන විභවතාවයන් පවතී. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් 2050 වර්ෂය දක්වා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්මට අනුව අනුරාධපුර නාගරික ප්‍රදේශය අධි නාගරික ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම අධි නාගරික ප්‍රදේශය ආසන්නයේ පිහිටා ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වැඩි අවධානයක් ජාතික භෞතික සැලැස්මේදී ලබාදී ඇත. අඩු නාගරීකරණ වේගයක් සහිතව සංවර්ධනය විය යුතු ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ගෙන ඇති මෙම ප්‍රදේශය සඳහා අවශ්‍ය කරනු ලබන යටිතල පහසුකම් වල ඝනත්වය හා ප්‍රමාණය අනුව ජාතික භෞතික සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබයි.

තලාව ප්‍රාදේශීය සභාව, පොස්පේට් ආයතනය, විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වන ජීවී දෙපාර්තමේන්තුව, වෙළඳ සංගම්, ආරක්ෂක අංශ වැනි පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් 2020. 01. 21 දින පවත්වනු ලැබූ පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී ප්‍රකාශ කරන ලද අදහස්, යෝජනා හා ගැටළු සැලකිල්ලට ගනිමින්ද සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් කරනු ලැබූ විද්‍යානුකූල විශ්ලේෂණයන් පාදක කර ගනිමින්ද, ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවයන් හා ගැටළු අංශ 03ක් යටතේ හඳුනා ගන්නා ලදී.

01. ආර්ථික සංවර්ධනය.

02. පාරිසරික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම.

03. ස්වාභාවික භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## 3.2 හඳුනාගත් විභවතා

ප්‍රදේශයේ පවතින විභවතා දෙස අවධානය යොමු කිරීමේදී ප්‍රදේශය සතුව විභවතාවයන් රැසක් ඇති බව හා ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ අවධානයක් ලබා ගත හැකි පරිදි එම විභවතා පවතින බව අවබෝධ කර ගත හැකිය. එබැවින් මෙම ප්‍රදේශය සතු විභවතා මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමටත්, සංවර්ධන ප්‍රවනතාවයන් වර්ධනය කර ගැනීමටත් හැකි වේ. ඒ අනුව, මෙම විභවතා මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශය ඉහළ විභවතාවයකින් සංවර්ධනය කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කරනු ලබයි. පහතින් දක්වා ඇත්තේ මෙම ප්‍රදේශය සතු ප්‍රධානතම සංවර්ධන විභවතාවයන්ය.

1 කෘෂි කර්මාන්තයට උචිත පාරිසරික තත්ත්වයන් පැවතීම

2 එප්පාවල පොස්පේට් නිධිය

3 විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ සහ අවට පැවතීම.


4 ප්‍රදේශය ආවරණය වන පරිදි පිහිටි ප්‍රවාහන පද්ධතිය

### 3.2.1 කෘෂි කර්මාන්තයට උචිත පාරිසරික තත්ත්වයන් පැවතීම

#### *3.2.1.1 සමස්ත භූමි පරිහරණ රටාවෙන් 62% කට ආසන්න ප්‍රමාණයක් කෘෂි කටයුතු උදෙසා වෙන්ව තිබීම.*


තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සමස්තයක් ලෙස ගත් විට කෘෂි ආර්ථිකයකින් ගොඩනැඟුණු ප්‍රදේශයකි. සමස්ත භූමි පරිහරණ රටාවෙන් 62% ක් තරම් ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු ඉටු කර ගැනීමට හැකි පරිදි වෙන්වී ඇති අතර, 41% ක් එනම් හෙක්. 12 954 තරම් ප්‍රමාණයක් වී ගොවිතැන් කටයුතු සඳහා වෙන් වී ඇත. ගොවිතැන් කටයුතු වලට අවශ්‍ය ජල සැපයුම සඳහා වැව් හා ඇළ වේලි රාශියක් ප්‍රදේශය තුල පිහිටා ඇති අතර, මෙම ඇළ වේලි වල ප්‍රමාණය සමස්ත භූමි පරිහරණ රටාවෙන් 7% ක් එනම් හෙක්ටයාර 2 291 ක් පමණ වේ. තවද, මිශ්‍ර කෘෂිකර්මාන්තය සඳහා 14% ක භූමි ප්‍රමාණයක්, එනම්, හෙක්ටයාර 4 582 ක් තරම් ප්‍රමාණයක් වෙන්ව ඇත. මේ අනුව බලන විට ප්‍රදේශය පුරා පැතිර පවතින කෘෂි සම්පත් වලින් උපරිම ලෙස ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව සකස් වී තිබීම ප්‍රදේශය තුළ පවතින එක් ප්‍රබල විභවතාවයක් ලෙස හඳුන්වා දිය හැකිය.

**රූපසටහන් අංක 18 මිශ්‍ර කෘෂිකාර්මික ප්‍රදේශ**





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 19 කුඹුරු ජලජ ප්‍රදේශ**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 20 පාර්ශවකරුවන් ප්‍රකාශ කරන අදහස්**





මූලාශ්‍රය:නාගරික සංවර්ධන අධිකාරිය - 2022

ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ අදහස වූයේ කෘෂි ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ එම ප්‍රදේශ මනා අයුරින් ආර්ථිකයට දායක කර ගත යුතු බවය. රූපසටහන් අංක 21න් දක්වා ඇත්තේ ඔවුන් ප්‍රකාශ කරන ලද අදහස් විශ්ලේෂණය කිරීමෙන් ලද ප්‍රතිඵලයන් වේ.

### *3.2.1.2 කෘෂි කර්මාන්තය සඳහා සුදුසු භූ විෂමතාවයක් පැවතීම*

**සිතියම් අංක 20 භූමියේ උන්නතාංශය**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ ළඟා කර ගැනීම උදෙසා ප්‍රදේශය තුළ පවතින තවත් එක් ප්‍රබල ශක්තියකි, භූ විෂමතාවය. මෙහිදී ප්‍රදේශය තුළ වැව් 130 ට අධික ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර, මෙය ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය නගා සිටුවීමට මහඟු පිටිවහලක් ලබාදෙනු ලබයි.


භූමියේ උන්නතාංශය පිළිබඳ කරනු ලැබූ විශ්ලේෂණයට අනුව උතුරු සීමාව තුළ භූමියේ උසෙහි වැඩි අගයක් පෙන්නුම් කරනු ලබන අතර, ක්‍රමයෙන් ප්‍රදේශයේ දකුණු දෙසට වන්නට බෑවුම් සහිත ස්වාභාවයක් ගනු ලබයි.

මෙහිදී විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල උන්නතාංශයේ ඉතා විශාල වෙනස්වීමක් දැකිය නොහැකි අතර සමස්තයක් ලෙස තැනිතලා භූමි ප්‍රදේශයක් දැකගත හැකිය. භූමි ප්‍රමාණයෙන් 60% කට අධික ප්‍රදේශයක උන්නතාංශය $97^0$ - $110^0$ අතර ව්‍යාප්ත වී ඇති බව විශ්ලේෂණ මගින් තහවුරු කර ගත හැකිය.

මේ අනුව, ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු ඉතා පහසුවෙන් සිදු කර ගැනීමටත් මනා ලෙස ජල කළමනාකරණය සිදු කර ගැනීමටත් හැකිවන පරිදි ප්‍රදේශයේ උස මට්ටම් ව්‍යාප්තව පවතින බව පැහැදිලි වේ. එයද කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රදේශය සතු ඉතා හොඳ විභවතාවයක් බව තහවුරු කරගත හැකිය.

### *3.2.1.3 ප්‍රදේශයම ආවරණය වන පරිදි ජල බැස්ම සහිත ප්‍රදේශ පැවතීම*

**සිතියම් අංක 21 ජල බැස්ම සහිත ප්‍රදේශ**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

ප්‍රදේශයේ පවතින කෘෂි සම්පත් වලින් ප්‍රශස්ථ මට්ටමේ ප්‍රයෝජනයක් ලබාගැනීමට ජල බැස්ම සහිත ප්‍රදේශ පැවතීම බලපානු ලබයි. සමස්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම ඊට පරිබාහිර ප්‍රදේශය ද ආවරණය වන පරිදි සමෝච්ඡ රේඛා යොදා ගනිමින් සිදු කරනු ලැබූ විශ්ලේෂණය මගින් ඒ බව මනාව පැහැදිලි කර ගැනීමට හැකි විය.

සිතියම් අංක 21 අනුව ඉතා හොඳින් ජලය බැස යන ප්‍රදේශ වැඩි වශයෙන් පිහිටා ඇති ආකාරය සහ ජල බැස්ම අඩු උස් ප්‍රදේශ වල පිහිටීම අවම අගයක් ගන්නා බව පැහැදිලි වේ.


ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පරිබාහිරින් ජල බැස්ම සහිත එක් ප්‍රදේශයක් පවතී. එමඟින් ප්‍රදේශය පුරා ජලය බෙදා හැරීමට ඇති හැකියාව තීව්‍ර වන අතර, ප්‍රදේශයේ ජල කළමනාකරණය ද, වගාවන් සඳහා ජලය ලබා ගැනීම ද, මනා ලෙස සිදුකර ගැනීමේ හැකියාව පවතී. මෙම හැකියාව ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතින බව කෘෂි බිම් ව්‍යාප්තිය පිළිබඳ කරනු ලැබූ විශ්ලේෂණයේ දී තහවුරු විය.

තලාව සංවර්ධන සැලැස්ම මගින් මෙම විභවතාවයන් මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් සහ කළමනාකරණය කිරීමෙන් ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, එමගින් ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයන්ට ඉතා පහසුවෙන් ඔවුන්ගේ කටයුතු සිදු කර ගැනීමටත් අවශ්‍ය කරනු ලබන ඉඩකඩ සකසා දීමට අවශ්‍ය කරනු ලබන ක්‍රමවේදය සකස් කිරීමට බලාපොරොත්තු වේ.

*3.2.1.4 ප්‍රාදේශීය සභා බලප්‍රදේශය අවටින් කෘෂිකර්මාන්තය කරනු ලබන ප්‍රදේශ වැඩි වශයෙන් පිහිටීම*

සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ලඟා වීම සඳහා පවතින ප්‍රධානතම අවස්ථාවක් ලෙස මෙම පිහිටීමේ ස්වභාවය ද පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම රාජාංගනය, නොච්චියාගම, නාච්චාදුව, නැගෙනහිර නුවරගම් පළාත වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වැඩි වශයෙන් කෘෂි බිම් පවතින අතර, වැඩි කෘෂි අස්වනු ප්‍රමාණයක් ද ලැබේ. මෙම කෘෂි නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය කරා රැගෙන එන අතර, එය ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාවලිය වර්ධනය කිරීමට සෘජු ලෙසම බලපානු ලබයි. එය ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා පවතින සුවිශේෂී ලක්ෂණයක් වන අතර, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අවට ප්‍රදේශ වල කෘෂි බිම් වල ප්‍රමාණය ප්‍රස්ථාර අංක 8 න් දක්වා ඇත.

**ප්‍රස්ථාර 8 වගා කරන ලද කෘෂි බිම්වල ප්‍රමාණයන්**





මූලාශ්‍රය : දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන වාර්තාව - 2020

*3.2.1.5 ප්‍රදේශයම ආවරණය වන පරිදි ජලය එකතු වන ප්‍රදේශ පැවතීම*

මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි ජලය එකතු වන ප්‍රදේශ තිබීම ප්‍රදේශය සතු තවත් එක් වැදගත් ලක්ෂණයකි. ප්‍රදේශයේ ආර්ථිකය බොහෝ විට රඳා පවතින්නේ කෘෂිකර්මාන්තය මූලික කොටගෙන වන අතර, කලා වැවේ සිට රාජාංගනය ජලාශය දක්වා ජලය රැගෙන යනු ලබන ජයගහ, ප්‍රදේශය හරහා ගමන් කරනු ලබයි. සලකා බලන ප්‍රදේශය ආවරණය වන පරිදි යෝධ ඇලේ පෝෂක ප්‍රදේශය පැතිර පැවතීම ද , ප්‍රදේශය තුළ හා පරිබාහිර ප්‍රදේශයේ පවතින කුඩා වැව් ආවරණය වන පරිදි පිහිටා ඇති ජලය බැස යන වාරි පද්ධතියේ පෝෂක ප්‍රදේශයන් ද වෙනත් ජල පෝෂක ප්‍රදේශද කෘෂිකර්මාන්තය පාදක කර ගත් ආර්ථිකයකට හේතු සාධක වී ඇත.

**සිතියම් අංක 22 වැඩි වශයෙන් ජලය එක්රැස් වන ප්‍රදේශ - 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

මෙම සංවර්ධන විභවතාවය මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු ඉතා පහසුවෙන් සිදුකර ගැනීමේ හැකියාව පවතී. එය ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය වර්ධනය කිරීමටත්, ආර්ථිකය ශක්තිමත් කිරීමටත් සෘජුව බලපානු ලබන අංගයක් ලෙස හඳුන්වා දිය හැකිය. විශේෂයෙන්ම ජලය එකතු වන ප්‍රදේශ හඳුනා ගැනීමට හැකි වන්නේ ප්‍රදේශයේ උන්නතාංශය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කිරීම මගිනි. එහිදී උන්නතාංශය සහ භූගෝලීය පිහිටීම හේතුවෙන් මේ ආකාරයට විශාල වශයෙන් ජලය එකතු වන ප්‍රදේශයන් හඳුනාගත හැකිය. නමුත් ජලය එකතු වන සහ ජලය ගමන් කරන ඇල මාර්ග සහ ස්ථාන තිබුණද , ඇතැම් විට එම ජල මාර්ග අබලන් තත්ත්වයේ පැවතීම හා නිසි කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් නිසි පරිදි ක්‍රියාත්මක නොවේ. ජලය නොමැතිවීම හේතුවෙන් ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු අඩාල වීමත්, ප්‍රදේශයේ ආර්ථිකයට එමඟින් හානි පැමිණීමත් සිදුවන බව අවබෝධ කරගත හැකිය.


*3.2.1.6 කෘෂි කර්මාන්තය සඳහා වඩාත් උචිත පාංශු ස්ථරයන් පැවතීම*

රතු දුඹුරු පසෙහි වැලි ලෝම සිට සැහැල්ලු මැටි දක්වා මතුපිට පස් ඇත. මැටි යටි පසට උඩින් ඇති ලෝම පසක් ලෙස මෙය හඳුන්වා දිය හැක. මෙය සැහැල්ලු (රළු) වයනය සහිත මතුපිට පස් සෙන්ටිමීටර 10 ත් 40 ත් අතර ඝනකමකින් යුක්ත වේ. රතු සිට අළු දුඹුරු දක්වා වර්ණය වෙනස් වන අතර, මෙම පාංශු ස්ථරයන් වියළීමේදී ඉරිතැලීම් දක්නට ලැබේ.

සමස්තයක් ලෙස ගත් කල ප්‍රදේශය පුරාම රතු දුඹුරු පස් ව්‍යාප්තව පවතින අතර, වගා කටයුතු සඳහා මහඟු ප්‍රයෝජනයක් මෙම පස මඟින් ලබා ගැනීමේ හැකියාව පවතී. මෙහිදී විශේෂයෙන්ම, වී වගාව හා අනෙකුත් භෝග වගාවන් ඉතා පහසුවෙන් සිදුකර ගැනීමේ හැකියාව පවතින අතර, පසෙහි ජලය ගලායෑමේ ස්වභාවය කෘෂිකර්මාන්තයට සුදුසු ආකාරයෙන් සිදු වේ. පසට අවශ්‍ය කරනු ලබන ජලය අවශෝෂණය කරනු ලබන්නේ ඉතා සෙමින්ය. මතුපිට පස් තට්ටුව දැඩි ස්වභාවයක් ගනු ලබන අතර නිසියාකාරයෙන් පස් පෙරලීම සහ පෝෂණ ද්‍රව්‍ය එකතු කිරීම මඟින් පසේ පෝෂණ ගුණය වැඩි කර ගැනීමෙන් වගා කටයුතු ඉතා සාර්ථක ලෙස සිදුකර ගැනීමේ හැකියාව පවතී.

එප්පාවල පොස්පේට් නිධියේ ව්‍යාප්තිය එප්පාවල ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් පවතින අතර, වගා කටයුතු සාර්ථක කර ගැනීම සඳහා විභවතාවයක් ලෙස පොස්පේට් යොදා ගත හැකිය. ප්‍රදේශය පුරා පැතිර පවතින පසෙහි පොස්පේට් අඩංගු වීමත් එමඟින් භෝග වගාවන් සඳහා අවශ්‍ය කරනු ලබන පෝෂණය සහ සංඝටක නිසි ආකාරයෙන් එම පාංශු ස්ථරයන් තුළ අඩංගු වීමත් ඊට හේතු සාධක වේ.

**රූපසටහන් අංක 21 ශ්‍රී ලංකාවේ පාංශු ස්ථරවල පිහිටීම**



එබැවින් මෙම විභවතාවය මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු නිසි ආකාරයෙන් පවත්වා ගැනීමේ හැකියාවක් ඇති අතර, පාංශු ස්ථරය විශ්ලේෂණය කිරීම මගින් ඒ බව අවබෝධ කරගත හැකිය.

මූලාශ්‍රය:-https://nsdi.gov.lk/ thematic–maps

### 3.2.2 එප්පාවල පොස්පේට් නිධිය

වර්ෂ 1971.04.04 දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් එප්පාවල පොස්පේට් නිධිය සොයා ගෙන ඇති බව වාර්තා වේ. මෙය ලෝකයේ පිහිටි පොස්පේට් නිධි අතරින් ඉතාමත් ඉහළ මට්ටමේ ප්‍රමිතියකින් යුත් පොස්පේට් නිධියක් ලෙස ලෝක ප්‍රසිද්ධියට පත්ව ඇත. එය වඩාත් තහවුරු කරන එක් සාධකයක් වන්නේ ලොව පොස්පේට් නිධි 414 අතරින් කැඩ්මියම් ප්‍රතිශතය අවම පොස්පේට් නිධි අතර දහවන ස්ථානය ගන්නා බැවිනි. මෙය ශ්‍රී ලාංකික ගොවි ජනතාව වැඩි වශයෙන් ගොදුරු වන වකුගඩු රෝගය අවම කර ගැනීම සඳහා එක් පිළියමක් ලෙස භාවිතා කළ හැකිය. ඊට හේතුව වන්නේ මෙම පොස්පේට් භාවිතා කර වගා කටයුතු කිරීම මගින් වකුගඩු රෝගය සෑදීමට ඇති හැකියාව ඉතාමත් අවම වීම ය. වර්තමානය වන විට චීන පොස්පේට් භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන පොහොර ලංකාවට ආනයනය කරනු ලබන අතර, මෙම චීන පොස්පේට් වල ඉතා ඉහළ කැඩ්මියම් ප්‍රතිශතයක් අඩංගු වේ. එමෙන්ම එය වකුගඩු රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි ද සෘජු ලෙසම බලපානු ලබන බව විවිධ පර්යේෂණ මගින් සනාථ කර ඇත. නමුත් ශ්‍රී ලංකාවේ පොස්පේට් තුළ ඉතා අවම කැඩ්මියම් ප්‍රතිශතයක් එනම් 0.0004 පැවතීම හේතුවෙන් එය වකුගඩු රෝගය ඇතිවීමේ අවදානම ඉතාම අවම කරන බව ශ්‍රී ලංකා පොස්පේට් ආයතනය සඳහන් කරනු ලබයි.

සමස්තයක් ලෙස ගත් විට වසරකට ලෝක පොස්පේට් භාවිතය මිලියන දහදාහක් පමණ වන බව සමීක්ෂණ වාර්තා මගින් පෙන්වා ඇත. එප්පාවල පොස්පේට් නිධිය සතු පොස්පේට් ප්‍රමාණය මෙට්‍රික්


ටොන් මිලියන හැටක් පමණ වන බව ගණනය කර ඇත. නමුත් වර්ෂයකට පොස්පේට් ලබා ගනු ලබන්නේ මෙට්‍රික් ටොන් 50,000 - 60,000 අතර ප්‍රමාණයකි. පොස්පේට් නිධිය සොයාගත් දින සිට වර්තමානය දක්වා භාවිතයට ගෙන ඇති පොස්පේට් ප්‍රමාණය මිලියන තුනක් පමණ වන බව ද ගණනය කර ඇත. මේ ආකාරයෙන් පොස්පේට් භාවිතා කරනු ලැබුවහොත් වසර පන්සීයකට අධික කාලයක් සඳහා මෙම පොස්පේට් ප්‍රමාණවත් වේ. නමුත් පොස්පේට් නිධියෙන් නිසි ප්‍රයෝජනයක් නොලැබෙන බව පොස්පේට් ආයතනය සඳහන් කරයි. ඊට හේතුව වන්නේ නවීන ලෝකය පොස්පේට් වෙනුවට වෙනත් ඛනිජ ද්‍රව්‍ය හෝ වෙනත් ආදේශකයන් නිෂ්පාදනය කිරීමට ඇති සම්භාවිතාව වැඩි විය හැකි බැවිනි.

ලෝකයේ පවතින ප්‍රධාන පොස්පේට් වර්ග දෙක වන අවසාදිත හා ආග්නේය පොස්පේට් අතරින් එප්පාවල පොස්පේට් නිධිය ආග්නේය පාෂාණ වලින් නිර්මාණය වී ඇත. මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ද්‍රවශීලි බව ඉතා අඩු වීමයි. එනම් මෙම පොස්පේට් තේ, පොල්, රබර් වැනි දීර්ඝකාලීන බෝග සඳහා භාවිතා කළ හැකි වුවද, වී වැනි කෙටි කාලීන බෝග සඳහා ඍජුව භාවිතා කිරීමට අපහසු වේ. එප්පාවල රොක් පොස්පේට් යනු පොස්පරස් පෙන්ටොක්සයිඩ් (P2 P5) ප්‍රමාණය 28% සිට 42% දක්වා පොස්පරස් අඩංගු සම්පතක් වන අතර, එය ආනයනික ට්‍රිපල් පොස්පේට් (TSP) සඳහා ඉතා හොඳ විකල්පයක් බව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය විසින් කරන ලද පර්යේෂණයකදී තහවුරු කරගෙන ඇත. තවද, ආම්ලික තත්ත්වයකින් යුත් පසෙහි වී වගා කිරීමේදී මෙම එප්පාවල රොක් පොස්පේට් භාවිතා කළ හැකි බවත්, එමගින් වැඩි ඵලදාවක් ලබාගත හැකි බවත්, පර්යේෂණ මගින් සනාථ කර ඇත.

ශ්‍රී ලංකාවේ තේ, පොල් හා රබර් වැනි දීර්ඝකාලීන බෝග සඳහා වසරකට මෙට්‍රික් ටොන් 50,000 - 60,000 අතර ප්‍රමාණයක් භාවිතා කරනු ලබයි. විශේෂයෙන්ම අමුද්‍රව්‍ය වශයෙන් පොස්පේට් භාවිතා කරනු ලබන බැවින්, ලංකාවට ඉතා අඩු වෙළෙඳ පොළක් නිර්මාණය වී ඇත. අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් මගින් පොස්පේට් වල තත්ත්වය වැඩිදියුණු කල හැකි අතර, එමගින් විවිධ අතුරු නිෂ්පාදන ද සිදු කල හැකිය. විශේෂයෙන් වී වගාවට භාවිතා කළ හැකි කැට පොහොර, මඩ පොහොර, මිශ්‍ර පොහොර වැනි පොහොර වර්ග හා තවත් පොහොර වර්ග ද නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇත.

එප්පාවල ප්‍රදේශය තුළ පොස්පේට් නිධි 06ක පමණ ප්‍රමාණයක් ඇති අතර, එප්පාවල පොස්පේට් නිධිය භාවිතා කරමින් ලබාගන්නා ලද ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහළ අගයක් ගන්නා බව 2013 - 2018 අතර කාලසීමාව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

**ප්‍රස්ථාර 9 එප්පාවල පොස්පේට් නිධියේ ආදායම**





මූලාශ්‍රය : පොස්පේට් ආයතනය (මූල්‍ය වාර්තාව-2022)

2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ යල - මහ දෙකන්නය තුල වගා කරන ලද කුඹුරු ප්‍රමාණය මිලියන 1.3 ක් බව ජාතික පොහොර ලේකම් කාර්යාලය වාර්තා කරන අතර වෙනත් බෝග සඳහා හෙක්ටයාර 97 120 ක් යොදාගෙන ඇති බවත් ආනයනය කරනු ලබන රසායනික පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1 260 053 ක් බවත්, මේ සඳහා වැය වන විදේශ විනිමය ප්‍රමාණය රුපියල් බිලියන 56.0 කට වඩා වැඩි බවත්, ජාතික පොහොර ලේකම් කාර්යාලය අනාවරණය කර ඇත.


මේ අනුව පෙනී යන්නේ මෙම පොස්පේට් නිධියෙන් නිසි ප්‍රයෝජන ලබා නොගැනීම නිසා අති විශාල මුදල් ප්‍රමාණයක් ජාතියට අහිමි වන බවයි. එබැවින් මෙම සංවර්ධන සැලැස්ම මගින් එකී අයහපත් තත්ත්වයන් මඟහරවා ගනිමින් ප්‍රදේශය සංවර්ධනය කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කරනු ලබයි.

**ප්‍රස්ථාර 10 පොහොර භාවිතය (මෙ.ටො)**





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**ප්‍රස්ථාර 11 පොහොර සහනාධාර සඳහා වෙන් කළ මුදල රාජ්‍ය වියදමෙන් ප්‍රතිශතයක් ලෙස**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**ප්‍රස්ථාර 12 පොහොර සහනාධාර සඳහා වෙන් කළ මුදල (රු. බි)**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

එපමණක්ද නොව, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර ආනයනය කිරීමට වැය කරන මුදල් ප්‍රමාණය ඉතිරි කරගත හැකි අතර, විදේශ විනිමය උපයා ගැනීමේ විශේෂ හැකියාවක්ද පවතී. ඊට හොඳම අවස්ථාවක් ලෙස දැක්විය හැක්කේ ඉන්දියාවයි. ඉන්දියාව ගෝලීය ද්‍රව පොස්පරස් නිෂ්පාදනයෙන් 54.04% ආනයනය කරනු ලබන අතර, එය ඔවුන්ගේ අවශ්‍යතාවයෙන් 4% තරම් ඉතා අඩු ප්‍රතිශතයකි. මෙම විභවතාවය මනා ලෙස භාවිතයට ගනිමින් සහ ශ්‍රී ලාංකීය පොස්පේට් වල ඉහළ ගුණාත්මක භාවය ප්‍රයෝජනයට ගනිමින් ඉතා ඉහළ ගුණාත්මක බවකින් යුත් පොහොර නිෂ්පාදනය කළ හැකි අතර, වැඩි විදේශ විනිමයක් මෙරටට ගෙන ඒමට හැකියාවද උදා වේ.

එමෙන්ම, ශ්‍රී ලංකාවට ආවේණික තැඹිලි ලෝකයේ ඉතාමත් ඉහළ ගනයේ වටිනාකමක් ඇති පානයක් ලෙස පර්යේෂණයන් මගින් තහවුරු කර ගෙන ඇත. පොටෑසියම්, සෝඩියම් ක්ලෝරයිඩ්, මැග්නීසියම්, ස්වාභාවික පැණි රස, මැංගනීස්, අයඩින්, සල්ෆර්, සින්ක්, සෙලේනියම්, කැල්සියම්, පොස්පරස්, යකඩ හා විටමින් සී, බී හා ඇමයිනෝ අම්ල, කාබනික අම්ල ආදී සංඝටක තැඹිලි වතුරෙහි අඩංගු වන බැවින් හෘදය වස්තුවේ ඇති වන අභිතකර කොලොස්ටරෝල් ඉවත් කර ඉතා හොඳ ක්‍රියාකාරීත්වයක් සඳහා උපකාරී වන බව පර්යේෂණ මගින් සොයා ගෙන ඇත. තවද තැඹිලි වතුරෙහි පවතින අධික ඛණිජ ලවණ නිසා හෘදයාබාධ සහ අධි රුධිර පීඩනය වැලැක්වීමට ඉතා සුදුසු පානයක් ලෙසද හඳුනාගෙන ඇත.

වකුගඩු හා මූත්‍රාශ්‍රයේ පවතින රොඩු ඉවත් කිරීමට මෙන්ම මත්පැන් පානය කිරීම නිසා වකුගඩු වලට වන හානිය අවම කර ගැනීමටත් බර අධික ආහාර ඉක්මනින් දිරවීමේ හැකියාවත්, තරුණකම රැක දෙන ශක්තියත්, දියවැඩියාව, මූත්‍රා ආසාධන, වැනි රෝග වැලැක්වීමටත්, තැඹිලි වතුර උපයෝගි වන බව සොයා ගෙන ඇත. එබැවින් මෙවන් වටිනාකමක් පවතින දේශීය භෝග තව තවත් ප්‍රචලිත කිරීම මගින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා ගැනීමේ ඉහළ හැකියාවක් පවතී. එහිදී තැඹිලි, පොල් වැනි

භෝග වල ඵලදාව වර්ධනය කර ගැනීම සඳහා පොස්පේට් නිසි පරිදි භාවිතා කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇත.

මේ ආකාරයට පොස්පේට් සතු විභවතාවය මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් පොල් හා තැඹිලි ආශ්‍රිත නිෂ්පාදනයන් මනා ලෙස වර්ධනය කර ගනිමින් හා එම භෝග වගාවන් පාදක කර ගනිමින් අගය එකතු කිරීමේ නිෂ්පාදනයන් සිදු කිරීම මගින් ප්‍රදේශයට මෙන්ම රටට ආර්ථික වාසි ලබාගැනීමේ හැකියාවක් පවතී. ගෝලීය වශයෙන් 2019 වසරේ පොල් වතුර වෙළඳපොලේ වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 4.27 ක් වූ අතර 2020 සිට 2027 දක්වා එය 16.1% ක වාර්ෂික වර්ධන වේගයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර තිබීම තුලින් එය තහවුරු වේ.

එහිදී ශ්‍රී ලංකාවේ පොල් වගාව සඳහා සුදුසු ප්‍රදේශ තෝරා ගනිමින් හා පොස්පේට් භාවිතා කරමින් පොල් වගා කිරීමත් කුරුම්බා ආශ්‍රිත නිෂ්පාදනයන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමට යොදා ගැනීමත් කළ හැකිය. මේ ආකාරයට පොල් සඳහා අගය එකතු කිරීමේ නිෂ්පාදනයන් සිදුකරන ප්‍රධාන රටක් ලෙස ඉන්දුනීසියාව පෙන්වා දිය හැකිය. ඉන්දුනීසියාවට අයත් ප්‍රධාන දූපත් වන බාලි දූපත් වල සංචාරක කර්මාන්තය ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ මෙම පොල් වගාව හා ඒ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදනයන් නිසාය.

**රූපසටහන් අංක 22 සංචාරක කර්මාන්තය හා බැඳි කුරුම්බා හා තැඹිලි නිෂ්පාදනයන්**



මූලාශ්‍රය: https://www.destimap.com - 2022

එබැවින් ගෝලීය පොල් නිෂ්පාදනය පිළිබඳව සලකා බැලීමේදී ඉන්දුනීසියාව ඉදිරියෙන් සිටින බව හඳුනාගත හැකිය.

**වගුව 11 ගෝලීය පොල් නිෂ්පාදනය**

| **ශ්‍රේණිගත කිරීම** | **රට** | **නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන** |
|---|---|---|
| 01 | ඉන්දුනීසියාව | 17.13 |
| 02 | පිලිපීනය | 14.77 |
| 03 | ඉන්දියාව | 14.68 |
| 04 | ශ්‍රී ලංකාව | 2.47 |
| 05 | බ්‍රසීලය | 2.33 |
| 06 | වියට්නාමය | 1.68 |
| 07 | මෙක්සිකෝව | 1.29 |
| 08 | පැපුවා නිව්ගිනි | 1.19 |
| 09 | තායිලන්තය | 0.81 |
| 10 | මැලේසියාව | 0.54 |

මූලාශ්‍රය: www.worldatlas.com – 2022

තැඹිලි වලට ඇති ඉල්ලුම හා ශ්‍රී ලංකාවේ පොස්පේට් වල ගුණාත්මක භාවය ප්‍රයෝජනයට ගනිමින් තැඹිලි වගාවන් සිදු කර, ඒ හා බැඳුණු නිෂ්පාදන ආර්ථිකයක් ශ්‍රී ලංකාව තුල ඇති කිරීමේ විභවතාවයක් පවතින අතර, එහිදී විදේශ විනිමය ඉපයිය හැකි කර්මාන්ත ඇති කිරීමේ හැකියාව ද වර්ධනය කර ගත හැකිය. මේ ආකාරයට පොල් හා තැඹිලි සඳහා ශ්‍රී ලංකාවේ පොස්පේට් භාවිතා කරමින් බෝග වගාවන් සිදු කිරීම මගින් පොස්පේට් සඳහා ඉතා හොඳ ඉල්ලුමක් ශ්‍රී ලංකාව තුල ද ඇති කිරීමේ හැකියාව පවතින අතර, එමඟින් රටේ ආර්ථිකය වර්ධනය කිරීමේ හැකියාව ද පවතී.

නමුත් මේ ආකාරයට පොහොර නිෂ්පාදනය කිරීම සඳහා සල්පියුරික් අම්ලය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර, ඒ සල්පියුරික් අම්ල නිෂ්පාදනය කිරීම සඳහා අතිශය වැදගත් වන අඛණ්ඩ ජල ප්‍රභවයන් හා ජල සැපයුමක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් ඉහත සඳහන් කරන ලද ආර්ථික වාසිය ලබා ගැනීමේ හැකියාව පවතී. මෙහිදී සල්පියුරික් අම්ල මෙට්‍රික් ටොන් 75 000 නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වාර්ෂික ජල අවශ්‍යතාවය කියුබික් මීටර් 50 000 කි.


මෙම පොස්පේට් නිධිය හෙක්ටයාර 319 ක් පුරා ව්‍යාප්තව පවතින අතර රුපියල් බිලියන 20 - 25 අතර ප්‍රමාණයේ ආයෝජනයක් මගින් සල්පියුරික් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ හැකි වේ.

### 3.2.3 විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ සහ අවට පැවතීම

තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය ද ප්‍රදේශයේ පවතින තවත් එක් ප්‍රබල විභවතාවයක් ලෙස හඳුන්වා දිය හැකිය. අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රධාන ලෙසම කෘෂිකර්මාන්තය ජීවනාලිය කරගත් ජනතාවක් ජීවත් වන ප්‍රදේශයකි.ගොවියන් විසින් දිස්ත්‍රික්කයේ ඇති කෘෂි නිෂ්පාදනයන් මෙම ආර්ථික මධ්‍යස්ථානය කරා පහසුවෙන් රැගෙන එනු ලබයි. ශ්‍රී ලංකාව තුල සංසරණය වන කෙසෙල්, අඹ, ගස්ලබු වැනි පළතුරු වලින් 50% ක පමණ ප්‍රමාණයක් එකතු කිරීමත්, ලංකාව පුරා මෙම පළතුරු බෙදා හැරීමත්, මෙම ආර්ථික මධ්‍යස්ථානයෙන් සිදු කරනු ලබයි. එළවළු හා පළතුරු කඩ කාමර 43 ක් හා කුළු බඩු හා ධාන්‍ය කඩ කාමර 13 බැගින් ආර්ථික මධ්‍යස්ථානය තුල පවතී.

දිනකට තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයට මෙට්‍රික් ටොන් 500 ක පමණ ප්‍රමාණයක එළවළු හා පළතුරු එකතු වන අතර, ගල්නෑව, කලංකුට්ටිය, එප්පාවල, තලාව, නොච්චියාගම, රාජාංගනය වැනි ප්‍රදේශ වලින් වැඩි නිෂ්පාදනයක් එකතු වෙයි. ඊට අමතරව, යාපනය, කුරුණෑගල, නුවරඑළිය, මන්නාරම, පුත්තලම, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශයන්ගෙන් මෙන්ම ඇඹිලිපිටිය වැනි ප්‍රදේශ වලින් ද මෙම ආර්ථික මධ්‍යස්ථානයට එළවළු හා පළතුරු නිෂ්පාදනයන් ගෙන එනු ලබයි. විශේෂයෙන්ම මෙම ආර්ථික මධ්‍යස්ථානය නිසා තලාව ප්‍රාදේශීය සහා බල ප්‍රදේශයට ජාතික මට්ටමේ අවධානයක් ද ලැබී ඇත. ප්‍රදේශයේ මූල්‍යය කටයුතු කරනු ලබන ආයතන බොහෝ ප්‍රමාණයක් ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පිහිටා ඇති අතර, එය ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලට සෘජු දායකත්වයක් ලබාදෙයි. එමෙන්ම සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් නිර්මාණය වීම තුලින් ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් වීමට ද හේතු වී ඇත.

**රූපසටහන් අංක 23** **දඹුල්ල හා තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන අතර දුර**





මූලාශ්‍රය: Google සිතියම ඇසුරෙනි

තවද, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ පිහිටා තිබීමද එක් වැදගත් ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය රටේ ප්‍රධානතම ක්‍රියාකාරී වාණිජ මධ්‍යස්ථානයක් වන අතර, නොයෙකුත් වර්ගයේ එළවළු හා පළතුරු ලංකාවේ සියළු පළාත් වලින් මෙම ආර්ථික මධ්‍යස්ථානයට රැගෙන එනු ලබයි. මෙලෙස ප්‍රධානතම ආර්ථික මධ්‍යස්ථානයක් මෙම ප්‍රදේශයට ආසන්නයේ පිහිටා තිබීම හේතුවෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කෘෂි නිෂ්පාදනයන් අඩු වේලාවකින් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය කරා ප්‍රවාහනය කිරීමටත්, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ කෘෂි නිෂ්පාදනයන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කරා ඉතාමත් පහසුවෙන් ප්‍රවාහනය කිරීමටත් හැකියාව ලැබෙන අතර, මෙම ආර්ථික මධ්‍යස්ථාන දෙක අතර, කිලෝමීටර් 60 ක පමණ දුරක් දක්නට ලැබේ.

මෙහිදී මෙම ආර්ථික මධ්‍යස්ථාන කරා රැගෙන යනු ලබන භාණ්ඩ යොදා ගනිමින් නව නිෂ්පාදනයන් කිරීමත්, අගය එකතු කිරීමේ නිෂ්පාදනයන් සිදු කිරීමත් මගින් මෙම මධ්‍යස්ථාන දෙක සම්බන්ධ කරමින් නව නිෂ්පාදන ප්‍රදේශයක් සංවර්ධනය කල හැකිය. ලංකාවේ සංසරණය වන එළවළු හා පළතුරු බොහෝ ප්‍රමාණයක් එම ආර්ථික මධ්‍යස්ථාන වෙත ලැබීම හා ඉතා පහසුවෙන් විවිධ ප්‍රදේශ කරා ප්‍රවාහනය කිරීමේ හැකියාව පැවතීම එම නව සංවර්ධන ප්‍රදේශය ඇති කිරීමට උපයෝගි වන ප්‍රධානම සාධක වේ. එබැවින් අගය එකතු කිරීමේ මධ්‍යස්ථාන හා නව නිෂ්පාදන කිරීමේ මධ්‍යස්ථාන වෙත මෙම ආර්ථික මධ්‍යස්ථාන කරා රැගෙන එන එළවළු පළතුරු ඉතා පහසුවෙන් ප්‍රවාහනය කිරීමට හැකි වීමත්, අවම කාලයක් තුළ ප්‍රවාහනය කිරීම මගින් ජීව ගුණය ආරක්ෂා වූ නිෂ්පාදනයන් වෙළෙඳපොළ කරා සැපයීමටත් හැකියාවක් පවතී.

මෙම සංවර්ධන විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශයේ ඇතැම් ව්‍යවසායකයන් විසින් පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කර ඇති අතර, එමඟින් මෙම ආර්ථික මධ්‍යස්ථාන වෙත ලැබෙන පළතුරු විවිධ වර්ගයේ අතුරු නිෂ්පාදනයන් ලෙස වෙළඳපලට සැපයීම සිදු කරනු ලබයි. මෙම තත්ත්වය ඉතා සාම්ප්‍රදායික ක්‍රමයක් වන අතර එමඟින් ජාතික ආර්ථිකයට ලැබෙන්නේ ඉතා අඩු දායකත්වයකි. නමුත් මෙම තත්ත්වය වලක්වා ගැනීමටත්, මෙම ආර්ථික මධ්‍යස්ථාන වෙත ලැබෙන පළතුරු නිෂ්පාදනයන්ට ඉතා ඉහල ඉල්ලුමක් ඇති කිරීමටත්, අතුරු නිෂ්පාදනයක් ලෙස මද්‍යසාර නිෂ්පාදනය කිරීම වැනි නවෝත්පාදන ක්‍රියාවලි කරා යොමු වීමෙන් මෙම පළතුරු සඳහා ඉතා ඉහල වටිනාකමක් ලබා දිය හැකි අතර, ප්‍රදේශයේ පළතුරු ගොවීන්ට ඉහළ ආර්ථික වාසියක් ලබාගැනීමේ හැකියාව ද එමඟින් ලැබේ. විදේශීය වෙළඳපොළ අරමුණු කරගනිමින් සිදුකරනු ලබන නිෂ්පාදන මඟින් විදේශ විනිමය ඉපයීමේ හැකියාවක්ද පවතී. එබැවින් තලාව සංවර්ධන සැලැස්ම මගින් ජාතික ආර්ථිකයට දායක වීම සඳහා විදේශ විනිමය උපයනු ලබන නිෂ්පාදන වර්ධනය කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර ඇත.

**ප්‍රස්ථාර 13 ආර්ථික මධ්‍යස්ථානයේ වාර්ෂික මුදල් සංසරණය (රු.මි)**




මූලාශ්‍රය : තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය - 2022

**රූපසටහන් අංක 24 තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය**



මූලාශ්‍රය : තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය - 2022

තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ පවතින ඇතැම් යටිතල පහසුකම් ප්‍රමාණය අවම වීම හේතුවෙන් උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීමට ඇති හැකියාව අවම කරනු ලබයි. ඒ අතර, වාහන රථගාලක් නොමැතිකම මළ අපවහන පද්ධතියක් නොමැතිකම හා එළවළු හා පළතුරු ආරක්ෂිතව තැබීම සඳහා ආවරණයක් නොමැතිවීම ආදී දුර්වලතාවයන් හඳුනාගත හැකිය. එබැවින් මෙම ආර්ථික මධ්‍යස්ථානයට අවශ්‍ය ඉහත පහසුකම් සම්පූර්ණ කිරීම තුලින් ආර්ථික මධ්‍යස්ථානයෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකි පරිදි සංවර්ධනය කිරීම මෙම සංවර්ධන සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

## 3.3 හඳුනාගත් ගැටලු

සමස්තයක් ලෙස ගත් විට ඉහත විශ්ලේෂණයන් මගින් හා පාර්ශවකරුවන්ගේ අදහස් වලට අනුව ප්‍රදේශයේ පවතින ගැටලු පහත පරිදි හඳුනා ගන්නා ලදී.


1. කෘෂිකර්මාන්තයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නොහැකි වීම.
2. වන අලි තර්ජන
3. පාරිසරික සංවේදී ප්‍රදේශ තර්ජනයට ලක්වීම

### 3.3.1 කෘෂිකර්මාන්තයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නොහැකි වීම

#### *3.3.1.1 ප්‍රදේශයේ පවතින එල්ලංගා පද්ධතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම*

මෙම තත්ත්වය ප්‍රදේශයේ කෘෂි කර්මාන්තයෙන් නිසි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා පවතින ප්‍රබල ගැටලුවක් වන අතර, ජලවහන පද්ධතිය හා සම්බන්ධ වැව් හා ඇළ වේලි ක්‍රමවත් ආකාරයට ක්‍රියාත්මක නොවීම මෙයට හේතුවයි. ප්‍රදේශය තුළ පිහිටා තිබෙන බොහෝ වැව් ගොඩවීමේ තර්ජනයට ලක්ව ඇති අතර, වැවේ සමස්ත ජල ධාරිතාවයෙන් 50% කටත් අඩු ප්‍රමාණයකින් ජලය ගබඩා කර ගනු ලබයි. කෝන්වැව, හුරිගස්වැව, නීලබැම්ම, නල්ලමුදාව වැව, තලාව වැව, නල්ලච්චිය වැව මේ ආකාරයට ගොඩ වී ඇති අතර, මෙම වැව් එකිනෙකට සම්බන්ධ කරමින් පවතින ඇළ මාර්ග පද්ධතියද නිසි ලෙස සම්බන්ධ නොවීමේ හා ගොඩ වීමේ තර්ජනයකට ලක්ව ඇත. භූමියේ උන්නතාංශය යොදා ගනිමින් කරනු ලැබූ විශ්ලේෂණයෙන් ප්‍රදේශයේ මනා ජලවහන රටාවක් පෙන්නුම් කරනු ලැබුවද, භූමියේ පවතින ඇළ වේලි අතර සම්බන්ධතාවයක් නොමැතිවීම හේතු කොට ගෙන වගා බිම් සඳහා නිසි පරිදි ජලය ලබා ගැනිමේ අවහිරතාවයක් පවතී.

**සිතියම් අංක 23 ප්‍රදේශයේ ජල වහන රටාව**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

*3.3.1.2 කෘෂිකර්මාන්තය පිළිබඳ ගොවීන් සතු තාක්ෂණික දැනුම අල්ප වීම*

සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැඩි භූමි ප්‍රමාණයක් වෙන්ව පවතින්නේ කෘෂිකර්මාන්තය සඳහා බව හඳුනාගත හැකිය. සමස්ත භූමි පරිහරණ රටාවෙන් 41% ක කුඹුරු සඳහා ද, 14% ක ප්‍රමාණයක් මිශ්‍ර කෘෂිකර්මාන්තය සඳහා ද 7% ක ප්‍රමාණයක් ජලපෝෂක ප්‍රදේශ සඳහා ද වෙන්ව පවතී.

මෙම කෘෂි බිම් සඳහා ප්‍රධාන වශයෙන්ම ජලය සම්පාදනය කරනු ලබන්නේ වාරිමාර්ග පද්ධතීන් උපයෝගී කර ගනිමිනි. ප්‍රමාණවත් පරිදි ජලය හා පොහොර, වගාවන් සඳහා භාවිතා කිරීමෙන් වැඩි ඵලදාවක් ලබාගත හැකි බව ගොවීන්ගේ අදහසයි.

නමුත් වර්තමානයේ භාවිතා කරනු ලබන කෘෂි තාක්ෂණික උපක්‍රම හා මෙවලම් මගින් මෙම මතය එතරම් ඵලදායී නොවන බවට තහවුරු කර ඇත. කෘෂිකර්මාන්තයේදී නවීන තාක්ෂණය භාවිතා කිරීමෙන් ජල සම්පාදනය කිරීමේ හැකියාව පවතින අතර, බිංදු ජල සම්පාදනය වැනි තාක්ෂණික ක්‍රම මගින් අඩු ජල ප්‍රමාණයක් භාවිතා කරමින් ඉහළ ආකාරයේ ඵලදාවක් නෙළා ගැනීමේ හැකියාව ඇත. මෙය ක්ෂුද්‍ර වාරිමාර්ග, දේශීය වාරිමාර්ග, බිංදු වාරිමාර්ග ක්‍රමය ලෙසද හැඳින්වෙන අතර අඩු පීඩන නල ජාලයක් හරහා අදාල භෝගයට ජලය සැපයීම සිදු කරනු ලබයි. මෙහිදී සාම්ප්‍රදායික මතුපිට වාරිමාර්ග ක්‍රම හා සසඳන විට සැලකිය යුතු ජල ඉතිරියක් සඳහා ඉඩ සලසන අතර, ශුෂ්ක දේශගුණික ප්‍රදේශවලට සුදුසු වාරිමාර්ග ක්‍රමයකි. ජල පරිභෝජනය අවම කිරීමේ අරමුණින්, සෘතුමය හා දෛනික වෙනස්කම්, දේශගුණික තත්ත්වයන් සහ භෝග වර්ග මත පදනම්ව මෙම ක්‍රමය භාවිතා කල හැකිය.

කෘෂි විද්‍යාඥයින් පවසන ආකාරයට මෙවැනි උපක්‍රම භාවිතා කරමින් භෝග වගා කිරීම මගින් ඉහළ අස්වනු ප්‍රමාණයක් ලබා ගැනීමේ හැකියාවක් පවතී. වගු අංක 12 අධ්‍යයනය කිරීමේදී එය තහවුරු කරගත හැකිය.

**වගුව 12 නවීන තාක්ෂණය භාවිතය මඟින් අස්වනු වැඩි කර ගැනීමට ඇති හැකියාව**

| භෝගය | ජල ඉතිරිය % | අස්වනු වැඩි වීමේ ප්‍රතිශතය % |
|---|---|---|
| කෙසෙල් | 45 | 52 |
| මල් ගෝවා | 68 | 70 |
| පිපිඤ්ඤා | 56 | 48 |
| මිදි | 48 | 23 |
| රටකජු | 40 | 152 |
| දෙළුම් | 45 | 45 |
| උක් | 50 | 99 |
| දෙහි | 61 | 50 |
| තක්කාලි | 42 | 60 |
| පැණි කොමඩු | 66 | 19 |

මූලාශ්‍රය: https://vikaspedia.in - 2022

එබැවින් මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා සමස්ත ප්‍රදේශයම ආවරණය වන පරිදි කෘෂි තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම හා කෘෂිකර්මාන්තය පිළිබඳ ගොවීන් සතු දැනුම හා තාක්ෂණික උපක්‍රම භාවිතය වර්ධනය කිරීම මගින් භෝග විවිධාංගීකරණයන් සමඟ ඉහළ මට්ටමේ කෘෂි ඵලදාවක් නෙළා ගැනීමේ හැකියාව පවතී. එම තත්ත්වය ජනතාවගේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකය වර්ධනය සඳහා ද දායක වෙයි.


*3.3.1.3 කෘෂි නිෂ්පාදන නිසි පරිදි වෙළඳපල කරා ප්‍රවාහනය කර ගැනීමට නොහැකි වීම*

මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව වන්නේ ප්‍රදේශය සතු මාර්ග පද්ධතිය නිසි පරිදි නොපැවතීමයි. විශේෂයෙන් අස්වනු නෙළා ගැනීමෙන් පසුව වෙළඳපළ කරා අස්වනු ප්‍රවාහනයේදී කෘෂි නිෂ්පාදනයන් බොහෝ ප්‍රමාණයක් පරිභෝජනයට නුසුදුසු ලෙස තැලී විනාශයට පත්වේ. එමගින් කෘෂි නිෂ්පාදනයන් සඳහා ප්‍රධාන මාර්ග මෙන්ම අතුරු මාර්ග සංවර්ධනය කිරීම සුදුසුම විකල්පය වේ. මෙම මාර්ග ප්‍රතිසංස්කරණය තුලින් ප්‍රදේශයේ ආර්ථික මට්ටම ඉහළ නංවා ගත හැකි ක්‍රමයක් නිර්මාණය වේ.

*3.3.1.4 කෘෂි වගා බිම් තර්ජනයට ලක්වීම*


මෙම තත්ත්වය ද ප්‍රදේශය සතු ප්‍රබල දුර්වලතාවයක් ලෙස හඳුන්වා දිය හැකිය. සමස්තයක් ලෙස සලකා බැලීමේදී ප්‍රදේශයම ආවරණය වන ආකාරයට මෙම කෘෂි බිම් ව්‍යාප්තව පවතින අතර, එම කෘෂි බිම් ආශ්‍රය කර ගනිමින් ජනාවාස ආරම්භ වී ඇත. මෙම ජනාවාස ක්‍රමයෙන් වර්ධනය වන විට, පැවතුනු කෘෂි බිම් ආරක්ෂා කර ගැනීම අභියෝගාත්මක කරුණක් විය. මෙම කෘෂි ඉඩම් ගොඩවීමේ තර්ජනය හා සංවර්ධන කටයුතු වලින් මෙම කෘෂි බිම් වලට සිදුවන බලපෑම පිළිබඳව ප්‍රදේශයේ ජනගහනය, ජනගහන වර්ධන වේගය, භෞතික හා සමාජයීය යටිතල පහසුකම් ප්‍රමාණය හා ඝනත්වය, අනෙකුත් නගර සමඟ පවතින සම්බන්ධතාවය, ජන ඝනත්වය ආදී බොහෝ අංශ සලකා බලමින් සිදු කරනු ලැබූ සංවර්ධන පීඩක දර්ශක විශ්ලේෂණය මගින් තහවුරු කර ගැනීමට හැකි විය. ඒ අනුව අක්කර 500 ට අධික ප්‍රමාණයක් මෙලෙස තර්ජනයට ලක්ව ඇත. සිතියම් අංක 24, 25 මගින් සංවර්ධන පීඩක දර්ශකය හා කෘෂි බිම් ආවරණය කරමින් ජනාවාස ව්‍යාප්තිය පිළිබඳව පැහැදිලි අදහසක් ලබාදෙයි.

**සිතියම් අංක 24 සංවර්ධන පීඩක දර්ශකය**




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**සිතියම් අංක 25 නේවාසික ප්‍රදේශ වල ව්‍යාප්තිය**





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 3.3.2 වන අලි තර්ජන

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවතින තවත් එක් ප්‍රධානතම ගැටළුවක් ලෙස මෙම තත්ත්වය හඳුන්වා දිය හැකිය. වන අලි තර්ජනය හේතුවෙන් ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ එදිනෙදා කටයුතු අවදානම් තත්ත්වයක පැවතීම මෙයට හේතුවයි. ඒ අතර, මිනිස් ජීවිත හානි, දේපල හානි, වගා බිම් හානි කිරීම් වැනි අවස්ථා දක්නට ලැබෙන අතර, මෙම අලි මිනිස් ගැටුම හේතුවෙන් අලින්ට මෙන්ම මිනිස් ජීවිත හානි මෙන්ම තුවාල වීම් ද වාර්තා වී ඇත. 2013 සිට 2021 දක්වා කාල පරාසය දෙස අවධානය යොමු කිරීමේදී මෙම අලි මිනිස් ගැටුම අඛණ්ඩව පැවති ආකාරය පැහැදිලි වේ.


සමස්තයක් ලෙස ගත් විට, අලියෙක් දිනකට ආහාර කිලෝග්‍රෑම් 200 - 250 ක අතර ප්‍රමාණයක් ගනු ලබන අතර, ජලය ලීටර් 200 - 250 අතර ප්‍රමාණයක් පානය කරනු ලබයි. ආහාර හා ජලය ලබාගැනීම සඳහා කිලෝ මීටර් 20 - 25 ත් අතර දුර ප්‍රමාණයක් සංචරණය කරනු ලබයි. නමුත් මෙම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සාධක තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉතාමත් අවම මට්ටමින් පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ සමස්ත වන ගහනය වර්ග කිලෝමීටර් 225 පමණ වුවද, මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි කෘෂි බිම් හා ජනාවාස පිහිටා ඇත. එමෙන්ම එම අලින්ට අවශ්‍ය පරිදි වන ගහන ප්‍රදේශ මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රමාණවත් ආකාරයෙන් දක්නට නොමැත. දළදාපුර, මොරගොඩ, කොරකහවැව, මාවතවැව වැනි ග්‍රාම නිලධාරී කොට්ඨාශයන් තුළ අඩු වපසරියකින් යුත් වන ගහන ප්‍රදේශ පිහිටා තිබුනද, අලි ඇතුන්ට තමාගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා එම ප්‍රදේශ ප්‍රමාණවත් නොවේ. ආහාර හා පානීය ජලය ලබා ගැනීමේ අවශ්‍යතාවය මත මෙම වන අලි ගම් වදින අතර, එම තත්ත්වය හේතුවෙන් වගා හානි, දේපල හානි හා ජීවිත හානි විශාල ප්‍රමාණයක් වාර්තා වී ඇත. මෙයට අමතරව 2015 වර්ෂයේ සිට වන අලි මිය ගිය ප්‍රමාණය 12 ක් පමණ දක්වා ඉහළ ගොස් ඇති අතර, වන අලි පහර දීමෙන් පුද්ගලයන් 20 ක් පමණ ජීවිතක්ෂයට පත් වී තිබේ. වෙනත් හානි සිදු වූ පුද්ගලයන් 75 ක් පමණ වාර්තා වී ඇත.

**ප්‍රස්ථාර 14 දිස්ත්‍රික්කයේ වන අලින්ගේ ජීවිත හානි වීම්**





මූලාශ්‍රය : ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2017

**ප්‍රස්ථාර 15 වන අලි තර්ජන ප්‍රමාණයන් 2012 - 2021**





මූලාශ්‍රය : වන ජීවී දෙපාර්තමේන්තුව - 2022

**ප්‍රස්ථාර 16 අලි මිනිස් ගැටුම 2003 - 2021**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 25** **අලි ගමන් කරන ප්‍රදේශ - තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**




මූලාශ්‍රය : වන ජීවී දෙපාර්තමේන්තුව - 2022

**සිතියම් අංක 26 වනාන්තර ප්‍රදේශ**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 3.3.3 පාරිසරික සංවේදී ප්‍රදේශ තර්ජනයට ලක්වීම


මෙම තත්ත්වයද , ප්‍රාදේශීය සහා බල ප්‍රදේශය තුල තිබෙන තවත් එක් ගැටළුවකි. මෙයට හේතුව වන්නේ අක්‍රමවත් ආකාරයට ප්‍රදේශය පුරා සංවර්ධන කටයුතු සිදුවීමයි. විශේෂයෙන්ම භූමි පරිහරණ රටාව පිළිබඳව අවධානය යොමු කිරීමේදී මෙම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදුවන්නේ පාරිසරික සංවේදී ප්‍රදේශ ආශ්‍රය කරගෙන බව පැහැදිලි වේ. එහිදී නේවාසික කටයුතු ව්‍යාප්ත වී ඇත්තේ කෘෂිකාර්මික බිම් වලට ඉතා ආසන්නයෙන්ය. සංවර්ධන කටයුතු අක්‍රමවත්ව සිදුවීම නිසා මෙම කුඹුරු ඉඩම් ගොඩවීමේ තර්ජනයට ලක්වෙමින් පවතින අතර, ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින වැව්, ඇළ මාර්ග රක්ෂිත ප්‍රදේශ තුල අනවසරයෙන් හා අක්‍රමවත්ව සිදුවන සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් ද පාරිසරික සංවේදී ප්‍රදේශ වලට දැඩි බලපෑමක් ඇති කරනු ලබයි.

රූපසටහන් අංක 27, 28 මගින් පෙන්වන ප්‍රදේශයම ආවරණය වන පරිදි කරන ලද පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ විශ්ලේෂණය හා සංවර්ධන පීඩක දර්ශකය පිළිබඳ විශ්ලේෂණය මගින් එය මනාව පැහැදිලි වේ.

**රූපසටහන් අංක 26 පාරිසරික සංවේදී ප්‍රදේශ**




**රූපසටහන් අංක 27 සංවර්ධන පීඩක දර්ශකය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රදේශයට සිදුවන බලපෑමේ ස්වභාවය, සංවර්ධන කටයුතු තවදුරටත් ව්‍යාප්ත විය හැකි ප්‍රදේශ පිළිබඳ සංවර්ධන පීඩක දර්ශකය තුළින් පෙන්නුම් කරයි. ඉහත දත්ත විශ්ලේෂණය කර බලන විට පාරිසරික සංවේදී ප්‍රදේශ කරා ද මෙම සංවර්ධන පීඩකයන් යොමු වෙමින් පවතින බව මනාව අවබෝධ කර ගත හැකිය. ඒ අනුව, සලකා බලනු ලබන ප්‍රදේශය අතිශයින්ම පාරිසරික සංවේදී ප්‍රදේශයක් බව තහවුරු වේ. ඊට හේතුව වන්නේ සමස්ත භූමි පරිහරණ රටාවෙන් 50 % ට ආසන්න ප්‍රමාණයක් කුඹුරු හා ජලජ ප්‍රදේශ වලට අයත් වීමයි. මෙහිදී සංවර්ධන පීඩක දර්ශකය මෙම පාරිසරික සංවේදී ප්‍රදේශ දෙසට ව්‍යාප්ත වීම තුලින් අක්‍රමවත් සංවර්ධන කටයුතු හේතුවෙන් විවිධ පාරිසරික ගැටලු උග්‍රවීමත්, එය සෘජු ලෙස මෙන්ම වක්‍ර ලෙසද, ප්‍රදේශයේ ආර්ථිකයට විශාල බලපෑමක් එල්ල කරන බවත් දැකිය හැකිය.

**රූපසටහන් අංක 28** **පාර්ශවකරුවන් ප්‍රකාශ කරන අදහස්**







ප්‍රදේශයේ පාර්ශවකරුවන් ප්‍රකාශ කළ අදහස් විශ්ලේෂණයේදී ඔවුන් වැඩි වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ ද ප්‍රදේශයේ පවතින රක්ෂිත, කුඹුරු, වැව් ආදී පාරිසරික සංවේදී ප්‍රදේශයන් ආරක්ෂා කර ගැනීමට වන අතර, සංවර්ධන සැලැස්මේදී වැඩි අවධානයක් ඒ සඳහා යොමු කරන ලදී. ඒ අනුව, පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර ගනිමින් ක්‍රමානුකූලව සංවර්ධන කටයුතු කිරීමට අවශ්‍ය ඉඩකඩ මෙම සැලැස්මෙන් සකස් කරනු ලබයි.

ප්‍රදේශය සතු විභවතා හා දුර්වලතාවයන් පිළිබඳ ජනතාව දැක්වූ අදහස් වලට අනුව, ප්‍රදේශය සතු විභවතාවයන් මනා ලෙස උපයෝගී කර ගනිමින් හා දුර්වලතාව මහහරවා ගනිමින් ප්‍රදේශය සංවර්ධනය කරා රැගෙන යා හැකි බව අවබෝධ වේ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

රූපසටහන් අංක 29 මගින් දක්වා ඇත්තේ ප්‍රදේශයේ ජනතාව හා විවිධ ආයතනයන් ප්‍රකාශ කරන ලද අදහස් විශ්ලේෂණය කිරීමෙන් ලබා ගත් ප්‍රතිඵලය යි.

# හතරවන පරිච්ඡේදය

# සංවර්ධන සැලසුම් රාමුව

මෙහිදී සංවර්ධන සැලැස්මට අනුව දැක්ම, දැක්මේ ප්‍රකාශය, දැක්මට අදාල වූ ඉලක්ක හා අභිමතාර්ථ විස්තර කරනු ලබන අතර, මෙම ඉලක්ක හා අභිමතාර්ථයන් ළඟා කර ගැනීම උදෙසා සිදුකරනු ලැබූ විද්‍යානුකූල විශ්ලේෂණයන් හා ගණනය කිරීම් ඉතාමත් සවිස්තරාත්මකව විවිධ ක්‍රමෝපායන් භාවිතා කරමින් පැහැදිලි කර ඇත.

## 4.1 දැක්ම

**“අනුරාධපුර සෞභාග්‍යමත් කෘෂි දොරටුව”**

## 4.2 දැක්මේ ප්‍රකාශය

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවයන් හා ගැටළු විද්‍යාත්මක ආකාරයට විශ්ලේෂණය කිරීමෙන් පසු භෞතික, ආර්ථික, සමාජයීය, පාරිසරික යන අංශ හරහා එම සංවර්ධන විභවතාවයන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමටත්, නගරයේ පවතින ගැටලුකාරී තත්ත්වයන් උපක්‍රමශීලීව මගහරවා ගැනීමටත්, දැක්ම සකස් කරන ලදී. ඒ අනුව, මෙම දැක්ම යටතේ නගරය තුළ ඇති සංවර්ධන විභවතාවයන් එනම්, කෘෂි බිම්, ජලජ ප්‍රදේශ, ප්‍රධාන ආර්ථික සම්පත් ආදිය මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් නගරය තුල පවතින ගැටළුකාරී තත්ත්වයන් වන, වන අලි තර්ජන, ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන නොගැනීම ආදිය මඟහරවා ගනිමින් කටයුතු කරන ආකාරය විස්තර කර ඇත.

මෙහිදී තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා “අනුරාධපුර සෞභාග්‍යමත් කෘෂි දොරටුව” යන දැක්ම සකස් කරගත් අතර, ඉහළ කෘෂි නිෂ්පාදනයන් හා සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් හිමි, නීල හරිත ජනාවාස වලින් ආවරණය වූ ඓතිහාසික අනුරාධපුර නගරයේ සමෘද්ධිමත් කෘෂි දොරටුව බවට පත් කිරීම යන්න එහි අදහස වේ.

## 4.3 ඉලක්ක

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ඉහත දැක්ම සකස් කර ගැනීමෙන් පසු එම දැක්ම ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන ඉලක්ක 03 ක් හඳුනා ගන්නා ලදී. ඒවා පහත පරිදි දැක්විය හැකිය.

### 4.3.1 පළමු ඉලක්කය

**කෘෂි සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ආර්ථිකය වර්ධනය කරගනු ලබන ප්‍රදේශයක් බවට පත් කිරීම.**

ප්‍රදේශය පුරා පැතිර පවත්නා කෘෂි බිම්, ජල සම්පත් හා ඛණිජ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් කෘෂි නිෂ්පාදන වර්ධනය කර ගන්නා වූත්, එකී නිෂ්පාදනයන් භාවිතා කරමින් වැඩි ආර්ථික වර්ධනයක් ළඟා කර ගනු ලබන ප්‍රදේශයක් බවට පත් කිරීමටත්, අලි මිනිස් ගැටුම අවම කරගනිමින් හා ඒ තුලින් ප්‍රදේශයේ ආර්ථිකයට වන හානිය අවම කරගැනීමට හැකි පරිදි ප්‍රදේශය සකස් කිරීමටත්, පොස්පේට් නිධියෙන් හා තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකි පරිදි ප්‍රදේශය සකස් කිරීමටත් මෙහිදී අපේක්ෂා කරනු ලබයි.

### 4.3.2 දෙවන ඉලක්කය

**නේවාසිකයින්ට හා නගරයට පිටතින් පැමිණෙන පුද්ගලයන්ට සුවපහසු හා ආරක්ෂාකාරී ප්‍රදේශයක් බවට පත් කිරීම**.

මෙමගින් අදහස් කරනු ලබන්නේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන මෙන්ම මෙම ප්‍රදේශයට විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීමට පැමිණෙන ජනතාවට ඉතාමත් සුව පහසු සහ කාර්යක්ෂම ජීවන රටාවක් පවත්වාගෙන යාමට හැකි පරිදි භෞතික හා සමාජයීය යටිතල පහසුකම් වර්ධනය කිරීමයි.

### 4.3.3 තෙවන ඉලක්කය

**පාරිසරික උරුමයන් ආරක්ෂාකාරී වූ ප්‍රදේශයක් බවට පත් කිරීම**.

ප්‍රදේශය තුළ ඇති 50% කට අධික පාරිසරික සංවේදී ප්‍රදේශ වල ආරක්ෂාකාරී බව තහවුරු කරන තිරසර සංවර්ධනයක් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම.

## 4.4 අභිමතාර්ථ

4.4.1 කෘෂි සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ආර්ථිකය වර්ධනය කර ගනු ලබන ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වන අභිමතාර්ථ

1. වර්ෂ 2033 වන විට ආර්ථික මධ්‍යස්ථානයේ දිනක මෙහෙයුම් ධාරිතාවය රුපියල් මිලියන 100 (2020 වර්ෂයට සාපේක්ෂව 25 % වර්ධනයක්) දක්වා වැඩි කිරීමට කටයුතු සම්පාදනය කිරීම.
2. ඉදිරි වසර 10 තුළ පොස්පේට් ආශ්‍රිත වාර්ෂික නිෂ්පාදන ක්‍රියාවලිය මෙට්‍රික් ටොන් 60 000 සිට 75 000 දක්වා 25% න් වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි ප්‍රදේශය සකස් කිරීම.
3. 2033 වන විට කෘෂි සම්පත් වල අගය වැඩි කිරීමට මුළු භූමි ප්‍රමාණයෙන් 10% ක් (හෙක්.3323) වෙන් කිරීම.

4.4.2 නේවාසිකයින්ට හා නගරයට පිටතින් පැමිණෙන පුද්ගලයන්ට සුවපහසු හා ආරක්ෂාකාරී ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වන අභිමතාර්ථ

1. 2033 වන විට පුද්ගලයන් 150 000 කට පහසුවෙන් සේවා අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි වන පරිදි ප්‍රදේශය සකස් කිරීම.
2. 2033 වන විට භෞතික හා ස්වාභාවික පරිසර පද්ධති අතර තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම.
3. 2033 වන විට ප්‍රවාහන අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමට හැකි වන පරිදි නාගරික ප්‍රදේශය සකස් කිරීම.

4.4.3 පාරිසරික උරුමයන් ආරක්ෂාකාරී වූ ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වූ අභිමතාර්ථ

1. 2033 වන විට ප්‍රදේශය පුරා පැතිර පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ හෙක්: 18 730 (මුළු භූමි ප්‍රමාණයෙන් 57%) ආරක්ෂා වන පරිදි ප්‍රදේශය සකස් කිරීම.
2. පාරිසරික වැදගත්කමකින් යුත් ප්‍රදේශ, ආර්ථිකයේ ප්‍රධාන අංගයක් බවට පත් කිරීම.

# පස්වන පරිච්ඡේදය

## ශ.දු.අ.ත. විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී දැක්ම කරා ළඟා වීම සඳහා ප්‍රදේශයේ ඇති ශක්තීන්, දුර්වලතාවයන්, අවස්ථාවන්, තර්ජනයන් පිළිබඳ මනා විශ්ලේෂණයක් කිරීම තුළින් සංවර්ධන ප්‍රවනතාවයන් සඳහා ඇති ඉලක්කගත කරුණු හඳුනා ගැනීම වැදගත් වේ. මේ සඳහා දත්ත විශ්ලේෂණය කිරීමට ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය සිදු කරන ලදී.

## 5. 1 පළමු ඉලක්කය :- ශ.දු.අ.ත. විශ්ලේෂණය

කෘෂි සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ආර්ථිකය වර්ධනය කරගනු ලබන ප්‍රදේශයක් බවට පත් කිරීම.

**ශක්තීන්**

- සමස්ත භූමි පරිහරණ රටාවෙන් 61% ට අධික ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය සඳහා වෙන්ව පැවතීම.
- තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය ප්‍රදේශය තුළ පිහිටා තිබීම.
- එප්පාවල පොස්පේට් නිධිය ප්‍රදේශය තුළ පිහිටා තිබීම.
- වගා කටයුතු සඳහා උචිත පසක් ප්‍රදේශය තුළ තිබීම.
- ප්‍රදේශය පුරා පැතිරුණු ජලවහන පද්ධතියක් තිබීම.
- කෘෂි කර්මාන්තය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමට උපකාරී වන කාලගුණික හා දේශගුණික රටාව.

**දුර්වලතා**

- ප්‍රදේශයේ පවතින ජලජ ප්‍රදේශ රොන්මඩ තැන්පත් වීම නිසා උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීම.
- ප්‍රදේශය පුරා පවතින එල්ලංගා පද්ධතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම.
- වන අලි තර්ජනය.

- අබලන් වූ මාර්ග පද්ධතිය හේතුවෙන් කෘෂි නිෂ්පාදනයන් නිසි පරිදි වෙළෙඳපොළ කරා රැගෙන යාමට නොහැකි වීම.
- කෘෂිකර්මාන්තය පිළිබඳ ගොවීන් සතු තාක්ෂණික දැනුම අල්ප වීම.
- පොස්පේට් නිධියෙන් උපරිම ප්‍රයෝජන ලබා නොගැනීම.
- ආර්ථික මධ්‍යස්ථානය තුල පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමක් ප්‍රදේශය තුළ සිදු නොවීම.
- ප්‍රවාහනයේදී හා ගබඩා කිරීමේදී කෘෂි නිෂ්පාදන විනාශයට ලක් වීම.

**අවස්ථා**

- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පරිබාහිරව පිහිටි ප්‍රදේශ තුළ කෘෂිකර්මාන්තය ප්‍රධාන කරගත් භූමි පරිහරණ රටාවක් පැවතීම.
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පරිබාහිර ප්‍රදේශ වල වගා කරනු ලබන එළවළු සහ පළතුරු තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය කරා ප්‍රවාහනය කිරීම.
- දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය මෙම ප්‍රදේශයට ආසන්නයෙන් පිහිටා තිබීම.
- අනෙකුත් බාහිර ප්‍රදේශවල කෘෂි සම්පත් මෙම ප්‍රදේශයට පහසුවෙන් ප්‍රවාහනය කිරීමට හැකි පරිදි ප්‍රවාහන පද්ධතිය පිහිටා තිබීම.

**තර්ජන**

- අවට ප්‍රදේශයේ වගා බිම් වලට හානි කරනු ලබන වන අලීන්.
- කෘෂිකර්මාන්තයට අදාල තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ජනතාව තුළ පවතින දැනුම අල්ප වීම.
- ප්‍රදේශය හා සම්බන්ධ වන වාරි මාර්ග පද්ධතිය සහ ඇළ මාර්ග පද්ධතිය උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීම.
- මෙම ප්‍රදේශයේ සහ අවට ප්‍රදේශ වල කෘෂි බිම් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වීමේ තර්ජනයට ලක්වීම.
- කෘෂිකාර්මික කටයුතු වලදී වල් පැළෑටි සහ කෘමීන්ගේ බලපෑම් වලට ලක්වීම.

## 5. 2 දෙවන ඉලක්කය :- ශ.ඳු.අ.ත. විශ්ලේෂණය

නේවාසිකයින්ට හා නගරයට පැමිණෙන්නන්ට සුවපහසු හා ආරක්ෂාකාරී ස්ථානයක් බවට පත් කිරීම.

**ශක්තීන්**

- නීල හරිත භූමි පරිහරණ රටාවක් ප්‍රදේශය තුළ පැවතීම.
- ප්‍රදේශය තුළ මනා අභ්‍යන්තර මාර්ග පද්ධතියක් පිහිටා තිබීම.
- අනෙකුත් නගර හා ප්‍රදේශ සමඟ සම්බන්ධ වන මාර්ග පද්ධතියක් හා උතුරු දුම්රිය මාර්ගය ප්‍රදේශය තුළ පිහිටා තිබීම.
- දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර 03 ක් ප්‍රදේශය තුළ පිහිටා තිබීම (තලාව, තඹුත්තේගම හා එප්පාවල).
- නාගරික ධූරාවලියේ දෙවන මට්ටමේ නගරයක් වන තඹුත්තේගම ප්‍රදේශය තුළ පිහිටා තිබීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් ස්ථාන හා සම්පත් ප්‍රදේශය තුළ පිහිටා තිබීම.
- ප්‍රදේශය තුළ මනා ක්‍රියාකාරීත්වයෙන් යුත් මූල්‍ය ආයතන පද්ධතියක් පිහිටා තිබීම.
- ප්‍රදේශය තුළ භාවිතයට ගත හැකි ඉඩම් රාශියක් පැවතීම.

**දුර්වලතා**

- ප්‍රදේශය හරහා ගමන් කරනු ලබන ප්‍රධාන මාර්ග අබලන් වීම.
- ප්‍රදේශය තුළ පිහිටා තිබෙන අභ්‍යන්තර මාර්ග පද්ධතිය අබලන් වීම.
- දුම්රිය ස්ථාන හා බස් නැවතුම්පළ අතර මනා සම්බන්ධතාවයක් නොමැතිවීම.
- සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් පාරිසරික සංවේදී ප්‍රදේශ තර්ජනයට ලක්ව පැවතීම.
- නගරයේ රථ වාහන නැවැත්වීමේ පහසුකම් අවම වීම.

**අවස්ථා**

- ප්‍රදේශයේ මාර්ග පද්ධතිය වන දුම්රිය මාර්ගය කලාපයේ අනෙක් ප්‍රධාන නගර හරහා මනා ලෙස සම්බන්ධ වීම.
- ප්‍රදේශයට පරිබාහිරින් වූ ප්‍රදේශ වල පවතින නීලහරිත භූමි පරිහරණ රටාව.
- වන අලින්ට පහසුවෙන් ගැවසිය හැකි විල්පත්තුව ජාතික වනෝද්‍යානය මෙම ප්‍රදේශයට ආසන්නයෙන් පිහිටා තිබීම.

**තර්ජන**

- අවට ප්‍රදේශවල වන අලීන් මෙම ප්‍රදේශයට පහසුවෙන් සංක්‍රමණය වීම.

## 5. 3 තෙවන ඉලක්කය :- ශ.දු.අ.ත. විශ්ලේෂණය

පාරිසරික උරුමයන් ආරක්ෂාකාරී වූ ප්‍රදේශයක් බවට පත් කිරීම.

**ශක්තීන්**

- සමස්ත ප්‍රදේශයෙන් 60% ට අධික ප්‍රමාණයක් පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ පිහිටා තිබීම.
- මෙම ප්‍රදේශය නීලහරිත භූමි පරිහරණ රටාව සමඟ මනා සම්බන්ධතාවයක් පැවතීම.
- පුද්ගලයන්ට පහසුවෙන් ළඟා විය හැකි ආකාරයට නීලහරිත ප්‍රදේශ මාර්ග ආසන්නයේ පිහිටා තිබීම.
- විශාල වනගහනයක් ප්‍රදේශය තුල පැතිරී පැවතීම.

**දුර්වලතා**

- පාරිසරික සංවේදී ප්‍රදේශ, සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් තර්ජනයට ලක්ව පැවතීම.
- නේවාසික ප්‍රදේශ පාරිසරික සංවේදී ප්‍රදේශ කරා ව්‍යාප්ත වීම.

**අවස්ථා**

- අවට ප්‍රදේශයන් තුල පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට මහජනයා පෙළඹීම.

# හයවන පරිච්ඡේදය

# සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

නාගරික ධූරාවලිය පදනම් කර ගනිමින් හා එහි විභවතාවයන් වර්ධනය කර ගැනීමට හැකිවන පරිදි තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය කිරීමට මෙහිදී අදහස් කරනු ලබයි.

එහිදී අනුරාධපුර, තලාව, තඹුත්තේගම, එප්පාවල යන නගර හා ඒවාට ආවේණික වූ වටිනාකම් විදහා දැක්වෙන පරිදි සංකල්පිත සැලැස්ම විස්තර කරනු ලබන අතර, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අනෙකුත් ප්‍රධාන නගර සමඟ පවතින සම්බන්ධතාවය ද විග්‍රහ කරනු ලබයි.

උතුරු මැද පළාතේ නාගරික ධූරාවලිය අනුව අනුරාධපුර නගරය පළමු මට්ටමේ නගරයක් ලෙස හඳුනා ගත හැකි අතර, තඹුත්තේගම, තලාව හා එප්පාවල යන නගර පිළිවෙලින් දෙවන හා තෙවන මට්ටමේ නගර ලෙස හඳුනාගත හැකිය. මෙහිදී, තඹුත්තේගම නගරය කලාපයේ අනෙකුත් නගර දෙකට සාපේක්ෂව වැඩි වශයෙන් සංවර්ධනය වී ඇත. ආර්ථික, පරිපාලන, සමාජයීය යන අංශයන්ගෙන් තඹුත්තේගම නගරය ඉදිරියෙන් සිටින අතර ප්‍රදේශයේ ප්‍රධානතම වාණිජ, සේවා හා ආර්ථික මධ්‍යස්ථානය ලෙස මෙම නගරය ක්‍රියාත්මක වෙනු ලබයි. පවත්නා තත්ත්වය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ඉඩකඩ මෙම සංවර්ධන සැලැස්ම මඟින් සකස් කරනු ලබයි.

තලාව නාගරික ප්‍රදේශය ප්‍රධාන වශයෙන්ම පරිපාලන කටයුතු සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙන අතර, යෝජිත නගර සංවර්ධන සැලැස්ම මඟින් ද එම නාගරික ප්‍රදේශය පරිපාලන කටයුතු වෙනුවෙන් සුවිශේෂී වූ ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අදහස් කරනු ලබයි. ඊට හේතුවක් වන්නේ ප්‍රදේශයේ පරිපාලන කටයුතු හා බැඳි රාජ්‍ය ආයතන රැසක් තලාව ප්‍රදේශයේ පිහිටා තිබීමයි. එමඟින් මහඟු සේවයක් ප්‍රදේශයේ ජනතාවට ලබා දෙනු ලබන අතර, මෙම තත්ත්වය වර්ධනය කරමින් ඉතාමත් සුව පහසු සහ ආරක්ෂාකාරී වටපිටාවක් සහිත ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි.

එප්පාවල නගරයද පවත්නා සම්පත් මනා ලෙස උපයෝගී කර ගනිමින් ප්‍රදේශයේ ආවේණිකත්වය විදහා දැක්වෙන පරිදි හා එම ප්‍රදේශය තුළ පවතින සම්පත් වලින් උපරිම ඵල ප්‍රයෝජන ලබා ගැනීමට හැකි පරිදි සංවර්ධනය කිරීමට අදහස් කරනු ලබයි. එහිදී ප්‍රධාන වශයෙන්ම කර්මාන්ත හා බැඳි ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉඩකඩ සකස් කරනු ලබයි. එප්පාවල


පොස්පේට් නිධිය හා සම්බන්ධ වූ කර්මාන්ත ඇති කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති හා උපාය මාර්ගික සැලසුම් මෙම ප්‍රදේශය තුළ  ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලබන අතර, කෘෂි නිෂ්පාදනයන් වල අතුරු ප්‍රතිඵල යොදා ගනිමින් හා කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ කර්මාන්තශාලාවන් මෙම ප්‍රදේශය තුළ ස්ථාපනය කිරීම මගින් ප්‍රදේශය කර්මාන්ත සඳහා වෙන් වුන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අදහස් කරනු ලබයි.

තවද, ප්‍රධාන මහා මාර්ග තුන යොදා ගනිමින් මනා ආකාරයෙන් සම්බන්ධතාවක් පවතින ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, එම නගර හරහා ගමන් කරනු ලබන ඍජු රේඛා මගින් මාර්ග නිරූපණය කරනු ලබයි.  මෙම මාර්ග මගින් ප්‍රදේශයේ පවතින ප්‍රධාන නගර තුනට අමතරව ප්‍රදේශයට පරිබාහිරව පිහිටි නගර වන අනුරාධපුර, කුරුණෑගල, නොච්චියාගම, කැකිරාව යනාදී නගර සමඟ මනා සම්බන්ධතාවයක් ඇති නාගරික ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කරනු ලබයි. ප්‍රධාන නගර තුන සම්බන්ධවන මාර්ග රතු හා තැඹිලි වර්ණ වලින් යුත් රේඛා මගින් පෙන්නුම් කර ඇත.

තවද, සමස්ත ප්‍රදේශයෙන් 50% කට අධික ප්‍රමාණයක් කෘෂි බිම් සඳහා වෙන්ව පවතින අතර නාගරික ප්‍රදේශයේ පවතින එම කෘෂිබිම් ආවරණය වන ලෙසට එම ප්‍රදේශ ආරක්ෂාකාරී ප්‍රදේශයන් ලෙස සංවර්ධනය කිරීමට අරමුණු කරනු ලබයි. ප්‍රදේශය අභ්‍යන්තරයේ පවතින කොළ පැහැති වර්ණයෙන් යුත්  වෘත්තය මගින් එම තත්ත්වයන් නිරූපණය කර ඇත. එමෙන්ම සමස්ත භූමි පරිහරණ රටාවන් 7% ක තරම් වූ ප්‍රමාණයක් ජලජ ප්‍රදේශ සඳහා වෙන්ව පවතින අතර, එම ප්‍රදේශයන් කෘෂි බිම් වලින් ආවරණය වී ඇත.  රූපසටහන් අංක 30 හි අභ්‍යන්තරයේ පවතින නිල් පැහැති වෘත්තය මගින් එය නිරූපණය කරනු ලබන අතර, මෙකී ජලජ ප්‍රදේශ ආරක්ෂාකාරී වූ ප්‍රදේශයන් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සහ උපක්‍රම සකස් කිරීම මෙම සැලැස්මේ අදහසයි.

ප්‍රදේශය සතු වැදගත් සම්පතක් වන නේවාසික ප්‍රදේශ පවතින්නේද නීල හරිත භූමි පරිහරණ රටාවන්ගෙන් ආවරණය වූ ප්‍රදේශයන් ලෙසය. එය කහ පැහැති වර්ණයෙන් දක්වා ඇති අතර, මෙම සංවර්ධන සැලැස්ම මගින් එම ප්‍රදේශ හා පාරිසරික සංවේදී ප්‍රදේශ අතර තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීමට කටයුතු කරනු ලබයි. මේ ආකාරයෙන් ප්‍රධාන නගර නේවාසික ප්‍රදේශ, කෘෂි බිම් හා අනෙකුත් ප්‍රදේශ අතර පවතින අන්‍යෝන්‍යය සම්බන්ධතාවය අභ්‍යන්තරයේ පවතින ඊතල මගින් පෙන්නුම් කරනු ලබන අතර, මෙහි සඳහන් සියළු අංශ සමඟ මනා සම්බන්ධයක් සහිත තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම මගින් ප්‍රදේශය තිරසාර ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබයි.

**රූපසටහන් අංක 29 සංකල්පිත සැලැස්ම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

## 6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම


තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය තලාව ප්‍රදේශය හරහා එප්පාවල ප්‍රදේශය දක්වා විහිදෙන ආකාරය එම ප්‍රදේශය සඳහා කරනු ලැබූ විශ්ලේෂණ මගින් තහවුරු වේ. සමස්තයක් ලෙස ගත් විට ප්‍රදේශයේ ජනාවාස හා නාගරික ප්‍රදේශ නීල හරිත භූමි පරිහරණ රටාවන්ගෙන් ආවරණය වී ඇති අතර, මෙම ප්‍රදේශ සඳහා භූමි පරිහරණ උපක්‍රම සකස් කිරීමේදී පහත අංශ වැඩිදියුණු වන ලෙස හා ආරක්ෂා වන අයුරින් විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ලබයි.

- පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම.
- තඹුත්තේගම නගරය ප්‍රධානතම ආර්ථික ප්‍රදේශය ලෙස වැඩිදියුණු කිරීම.
- එප්පාවල නගරය කෘෂිකර්මාන්තය හා බැඳි කර්මාන්ත පවතින ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම.
- ප්‍රදේශය තුල හා ඉන් පිටත ඉතාමත් සුව පහසු හා ආරක්ෂාකාරී පරිසරයක් ඇති කිරීම.

මේ අනුව, තඹුත්තේගම නගරය කෘෂි ආර්ථිකයකින් පෝෂණය වූ ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාවන් ඇති කරනු ලබයි. මේ සඳහා තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම, නවීන කෘෂි තාක්ෂණය ගොවීන්ට ලබාගත හැකි ස්ථාන සංවර්ධනය කිරීම, පුහුණු ශ්‍රමිකයන් නිර්මාණය කිරීමට අවශ්‍ය ඉඩකඩ සකස් කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කරගනු ලබන අතර, තලාව ප්‍රදේශය තුල පවතින පාසැල්, රෝහල් හා අනෙකුත් සේවා සපයනු ලබන රාජ්‍ය අංශද ඇතුලත් වූ පරිපාලන කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කරනු ලබයි. තවද, ප්‍රදේශයේ ජනතාවට ඉතා පහසුවෙන් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට හැකි වන පරිදි ප්‍රදේශයේ ප්‍රවාහන පද්ධතිය හා අදාල අංශ සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, ප්‍රදේශය තුල පවතින නීල හරිත භූමි පරිහරණ රටාවන් ජනතාවට ස්වභාව සෞන්දර්ය විඳිය හැකි ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි.

මෙයට අමතරව ප්‍රදේශයට මුහුණදීමට සිදුවන වන අලි තර්ජනයන්ගෙන් සිදුවන බලපෑම අවම කිරීමට හැකි වන පරිදි ප්‍රදේශය සකස් කිරීමට යෝජනා කරනු ලබන අතර, එමඟින් නේවාසිකයන්ට හා නගරයට පිටතින් පැමිණෙන ජනතාවට ද ඉතාමත් සුව පහසු හා ආරක්ෂාකාරී වටපිටාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය ඉඩකඩ මෙම සංවර්ධන සැලැස්ම තුලින් සකස් කරනු ලබයි.

**රූපසටහන් අංක 30 යෝජිත භූමි පරිහරණ සැලැස්ම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

## 6.3 සමාජයීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

### 6.3.1 සමාජයීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

තලාව ප්‍රදේශයේ සංවර්ධන මට්ටම ඉහළ නැංවීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධානතම උපාය මාර්ගයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. මෙම උපාය මාර්ගය යටතේ මාර්ග සංවර්ධනය, ප්‍රවාහන මධ්‍යස්ථාන සංවර්ධනය, රථවාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධනය, ජලය හා විදුලිය යන සේවා අංශ සංවර්ධනය, කැලිකසළ කළමනාකරණය යනාදී අංශ පිළිබඳ අවධානය යොමු කරනු ලබයි.

මෙහිදී විශේෂයෙන්ම ප්‍රවාහන අංශය ඉතා මැනවින් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, එමගින් ප්‍රදේශයේ ප්‍රවාහන අංශය ශක්තිමත් කිරීමටත්, කාර්යක්ෂම කිරීමටත්, ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමටත්, යෝජිත කර්මාන්ත හා සේවා ප්‍රදේශ ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාගැනීම අපේක්ෂා කරනු ලබයි.

තවද, ප්‍රදේශයේ පවතින ජල මූලාශ්‍ර මනා ලෙස උපයෝගී කර ගනිමින් වර්ෂ 2033 වන විට වැඩිවනු ඇතැයි බලාපොරොත්තු වන ජනගහනයට අවශ්‍ය පානීය ජල පහසුකම් ලබාදීමටත්, තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රදේශයට පැමිණෙන ජනතාවට අවශ්‍ය ජල පහසුකම් සපයාදීමටත්, ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරනු ලබන විදුලි බලය වැනි අංශ පිළිබඳ අවධානය යොමු කර ඇත.

එමෙන්ම, ප්‍රදේශය තුල දිනපතා එකතු වන කැලිකසළ කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය උපක්‍රම සකස් කිරීමට යෝජනා කරනු ලබන අතර, ආර්ථික මධ්‍යස්ථානයෙන් හා අනෙකුත් ප්‍රදේශ වලින් දිනපතා එකතු වන දිරන හා නොදිරන කසළ ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකිවන පරිදි යොදා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට බලාපොරොත්තු වේ. අවසාන වශයෙන් ප්‍රදේශයේ භෞතික හා යටිතල පහසුකම් නිසි ලෙස සංවර්ධනය වූ හා එමගින් ප්‍රදේශයේ මෙන්ම රටේ ආර්ථිකයටද විශාල දායකත්වයක් ලබාදෙන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් හා උපක්‍රම සකස් කිරීමට අදහස් කර ඇත.

*6.3.1.1 සෞඛ්‍ය සේවා සැලැස්ම*

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතුව රෝහල් 04 ක් පවතින අතර, එය ප්‍රධාන නගර 03 කේන්ද්‍ර කර ගනිමින් හා කටියාව ප්‍රදේශයේ එක් ග්‍රාමීය රෝහලක් වශයෙන් පිහිටා ඇත. එහිදී විශේෂයෙන්ම තඹුත්තේගම රෝහල තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධානතම රෝහල ලෙස ක්‍රියාකරනු ලබන අතර, ප්‍රදේශයේ ජනතාවට මෙන්ම ප්‍රදේශයට පරිබාහිරින් ජීවත්වන ජනතාවට ද විශාල සේවාවක් ලබාදෙයි. එහිදී විශේෂයෙන්ම අනුරාධපුර රෝහලේ පවතින තදබදය හේතුවෙන් බොහෝ පිරිසක් තමාගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා මෙම රෝහල වෙත පැමිණෙන බැවින්, මෙම රෝහල හා එප්පාවල, තලාව පිහිටි අනෙකුත් ප්‍රධාන රෝහල් 02 සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ද පවතී. කටියාව රෝහල ද බෙහෙත් ශාලාවක් ලෙස ක්‍රියාත්මක වන බැවින්, එහි දායකත්වය ද ප්‍රදේශයේ අවශ්‍යතාවය මත වැඩිදියුණු කල යුතුය.

එකී අවශ්‍යතා හේතුවෙන් තඹුත්තේගම රෝහලෙහි පවතින පහසුකම් ඉහළ නැංවීමට යෝජනා කරන අතර, එහිදී කුඩා ශල්‍යාගාරයක් සංවර්ධනය කිරීම, රෝහල් භූමියේ පවතින අභ්‍යන්තර මාර්ග සංවර්ධනය, වෛද්‍යවරුන්ගේ නේවාසික කටයුතු සඳහා වෙනම නේවාසික ස්ථානයක් සංවර්ධනය කිරීම යෝජනා කරනු ලබයි. මෙහිදී විශේෂයෙන්ම තඹුත්තේගම රෝහල තුල හෙද විදුහලක් ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබන අතර, එමගින් රෝහලේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව ඉහළ නැංවීමටත්, පුහුණු ශ්‍රමිකයන් ලෙස හෙදියන් විදේශගත කිරීමටත්, එමඟින් මහඟු අවස්ථාවක් උදා වේ. ප්‍රදේශයේ පවතින අනෙකුත් රෝහල් සඳහාද, එම සේවාව ලබාදීමේ හැකියාවක් පවතින බැවින්, හෙද විදුහලක් තඹුත්තේගම රෝහල තුළ ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත හැකිය.

මෙයට අමතරව රෝහල් භූමිය තුල රථගාලක් ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබන අතර, සේවා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පැමිණෙන ජනතාවට මෙන්ම රෝහල් කාර්යය මණ්ඩලයට ද එමගින් විශාල පහසුවක් සැලසෙයි.

එමෙන්ම එප්පාවල හා තලාව රෝහල් සංවර්ධනය කිරීමට ද යෝජනා කරනු ලබන අතර, රෝහල් පරිශ්‍රයේ රථගාල් සංවර්ධනය කිරීම, අභ්‍යන්තර මාර්ග සංවර්ධනය, කුඩා ශල්‍ය කර්ම සඳහා ස්ථානයක් සංවර්ධනය කිරීම යනාදී සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන ඇත. එමඟින් ප්‍රදේශයේ ජනතාවට තම සෞඛ්‍ය අවශ්‍යතා ඉතා පහසුවෙන් හා කාර්යක්ෂමව ඉටු කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබාදීම අපේක්ෂා කරනු ලබයි.

**සිතියම් අංක 27 සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන රෝහල්**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

*6.3.1.2 අධ්‍යාපන සේවා සැලැස්ම*

සංවර්ධනයේදී ප්‍රධාන දර්ශකයක් ලෙස අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීම දැක්විය හැකිය. මෙහිදී සමස්ත ප්‍රදේශය පුරාම පාසැල් ප්‍රමාණවත් අයුරින් ව්‍යාප්තව පවතින අතර, අනාගතයේදී වැඩිවිය හැකි යැයි අපේක්ෂිත ජනගහනයට සාපේක්ෂව පාසැල්වල පවතින සම්පත් සංවර්ධනය කිරීම සිදු කල යුතුව ඇත. එහිදී ප්‍රධාන වශයෙන්ම ප්‍රදේශය පුරා පාසැල් 38 ක ප්‍රමාණයක් විහිදී පවතින අතර, එම පාසැල් වලට අවශ්‍ය පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් පරිගණක හා විද්‍යාගාර පහසුකම් ප්‍රමාණවත් පරිදි වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යෝජනා මෙම සංවර්ධන සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇත.

**සිතියම් අංක 28 සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන පාසැල්**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 6.3.2 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

තලාව ප්‍රදේශයේ සංවර්ධන මට්ටම ඉහළ නැංවීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධානතම උපාය මාර්ගයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. මෙම උපාය මාර්ගය යටතේ රථවාහන සඳහා සේවා සැපයුම් ස්ථාන සංවර්ධනය, රථවාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධනය, ජලය, විදුලිය ප්‍රමාණාත්මකව සැපයීම, කැලිකසළ කළමනාකරණය යනාදී අංශ පිළිබඳ අවධානය යොමු කරනු ලබයි.

මෙහිදී විශේෂයෙන්ම ප්‍රවාහන අංශය ඉතා ශක්තිමත්ව සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, කාර්යක්ෂම ප්‍රවාහන ක්ෂේත්‍රයක් තුලින් ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමටත්, යෝජිත කර්මාන්ත හා සේවා ප්‍රදේශ ඉතා හොඳින් ක්‍රියාත්මක වීම සඳහාත් අවශ්‍ය දායකත්වය ලබාගැනීම අපේක්ෂා කරනු ලබයි.

තවද, ප්‍රදේශයේ පවතින ජල මූලාශ්‍ර මනා ලෙස උපයෝගි කර ගනිමින් වර්ෂ 2033 වන විට අපේක්ෂිත ජනගහනයට අවශ්‍ය පානීය ජල පහසුකම් ලබාදීමටත්, ප්‍රදේශයට පැමිණෙන ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීමටත්, ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරනු ලබන විදුලි බලය ලබාගැනීමටත් අවධානය යොමු කර ඇත.

එමෙන්ම දිනකට එකතු වන කැලිකසළ කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය උපක්‍රම සකස් කිරීමට යෝජනා කරනු ලබන අතර, ආර්ථික මධ්‍යස්ථානයෙන් හා අනෙකුත් ප්‍රදේශ වලින් දිනපතා එකතු වන දිරන හා නොදිරන කසළ, ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකිවන පරිදි යොදා ගැනීමට අවශ්‍ය සැලසුම් මෙමගින් සකස් කිරීමට බලාපොරොත්තු වෙයි. සමස්තයක් ලෙස ප්‍රදේශයේ භෞතික හා යටිතල පහසුකම් මනා ලෙස සංවර්ධනය හා එමගින් ප්‍රදේශයේ මෙන්ම රටේ ආර්ථිකයටද විශාල දායකත්වයක් ලබාදිය හැකි පරිදි සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් හා උපක්‍රම මෙමගින් සකස් කරනු ලබයි.

#### *6.3.2.1 මාර්ග සංවර්ධන සැලැස්ම*

මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉහළ නැංවීමටද සංවර්ධන සැලැස්මේ දැක්ම ලභා කර ගැනීමටද ප්‍රබලම දායකත්වයක් ලබාදෙන අතර, ඒ යටතේ ප්‍රධාන මාර්ග හා අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කර ඇත.

ප්‍රධාන මාර්ග වලින් මනා ලෙස සම්බන්ධ වී ඇති තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ A 28 මාර්ගය මගින් අනුරාධපුර හා කුරුණෑගල යන ප්‍රධාන මට්ටමේ නගරත් B 213 හා B 117 යන මාර්ග මගින් තලාව හා එප්පාවල මෙන්ම තඹුත්තේගම එප්පාවල යන නගරත් අතර සෘජු සම්බන්ධතාවයක් වර්ධනය කර ඇත.


ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය ඉතාමත් සක්‍රීය ආකාරයෙන් පවත්වාගෙන යාමට මෙම ප්‍රධාන මාර්ග පද්ධතිය ඉතා ඉහළ දායකත්වයක් ලබාදෙයි. අභ්‍යන්තරයේ පවතින මාර්ග ද ක්‍රමයෙන් මෙම ප්‍රධාන මාර්ග හා සම්බන්ධ වන අතර, එමඟින් තමාගේ ප්‍රවාහන අවශ්‍යතා ඉතා කඩිනම්ව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමේ හැකියාව ජනතාවට උදා වේ. මාර්ග වල ඇති දුර්වලතා මත තඹුත්තේගම සිට එප්පාවල නගරයට ගමන් කරන ජනතාවට ප්‍රවාහනයේදී දැඩි දුෂ්කරතා වලට මුහුණදීමට සිදු වී ඇත.

කෘෂි ආර්ථිකය පදනම් කරගත් ජනතාව, තම කෘෂි නිෂ්පාදනයන් වෙළඳපල කරා ප්‍රවාහනය කිරීමේදී අබලන් මාර්ග පද්ධතිය හේතුවෙන් විනාශයට ලක් වන කෘෂි නිෂ්පාදන වල ප්‍රමාණය ඉහළ අගයක් ගනී.

තවද, මෙම සංවර්ධන සැලැස්ම මගින් එප්පාවල ප්‍රදේශයේ පොස්පේට් ආශ්‍රිත කර්මාන්ත ශාලා හා කෘෂි නිෂ්පාදනයන් යොදා ගනිමින් විවිධ අතුරු නිෂ්පාදනයන් කල හැකි කර්මාන්ත ශාලා ඇති කිරීමට යෝජනා කරනු ලබන අතර, එම කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා මෙම ප්‍රධාන මාර්ග භාවිතා කිරීමට යෝජිත බැවින් ප්‍රධාන මාර්ග සංවර්ධනය ද උප ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත හැකිය.

ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග පමණක් නොව අභ්‍යන්තර මාර්ග ද සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, මෙහිදී ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට පහසුවෙන් තමාගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කර ගැනීමටත්, කෘෂි ජීව ගුණය ආරක්ෂා වන අයුරින් කෘෂි නිෂ්පාදන වෙළඳපොළ කරා කාර්යක්ෂමව ප්‍රවාහනය කිරීමටත්, හැකි වන පරිදි සමස්ත ප්‍රදේශයම ආවරණය වූ අභ්‍යන්තර මාර්ග ජාලය සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, සංවර්ධන සැලැස්මේ දැක්ම හා අරමුණු කරා ලහා වීමට එමගින් අදහස් කරයි.


**රූපසටහන් අංක 31** **සංවර්ධනය කිරීමට යෝජිත ප්‍රධාන මාර්ග**


අනුරාධපුර
තලාව
A 9
A 13
A 9
A 13
A 9
A 13

*6.3.2.2 රථගාල් හා මාර්ගස්ථ මගී පහසුකම් සංවර්ධන සැලැස්ම*

වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීමද ප්‍රදේශයේ ප්‍රවාහන අංශය ශක්තිමත් කිරීමට අවශ්‍ය එක් අංගයක් ලෙස පෙන්වා දිය හැකිය. මෙහිදී ප්‍රධාන නගර 03 කේන්ද්‍ර කර ගනිමින්, මෙම නගරවල ඉහළ ඝනත්වයක් ඇති ප්‍රදේශ තුල සහ ඉදිරියේදී ක්‍රියාකාරී ප්‍රදේශ ලෙස හඳුනාගත් ස්ථාන තුල , මෙම රථගාල් අනෙකුත් සේවා පහසුකම් ද ලබාගත හැකි ලෙස සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කෙරේ. තලාව නගරය ආවරණය වන පරිදි, යෝජිත දුම්රිය ස්ථානය අසල, බස් නැවතුම් පල තුළ හා ඒ අසල ද, පොළ භූමිය තුළ හා අසල ද , දුම්රිය මාර්ග රක්ෂිතය දෙපස, ආයුර්වේද මධ්‍යස්ථානය ඉදිරිපිට, තලාව ජාතික පාසල ඉදිරිපිට තඹුත්තේගම නගරයේ පවතින හා යෝජිත ආර්ථික මධ්‍යස්ථානය හා ඒ ආසන්නයේද , යෝජිත සේවා පහසුකම් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි. තවද, එප්පාවල ප්‍රදේශයේ තෝරා ගත් ස්ථාන වලද, මෙම රථවාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කෙරේ.

**රූපසටහන් අංක 33 යෝජිත රථගාල් සංවර්ධන ස්ථාන**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

*6.3.2.3 ප්‍රවාහන මධ්‍යස්ථාන සංවර්ධන සැලැස්ම*

එමෙන්ම නාගරික ප්‍රදේශය තුල පවතින ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමට යෝජනා කරන අතර, මෙහිදී අබලන් තත්ත්වයේ පවතින තලාව බස්නැවතුම්පලෙහි නව ගොඩනැගිලි ඇතුළුව නව වෙළඳසැල් සංවර්ධනය කිරීමටත්, ඒ හා සමගාමීව වාණිජ කටයුතු පවත්වාගෙන යාම සඳහා වෙළඳසැල් ඉදිකිරීමටත්, තඹුත්තේගම ප්‍රදේශයේ අඩක් නිම වූ, පවතින බස්නැවතුම්පල හා ඒ හා සම්බන්ධ කරමින් වාණිජ කටයුතු සංවර්ධනය කිරීමටත් යෝජනා ඉදිරිපත් කරනු ලබයි.

**රූපසටහන් අංක 34 සංවර්ධනය කිරීමට යෝජිත තඹුත්තේගම බස්නැවතුම්පල**









මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 35** **සංවර්ධනය කිරීමට යෝජිත තලාව බස්නැවතුම්පල**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 36** **යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය - තලාව**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022


යෝජිත ප්‍රදේශය තුල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේදී ප්‍රදේශයට ඉහළ වටිනාකමක් ඇතිවන පරිදි සංවර්ධනය කිරීම තුලින් කලාපයේ වැඩි අවධානයක් මෙන්ම සංවර්ධන විභවතාවයක් සහිතව මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමේ හැකියාව පවතී.

මෙකී හේතු සාධක සැලකිල්ලට ගනිමින් හා ප්‍රදේශයේ මහජනතාවට ඉතාමත් සුව පහසු ආරක්ෂාකාරී හා විකල්ප අවස්ථා සලසන ප්‍රවාහන සේවයක් ලබාදීමේ අරමුණු ඇතිව හා සංවර්ධන සැලැස්මේ

දැක්ම හා අරමුණු ළඟා කර ගැනීම සඳහා තලාව නාගරික ප්‍රදේශයේ දැනට පවත්නා බස්නැවතුම්පල දුම්රිය ස්ථානය දක්වා රැගෙන යාමත් ඒ අනුව, එම ස්ථානය සංවර්ධනය කිරීමටත් අපේක්ෂා කෙරේ. තලාව බස්නැවතුම හා තලාව දුම්රිය ස්ථානය අතර මීටර් 500 කට වඩා වැඩි දුරක් පවතින බැවින්, මෙම ප්‍රවාහන මාධ්‍ය උපයෝගී කර ගන්නා මගීන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙයි. එබැවින්, කලාපයේ ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස තලාව ප්‍රදේශය මේ ආකාරයෙන් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, මෙමගින් නිෂ්පාදන කර්මාන්ත ශාලා සඳහා අදාල යෙදවුම් අඩු කාලයකින් ප්‍රවාහනය කර ගැනීමත්, එම නිෂ්පාදනයන් ලංකාව පුරා ඉතා පහසුවෙන් සහ අඩු කාලයකින් බෙදා හැරීමත්, අරමුණු කෙරේ.

එප්පාවල ප්‍රදේශයේ ජනතාවට ද තමාගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා බස්නැවතුම්පලක් නොමැති වීම ප්‍රධාන ගැටළුවක් ලෙස දැක්විය හැකිය. මෙහිදී අනුරාධපුර සිට මහනුවර දක්වා සහ අනුරාධපුර සිට කැකිරාව දක්වා ගමන් කරනු ලබන බස් රථ වැඩි ප්‍රමාණයක් තලාව - එප්පාවල හරහා ගමන් කර, අදාල ගමනාන්තයන් කරා ළඟා වේ. නමුත් මේ ආකාරයෙන් බස්රථ ගමන් කරන ප්‍රදේශයක් ලෙස එප්පාවල නාගරික ප්‍රදේශය හඳුනා ගත හැකි වුවද, එම ප්‍රදේශයෙන් ගමන් පහසුකම් ලබාගන්නා මගීන් සඳහා බස්නැවතුම්පලක් නොමැති වීම දුර්වලතාවයක් ලෙස පෙන්වා දිය හැකිය. වර්තමානය වන විට එප්පාවල - කැකිරාව මාර්ගයේ එක් ස්ථානයක බස්රථ නැවැත්වීම සිදු කරනු ලබන අතර, බස්නැවතුම්පලක් සංවර්ධනය කිරීම සඳහා එම ස්ථානය යෝජනා කර ඇත්තේ සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ළඟාවීම අරමුණු කරගෙනය.

**රූපසටහන් අංක 37** **යෝජිත බස් නැවතුම්පල - එප්පාවල**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

*6.3.2.4 ජල සම්පාදන සැලැස්ම*

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා ජල සම්පාදන සැලැස්ම ද අත්‍යවශ්‍ය වේ. මෙහිදී සමස්ත ප්‍රදේශයේම ප්‍රධාන නාගරික කලාප 03, එනම් තලාව, තඹුත්තේගම, එප්පාවල යන නාගරික ප්‍රදේශ පමණක් ආවරණය කර ගනිමින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජල පහසුකම් ලබාදී ඇත.

නමුත් ප්‍රදේශයේ ජලයේ පවතින ලවණතාවය හේතුවෙන් පානීය ජල පහසුකම් ලබාදීම අත්‍යවශ්‍ය අංගයක් ලෙස සඳහන් කල හැකිය. ජල නල පහසුකම් නොමැති ප්‍රදේශවල ජනතාව තමාගේ පානීය ජල පහසුකම් සපුරාගනු ලබන්නේ ප්‍රදේශය පුරා පැතිර පවතින ළිං භාවිතා කරමින් වන අතර, එහිදී එම ජනතාවට වකුගඩු රෝග හා දන්ත රෝග වැනි විවිධ රෝග වලට ලක්වීමට ද සිදු වේ.

මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා ප්‍රදේශයම ආවරණය වන පරිදි නල ජල පහසුකම් ලබාදීමට යෝජනා කරනු ලබන අතර, පහතින් දැක්වෙන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් විවිධ ව්‍යාපෘති යටතේ ප්‍රමාණවත් අයුරින් පානීය ජල පහසුකම් ලබාදීමට සැලසුම් කර ඇති ආකාරයයි.

**වගුව 13 යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති**

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාශය** | **ග්‍රාම නිලධාරී වසම් අංකය** | **පවුල් සංඛ්‍යාව** | **ජල පරිමාව ($m^3$)** | **ජල ව්‍යාපෘතිය** |
|---|---|---|---|---|---|
| **තලාව** | අදිරාණිගම | 397 | 495 | 347 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | ඉහළ සියඹලෑව | 390 | 576 | 403 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | පලුගස්වැව | 391 | 691 | 484 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කදුරුගස්වැව | 389 | 343 | 240 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කටියාව යාය 06 | 383 | 635 | 445 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කටියාව යාය 09 | 384 | 552 | 386 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කැලේදිවුල්වැව | 379 | 340 | 238 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කටියාව යාය 10 | 385 | 384 | 269 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තලාව | කටියාව යාය 10 | 385 | 384 | 269 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කටියාව යාය 02 | 387 | 232 | 162 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කැලෑසියඹලාව | 380 | 424 | 297 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කටියාව යාය 01 | 386 | 593 | 415 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | ගල්වඩුවාගම | 394 | 345 | 242 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | ඇඳගල | 393 | 482 | 337 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | ඉහළගම | 382 | 368 | 258 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | මැඩියාව | 392 | 292 | 204 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කඩිගාව | 374 | 374 | 262 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | ගල්මඩුව | 378 | 294 | 206 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | ඉහළ හල්මිල්ලෑව | 395 | 307 | 215 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | මැදගම | 381 | 453 | 317 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කිරිඅමුණුකොලේ | 375 | 500 | 350 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | රජල්ලේගම | 396 | 316 | 221 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | එළියදිවුල්වැව | 388 | 546 | 382 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | එප්පාවල | 373 | 608 | 426 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කැටකැලේ | 399 | 483 | 338 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | නල්ලමුදාව | 376 | 406 | 284 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කිරලගම | 398 | 483 | 338 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | මාවතවැව | 377 | 348 | 244 | එප්පාවල සහ ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | මීගස්සේගම | 400 | 475 | 333 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කුරුඳුවැව | 403 | 577 | 404 | තුරුවිල ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| තලාව | කොරකහවැව | 402 | 254 | 178 | අනුරාධපුර දකුණ අදියර II |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | හිරිගොල්ලේගම | 411 | 617 | 432 | අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | ඉහළ තලාව | 404 | 703 | 492 | තුරුවිල ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කරගහවැව | 406 | 732 | 512 | තුරුවිල ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | නව හඟුරන්කෙත | 409 | 537 | 376 | අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | හිහරුවැව | 401 | 326 | 228 | තුරුවිල ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | කුඹුක්ගහවැව | 410 | 515 | 361 | අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | මොරගොඩ | 405 | 544 | 381 | තුරුවිල ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | දළදාපුර | 408 | 243 | 170 | අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තලාව** | පහළතලාව | 407 | 360 | 252 | අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | දෙල්නේගම | 436 | 391 | 274 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | කුඩා බෙල්ලන්කඩවල | 437 | 350 | 245 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | සෝලම | 434 | 347 | 243 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | මහ බෙල්ලන්කඩවල | 435 | 491 | 344 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | වැලියාව | 414 | 371 | 260 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | හුරිගස්වැව | 412 | 366 | 256 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | හැලඹවැව | 413 | 272 | 190 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | මුදුන්ගොඩ | 416 | 470 | 329 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | මකුලෑව | 415 | 412 | 288 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | තම්මැන්නාව | 417 | 548 | 384 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| **තඹුත්තේගම** | තිස්පනේපුර | 428 | 268 | 188 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | හුරිගස්වැව | 412 | 366 | 256 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | හැලඹවැව | 413 | 272 | 190 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | මුදුන්ගොඩ | 416 | 470 | 329 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | මකුලැව | 415 | 412 | 288 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | තම්මැන්නාව | 417 | 548 | 384 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | තිස්පනේපුර | 428 | 268 | 188 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | ඉකිරිවැව | 419 | 1025 | 718 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | මුසල්පිටිය | 420 | 506 | 354 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | තඹුත්තේගම | 418 | 565 | 396 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | තෙල්හිරියාව | 427 | 502 | 351 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | නල්ලච්චිය | 421 | 782 | 547 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | ගල්විහාරවැව | 429 | 380 | 266 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | වැලියාව | 426 | 610 | 427 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | තම්මැන්නාගම | 424 | 1012 | 708 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | ජයසිරිගම | 423 | 272 | 190 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | ලුණුවැව | 422 | 359 | 251 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | කෝන්වැව | 425 | 544 | 381 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | පහලගම | 432 | 458 | 321 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | ඒරියාව | 430 | 360 | 252 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | කැලෑගම | 433 | 495 | 347 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය |
| **තඹුත්තේගම** | කෝන්ගොල්ලෑව | 431 | 773 | 541 | තුරුවිල ජලසම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |

මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2022

*6.3.2.5 විදුලිබල සැපයුම් සැලැස්ම*

අඛණ්ඩ විදුලි සැපයුම නාගරික ක්‍රියාවලීන් ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන අතර, තලාව නගරයේ ද විදුලිය අඛණ්ඩව සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම ඉතා වැදගත් වේ. ලංකා විදුලිබල මණ්ඩලයේ දත්ත අනුව නගරයේ විදුලි පරිභෝජනය දිනකට 6.32 MW ක් පමණ වේ.


වර්තමානය වන විට මෙම විදුලි සැපයුම ප්‍රමාණවත් බව විදුලි බල මණ්ඩලය හඳුනාගෙන ඇති අතර, වර්ෂ 2033 වන විට මෙම ප්‍රදේශය සඳහා විදුලි බල ඉල්ලුම දිනකට 8.42 MW ක් ලෙස ගණන් බලා ඇත. නමුත් මේ ආකාරයෙන් දිනකට වැඩිවන 2.1 MW ක ප්‍රමාණය ලබාගැනීම සඳහා විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම විදුලි බල මණ්ඩලය මගින් මෙතෙක් හඳුනාගෙන නොමැත.

එබැවින් මෙම සංවර්ධන සැලැස්ම මගින් 2033 වන විට අවශ්‍ය යැයි ගණන් බලා ඇති විදුලි සැපයුම සපුරා ගැනීමට සංවර්ධන යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි. එහිදී විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්තිය භාවිතා කරමින් ප්‍රදේශය සඳහා අවශ්‍ය කරනු ලබන විදුලි බලය ලබාගැනීමට අවශ්‍ය පසුබිම මෙම සංවර්ධන සැලැස්ම මගින් සකස් කරනු ලබයි.

*6.3.2.6 මළාපවහන හා අපජල කළමනාකරණ සැලැස්ම*

ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉහළ නැංවීම සඳහා මෙන්ම අනාගතයේදී අපේක්ෂා කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් මනා අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මළාපවහන හා අප ජල කළමනාකරණ සැලැස්මක් යෝජනා කරනු ලබයි. මෙහිදී තඹුත්තේගම ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් මෙම මළාපවහන හා අප ජල කළමනාකරණ සැලැස්ම යෝජනා කරනු ලබන අතර, එහිදී වර්ෂ 2033 වන විට මෙම ප්‍රදේශය තුල භූමි පරිහරණ රටාවේ කැපී පෙනෙන වෙනසක් හා 20 500 ක් තරම් ජනගහනයක් අපේක්ෂා කරනු ලබයි. ප්‍රධාන වශයෙන්ම වාණිජ කටයුතු සඳහා 60% ක් ද නේවාසික කටයුතු සඳහා 30% ක් හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා 10% ක් ලෙස, ප්‍රදේශයේ සමස්ත භූමි පරිහරණ රටාවේ වෙනසක් අපේක්ෂා කරනු ලබයි.

**සිතියම් අංක 29 මලාපවහන හා අපජලය කළමනාකරණ සැලැස්ම - යෝජිත ප්‍රදේශ 2022**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

*6.3.2.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම*

ගෘහස්ථ, හා වාණිජ කටයුතු කාර්මික හා කෘෂිකාර්මික කටයුතු වලදී මෙන්ම අනෙකුත් පොදු කටයුතු වලදී ද ජනිත වන ද්‍රවමය නොවන ද්‍රව්‍යයන්, ඝන අපද්‍රව්‍ය ලෙස සලකනු ලැබේ. ආහාරමය අපද්‍රව්‍ය ඇසුරුම් වශයෙන් ඉවත් කරන කඩදාසි, ලෝහ, ප්ලාස්ටික්, වීදුරු ආදිය ද ඉවතලන රෙදි, ගෙවත්තේ ඇති අපද්‍රව්‍ය, ඉදිකිරීම් කටයුතු වලදී බැහැර කරන අපද්‍රව්‍ය, කර්මාන්ත ශාලා වලින් ඉවතලන දෑ යනාදී විවිධ කොටස් වලින් ඝන අපද්‍රව්‍ය සංයුක්ත වී ඇත. ඝන අපද්‍රව්‍ය ජනනය, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, පරිසරයට හිතකර ලෙස වෙනත් සුදුසු ක්‍රම වලට සකස් කිරීමෙන් පසු අවසාන බැහැරලීම යන කරුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි අන්තර්ගත ක්‍රියාවලීන් වේ.

සමස්තයක් ලෙස ගත් විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිනකට එකතු වන කැලිකසළ ප්‍රමාණය ටොන් 05ක් පමණ වන අතර, ඉන් වැඩි ප්‍රමාණයක් තඹුත්තේගම ප්‍රදේශයෙන් වාර්තා වේ. දිරන කසළ සේම නොදිරන කසළ ද දිනපතා මෙම ප්‍රදේශය තුළ එකතු කරනු ලබන අතර සමස්ත ප්‍රදේශයෙන්ම එකතු වන නොදිරන කසළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 500 ක් පමණ වේ. එහිදී වැඩිපුර ප්‍රමාණයක් එකතු වන්නේ තඹුත්තේගම ප්‍රදේශයෙන් වන අතර, එය දිනකට කිලෝ ග්‍රෑම් 250 ක් පමණ වේ. අනෙකුත් ප්‍රදේශ දෙක එනම් එප්පාවල හා තලාව ප්‍රදේශයන් තුළ එකතු වනු ලබන්නේ කිලෝ ග්‍රෑම් 250 ක් පමණ ඉතා අවම ප්‍රමාණයකි.

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු වන දෛනික කසළ වලට අමතරව ආර්ථික මධ්‍යස්ථානයේ දිනකට එකතුවන කැලිකසළ ප්‍රමාණය ටොන් 0.5 ක් පමණ වේ. මේ හේතුව නිසා ඔරුගලයාය කසළ අංගනයට දෛනිකව කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ප්‍රවාහනය කරනු ලබන දිරන කසළ ප්‍රමාණය ටොන් 5.5 පමණ වෙයි. ඇතැම් මාස වල මෙය කිලෝ ග්‍රෑම් 7 000 – 8 000 අතර ප්‍රමාණයක් ගනු ලබයි. තලාව නාගරික බල ප්‍රදේශයේ 2032 වසර සඳහා පුරෝකථන ජනගහනය 128 365 ක් පමණ වන අතර, එම වසර සඳහා පුරෝකථනය කරන ලද දෛනිකව ජනනය වන කසළ ප්‍රමාණය ටොන් 5.5 ක් පමණ වේ.

තලාව ප්‍රදේශයේ දිනකට සංක්‍රමණික ජනගහනය 20 000 ක් පමණ වන අතර 2033 වසර වන විට එය. 25 000 පමණ වෙතැයි පුරෝකථනය කෙරේ. සංක්‍රමණික ජනගහනය මගින් ජනනය වන දෛනික කැලිකසළ ප්‍රමාණය ඉතා සුළු ප්‍රමාණයක් වන බවට ගණනය කර ඇත.

තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණ කටයුතු ප්‍රාදේශීය සභාවේ මූලිකත්වයෙන් සිදු කරනු ලබන අතර, කසළ එකතු කිරීම ප්‍රධාන නගර 03 කේන්ද්‍ර කර ගනිමින් සිදු කරනු ලබයි. වෙළඳ සැල්, රෝහල්, කර්මාන්ත ශාලා, හෝටල්, බැංකු, ආර්ථික මධ්‍යස්ථානය ආදිය කසළ එකතු වන මූලාශ්‍ර ලෙස හඳුනාගත හැකිය.

මෙම එකතු වන කසළ ප්‍රාදේශීය සභාවට අයත් ඔරුගල යාය කසළ අංගනයට ප්‍රවාහනය කරනු ලබන අතර, එහි දිරන කසළ යොදා ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබයි. නොදිරන කසළ වෙන් කර ඒවා ප්‍රදේශයේ ආර්ථික කටයුතු වර්ධනය කිරීමට යොදා ගනු ලබයි.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන්**

තලාව ප්‍රාදේශීය සභා සීමාවේ දැනට පවතින කසළ කළමනාකරණ ක්‍රමවේදය තුළ කසළ ජනනය වීම අවම වුවද, කසළ වෙන් කොට එක්රැස් කර ගැනීම සඳහා කසළ බඳුන් සුදුසු ස්ථාන වල තැබීමත්, එම කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය භාවිතා කිරීමත් සිදු වේ. කසළ කළමනාකරණය කිරීම මගින් තලාව ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් උත්පාදනය කර ගැනීම උදෙසා ද දෛනිකව ජනනය වන කසළ ප්‍රමාණය අවම කරමින් සමස්ත බැහැර කිරීම අවම කිරීම සඳහා ද සැලසුම් සහගත ක්‍රමෝපායන් මෙම සැලැස්මෙන් හඳුනාගන්නා ලදී.

**ක්‍රමෝපාය 01** - ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම

1. ගෘහස්ථ, වෙළඳ, කාර්මික, ක්ෂේත්‍රයන්හි සහ අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම දිරිමත් කිරීම සඳහා විවිධ ක්‍රම හඳුන්වාදීම.

2. පොදු ස්ථාන හා පාසැල් තුළ දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කර ඒ හරහා මහජනයාට කසළ කළමනාකරණය පිළිබඳ පවතින 10 R වැනි සංකල්පයන් හඳුන්වා දී ඒ තුළින් ඝන අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම.

**ක්‍රමෝපාය 02** - ජනනය වන කසළ ජනනය වන ස්ථානයේදීම වෙන් කිරීම

ගෘහස්ථ, ආයතනික, වෙළඳ, කාර්මික යන සෑම අංශයකම වෙන්ව හඳුනාගත හැකි කසළ බඳුන් තැබීම. එනම්, කසළවල ස්වභාවය අනුව වර්ගීකරණය කර වෙන් කිරීම.

**වගුව 14 කසළ වර්ගීකරණයට අදාල විස්තර**

| කසළ වර්ගය | බඳුන් වර්ණය |
|---|---|
| කාබනික | කොළ |
| කඩදාසි | නිල් |
| ප්ලාස්ටික් | තැඹිලි |
| ලෝහ | දුඹුරු |
| වීදුරු | රතු |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2022

1. පළාත් පාලන ආයතනය මගින් නිවාස හා වෙළඳ ආයතනය සඳහා කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

2. ජෛව භායනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකිරීම.

3. අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරුව සංවිධානය කිරීම සහ එමගින් වෙන් නොකරන කසළ එකතු නොකිරීමේ ක්‍රමවේදය (No Separation – No Collection) පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ඒ අනුව ක්‍රියාත්මක වීම.

**ක්‍රමෝපාය 03** - කෙටි කාලීනව ජෛව භායනය වන සියළුම ඝන අපද්‍රව්‍ය කාබනික පොහොර (කොම්පෝස්ට්) බවට පත් කිරීම ප්‍රවර්ධනය කිරීම, ජනතාව ඒ සඳහා යොමු කිරීමට සහ කාබනික පොහොර සඳහා ලාබදායී වෙළඳ පොළක් හඳුන්වාදීම.

1. ජෛව භායනය වන ආහාරමය අපද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපද්‍රව්‍ය ජීව වායු නිෂ්පාදනය කිරීම සඳහා යොදාගත හැකි අතර, නිෂ්පාදනය වන පීව වායුව ආහාර පිසීම, ආලෝකකරණය වැනි එදිනෙදා කටයුතු සඳහා යොදා ගැනීම දිරිමත් කිරීම.

**ක්‍රමෝපාය 04** - ජෛව භායනය වන ආහාරමය ද්‍රව්‍ය සත්ත්ව ගොවිපල වලට නිකුත් කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම.

**ක්‍රමෝපාය 05** - ජෛව භායනය නොවන (ප්‍රතිචක්‍රීකරණය කල හැකි) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.

1. සෑම මට්ටමකට ජනතාව තුළ භාණ්ඩ නැවත භාවිතය (Re-use) වැනි සංකල්ප ප්‍රවර්ධනය සඳහා පාසැල් හා ආයතනික මට්ටමින් ආකල්පමය වෙනසක් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම.

2. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය (වීදුරු, කඩදාසි, ලෝහ) මිලදී ගනු ලබන ස්ථාන පිහිටුවීම හා මෙම ක්‍රමය ප්‍රචලිත කිරීම සහ දිරි ගැන්වීම සඳහා වෙළඳපොල සහ ව්‍යවසායකයින් වර්ධනය කිරීම.

3. පළාත් පාලන ආයතන මගින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍යය මිලදී ගනු ලබන ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඔවුන් සමඟ නිරතුරු සම්බන්ධතා පවත්වා ගැනීම සහ ඒ පිළිබඳ තොරතුරු ජනතාව වෙත ලබාදීම.

4. එකතු වන කසළ අතර ඇති පොල්කටු, යකඩ, ප්ලාස්ටික් විදුලි උපකරණ වැනි දේ සඳහා කසළ පොළ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

**ක්‍රමෝපාය 06** - රෝහල් මගින් නිකුත් කරන ඝායනික අපද්‍රව්‍යය නාගරික ඝන අපද්‍රව්‍යය වලට එකතුවීම වැලැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම.

1. සායනික සහ ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම අනිවාර්යය කිරීම.

2. සායනික සහ ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීමට පෙර ඒවා ආසාදනය නොවන ද්‍රව්‍ය බවට පත් කිරීම අනිවාර්යය කිරීම.

3. සායනික සහ ඝන අපද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිතව බැහැර කිරීම සඳහා රෝහල් තුලම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

**ක්‍රමෝපාය 07** - ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම.

1. දොරින් දොර එකතු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

2. ඝන අපද්‍රව්‍ය එකතු කරන දින සහ එම දින වල එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය වර්ග ප්ලාස්ටික් පොල්කටු, වීදුරු ආදි ලෙස වර්ගීකරණය කර ඒ පිළිබඳව කාලසටහන් අදාල පළාත් පාලන ආයතනය මගින් නිවාස වෙත ලබාදීම.

3. පලාත් පාලන ආයතන වලට කොම්පෝස්ට් අංගන සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් ලබාදීම.

4. ඝන අපද්‍රව්‍ය වර්ග සඳහා කසළ එකතු කරන වාහනයේ වෙන් වෙන් වශයෙන් කොටස් බෙදා තිබීම.

5. බර වාහන ලඟා විය නොහැකි ස්ථාන වල අත් කරත්ත මඟින් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම.

**ක්‍රමෝපාය 08** - සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපනය කිරීම.

1. ජෛවීය ක්‍රියාවලියට සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට භාවිතා කල නොහැකි ජීර්ණය නොවන අනෙකුත් කසළ, බිම් පිරවීම සඳහා යොදාගැනීම සුදුසු වන අතර මූල්‍යමය ගැටළු පැන නගින බැවින්, පළාත් පාලන ආයතනයන් කිහිපයක් ඒකාබද්ධව සනීපාරක්ෂක බිම් පිරවුමක් ස්ථාපනය කිරීම.

**ක්‍රමෝපාය 09** - විද්‍යුත් ඝන අපද්‍රව්‍ය (E-Waset) කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

1. ඉවතලන පරිසනක යතුරු පුවරු, රූපවාහිනී, ජංගම දුරකථන වැනි උපාංග නාගරික ඝන අපද්‍රව්‍ය සමඟ බැහැර නොකල යුතු අතර, එම අපද්‍රව්‍ය වෙන් කොට එක්රැස් කර ඒවා මිලදී ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි ගැනුම්කරුවන් වෙත ලබාදිය යුතුය.

**ක්‍රමෝපාය 10** - පසු විපරම් කමිටුවක් පිහිටුවීම.

1. අදාල ආයතන වල නිලධාරී මණ්ඩලයකින් සමන්විත පසු විපරම් කමිටුවක් පිහිටුවීම මගින් පසු විපරම් කටයුතු සිදු කිරීම.

වගකිවයුතු ආයතන :- අදාල පළාත් පාලන ආයතනය

## 6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ග

### 6.4.1 හැඳින්වීම

මෙම සංවර්ධන සැලැස්මේ වැදගත් අංගයක් ලෙස ආර්ථික සංවර්ධන සැලැස්ම දැක්විය හැකිය. ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය, ජනතාවගේ ආර්ථිකය සංවර්ධනය, ප්‍රදේශය තුල වැඩි රැකියා අවස්ථා රාශියක් බිහි කිරීම අරමුණු කර ගනිමින් මෙම උපාය මාර්ගය සකස් කරනු ලබයි. මෙහිදී විශේෂයෙන්ම ප්‍රදේශයේ ආර්ථික කටයුතු වර්ධනය කිරීම සඳහා කලාපීකරණ සැලැස්ම මගින් අවශ්‍ය නීති හා රෙගුලාසි සකස් කරනු ලබන අතර, කර්මාන්ත සංවර්ධන සැලැස්ම මගින් ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමට වැඩි දායකත්වයක් ලබාගැනීමට අපේක්ෂා කරනු ලබයි.

තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමටත්, එය ඉහළ සංවර්ධන මට්ටමක් කරා ගෙන ඒමටත් අවධානය යොමු කරනු ලබන අතර, එමගින් ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබයි.

### 6.4.2 වෙළඳ හා වාණිජ සංවර්ධන සැලැස්ම

තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ පවතින යටිතල පහසුකම් හා අවශ්‍යතා වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීමට ප්‍රමුඛ ලෙසම අවධානය යොමු කර ඇති අතර, එහිදී තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ නව වෙළඳසැල් සංවර්ධනය කිරීම, එළවළු හා පළතුරු ගබඩා කිරීමේ ස්ථාන සංවර්ධනය හා අදාල ප්‍රවාහන මාධ්‍යයන් වෙත භාණ්ඩ හුවමාරු කිරීමට හැකි පරිදි ආවරණයක් සහිත ප්‍රදේශයක් සංවර්ධනය කිරීම අපේක්ෂා කරයි.

වර්තමානය වන විට එළවලු හා පළතුරු රැගෙන එන රථ නැවැත්වීම සඳහා ප්‍රමාණවත් හා ආවරණයක් සහිත ප්‍රදේශයක් දක්නට නොලැබෙන අතර, මෙම හේතුව නිසා එළවලු හා පළතුරු වැඩි ප්‍රමාණයක් විනාශවීමට ලක්වේ. මෙහිදී ආවරණ සහිත වෙළඳසැල් හා කෘෂි භාණ්ඩ ප්‍රවාහන කටයුතු සිදු කරන රථවාහන ගාල් කිරීමේ පහසුකම් සහිත ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි.

**රූපසටහන් අංක 38 ආර්ථික මධ්‍යස්ථානයේ යෝජිත නව කඩ පෙළ**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

ආර්ථික මධ්‍යස්ථානය තුළ ජනනය වන අපද්‍රව්‍ය ඉවත් කිරීම දිනපතා සිදුවන අතර, ඒ සඳහා ඉතා විශාල පිරිවැයක් හා කාලයක් වැය කිරීමට සිදු වේ. තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන භූමියට දිනපතා ඉතා විශාල පිරිසක් තමාගේ වෙළඳ හා කෘෂි නිෂ්පාදන අළෙවි කිරීමේ අවශ්‍යතා සඳහා පැමිණෙන අතර, මෙම හේතුව නිසා දැනට ආර්ථික මධ්‍යස්ථානය තුළ පවතින සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවේ. එබැවින් මෙම ආර්ථික මධ්‍යස්ථාන භූමිය තුල භූගත මළ අපවහන පද්ධතියක් ස්ථාපනය කිරීමටත්, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමටත්, යෝජනා කරනු ලබන අතර, එය ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිරි ක්‍රියාවලිය වේගවත් කිරීමටත්, තමාගේ අවශ්‍යතා සඳහා ආර්ථික මධ්‍යස්ථානය වෙත පැමිණෙන මහජනතාවට මනා සේවාවක් ලබාදීමටත් හැකි සුවිශේෂී ආර්ථික කටයුත්තක් ලෙස පෙන්වා දිය හැකිය.


**රූපසටහන් අංක 39** **ආර්ථික මධ්‍යස්ථානය තුළ යෝජිත භූගත මළ අපවහන පද්ධතිය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

තවද, ආර්ථික මධ්‍යස්ථානය ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා මහවැලි අධිකාරිය හා ප්‍රාදේශීය සභාව සතු භූමිය යොදා ගනිමින් තඹුත්තේගම පොළ අසල ආවරණ සහිත වාහන නැවතුම් ස්ථාන ඇතුලත් කර යෝජිත නව ආර්ථික මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

**රූපසටහන් අංක 40** **යෝජිත නව ආර්ථික මධ්‍යස්ථානය හා මූල්‍ය මධ්‍යස්ථානය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

තවද, මෙම භූමි ප්‍රදේශය තුල නව බැංකු පද්ධතියක් ස්ථාපිත කිරීම මෙන්ම ප්‍රදේශයේ පවතින සියළුම මූල්‍ය ආයතන මෙම ස්ථානය වෙත රැගෙන ඒමට යෝජනා කෙරේ. එමඟින් මෙම නව ස්ථානය ඉතා සංකීර්ණ හා කාර්යක්ෂම ලෙසද ස්ථාවර ආර්ථික වටිනාකමක් හා ඉතා හොඳ ආර්ථික දායකත්වයක් ප්‍රදේශයට ලබාදෙන ස්ථානයක් ලෙසද සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි.

එමෙන්ම, ප්‍රදේශයේ මහඟු සම්පතක් වන තඹුත්තේගම වැවට ඇති වටිනාකම හා අවධානය වැඩිදියුණු කිරීමටද සැලැස්මෙන් අපේක්ෂා කරන අතර, ප්‍රදේශයේ ආර්ථිකයේ ප්‍රධාන කොටස් කරුවෙකු බවට එම ස්ථානය පත් කිරීමට යෝජනා කෙරේ.

එපමණක් ද නොව, මෙම සංවර්ධන ක්‍රියාකාරකම් නිසා එකතු වන සනීපාරක්ෂක කසළ ඉතාමත් ආරක්ෂිතව හා මනා ආකාරයෙන් මුදා හැරීමට අවශ්‍ය පරිදි මෙම යෝජිත සංවර්ධන කාර්යයන් පවතින ප්‍රදේශය ආවරණය වන පරිදි , භූගත මළඅපවහන පද්ධතියක් යෝජනා කරනු ලබනු අතර, වර්තමානය වන විට ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිතව පවතින ගැටළු නිරාකරණය කිරීම මෙමඟින් අපේක්ෂා කරයි.

ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කර ගැනීම හා ආර්ථිකය ශක්තිමත් ආකාරයෙන් පවත්වා ගැනීමටත්, කෘෂි නිෂ්පාදනයන් සඳහා මනා වූ ආර්ථික වටිනාකමක් ලබාගැනීම සඳහාත් සති පොළ මඟින් ඉහළ දායකත්වයක් ලබාදෙයි. මෙහිදී තලාව, එප්පාවල හා තඹුත්තේගම යන ප්‍රධාන නගර කේන්ද්‍ර කර ගනිමින් පවතින මහජන පොළ භූමි සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පවතී. වර්තමානය වන විට එම ස්ථාන අඩු පහසුකම් සහිතව පවත්වාගෙන යනු ලබන ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගත හැකි ස්ථාන වීම විශේෂත්වයකි.

**රූපසටහන් අංක 41** **මහජන පොළ ප්‍රතිසංවර්ධනය කිරීම - තලාව**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 42 මහජන පොළ ප්‍රතිසංවර්ධනය කිරීම - එප්පාවල**




මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය - 2022

විශේෂයෙන්ම තලාව හා එප්පාවල යන ප්‍රදේශවල පවතින මහජන පොළ ප්‍රතිසංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. වර්තමානය වනවිට පවතින පොළ තුල ඉතා පහසුවෙන් වෙළඳ කටයුතු සිදුකර ගැනීමට ඇති හැකියාව අවම වී ඇත. පවතින ආවරණ මගින් වර්ෂා කාලයේදී අපහසුවකින් තොරව වෙළඳාම් කටයුතු සිදුකර ගැනීමට හැකිවන ලෙසත්, පොළ භූමිය වෙත රැගෙන එනු ලබන හා රැගෙන යනු ලබන භාණ්ඩ සඳහා ආරක්ෂාකාරී බව තහවුරු කරන ස්ථානයක් ලෙසත් මෙම ස්ථානය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. එමෙන්ම මෙම පොළ පවතින ස්ථානයන් තුළ රථවාහන නැවැත්වීමේ පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, එළවලු හා පළතුරු පැටවීමේ සහ බෑමේ ක්‍රියාවලිය මනා ලෙස සිදු කර ගැනීමට හැකි පරිදි මෙම ස්ථානයන් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

මේ ආකාරයෙන් අපේක්ෂා කරනු ලබන සංවර්ධන යෝජනා ක්‍රම හා ව්‍යාපෘති මගින් ප්‍රදේශයේ වාණිජ කටයුතු ඉතාමත් සක්‍රීය හා සාර්ථක ආකාරයෙන් ප්‍රදේශය තුලම පවත්වාගෙන යාමටත්, එමගින් ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කර ගැනීමටත්, අපේක්ෂා කරනු ලබයි.

### 6.4.3 කර්මාන්ත සංවර්ධන සැලැස්ම

කර්මාන්ත සංවර්ධනය ද , ප්‍රදේශයේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකය වර්ධනය කිරීමටත්, විදේශ විනිමය උපයා ගැනීමටත් හැකි පරිදි සකස් කිරීමට අදහස් කරනු ලබයි.

විශේෂයෙන්ම ප්‍රදේශය සඳහා කලාපීකරණ සැලැස්ම සකස් කිරීමේදී කෘෂිකර්මාන්තය සඳහාම සුවිශේෂී වූ ප්‍රදේශයක් වෙන් කර ඇති අතර, එහි කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය නීති රෙගුලාසි


සකස් කර ඇත. එහිදී විශේෂයෙන්ම කර්මාන්ත මනා ක්‍රියාකාරීත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරනු ලබන සාධකයක් ලෙස ජල සම්පත හා නිදහස් භූමිය හඳුනාගත හැකි අතර, මෙම සම්පත් වලින් අනූන ප්‍රදේශයක් කර්මාන්ත ප්‍රවර්ධනය හා ස්ථාපනය කිරීම සඳහා වෙන්කර ඇත.

සමස්තයක් ලෙස ගත් විට එප්පාවල ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, එම කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය කරනු ලබන අනෙකුත් පහසුකම් විවිධ සංවර්ධන උපාය මාර්ග යටතේ ලබාදීමට යෝජිතය.

### *6.4.3.1 පොහොර නිෂ්පාදන කර්මාන්ත ශාලාව*

ප්‍රධාන වශයෙන් එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීමට අදහස් කරනු ලබන අතර, එහිදී එප්පාවල පොස්පේට් නිධිය ආසන්නයේ පොහොර නිෂ්පාදනය කිරීමට අත්‍යවශ්‍ය අංගයක් වන සල්පියුරික් අම්ල නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට යෝජනා කරනු ලබයි. මෙම කර්මාන්තශාලාව මගින් පොස්පේට් යොදා ගනිමින් පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට කටයුතු කරනු ලබන අතර, එය භෝග වගාවන්ට අවශ්‍ය පොහොර නිෂ්පාදනය සඳහා විශාල පිටිවහලක් වේ. තවද, එමඟින් පොහොර ආනයනය සඳහා යොදවන විදේශ විනිමය මෙරට තුළ රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන අතර, අපනයනය කිරීම සඳහා අවශ්‍ය පොහොර නිෂ්පාදනය කිරීමටද යෝජනා කරනු ලබයි. ද්‍රව පොස්පේට් සඳහා ඉතා විශාල ඉල්ලුමක් ඉන්දියාව තුල පවතින අතර, ඉන්දියාවට මෙන්ම ගෝලීය පොස්පේට් අවශ්‍යතාවය සඳහා සැපයුමක් ලබාදිය හැකි පරිදි අවශ්‍ය කරනු ලබන කර්මාන්ත ශාලා ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබයි.


**රූපසටහන් අංක 43 යෝජිත පොහොර නිෂ්පාදන කර්මාන්ත ශාලාව**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

පොස්පේට් භාවිතා කරමින් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ජලය, ඉතාමත් අත්‍යවශ්‍ය අංගයකි. එහිදී සල්පියුරික් අම්ල මෙට්‍රික් ටොන් 75 000ක් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ජල පරිමාව කියුබික් මීටර 50 000 ක් පමණ වේ. මෙම ජල අවශ්‍යතාවය නොකඩවා ලබාගත හැකි අතර, මෙම තත්ත්වයට අවශ්‍ය ජලය කහදේගම වැව භාවිතා කරමින් ලබාගැනීමට යෝජනා කරනු ලබයි. වර්තමානය වන විට කහදේගම වැව ගොඩවීමේ තර්ජනයකට ලක්ව ඇති අතර, එම වැවෙහි ධාරිතාවය වැඩිවන පරිදි සකස් කිරීමට යෝජනා කරනු ලබයි. තවද, කෝන්වැව සහ කහදේගම වැව සම්බන්ධ කර සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ක්‍රියාවලිය නොකඩවා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසා දීම මෙමඟින් අරමුණු කරනු ලබයි.

**රූපසටහන් අංක 44 යෝජිත සල්පියුරික් අම්ල නිෂ්පාදන කර්මාන්ත ශාලාව හා කහදේගම වැව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

*6.4.3.2 ඇල්කොහොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීම*


සමස්තයක් ලෙස ගත් විට ප්‍රදේශය තුල මෙන්ම ප්‍රදේශයට පරිබාහිරින් වූ ප්‍රදේශ තුල ද එළවලු හා පළතුරු වැඩි වශයෙන් නිෂ්පාදනය කරනු ලබයි. මෙහිදී කෙසෙල්, අඹ, කොමඩු, ගස්ලබු වැනි පළතුරු විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබයි. දඹුල්ල හා තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන දෙක අවට ප්‍රදේශවල කෘෂි නිෂ්පාදනයන් පමණක් නොව ලංකාවේ සියළුම ප්‍රදේශයන්හි වගා කරනු ලබන එළවලු හා පළතුරු මෙම ආර්ථික මධ්‍යස්ථානය කරා ප්‍රවාහනය කරනු ලබයි.

මෙලෙස ප්‍රවාහනය කරනු ලබන පළතුරු විවිධ ප්‍රදේශ කරා බෙදා හරින අතර, ඇතැම් පළතුරු විවිධ නිෂ්පාදනයන් කිරීම සඳහා නිෂ්පාදනාගාර වෙත ප්‍රවාහනය කරනු ලබයි. නමුත් මේ ආකාරයට

ප්‍රවාහනය කරනු ලබන පළතුරු මගින් පළතුරු බීම පමණක් නිෂ්පාදනය වේ. නමුත් වර්තමානය වන විට පළතුරු බීම සඳහා පවත්නා ඉල්ලුම ක්‍රමයෙන් අඩු වෙමින් පවතින අතර, පළතුරු නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ නිෂ්පාදනයන් අවම වීම නිසා නිෂ්පාදන බොහෝ ප්‍රමාණයක් අපතේ යාම සිදු වේ.

මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහාත්, පළතුරු සඳහා ඉතා හොඳ ඉල්ලුමක් ඇති කිරීම සඳහාත් එප්පාවල ප්‍රදේශයේදී පළතුරු යොදා ගනිමින් මධ්‍යසාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. මෙම නිෂ්පාදන කර්මාන්ත ශාලාව සංවර්ධනය කිරීම මගින් පළතුරු නිෂ්පාදනයන් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් ඇති කිරීමටත්, විවිධ හේතූන් නිසා අපතේ යන පළතුරු ප්‍රමාණයන් අවම කර ගැනීමටත්, ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමටත්, ප්‍රධාන වශයෙන් අරමුණු කරනු ලබයි.

**රූපසටහන් අංක 45 යෝජිත මධ්‍යසාර නිෂ්පාදන කර්මාන්ත ශාලාව**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

විශේෂයෙන්ම මෙම පළතුරු නිෂ්පාදනයන් භාවිතා කරමින් අනර්ඝ මට්ටමේ මධ්‍යසාර නිෂ්පාදනය කිරීමේ හැකියාවක් පවතින බව ඉන්දියාවේ "මනාවිරඡ්නා" විශ්ව විද්‍යාලය මගින් කරනු ලැබූ පරීක්ෂණ මගින් තහවුරු කරගෙන ඇත. තඹුත්තේගම හා දඹුල්ල යන ආර්ථික මධ්‍යස්ථාන මගින් අවශ්‍ය කරනු ලබන පළතුරු මෙම කර්මාන්ත ශාලාව වෙත ඉතා පහසුවෙන් හා ඉක්මනින් ප්‍රවාහනය කිරීමට හැකිවීමේ විභවතාවය හා අවශ්‍ය කරනු ලබන ජල පහසුකම් ලබාගැනීම මෙන්ම නියමිත භූමි ප්‍රමාණයන් සපයා ගැනීමේ පහසුව යනාදී කරුණු සැලකිල්ලට ගනිමින් මෙම කර්මාන්තශාලාව එප්පාවල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත කලාපය තුල සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. ඒ

තුළින් ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය වර්ධනය කිරීමටත්, වාණිජමය වශයෙන් ප්‍රදේශයට වැඩි වටිනාකමක් ලබාදීමටත්, රටේ ජාතික ආර්ථිකයට ද ඉහළ දායකත්වයක් ලබාදීමටත් අපේක්ෂා කරනු ලබයි.


*6.4.3.3 තැඹිලි වතුර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීම*

අධික පෝෂණ ගුණය හේතුවෙන් තැඹිලි වතුර සහ පොල් වතුර සඳහා වර්තමාන ලෝකයේ ඉහළ ඉල්ලුමක් නිර්මාණය වී ඇත. ලෝකයේ ඖෂධීය පානයන් අතරින් තැඹිලි ඉදිරියෙන්ම පවතින පානයක් වන අතර, ශ්‍රී ලංකාව තුල තැඹිලි නිෂ්පාදනය ද ඉතාමත් ඉහළ අගයක් ගනු ලබයි.

විශේෂයෙන්ම පුත්තලම, කුරුණෑගල හා උතුරු පළාතේ බොහෝ ප්‍රදේශ වල ද ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වල ද තැඹිලි ඉතා හොඳින් වැඩෙන භෝගයකි. තවද, එප්පාවල පොස්පේට් නිධිය පවතින භූමිය තුල යෝජිත පොහොර කර්මාන්ත ශාලාවෙන් නිෂ්පාදනය කරනු ලබන පොහොර යොදාගනිමින් මෙම තැඹිලි වගාවන්වල ඵලදායිත්වය වර්ධනය කරගත හැකිය.

මෙම විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් එප්පාවල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත කලාපය තුල තැඹිලි වතුර නිෂ්පාදන කර්මාන්ත ශාලාව සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, එම සංවර්ධන කටයුත්තට සමගාමීව කර්මාන්ත ශාලාව ආසන්න ප්‍රදේශයේ තැඹිලි වගා කිරීම සඳහා කලාපයක් වෙන්කිරීමට යෝජනා කරනු ලබයි. මීට අමතරව රටට අවශ්‍ය විදේශ විනිමය උපයා ගැනීම සඳහා මෙම ස්ථානයේම තැඹිලි වතුර අපනයන කර්මාන්තශාලාවක් ස්ථාපනය කිරීමට යෝජනා කරයි. මෙය රූපසටහන් අංක 47 මගින් පෙන්වා ඇත.

**රූපසටහන් අංක 46 තැඹිලි වතුර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාව**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### 6.4.4 කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම

කෘෂිකර්මාන්තයට උචිත භූමි පරිහරණ රටාවන් පවතින මෙම ප්‍රදේශයේ ආර්ථිකයේ ජීවනාලිය ලෙස සැලකිය හැක්කේ ද කෘෂිකර්මාන්තය හා බැඳි කටයුතු වේ. මෙහිදී විශේෂයෙන්ම සමස්ත ප්‍රදේශයම ආවරණය වන පරිදි ජලාපවහන පද්ධතියක් පිහිටා ඇති අතර, මෙම වාරි පද්ධතිය මගින් සමස්ත ප්‍රදේශයේම පවතින කෘෂි බිම් සඳහා අවශ්‍ය කරනු ලබන ජලය බෙදා හරිනු ලබයි. මෙහිදී ඉලන්දකුලම වැව, තලාව වැව, ලුණුවැව, කෝන්වැව, නල්ලච්චිය වැව, සියඹලන්ගමුව ජලාශය, මීගලෑව වැව හා තවත් කුඩා වැව් පද්ධතියක් ප්‍රදේශය තුල පිහිටා ඇති අතර, ඒවා ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන එල්ලංගා පද්ධතිය මගින් එකිනෙකට සම්බන්ධ කරනු ලබයි. මෙම එල්ලංගා පද්ධතිය තුල ජලය ගමන් කරනු ලබන ප්‍රධාන ඇළ මාර්ග 20 කට අධික සංඛ්‍යාවක් පවතින අතර, ඒ අතරින් කලංකුට්ටිය ඔය, යෝධ ඇළ ප්‍රධාන ස්ථානයක් ගනු ලබයි.

නමුත් වැව් ගොඩ වීමේ තර්ජනයට ලක්වීම නිසා මෙම එල්ලංගා පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවන අතර, ඇළ මාර්ග ද ගොඩවීමේ තර්ජනයට ලක්ව ඇත. එබැවින් ප්‍රදේශය තුල පිහිටා තිබෙන වැව් පද්ධතිය හා ඇළ මාර්ග පද්ධතිය පිළිසකර කිරීමට යෝජනා කරනු ලබන අතර, එමගින් ප්‍රදේශයේ ආර්ථික වර්ධනය සඳහා ප්‍රබල දායකත්වයක් ලබාදීමට අපේක්ෂා කරයි. ප්‍රතිසංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන ඇළ මාර්ග හා වැව් පද්ධතිය රූපසටහන් අංක 48 මගින් දක්වා ඇත.

**රූපසටහන් අංක 47 ප්‍රතිසංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන ඇළ මාර්ග හා වැව් පද්ධතිය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

### *6.4.4.1 කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම*

කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම මගින් ද , ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලබයි. මෙම කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානය මගින් ප්‍රදේශයේ ජනතාවට කෘෂිකර්මාන්තය පිළිබඳව නවීනතම තාක්ෂණික දැනුම ලබාගත හැකි හා නවීන තාක්ෂණය සමඟ බද්ධ වූ කෘෂිකර්මාන්තය හා බැඳි අත්දැකීම් ලබාගත හැකි ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. ජල කළමනාකරණය , වගාවන් සඳහා පොහොර භාවිතය, පස සැකසීම, ඵලදාව නෙලීම, ප්‍රවාහනය යනාදී ලෙස කෘෂිකර්මාන්තය හා බැඳුණු සියළුම අංශ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික දැනුම මෙම මධ්‍යස්ථානය මගින් ලබාගැනීමට හැකි වන පරිදි සංවර්ධනය කිරීමට කටයුතු කරනු ලබන අතර, ඒ තුලින් ප්‍රදේශයේ ගොවි ජනතාවගේ පමණක් නොව කෘෂි නිෂ්පාදනයන් අලෙවි කර ගැනීම සඳහා තඹුත්තේගම ප්‍රදේශයේ පදිංචි හා පිටතින් පැමිණෙන ගොවි ජනතාවගේ ද කෘෂිකර්මාන්තය හා බැඳි තාක්ෂණික දැනුම ඉහළ නැංවීමට අදහස් කරනු ලබයි. මෙම කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානය පිළිබඳව රූපසටහන් අංක 49 මගින් විස්තර කර ඇත.

**රූපසටහන් අංක 48 යෝජිත කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

## 6.5 තිරසර පාරිසරික උපාය මාර්ගික සැලැස්ම

### 6.5.1 පාරිසරික සංවේදී ප්‍රදේශ

#### *6.5.1.1 ඉලක්ක හා අරමුණු*

(අ) ඉලක්කය

තලාව නාගරික සභා බල ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ කලාපීකරණ කිරීම සඳහා ඉලක්කය වනුයේ, තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා පරිසර සංවේදී ප්‍රදේශ යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකීමට ගැනීමත් එමඟින් අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීමත්ය.

(ආ) අරමුණු

1. තලාව නාගරික බල ප්‍රදේශය තුල වර්ෂාව නිසා සිදුවන හදිසි ජලගැලීම් අවම කිරීම තුලින් පරිසර හිතකාමී නගර ඇති කිරීම.
2. විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපනික දැනුවත් කිරීම සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශ යොදා ගැනීම.
3. ජෛව විවිධත්වය ඉහළ නංවමින් පාරිසරික, සංචාරක හා විනෝදාත්මක අවස්ථා වැඩි කිරීම සඳහා පරිසර සංවේදී ප්‍රදේශ සුදුසු ලෙස යොදා ගැනීම.
4. අනවසර අත්පත් කර ගැනීම්, පරිසරයට හානි වන නොගැලපෙන සහ නුසුදුසු ඉදිකිරීම් මගින් ප්‍රදේශයට සිදුවන හානිකර බලපෑම අවම කර ගැනීම.

#### *6.5.1.2 තලාව නාගරික බල ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ කලාපීකරණය*

1. අධි සංවේදී සංරක්ෂණ කලාපය

   ජාත්‍යන්තර සම්මුතියකින්, දේශීය පනතකින් හෝ ගැසට් පත්‍රයක් මගින් ආරක්ෂක හෝ විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ මේ යටතට ගැනෙන අතර, තලාව නාගරික බල ප්‍රදේශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ වන සංරක්ෂණ ආඥා පනතට අනුව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති වන

සංරක්ෂක ප්‍රදේශ සහ යෝජිත ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ. (නුවරගම රක්ෂිතය, යෝධ ඇළ රක්ෂිතය, මැදගල රක්ෂිතය මුල්ලේගල රක්ෂිතය, තෙල්හිරියාව රක්ෂිතය, පිංකුලම යෝජිත වනාන්තරය, පල්ලන්කුලම යෝජිත වනාන්තරය, වැටියාව යෝජිත වනාන්තරය, හල්මිල්ලකුලම යෝජිත වනාන්තරය, කැලේගම යෝජිත වනාන්තරය, ඔරුගලයාය යෝජිත වනාන්තරය, ඒරියාගම යෝජිත වනාන්තරය, මීගස්සෑගම යෝජිත වනාන්තරය, කරගහවැව යෝජිත වනාන්තරය)

2. මධ්‍යම සංවේදී සංරක්ෂණ කලාපය

ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

3. අඩු සංවේදී සංරක්ෂණ කලාපය

පවතින වගා කුඹුරු සහ ඊට සම්බන්ධ දෙනිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ සහ තලාව නාගරික බල ප්‍රදේශයේ තෙත්බිම් ආශ්‍රිත කෘෂිකර්මාන්තය කෙරෙන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

තලාව නාගරික බල ප්‍රදේශය තුල පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ කලාප තුනක් යටතට කලාපීකරණය කරන අතර, එහි අවකාශීය ව්‍යාප්තිය සිතියම් අංක 30 මගින් දක්වා ඇත.

*6.5.1.3 පරිසර සංරක්ෂණ කලාප සඳහා අනුමත භාවිතයන්*

1. අධි සංවේදී සංරක්ෂණ කලාපය

(අ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයන්හි දැක්වෙන අනුමත භාවිතයන්(වන සංරක්ෂණ ආඥා පනතට අනුව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති වන සංරක්ෂණ ප්‍රදේශයන්හි සිදු කරන ඕනෑම සංවර්ධන කටයුත්තක් එම දෙපාර්තමේන්තුවේ අදාල කමිටු තීරණයන්ට අනුව සිදු කල යුතුය.)

(ආ) වන වගා ව්‍යාපෘති.

(ඇ) අධ්‍යයන හා පර්යේෂණ කටයුතු.

(ඈ) ස්වභාවිකත්වය මත පදනම් වූ පරිසර සංචාරක කටයුතු.

(ඉ) ජාතික වැදගත්කමක් සහිත රජයේ අනුමත පොදු අපරව්‍යුහ ව්‍යාපෘති.

මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත.

2. මධ්‍යම සංවේදී සංරක්ෂණ කලාපය

(අ) වියලි කාලගුණ තත්ත්වයේදී පමණක් ක්‍රීඩා කළ හැකි ක්‍රීඩා පිටි.
(Dry Weather Playgrounds)

(ආ) සම්ප්‍රදායික මසුන් ඇල්ලීම.

(ඇ) මල් එකතු කිරීම.

(ඈ) නව වාරි මාර්ග ඉදිකිරීම/ගංවතුර ආරක්ෂණ ක්‍රම සකස් කිරීම.

(ඉ) අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු.

(ඊ) තෙත්බිම් ස්වභාවික උද්‍යාන.

(උ) පරිසර හිතකාමී අවන්හල් - වර්ග අඩි 1200 (කුළුණු මත)

(ඌ) කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන - (කුළුණු මත)
වර්ග අඩි 2000 - ආසන ධාරිතාවය - 100

(එ) ජාතික වැදගත්කමක් සහිත රජයේ අනුමත පොදු අපරව්‍යුහ ව්‍යාපෘති.

මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත.

3. අඩු සංවේදී සංරක්ෂණ කලාපය

(අ) පවතින වගා කුඹුරු හා ඊට සම්බන්ධ දෙණිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ තුල ගොවිජන සංවර්ධන පනතට අනුකූල වන අනුමත භාවිතයන්.

(ආ) තෙත්බිම් ආශ්‍රිතව සිදු කරන කෘෂිකර්මාන්තය.

(ඇ) අපි ශාක වගාවන් (growing epiphytes).

මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත.

**ඉහත කලාපයන්හි අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීමට අදාල කොන්දේසි**

(අ) තෙත්බිම් කලාප ආශ්‍රිතව පවතින හෝ තෙත්බිම් තුල පවතින උස් බිම් ප්‍රදේශ (Highland areas) පිහිටි අවස්ථාවේදී යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට පෙර සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා මිනින්දෝරු සැලැස්ම

(Servey Plan) සහ සංවර්ධනයට අදාල යෝජිත භූමියේ වත්මන් භාවිතය/පවතින තත්ත්වය සලකා බැලිය යුතුය.

(ආ) තෙත්බිම් කලාපීකරණයට අනුව යම් තෙත්බිම් කලාපයක මායිම් අපැහැදිලි හෝ අවිනිශ්චිත අවස්ථා වලදී මායිමේ සිට පිටතට/ඇතුලතට මීටර් 20 ක දුර ප්‍රමාණයක පවතින තෙත්බිම් ආසන්න තෙත්බිම් කලාපයට අයත් වන අතර, එම කලාපයේ අදාල නීති රෙගුලාසි සහ අනුමත භාවිතයන්ට යටත්ව ක්‍රියාකල යුතුය.

(භූගෝලීය පිහිටුම් පද්ධතියට - GPS අනුව ස්ථානීය පිහිටීම නිවැරදිව නිර්ණය කර ගැනීමේදී පවතින දෝෂ සහගත තත්ත්වය මහහරවා ගැනීම සඳහා.)

*6.5.1.4 තෙත්බිම් සඳහා වූ මාර්ගෝපදේශ*

(අ) මෙම මාර්ගෝපදේශ තලාව නාගරික බල ප්‍රදේශයේ පිහිටි සියළු තෙත්බිම් සඳහා පමණක් වලංගු වේ.

(ආ) දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත්බිම් වල සිදුකර ඇති ගොඩකිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැලකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු උපලේඛනයේ සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදුකල යුතුය.

(ඇ) පහත් බිමක් / පුරන් වූ කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සහ උපලේඛනයේ සඳහන් අංක 01,03,04,05 හා 09 දරණ ආයතන වලින් අනුමැතිය ලබාගත යුතුයි. එසේම විවිධ පනත් මගින් තෙත්බිම් වල අයිතිය අදාළ ආයතන වල විෂය පථයට අයත් වන අවස්ථා වලදී උපලේඛනයේ සඳහන් ආයතන වලින් සහ අනෙකුත් අදාල ආයතන වලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබාගත යුතුය.

(ඈ) තෙත්බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා පහත උපලේඛනයේ සඳහන් අංක 03 හා 05 දරණ ආයතන වලින් පරිසර නිරවුල් කිරීමේ සහතිකය හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු අතර, නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

(ඉ) උපලේඛනයේ සඳහන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් තෙත්බිමක සංවර්ධන කාර්යයක් සඳහා නිකුත් කරනු ලබන නිර්දේශ/අනුමැතිය

(අවසන් නිරවුල් සහතිකය) එම සැලසුම් කමිටු තීරණය පරිදි වාර්ෂිකව අළුත් කල යුතු ය.

(ඊ) තෙත්බිම් වල ආගන්තුක ආක්‍රමණශීලි ශාක හා සතුන් හැර වෙනත් ශාක හා සතුන් ඉවත් නොකල යුතුය.

(උ) ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් අවශ්‍ය වන සෑම තෙත් බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා අදාල ආයතන වල අනුමැතිය ලබාගත යුතුය.

(ඌ) සාම්ප්‍රදායික ධීවර කටයුතු හැර මසුන් හෝ වෙනත් ජලජ ජීවීන් ඇල්ලීමේ ක්‍රියාවලියේදී යාන්ත්‍රික බෝට්ටු, ධීවර ආම්පන්න, ඉන්ධන හෝ වෙනත් යාත්‍රා භාවිතා නොකල යුතුය.

(එ) පැහැදිලිව හඳුනාගත හැකි ඉහල ජෛව විවිධත්වය ඇති තෙත්බිම් ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

(ඒ) මසුන් හා අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

(ඔ) තෙත් බිම් වල කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය.
(ගෘහස්ථ,ආයතනික,කාර්මික,වෙළඳ,විද්‍යුත් සහ සායනික අපද්‍රව්‍ය)

තෙත්බිම් කලාපයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් උපලේඛනයේ සඳහන් ආයතනයක් මගින් බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම මාර්ගෝපදේශයන් එම බලපත්‍රවල කොන්දේසි ලෙස ඇතුලත් කල යුතු අතර, එකී කොන්දේසි කඩ කිරීම එකී බලපත්‍රය අවලංගු කිරීමට හෝ දඬුවම් නියම කිරීමට හේතු වනු ඇත.

*6.5.1.5 පොදු රෙගුලාසි*

1. ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක, ජලාශ්‍රිතව හෝ ජල මාර්ග වල සිදු නොකළ යුතුය. නමුත් මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාණ උපදේශන මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘති අදාළ ආයතනයන්වල නිර්දේශය හා අනුමැතියට යටත්ව සිදු කළ යුතුය.

2. තෙත් බිම් කලාප වල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.

3. තෙත්බිම් පිරවීමේදි ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ තිරසාර වැසි ජලය බැසයාමේ ක්‍රම භාවිතා කල යුතුය.

4. තෙත්බිම් පිරවීම සඳහා ගන්නා ද්‍රව්‍ය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබාගත යුතුය.

5. තෙත් බිම් වල අනුමත කාර්යයන් වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.

6. තෙත් බිම් වල සංවර්ධන කටයුතු සැලසුම් සකස් කිරීම, නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබාගත යුතුය.

7. තෙත් බිම් වලට අපජලය බැහැර නොකල යුතුය. මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව පිරිපහදු කල ජලය පමණක් මුදාහැරිය හැකිය.

8. අවශ්‍ය අවස්ථාවන්හිදී පරිසර පනත යටතේ පවතින "නියමිත ව්‍යාපෘති" (Prescribe Projects) සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරි මාර්ග දෙපාර්තමේන්තුව ආදි ආයතනයන්ගේ කොන්දේසි ආරෝපනය කල හැක.

උපලේඛනය

01. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

02. වාරි මාර්ග දෙපාර්තමේන්තුව

03. මධ්‍යම පරිසර අධිකාරිය

04. නාගරික සංවර්ධන අධිකාරිය

05. ප්‍රාදේශීය සභාව (තලාව/තඹුත්තේගම)

06. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

07. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

08. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව

09. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

10. උතුරු මැද පළාත් සභාව

11. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය

12. ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය

13. ජල ජීවී සංවර්ධන අධිකාරිය

14. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය


15. ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය

16. ශ්‍රී ලංකා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

17. මාර්ග සංවර්ධන අධිකාරිය

18. අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**සිතියම් අංක 30 සංරක්ෂණ කලාපීකරණ සැලැස්ම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**තෙත් බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය**

ඉහළ පෙව විවිධත්ත්ව අගයක් ඇති තෙත් බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත් බිම් හා ජල රැඳවුම් හා ජලය බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය - අනුමත භාවිතයන්

1. එළිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන.
2. වියලි කාලගුණ තත්ත්වයේදී පමණක් ක්‍රීඩා කළ හැකි ස්ථාන.
3. ජාතික වැදගත්කමක් සහිත රජයේ අනුමත පොදු අපරවයුහ ව්‍යාපෘති.
4. නව වාරිමාර්ග ඉදිකිරීම.

මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත.

කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය - අනුමත භාවිතයන්

1. පවතින වගා කුඹුරු හා පුරන් කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙණිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ තුල ගොවිජන සංවර්ධන පනතට අනුකූල වන අනුමත භාවිතයන් පමණක් සිදු කල හැකිය.
2. තෙත් බිම් ආශ්‍රිතව සිදු කරන කෘෂිකර්මාන්තය.
3. අපිශාක වගාවන්.
4. පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු .

මෙම කලාපයේ කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර නොමැත.

**පාරිසරික සංරක්ෂණ කලාපය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ වන සංරක්ෂණ ආඥා පනතට අනුව ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර ඇති වන සංරක්ෂණ ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීමේදී එම දෙපාර්තමේන්තුවේ තීරණයන්ට අනුගත විය යුතුය.

**ඉහත කලාපයන්හි අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීමට අදාල කොන්දේසි**

රජයේ හෝ පොදු අපරවයුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ අවස්ථාවකදී, ඉහත කොන්දේසි දිස්ත්‍රික් සැලසුම් කමිටුවට ලිහිල් කළ හැක. (අවසර ඇති උපරිම යටිතල පහසුකම් ව්‍යාපෘති - විදුලිය, ජල සැපයුම, දුරකථන, මහා මාර්ග, දුම්රිය මාර්ග ආදිය.)

තෙත් බිමක් ආශ්‍රිතව හෝ තෙත් බිමක් තුල උස්බිම් ප්‍රදේශ (Highland areas) පවතින අවස්ථාවේදී යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට පෙර සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා මිනින්දෝරු සැලැස්ම (Survey Plan) සලකා බැලිය යුතුය.

තෙත් බිම් කලාපීකරණයට අනුව යම් තෙත් බිම් කලාපයක මායිමේ සිට පිටතට මීටර් 20 ක දුර ප්‍රමාණයක් ආසන්න තෙත් බිම් කලාපයට අයත් වන අතර එම කලාපයේ අදාළ නීති රෙගුලාසි සහ අනුමත භාවිතයන්ට යටත්ව ක්‍රියාකල යුතුය. (භූගෝලීය පිහිටීම් පද්ධතියට අනුව ස්ථානීය පිහිටීම නිවැරදිව නිර්ණය කරගැනීමේදී පවතින දෝෂ සහගත තත්ත්වය මඟහරවා ගැනීම සඳහා)

**සැ.යු.**

අවශ්‍ය අවස්ථාවන්හිදී පරිසර පනත යටතේ පවතින " නියමිත ව්‍යාපෘති " සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතනයන්ගේ අතිරේක විශේෂිත තත්ත්වයන් ආරෝපණය කල හැක.

කිසියම් තෙත්බිමක් සංවර්ධනය කිරීමේදී ඉහත කොන්දේසීන් උල්ලංඝනය වීමක් සිදු කළහොත් උපලේඛන ගත ආයතන සතු බලතල යටතේ නීතිමය පියවර ගත හැකිය.

### 6.5.2 භූ දර්ශන සැලැස්ම

මෙම සැලැස්ම මඟින් ප්‍රදේශයේ පවත්නා ස්වාභාවික භූ දර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ එම ලක්ෂණ ඉස්මතු කිරීම ප්‍රධානතම අරමුණ වේ. උතුරු මැද පළාතට අනන්‍ය වූ පාරිසරික ලක්ෂණ පෙරදැරි කර ගත් ක්‍රමවත් සැලසුමක් මඟින් මෙම ප්‍රදේශයට ආවේණික ලක්ෂණ ඉස්මතු වන ආකාරයේ නගරයක් නිර්මාණය කිරීමට සැලසුම් සකස් කල හැකිය. වියළි කලාපීය දේශගුණික ලක්ෂණ වලින් යුත් මෙම ප්‍රදේශය මූලික කර ගනිමින් භූ දර්ශන සැලැස්ම සකස් කර ඇත.

ගෝලීය කාලගුණ විපර්යාස සඳහා අනාගතයේ මුහුණ දීමට හැකි ලෙස මෙම නාගරික ප්‍රදේශයේ භූ දර්ශන සැලසුම පහත අරමුණු අනුව සැකසෙනු ඇත.

- නගරය වටා සහ මධ්‍යයේ නාගරික උෂ්ණත්වය, කාබන් පියසටහන, වායු දූෂණය, ජල ගැලීම් ඉහළ යාම යන ආපදා තත්ත්වයන් අවම කිරීම සඳහා නාගරික වන ගහනය වැඩි කිරීම.
- නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා රජරට වියළි කලාපයට ආවේණික වූ ශාක, විවිධත්වයක් සහිතව එක් කිරීම.
- ක්‍රමවත් සහ සක්‍රීය පදික මංතීරු පද්ධතියක් වෙන් කිරීම සහ එයට අදාල මූලික පහසුකම් ලෙස සෙවන ලබා දෙන ශාක, ක්‍රමවත් සංඥා පුවරු පද්ධතියක් සැකසීම මෙන්ම සැලසුමක් සහිතව විවේක ගත හැකි ස්ථාන ලබා දීම.
- නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරව්‍යුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් නිර්මාණය කිරීම.
- නගරයට අනන්‍යතාවයක් ගෙන දෙන ආකාරයට නිර්මාණය කරන ලද දැන්වීම් පුවරු සහ ආලෝක නාම පුවරු නිර්මාණයට ජනතාව දිරිමත් කිරීම සහ අදාල ක්‍රමවේදයන් සැකසීම.

දර්ශනීය ස්ථාන **(Scenic view points)**

මෙම නාගරික බල ප්‍රදේශය තුල දර්ශනීය ස්ථාන විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකිය. යෝධ ඇල සමඟ ඇති කලාපය, ඊරියගොල්ල වැව, තඹුත්තේගම වැව, එප්පාවල වැව, පහළ මොරගොඩ වැව, ඉහල තලාව වැව මෙම කලාපයේ ප්‍රධාන නාගරික කේන්ද්‍රයන් වන තලාව, තඹුත්තේගම සහ එප්පාවල නගරයන් ආසන්නයෙහි පිහිටා ඇත. මෙම ස්වාභාවික භූ දර්ශනයන් නගරයට විවෘත කිරීම සහ එහි දර්ශන පථය විවෘත වන ලෙස අනෙකුත් සංවර්ධන කටයුතු සිදු කල යුතු අතර, මෙම ස්වභාවික අවකාශයන් තුලින් නගරයට පැමිණෙන සුළං ධාරාවන්ට බාධා නොවන ලෙස ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සිදු කල යුතුය. නගරය මධ්‍යයේ ඇති නාගරික උෂ්ණත්වය අවම කිරීමට මෙම ස්වභාවික පිහිටීම් පිටිවහලක් වන බැවින් නාගරික පීඩනය අවම වන ලෙස මෙම වැව් වටා සංවර්ධන කටයුතු සිදු කල යුතු වේ.

එමෙන්ම, මෙම නාගරික ප්‍රදේශයන්ට ආසන්නව හෝ දුරස්ව පිහිටි සියළු දර්ශනීය ස්ථානයන් තුල අනවසර ඉදිකිරීම්, ගොඩ කිරීම් හෝ කසළ බැහැර කිරීම්, ගල් පස් කැණීම් හෝ එම ප්‍රදේශ විනාශ වන ආකාරයේ කිසිදු අක්‍රමවත් ක්‍රියාවන් සිදු නොකළ යුතුය. එමෙන්ම මෙම ස්ථාන හැරුණු විට මෙම නාගරික සැලසුම් ප්‍රදේශය තුල පවතින මාර්ග මැදි කරගත් තෙත් බිම් සැලැස්මට අදාල ඕනෑම ප්‍රදේශයක එහි දර්ශනීය භාවයට තර්ජනයක් වන ආකාරයේ ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව ලබා නොදිය යුතුය.

### 6.5.3 ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම

1. අලි මිනිස් ගැටුම

රාජ්‍ය හා පෞද්ගලික ආයතන මගින් අවධිමත්ව සිදුකරනු ලබන සංවර්ධන කටයුතු සහ නීති විරෝධී ලෙස සිදු කරන වන විනාශය හේතුවෙන් භූමි රටාවේ වෙනස් වීම් ද, භාවිත කල හැකි සුදුසු වාසස්ථාන සතුන්ට අහිමි වීම සහ අවම වීම මෙන්ම වන අලින් සඳහා ආහාර හිඟ වීමද අලි මන්කඩ සහ අලින් ගමන් ගන්නා ගමන් මාර්ග අවහිර කර සංවර්ධන කටයුතු සිදු කිරීමද වැනි හේතු නිසා වන අලි ගම් වැදීම සිදු වේ.

උපාය මාර්ග

1. අලින්ගේ ගමන් රටාවට බාධා වූ සංවර්ධන කටයුතු සිදු වී ඇති ප්‍රදේශ හඳුනාගෙන ඔවුන් සඳහා විකල්ප ස්ථාන ලබාදීම.

2. වන අලි ගම් වැදෙන මාර්ග අවහිර කරමින් බාධක පැනවීම.

**රූපසටහන් අංක 49 එල්ලෙන විදුලි වැට හඳුන්වා දීම**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 50** **මී මැසි වැට හඳුන්වා දීම**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

3. ජීව වැට හඳුන්වා දීම

දෙහි, දොඩම් වැනි පැඟිරි කුලයේ ශාක, ඉඟුරු,මිරිස් සහ බෝගන්විලා වැනි කටුසහිත ශාක මේ සඳහා යොදා ගත හැකිය.


**රූපසටහන් අංක 51** **ජීව වැට හඳුන්වා දීම**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

**රූපසටහන් අංක 52** **අගල් කැපීම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

- අලි ඇතුන්ගේ වාසස්ථාන ආශ්‍රිතව ආහාරමය ශාක විශේෂ වගා කිරීම.
  උදා: කෙසෙල් ,දිවුල්
- අලි මිනිස් ගැටුම් පවතින ප්‍රදේශයෙන් අලි ඇතුන් ඉවත් කර ආරක්ෂිත ප්‍රදේශයකට මුදා හැරීම හා ආරක්ෂාව ලබාදීම.
- විවිධ ස්ථාන සඳහා නිශ්චිත සංරක්ෂණ සැලසුම් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- අලි ඇතුන්ගේ හැසිරීම පිළිබඳව අවට මහජනතාව දැනුවත් කිරීම.

4. පානීය ජල භිඟය

- නිසි ජල කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- විකල්ප ජල බෙදාහැරීම් ක්‍රමවේදයන් හඳුන්වා දීම.
  උදා: බවුසර්
- ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම සඳහා පරිසර නීති බලාත්මක කිරීම.
- වාරිමාර්ග සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ක්‍රමවත් ජල කළමනාකරණ ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- නල ජල සැපයුම වැඩි දියුණු කිරීම.
- ප්‍රජා මූලික ජල ව්‍යාපෘති හඳුන්වා දීම.
- ජාතික සහ අන්තර් ජාතික ආයතන ඒකාබද්ධව දීර්ඝකාලීන සැලසුම් සකස් කිරීම.

5. අධික උෂ්ණත්වය පාලනය කිරීම (Heat island effect)

- ප්‍රධාන මාර්ග දෙපස තුරු වියන් සංවර්ධන කිරීම.

  අනුරාධපුර - පාදෙණිය මාර්ගය

  එප්පාවල - තිඹිරිවැව මාර්ගය

  කැකිරාව - තලාව මාර්ගය

  ඔත්තප්පුව - ඉහළවැව මාර්ගය

- තෙත්බිම් රෙගුලාසි බලාත්මක කිරීම.
- නව සංවර්ධන කටයුතු වලදී පවතින ශාක නඩත්තු කිරීම සහ නව හරිත ප්‍රදේශ (green space) හඳුන්වා දීම.
- නව හරිත ප්‍රදේශ හඳුන්වා දීම සඳහා අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම.
- පොදු විවෘත භූමි නියමතා බලාත්මක කිරීම.

### 6.5.4 පොදු එළිමහන් විවේක , විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

සංගණන වාර්තා වලට අනුව 2022 වර්ෂයේදී 116 860 ක ජනගහනයක් සහිත වර්ග කිලෝමීටර් 309.69 ක භූමි භාගයක පිහිටි තලාව නාගරික බල ප්‍රදේශයෙහි, සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2033 වන විට ප්‍රදේශයේ ජනගහනය 128 365 ක් බවට පුරෝකථනය කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1.4 ක් අවම වශයෙන් විවේක විනෝද කටයුතු සඳහා පොදු එළිමහන් විවෘත භූමි වෙන් කල යුතුය.

ඒ අනුව, 2033 වසර වන විට පොදු එළිමහන් විවෘත භූමි සඳහා ඉඩම් හෙක්ටයාර් 128 ක් අවම වශයෙන් වෙන් කල යුතු අතර, හෙක්ටයාර් 76.8 ක් මධ්‍යගත පහසුකම් සඳහා ද හෙක්ටයාර් 51.2 ක් ප්‍රාදේශීය පහසුකම් ලෙස ද වෙන් වෙන් වශයෙන් පහසුකම් සැපයිය යුතුය.

මේ වන විට පවතින පොදු එළිමහන් විවෘත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 30 ක් වන අතර, යෝජිත පොදු එළිමහන් විවෘත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 128 ක් වේ. තලාව නාගරික බල ප්‍රදේශයට අයත් විවේක සහ විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවල ඉඩම් හිඟතාවය සලකා පොදු විවේක විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථාන මෙම සැලැස්මෙන් යෝජනා කෙරේ.

පවත්නා උද්‍යාන සහ ක්‍රීඩා පිටි වර්ගීකරණය කර, විවෘත භූමි ලෙස සංවර්ධනය කිරීම සඳහා සුදුසු ඉඩම් පරීක්ෂා කිරීමෙන් පසුව මෙම සැලැස්ම සකස් කරන ලදී. සිතියම් අංක 31 මගින් උද්‍යාන වල ස්ථානීය පිහිටීම දක්වා ඇත.

**වගුව 15 තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යෝජිත පොදු එළිමහන් විවේක විනෝද කටයුතු**

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|
| 01 | කුඩා උද්‍යාන | 6.85 |
| 02 | අසල උද්‍යාන | 74.64 |
| 03 | රේඛීය උද්‍යාන | 6.56 |
| **එකතුව** | | **88.05** |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2022

| ව්‍යාපෘති පදනම | පොස්පේට් නිධිය භාවිතා කරමින් පොහොර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අංගයක් වන්නේ සල්ෆියුරික් අම්ලය වේ. මෙහිදී සල්ෆියුරික් අම්ල භාවිතා කරමින් පොහොර නිෂ්පාදනය කිරීමට වරකට අවශ්‍ය ජල පරිමාව කියුබික් මීටර 50 000 කි. මෙම ජල පරිමාව නොකඩවා ලබාගැනීම පොහොර නිෂ්පාදන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයකි. එබැවින් කහඳේගම වැවේ ධාරිතාව වැඩිවන පරිදි නැවත සංවර්ධනය කර (කෝන්වැව හා සම්බන්ධ කරමින්) සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. එමගින් පොහොර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ජල සැපයුම නොකඩවා ලබාගැනීමේ හැකියාව පවතී. | | | | | | |
| ව්‍යාපෘතියේ අරමුණු | සල්ෆියුරික් අම්ල භාවිතා කර පොහොර නිෂ්පාදනය කිරීමට වරකට අවශ්‍ය ජල පරිමාව නොකඩවා ලබාගැනීම. | | | | | | |
| උපකල්පිත තත්ත්වය | • වැව සංවර්ධනය කිරීම | | | | | | |
| ව්‍යාපෘති කාලය | කෙටිකාලීන (1> වර්ෂය) | | මධ්‍ය කාලීන (1-3 වර්ෂ) | | ✓ දීර්ඝ කාලීන (3<වර්ෂ) | | |
| ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය | කර්මාන්ත කලාපය | | | | | | |

**ව්‍යාපෘති අංක 20 -** මධ්‍යසාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීම.

| | |
|---|---|
| 1. ව්‍යාපෘතියේ නම | මධ්‍යසාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීම. |
| 2. ව්‍යාපෘති අංශය | කර්මාන්ත සංවර්ධන සැලැස්ම. |

3. ව්‍යාපෘති විස්තරය

| | | | |
|---|---|---|---|
| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ග්‍රාම නිළධාරී වසම |
| උතුරු මැද | අනුරාධපුර | තලාව | මැදගම 2 |
| පිහිටීම | | | |
| උතුර<br>දකුණ<br>නැගෙනහිර<br>බටහිර | එළිකරන ලද හේන් ප්‍රදේශයකි |  | |
| මුළු භූමි ප්‍රමාණය | හෙක්. 3 ක් පමණ | | |
| වර්තමාන තත්ත්වය/අවට භාවිතය | අතහැර දමන ලද හේන් ලෙස පවතින භූමියකි. | | |
| ඉඩමේ අයිතිය | | | |


4. අපේක්ෂිත තත්ත්වය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | | දීර්ඝ කිරීම | ඉඩම් සංවර්ධනය පමණක් | |
| | ✓ | | | | | | |
| ව්‍යාපෘති ප්‍රභේදය | සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක) | වාණිජ | භූ දර්ශන හා විනෝද කටයුතු | නිවාස | නැවත පදිංචි කිරීම් | යටිතල පහසුකම් සංවර්ධනය | වෙනත් |
| | | | | | | | ✓ (කර්මාන්ත) |
| ව්‍යාපෘති පදනම | තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වල බහුල හා ආවේණික පළතුරු වර්ග වගා කරනු ලබයි. මේ ආකාරයට නිෂ්පාදනය කරනු ලබන පළතුරු දඹුල්ල හා තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කරනු ලබන නමුත්, පළතුරු තැලී විනාශ වීම හේතුවෙන් නිසි පරිදි අළෙවි කර ගැනීමට නොහැකි වේ. මෙම විභවතාවය ප්‍රයෝජනයට ගනිමින් හා නැවුම් පළතුරු ද යොදා ගනිමින් ඉහළ ගුණාත්මක භාවයකින් යුත් මධ්‍යසාර නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට යෝජනා කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ ආසන්න වශයෙන් පළතුරු වර්ග 107 ක් පමණ ඇති අතර, මෙම පළතුරු වලින් බොහෝ ප්‍රමාණයක් මෙම ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන කරා ප්‍රවාහනය කරනු ලබයි. තවද, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය හා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය අතර ආසන්න වශයෙන් කිලෝමීටර 60 ක පමණ දුරක් පවතින අතර, මෙම අවම දුර හේතුවෙන් යෝජිත කර්මාන්ත ශාලාවට අවශ්‍ය කරනු ලබන පළතුරු ඉතා පහසුවෙන් ප්‍රවාහනය කිරීමේ හැකියාව පවතී. තවද, දිවයිනේ ප්‍රධානතම ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට අති විශාල පළතුරු ප්‍රමාණයක් ප්‍රවාහනය කරනු ලබන බැවින්, මෙම විභවතාවය ප්‍රයෝජනයට ගනිමින් එප්පාවල ප්‍රදේශයේ පළතුරු භාවිතා කරමින් මධ්‍යසාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. එමගින් ප්‍රදේශයේ ආර්ථිකය වර්ධනය කිරීමත්, විදේශ විනිමය ඉපයීමත් අරමුණ කරනු ලබයි. | | | | | | |
| ව්‍යාපෘතියේ අරමුණු | විදේශ විනිමය ඉපයීම හා ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ඉහල නැංවීම. | | | | | | |
| උපකල්පිත තත්ත්වය | මධ්‍යසාර නිෂ්පාදන කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම . | | | | | | |
| ව්‍යාපෘති කාලය | කෙටිකාලීන (1> වර්ෂය) | මධ්‍ය කාලීන (1-3 වර්ෂ) | ✓ දීර්ඝකාලීන (3<වර්ෂ) | | | | |
| ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය | කර්මාන්ත කලාපය | | | | | | |

**ව්‍යාපෘති අංක 21 -** තැඹිලි වතුර නිෂ්පාදනය කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්ත ශාලාවක් සංවර්ධනය කිරීම.

| | |
|---|---|
| 1. ව්‍යාපෘතියේ නම | තැඹිලි වතුර නිෂ්පාදනය කිරීමේ<br>හා අපනයනය කිරීමේ කර්මාන්ත ශාලාවක් සංවර්ධනය කිරීම. |
| 2. ව්‍යාපෘති අංශය | කර්මාන්ත සංවර්ධන සැලැස්ම. |

3. ව්‍යාපෘති විස්තරය

<table>
<tr><td>පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>ප්‍රා.ලේ. කොට්ඨාශය</td><td>ග්‍රාම නිළධාරි වසම</td></tr>
<tr><td>උතුරු මැද</td><td>අනුරාධපුර</td><td>තලාව</td><td>මැදගම 2</td></tr>
<tr><td colspan="4">පිහිටීම</td></tr>
<tr><td>උතුර<br>දකුණ<br>නැගෙනහිර<br>බටහිර</td><td colspan="2">එළිකරන ලද හේන් සහිත ප්‍රදේශයකි</td><td rowspan="2"> 
</td></tr>
<tr><td>මුළු භූමි ප්‍රමාණය</td><td>හෙක්. 10 ක් පමණ</td></tr>
<tr><td>වර්තමාන තත්ත්වය/අවට භාවිතය</td><td colspan="3">අතහැර දමන ලද හේන් ලෙස පවතින භූමියකි.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="3"></td></tr>
</table>


4. අපේක්ෂිත තත්ත්වය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | | දීර්ඝ කිරීම | ඉඩම් සංවර්ධනය පමණක් | |
| | ✓ | | | | | | |
| ව්‍යාපෘති ප්‍රභේදය | සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක) | වාණිජ | භූ දර්ශන හා විනෝද කටයුතු | නිවාස | නැවත පදිංචි කිරීම් | යටිතල පහසුකම් සංවර්ධනය | වෙනත් |
| | | | | | | | ✓ (කර්මාන්ත) |
| ව්‍යාපෘති පදනම | වර්තමාන ලෝකයේ තැඹිලි වතුර සඳහා ඇත්තේ අධික ඉල්ලුමකි. තැඹිලි සඳහා ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියක් උසුලන අතර, 2019 වන විට තැඹිලි වතුර සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 4.27 ක ආර්ථිකයක් ලෝකය පුරා නිර්මාණය වී පැවතුනි. මෙම ඉල්ලුම සැලකිල්ලට ගනිමින් එප්පාවල ප්‍රදේශයේ යෝජිත කර්මාන්ත කලාපය තුල තැඹිලි වතුර අපනයනය කිරීමේ කර්මාන්ත ශාලාවක් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. තවද, එප්පාවල පොස්පේට් නිධියෙන් නිෂ්පාදනය කරනු ලබන පොහොර යොදා ගනිමින් තැඹිලි වගාව අති සාර්ථක වාණිජ වගාවක් ලෙස පවත්වාගැනීමේ ඉහළ සම්භාවිතාවක් පවතින අතර, පොස්පේට් එම තැඹිලි වගාවන් සඳහා යොදා ගැනීම මගින් ලබාගනු ලබන අස්වැන්න ඉතා ඉහළ මට්ටමකට වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතී. තවද, මෙම කර්මාන්ත ශාලාව සඳහා අවශ්‍ය කරනු ලබන තැඹිලි වගා කිරීම සඳහා සුදුසු ප්‍රදේශ ලෙස මාවතවැව, නල්ලමුදාව, මැදගම, ඉහළගම වැනි ග්‍රාම නිලධාරී කොට්ඨාශ දැක්විය හැකි අතර, එම ප්‍රදේශ වල පවතින හිස් ඉඩම් භාවිතා කරමින් තැඹිලි වගාවන් කිරීමට යෝජනා කරනු ලබයි. එබැවින් ඉහත සඳහන් කරන ලද විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් එප්පාවල ප්‍රදේශයේ කර්මාන්ත කලාපය තුළ තැඹිලි වතුර නිෂ්පාදනය කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්ත ශාලාවක් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. | | | | | | |
| ව්‍යාපෘතියේ අරමුණු | විදේශ විනිමය ඉපයීම හා ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ඉහල නැංවීම. | | | | | | |
| උපකල්පිත තත්ත්වය | තැඹිලි වතුර නිෂ්පාදන කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම. | | | | | | |
| ව්‍යාපෘති කාලය | කෙටිකාලීන (1>වර්ෂය) | | මධ්‍ය කාලීන (1-3 වර්ෂ) | | ✓ දීර්ඝ කාලීන (3<වර්ෂ) | | |
| ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය | කර්මාන්ත කලාපය | | | | | | |

**ව්‍යාපෘති අංක 22 -** වාරි ජලය ප්‍රවාහනය කරනු ලබන ඇළ මාර්ග හා වැව් පද්ධතිය සංවර්ධනය කිරීම.

| | |
|---|---|
| 1. ව්‍යාපෘතියේ නම | වාරි ජලය ප්‍රවාහනය කරනු ලබන ඇළ මාර්ග හා වැව් පද්ධතිය සංවර්ධනය කිරීම. |
| 2. ව්‍යාපෘති අංශය | කර්මාන්ත සංවර්ධන සැලැස්ම. |

3. ව්‍යාපෘති විස්තරය

<table>
<tr><td>පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>ප්‍රා.ලේ. කොට්ඨාශය</td><td>ග්‍රාම නිළධාරී වසම</td></tr>
<tr><td>උතුරු මැද</td><td>අනුරාධපුර</td><td>තලාව</td><td>-</td></tr>
<tr><td colspan="4">පිහිටීම</td></tr>
<tr><td>උතුර<br>දකුණ<br>නැගෙනහිර<br>බටහිර</td><td colspan="2">නේවාසික හා කෘෂි බිම් වලින් ආවරණය වූ ප්‍රදේශය</td><td rowspan="2"> 
</td></tr>
<tr><td>මුළු භූමි ප්‍රමාණය</td><td colspan="2">-</td></tr>
<tr><td>වර්තමාන තත්ත්වය/අවට භාවිතය</td><td colspan="3">කෘෂිකාර්මික ප්‍රදේශ සඳහා ජලය බෙදා හැරීම හා ප්‍රවාහනය කිරීම සිදු කරනු ලබන අතර, ඇතැම් ඇළ මාර්ග හා වැව් වලට අදාල ගබඩා කල හැකි ජල ධාරිතාව අඩුවීමේ තර්ජනයට ලක්ව ඇත.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="3"></td></tr>
</table>

4. අපේක්ෂිත තත්ත්වය

<table>
<tr><td rowspan="2">ව්‍යාපෘති වර්ගය</td><td colspan="2">නව</td><td>වැඩිදියුණු කිරීම</td><td colspan="2">දීර්ඝ කිරීම</td><td colspan="2">ඉඩම් සංවර්ධනය පමණක්</td></tr>
<tr><td colspan="2"></td><td>✓</td><td colspan="2"></td><td colspan="2"></td></tr>
<tr><td rowspan="2">ව්‍යාපෘති ප්‍රභේදය</td><td>සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)</td><td>වාණිජ</td><td>භූ දර්ශන හා විනෝද කටයුතු</td><td>නිවාස</td><td>නැවත පදිංචි කිරීම්</td><td>යටිතල පහසුකම් සංවර්ධනය</td><td>වෙනත්</td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td>✓ (කෘෂි කර්මාන්ත)</td></tr>
<tr><td>ව්‍යාපෘති පදනම</td><td colspan="7">සමස්ත ප්‍රාදේශීය සහා බල ප්‍රදේශයේ ප්‍රධානතම ආර්ථික විභවතාවය බවට පත්ව ඇත්තේ කෘෂිකර්මාන්තයයි. කෘෂිකර්මාන්තය ඉතා හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රබල සාධකයක් වන්නේ මනා ජල සැපයුම හරහා ජල කළමනාකරණයයි. වර්තමානය වන විට ප්‍රදේශය තුල පිහිටා ඇති එල්ලංගා පද්ධතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවන මට්ටමකට පත්ව ඇත. මෙහිදී ඇළ මාර්ග මගින් නිසි ලෙස ජලය ප්‍රවාහනය කිරීමට නොහැකි ලෙස ඇළ මාර්ග ගොඩවීමේ තර්ජනයට ලක්ව ඇති අතර, ප්‍රදේශය තුල පිහිටා තිබෙන වැව් පද්ධතියද ගොඩවීමේ තර්ජනයට ලක්ව ඇත. එබැවින් වැව් පද්ධතියේ ජල ධාරිතාව අඩුවී ඇති අතර, එය අයහපත් ආකාරයට ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයට බලපානු ලබයි. නියඟ වැනි ජලය හිඟ කාල වලදී වගා හානි තත්ත්වයන් මඟ හරවා ගැනීම සඳහාත් ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසාත් මෙම ව්‍යාපෘතිය යෝජනා කරනු ලබයි.</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ අරමුණු</td><td colspan="7">ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය නගා සිටුවීම හා ශක්තිමත් ජල කළමනාකරණයක් ප්‍රදේශය තුළ පවත්වාගෙන යාම.</td></tr>
<tr><td>උපකල්පිත තත්ත්වය</td><td colspan="7">ප්‍රදේශයේ කෘෂිආර්ථිකය ශක්තිමත් කිරීම හා ශක්තිමත් ජල කළමනාකරණයක් ප්‍රදේශය තුළ පවත්වාගෙන යාම.</td></tr>
<tr><td>ව්‍යාපෘති කාලය</td><td colspan="2">කෙටිකාලීන (1> වර්ෂය)</td><td colspan="2">මධ්‍ය කාලීන (1-3 වර්ෂ)</td><td colspan="3">✓ දීර්ඝ කාලීන (3<වර්ෂ)</td></tr>
<tr><td>ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය</td><td colspan="7"></td></tr>
</table>

**ව්‍යාපෘති අංක 23 -** කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 1. ව්‍යාපෘතියේ නම | කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය |
| 2. ව්‍යාපෘති අංශය | කර්මාන්ත සංවර්ධන සැලැස්ම |

3. ව්‍යාපෘති විස්තරය

<table>
<tr><td>පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>ප්‍රා.ලේ. කොට්ඨාශය</td><td>ග්‍රාම නිළධාරී වසම</td></tr>
<tr><td>උතුරු මැද</td><td>අනුරාධපුර</td><td>තඹුත්තේගම</td><td>තම්මැන්නාගම 2</td></tr>
<tr><td colspan="4">පිහිටීම</td></tr>
<tr><td>උතුර<br>දකුණ<br>නැගෙනහිර<br>බටහිර</td><td colspan="2">තඹුත්තේගම මහජන පොළ, යෝජිත ආර්ථික මධ්‍යස්ථානය හා යෝජිත මූල්‍ය මධ්‍යස්ථානය</td><td rowspan="2"> 
</td></tr>
<tr><td>මුළු භූමි ප්‍රමාණය</td><td>-</td></tr>
<tr><td>වර්තමාන තත්ත්වය/අවට භාවිතය</td><td colspan="3">හිස් ඉඩමක් ලෙස පවතී.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="3">-</td></tr>
</table>


4. අපේක්ෂිත තත්ත්වය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | | දීර්ඝ කිරීම | ඉඩම් සංවර්ධනය පමණක් | |
| | ✓ | | | | | | |
| ව්‍යාපෘති ප්‍රභේදය | සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක) | වාණිජ | භූ දර්ශන හා විනෝද කටයුතු | නිවාස | නැවත පදිංචි කිරීම් | යටිතල පහසුකම් සංවර්ධනය | වෙනත් |
| | | | | | | ✓ | |
| | තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය වෙත අති විශාල ප්‍රමාණයෙන් ගොවි මහතුන් මෙන්ම කෘෂිකර්මාන්තය හා සම්බන්ධ විවිධ පුද්ගලයන් තමාගේ වාණිජ හා කෘෂිකාර්මික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා දෛනිකව පැමිණේ. මෙහිදී කරන ලද විශ්ලේෂණයන් මගින් තහවුරු වූයේ කෘෂිකර්මාන්තයට අදාල තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් එම පුද්ගලයන් සතු දැනුම ඉතා අල්ප බවයි. එබැවින් ඔවුන් සතු දැනුම වර්ධනය කිරීම සඳහා හා එම තාක්ෂණික දැනුම ප්‍රායෝගිකව යොදවාගැනීමට හැකි පරිදි කෘෂි තාක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. එහිදී ජල කළමනාකරණය, පොහොර භාවිතය, පලිබෝධ නාශක පිළිබඳ දැනුම, කෘෂි නිෂ්පාදනයන් ප්‍රවාහනය කිරීම, යනාදී ලෙස හා තවත් කෘෂිකර්මාන්තය හා බැඳි ක්‍රියාකාරකම් වලට අදාල දැනුම ප්‍රායෝගිකව ලබාදෙන ස්ථානයක් ලෙස මෙම ස්ථානය සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, එමගින් ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමත්, කෘෂි ආර්ථිකය වර්ධනය කිරීමත්, කෘෂිකර්මාන්තයට අදාල සම්පත් ප්‍රශස්ථ ආකාරයෙන් භාවිතයට ගැනීම ඉහළ මට්ටමකට පත් කරලීමත් අපේක්ෂා කරනු ලබයි. | | | | | | |
| ව්‍යාපෘතියේ අරමුණු | ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම, මනා ජල කළමනාකරණයක් ප්‍රදේශය තුළ පවත්වාගෙන යාම හා කෘෂිකර්මාන්තයට අදාල තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් ගොවි මහතුන් හා කෘෂිකර්මාන්තය හා සම්බන්ධ විවිධ පුද්ගලයන් සතු දැනුම වර්ධනය කිරීම. | | | | | | |
| උපකල්පිත තත්ත්වය | ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම, මනා කළමනාකරණයක් ප්‍රදේශ තුළ පවත්වාගෙන යාම හා කෘෂිකර්මාන්තයට අදාල තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් ගොවි මහතුන් හා කෘෂිකර්මාන්තය හා සම්බන්ධ විවිධ පුද්ගලයන් සතු දැනුම වර්ධනය කිරීම. | | | | | | |
| ව්‍යාපෘති කාලය | කෙටිකාලීන (1> වර්ෂය) | | මධ්‍ය කාලීන (1-3 වර්ෂ) | | ✓ දීර්ඝ කාලීන (3<වර්ෂ) | | |
| ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය | අධි ඝනත්ව වාණිජ කලාපය | | | | | | |

**ව්‍යාපෘති අංක 24 -** නගර ආශ්‍රිත ගිමන් හැරීමේ ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 1. ව්‍යාපෘතියේ නම | නගර ආශ්‍රිත ගිමන් හැරීමේ ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. |
| 2. ව්‍යාපෘති අංශය | පරිසර කළමනාකරණ සැලැස්ම. |

3. ව්‍යාපෘති විස්තරය

| | | | |
|---|---|---|---|
| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ග්‍රාම නිළධාරී වසම |
| උතුරු මැද | අනුරාධපුර | තඹුත්තේගම හා තලාව | තම්මැන්නාගම 2, ඉහළ තලාව, කෝන්ගොල්ලෑව, එප්පාවල 1, එළියදිවුල්වැව |
| පිහිටීම | | | |
| උතුර<br>දකුණ<br>නැගෙනහිර<br>බටහිර | ඉතා මනස්කාන්ත අයුරින් සංවර්ධනය කල හැකි වුවද හිස් ඉඩම් ලෙස පවතී. |  | |
| මුළු භූමි ප්‍රමාණය | - | | |
| වර්තමාන තත්ත්වය/අවට භාවිතය | ඉතා මනස්කාන්ත අයුරින් සංවර්ධනය කල හැකි වුවද, දැනට හිස් ඉඩම් ලෙස පවතී. | | |
| ඉඩමේ අයිතිය | - | | |

4. අපේක්ෂිත තත්ත්වය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | | දීර්ඝ කිරීම | ඉඩම් සංවර්ධනය පමණක් | |
| | ✓ | | | | | | |
| ව්‍යාපෘති ප්‍රභේදය | සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක) | වාණිජ | භූ දර්ශන හා විනෝද කටයුතු | නිවාස | නැවත පදිංචි කිරීම් | යටිතල පහසුකම් සංවර්ධනය | වෙනත් |
| | | | ✓ | | | | |
| ව්‍යාපෘති පදනම | සමස්ත භූමි පරිහරණ රටාව නිර්මාණය වී තිබෙන්නේ නීල හරිත භූමි පරිහරණ රටාවක් ලෙසය. මෙහිදී, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අනුරාධපුර ප්‍රධාන නගරයට මායිම්ව පිහිටා ඇති අලංකාර ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. අනුරාධපුර නගරය ඇතුළු ප්‍රදේශයේ ප්‍රධානතම නගර වෙත මෙම ප්‍රදේශය හරහා ගමන් කරනු ලබන මගීන්ට ගිමන් හැරීමට හැකි ස්ථාන ලෙස සංවර්ධනය කිරීමෙන් ප්‍රදේශයට වැඩි ආකර්ෂණයක් ලබාගත හැකි අතර, ඒ හරහා ප්‍රදේශයේ වටිනාකම වර්ධනය කිරීමට දායකත්වයක් ලබාදීමට අපේක්ෂා කරනු ලබයි. | | | | | | |
| ව්‍යාපෘතියේ අරමුණු | පාරිසරික සුන්දරත්වය වර්ධනය වන අයුරින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදුකිරීම හා ප්‍රදේශයට වැඩි වටිනාකමක් ලබාදීම. | | | | | | |
| උපකල්පිත තත්ත්වය | පාරිසරික සුන්දරත්වය වර්ධනය වන අයුරින් සංවර්ධන කටයුතු සිදු කිරීම හා ප්‍රදේශයට වැඩි වටිනාකමක් ලබාදීම. | | | | | | |
| ව්‍යාපෘති කාලය | කෙටිකාලීන (1>වර්ෂය) | | මධ්‍ය කාලීන (1-3 වර්ෂ) | | ✓ දීර්ඝ කාලීන (3<වර්ෂ) | | |
| ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය | | | | | | | |

# 11 වන කොටස

# හත්වන පරිච්ඡේදය

# සංවර්ධන කලාප හා කලාප නියමතා

## 7.1 හැඳින්වීම


තලාව නගර සංවර්ධන සැලැස්ම (2023-2033) මඟින් ‘‘අනුරාධපුර සෞභාග්‍යමත් කෘෂි දොරටුව’’ පිළිබඳ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරි වසර 10 තුළ ඉලක්ක සහ අභිමතාර්ථ තුලින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. මෙම ඉලක්ක සහ අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා උපාය මාර්ගික සැලසුම් හඳුන්වා දී ඇති අතර, එම උපාය මාර්ගික සැලසුම්වල එක් සැලැස්මක් ලෙස සංවර්ධන කලාප සහ සැලසුම් රෙගුලාසි හඳුන්වා දිය හැකිය.

විශේෂයෙන්ම, මෙම සැලැස්මේදී සාම්ප්‍රදායික ඉඩම් පරිහරණය සහ සාම්ප්‍රදායික කලාපීකරණ සැලසුම් වලින් ඔබ්බට ගොස් ඝනත්වය මත පදනම්ව සංවර්ධනය සඳහා අවස්ථාව ලබා දෙන අතර, එමඟින් යෝජිත නාගරික ආකෘතිය නිර්මාණය කිරීමට අදහස් කෙරේ. තවද, සංවර්ධන කලාප සහ කලාපීකරණ රෙගුලාසි පිළිබඳව මෙහිදී සවිස්තරාත්මකව විස්තර කරන අතර සංවර්ධන කලාප, කලාප සංගුණකය, සංවර්ධන කලාප සඳහා අවසර ලත් භාවිතයන් සහ එම සංවර්ධන කලාපවලට බලපාන පොදු රෙගුලාසි විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

කලාපීකරණ සැලැස්ම සකස් කිරීම සහ එහි මායිම් තීරණය කිරීම සැලසුම් ප්‍රදේශයට අදාළ විශ්ලේෂණයන් සහ නාගරීකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් බව පැවසිය හැකි අතර, තලාව නගර සංවර්ධන සැලැස්මේ (2023-2033) කලාප හඳුනාගැනීමේදී සැලසුම් සංකල්පය, සංවර්ධන පීඩක විශ්ලේෂණය, සංවේදීතා විශ්ලේෂණය ජීවත්වීමට සුදුසු ප්‍රදේශ පිළිබඳ විශ්ලේෂණය විභවතා විශ්ලේෂණය, ප්‍රධාන නගරවලින් දුරස්ථභාවය සහ යටිතල පහසුකම් පුළුල් කිරීම වැනි විශ්ලේෂණ හා කරුණු උපයෝගී කරලන්නා ලදී.

## 7.2 සංවර්ධන කලාප

**සිතියම් අංක 32 සංවර්ධන කලාප**




මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය - 2023

## 7.3 කලාප සංගුණකය

කලාප සංගුණකය යනු සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක කරන ලද ගෙබිම් අනුපාතය වෙනුවට හඳුන්වා දුන් නව සංකල්පයකි. මෙම සංගුණකය මත පදනම්ව සැලසුම් සකස් කිරීම සහ ගොඩනැගිලි රෙගුලාසි සකස් කිරීම සිදු කරනු ලබන අතර, මෙමගින් යම් ප්‍රදේශයක අවසර දී ඇති උපරිම සංවර්ධනයේ ප්‍රමාණය තීරණය වෙයි. එමෙන්ම සංවර්ධනකරුට ඔහුගේ සංවර්ධනය සිදුකිරීමට සාධාරණ අවස්ථාවක් ලබා දී ඇත. තලාව නගර සංවර්ධන සැලැස්ම (2023-2033) මඟින් වසර 2033 වන විට එම ප්‍රදේශය සඳහා ඝනත්වය පදනම් කරගත් සංවර්ධනයක් සිදු වනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. එය අඩු ඝනත්ව මට්ටමේ සිට මධ්‍යස්ථ සහ වැඩි ඝනත්ව කලාප දක්වා විහිදී යන ආකාරයට සකස් කරනු ලබන අතර, ඒ අනුව යෝජිත නාගරික ආකෘතිය 2033 වන විට ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඩම්වල සිදුවන සංවර්ධන කටයුතු වලට මෙය සෘජුවම බලපානු ලබන අතර, කලාප සංගුණකය යටතේ තීරණය කරනු ලබන උපරිම සංවර්ධනයේ ස්වාභාවය මත අපේක්ෂිත නාගරික ආකෘතිය නිර්මාණය වීම සිදු වේ.

කිසියම් ප්‍රදේශයක උපරිම සංවර්ධනයේ ප්‍රමාණය තීරණය කිරීමට පෙර, සංවර්ධනය සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම ප්‍රථමයෙන් සිදු කළ යුතුය. ඒ අනුව, අධි ඝනත්ව, මධ්‍යස්ථ ඝනත්ව සහ අඩු ඝනත්ව සංවර්ධන කලාප නිර්ණය කිරීම, විශ්ලේෂණ මගින් සිදු කළ අතර, එම නිරීක්ෂණ සහ නාගරික ක්‍රියාකාරකම් පිළිබඳ සලකා බලමින් කලාප තීරණය කරනු ලැබේ. මෙම කලාප සංගුණකය ප්‍රදේශයේ සියලු සංවර්ධන කටයුතු සඳහා සෘජු බලපෑමක් සිදු කරනු ලබන හෙයින් මෙම සියලු සාධක භෞතික, සමාජයීය, පාරිසරික සහ ආර්ථික අංශ සමඟ සමතුලිත විය යුතුය.

ඒ අනුව, පාරිසරික සංවේදීතාව, සංවර්ධන කටයුතු වල තීව්‍රතාවය සහ එහි දිශානතිය, යටිතල පහසුකම් බෙදා හැරීම, වාණිජ කටයුතු වල සංවර්ධනය, භූගෝලීය තත්ත්වයන් සහ ජන ඝනත්වය මත පදනම්ව කලාප තීරණය කර ඇති අතර, ඒ අනුව, සංවර්ධන සැලැස්ම යටතේ එක් එක් කලාපය සඳහා කලාප සංගුණකයක් ලබා දී ඇත. එක් කලාපයක කලාප සංගුණකය අනෙකුත් කලාප වලට වඩා ඉහළ අගයක් ගන්නා අවස්ථාවන්හිදී එහි ඉහළ වාණිජ සංවර්ධනයක් සඳහා විභවතාවයක් පවතින අතර, එම ප්‍රදේශ වල යටිතල පහසුකම් සුදුසු පරිදි පවතින බැවින් කලාපය තුළ ඉහළ ජන ආකර්ෂණයක් ද සිදුවේ. සලකා බලන ප්‍රදේශය තුළ පරිසර සංවේදී ප්‍රදේශයක් තිබේ නම් හෝ එවැනි ප්‍රදේශ නිසා සංවර්ධනය සඳහා ඉඩම් අහිමි වීම සිදුවන්නේ නම් හෝ යටිතල පහසුකම් හිඟයක් පවතී නම් හෝ අපේක්ෂිත නාගරික මට්ටම අඩු අගයක් ගන්නා අතර, කලාප සංගුණකයේ අගය ද අඩු අගයක් ගනී.

### 7.3.1 කලාප සංගුණකය තීරණය වන ආකාරය

සංවර්ධන සැලැස්මේ දැක්ම සහ අරමුණු ළඟා කර ගැනීම සඳහා අනාගතයේ අපේක්ෂා කරනු ලබන නාගරික ස්වරූපය, අනාගතයේදී සංවර්ධන කටයුතු සීමා කරන ප්‍රදේශ, පාරිසරික සංවේදීතාව, නේවාසික, වාණිජ සහ වෙනත් භාවිතයන් සඳහා ඇති මුළු ඉඩම් ප්‍රමාණය අනුව කලාපීකරණ සාධකය තීරණය වේ. ඒ අනුව, අනාගතයේදී අපේක්ෂිත සංවර්ධන කටයුතු වල ඝනත්වය සංවර්ධනය කළ හැකි ඉඩම් ප්‍රමාණයෙන් බෙදූ විට එක් එක් කලාප සඳහා වූ කලාප සංගුණකය ලබාගත හැකිය.

ඒ අනුව, සංවර්ධන සැලැස්මේ එක් එක් සංවර්ධන කලාපවල අපේක්ෂිත සංවර්ධන තීව්‍රතාවය තීරණය කිරීම කලාප සංගුණකය යටතේ සිදු කරනු ලබයි. කලාප සංගුණකය අවම 0.5 සිට 4.0 දක්වා විචලනය වේ. කලාපවල ඉතා ඉහළ සංවර්ධනයක් අපේක්ෂා කරන්නේ නම්, මෙම අගය 1.0 ට වඩා වැඩි වනු ඇත. උදාහරණයක් ලෙස, කලාපීකරණ සංගුණක අගය 2.0 හෝ ඊට වැඩි නම්, එයින් අදහස් වන්නේ කලාපය තුළ වැඩි සංවර්ධන ඝනත්වයක් කරා ගමන් කළ හැකි බවයි. 0.5 සිට 1.0 දක්වා අගයකදී එය අඩු සහ / සාමාන්‍ය සංවර්ධනයකට ඉඩ සලසන අතර 1.5 සිට 2.0 දක්වා මධ්‍යම ඝනත්ව වර්ධනයකට ඉඩ සලසයි.

තලාව නගර සංවර්ධන සැලැස්මේ යෝජිත කලාප සැලැස්ම මඟින් එක් එක් කලාපය සඳහා කලාප සංගුණකයක් හඳුන්වා දී ඇත. (සිතියම් අංක 32) මෙහිදී, ඉහළම කලාපීකරණ සංගුණකය (2.0) පවතින්නේ අධි ඝනත්ව වාණිජ කලාපයේ වන අතර, ඉහළ සංවර්ධනයක් ආකර්ෂණය කර ගැනීමේ අරමුණ ඇතිව මෙම කලාපය වෙන් කර ඇත. එමෙන්ම තඹුත්තේගම නගරයට සමගාමීව තලාව සහ එප්පාවල යන නගර සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (තලාව) මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (එප්පාවල) හා කර්මාන්ත කලාපයන්හි කලාප සංගුණකය 1.5 ක අගයක් සහිත ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, එමඟින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉහළ නැංවීමටත් තලාව හා එප්පාවල යන නගර තඹුත්තේගම නගරයේ ක්‍රියාකාරීත්වයට පාදක වන සහයෝගී නගර ලෙස සංවර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලබයි.

### 7.3.2 සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන්

| **සංවර්ධන කලාපය** | **උප සංවර්ධන කලාපය** | **කලාප කේතය** | **කලාප සංගුණකය** |
|---|---|---|---|
| නේවාසික කලාපය (Residential Zone) | නේවාසික කලාපය | R1 | 0.5 |
| වාණිජ කලාපය (Commercial Zone) | අධි ඝනත්ව වාණිජ කලාපය | C1 | 2 |
| | මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය | C2 | 1.5 |
| මිශ්‍ර සංවර්ධන කලාපය (Mix Development Zone) | මිශ්‍ර සංවර්ධන කලාපය | MD1 | 1 |
| කර්මාන්ත කලාපය (Industrial Zone) | කර්මාන්ත කලාපය | I | 1.5 |

## 7.4 කලාපීකරණ පොදු නියමතා

පහත සඳහන් නියමතා මෙම සැලැස්මේ පොදු නියමතා ලෙස සියලුම කලාප සඳහා බලාත්මක වේ.

1. තලාව නගර සංවර්ධන සැලැස්ම තුළ ඇතුළත් කර ඇති සියලු කලාප හා කලාප වලට අදාල රෙගුලාසි, වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 03 වන වගන්තිය යටතේ, වර්ෂ 2001 අප්‍රේල් 10 වන දින අංක 1179/11 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත අනුරාධපුර දිස්ත්‍රික්කයේ විසල් අනුරාධපුර සංවර්ධන සැලසුම් යෝජනා ක්‍රමය තුල පිහිටි තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පමණක් සීමා වේ.

2. කිසියම් සංවර්ධන කටයුත්තක් සිදුකිරීමේදී ඊට අදාළ වන සැලසුම් හා සංවර්ධන රෙගුලාසි 2021.07.08 දිනැති, අංක 2235/54 දරන ගැසට් නිවේදනය මගින් නීති ගත කර ඇත. එම නීතිගත කරන ලද නියෝග හා රෙගුලාසි (කලාපීකරණ පොදු නියමතා වල සඳහන් කර නොමැති) තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ද බලාත්මක වේ.

3. 1986.03.10 දිනට පසු නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ වල ඉඩම් අනුබෙදුම් විය යුතු අවම බිම් ප්‍රමාණය ව.මී.150 ක් වන අතර, එම දිනට පෙර අනුබෙදුම් කර ඇති ඉඩම් සඳහා අවම බිම් ප්‍රමාණය ව.මී. 150 ට අඩු වුවහොත් පවත්නා බිම් කට්ටියක් ලෙස ද සලකනු ලබයි. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය 2001 අප්‍රේල් 10 වන දින නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බැවින්, අනුබෙදුම් කටයුතු වලදී ඊට පෙර පැවති අනුබෙදුම් පවත්නා බිම් කට්ටි ලෙස සලකා කටයුතු කරනු ලබයි.

4. සංවර්ධන නියාමන ප්‍රදේශ සඳහා සංවර්ධන නියාමන සැලසුම් මගින් (Development Guide Plan) හඳුන්වා දෙනු ලබන රෙගුලාසි අදාළ වේ. එම රෙගුලාසි හඳුන්වාදෙන තෙක් මෙම සැලැස්මේ සඳහන් කලාපීකරණ රෙගුලාසි එම ප්‍රදේශ සඳහාද බල පැවැත්වේ. කෙසේ වුවද, ඉහත සංවර්ධන නියාමන ප්‍රදේශයන්හි සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබාගත යුතු අතර, අධිකාරිය විසින් සකස් කර ඇති කෙටුම්පත් සංවර්ධන නියාමන සැලැස්මට අනුව, සංවර්ධනයන් තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

5. යම් ඉඩමක අයිතිකරුවකු විසින්, වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්, යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සලකා බැලීමට සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු

ලබයි. නමුත් බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිය යුතුය.

6. එකිනෙකට ස්වායක්තව ප්‍රධාන මාර්ගයන් හා සම්බන්ධ වන, අවම පළල මීටර් 6 හෝ ඊට වැඩි සහ නිත්‍යානුකූල ප්‍රවේශ අයිතිය හිමි මාර්ග එකකට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධන පරිශ්‍රයට මුහුණලා ඇති අවස්ථාවන්හිදී, ප්‍රවේශ මාර්ගයේ පළල ලෙස එකී සියලු මාර්ගවල පළලේ එකතුව ලෙස සලකා අවසරලත් සංවර්ධනයේ ප්‍රමාණය ගණනය කිරීම අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

7. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සැලසුම් ප්‍රදේශය සඳහා යථා කාලයේ කරනු ලබන ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මේ නියමු උපදේශයන්ට යටත්ව මෙම සැලැස්ම බල පැවැත්වේ.

8. කලාපීකරණ සැලැස්ම මඟින් යම් ස්ථානයක් හෝ දේපලක් යම් විශේෂිත භාවිතාවක් සඳහා පමණක් නම් කර ඇති විටකදී, එම ස්ථානය හෝ දේපල එම නම් කරන ලද කාර්යය සඳහා පමණක් යොදා ගත යුතුය.

9. සංවර්ධන සැලැස්මේ රෙගුලාසි වලින් ආවරණය නොවන්නා වූ යම් සංවර්ධන කටයුත්තක් වේ නම්, ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව මඟින් සිදු කළ යුතුය.

10. මෙම නියමතාවල කවර ආකාරයෙන් සඳහන් වුවද, අධිකාරිය විසින් සංවර්ධන සැලැස්මේ අරමුණු ඉටුකර ගනු පිණිස බිම් කට්ටියක් භාවිතයට ගැනීම, කවර හෝ සංවර්ධන ක්‍රියාවක් තහනම් කිරීම හෝ සීමා කිරීම හෝ නියමතා ලිහිල් කිරීම හෝ නව නියමතා හඳුන්වා දීම කල හැකි වන්නේය.

11. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් අතරට හසු වන සේ ඇත්නම්, එම බිම් කොටසට ප්‍රවේශකත්වය සපයන මාර්ගය අයත් පළාත් පාලන බල ප්‍රදේශයට එම බිම් කොටස අයත් වේ. එසේම කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකකට අයත් මාර්ග වලින් ප්‍රවේශය ලබන්නේ නම්, ප්‍රධාන මාර්ගය අයත් බල ප්‍රදේශයට එම බිම් කට්ටිය අයත් වන අතර, එම මාර්ග දෙකම එකම පළලින් යුක්ත වේ නම්, එම බිම් කොටසේ වැඩි ප්‍රමාණයක් අයත් වන පළාත් පාලන බල ප්‍රදේශයට ඉඩම් කොටස අයත් යැයි සැලකිය යුතුය.

12. අනුමත කරනු ලැබූ භාවිතාවට නිකුත් කල සංවර්ධන බලපත්‍රයේ සඳහන් භාවිතය හැර, යම් ස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් කිසිදු පුද්ගලයකු විසින් අවසරයකින් තොරව වෙනත් කිසිදු භාවිතයකට නොගත යුතුයි.

13. අධිකාරිය විසින් නම් කර ඇති විශේෂ ව්‍යාපෘති ප්‍රදේශ තුළ කිනම් හෝ විශේෂිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා බිම් ප්‍රදේශ භාවිතා කිරීම, සීමා කිරීම හෝ තහනම් කිරීම, මෙම සැලැස්මෙන් පනවා ඇති නියෝග ලිහිල් කිරීම හෝ ප්‍රදේශය සඳහා නියම කර ඇති කාර්යයන් ඉටු කර ගැනීම සඳහා වෙනත් ව්‍යවස්ථා පැනවීම හෝ අධිකාරිය විසින් සිදුකරනු ලැබිය හැක.

14. නිත්‍ය වශයෙන් ඉදිකරනු ලබන විවිධ ආගමික ස්ථාන, ආගමික සංකේත, සලකුණු, ප්‍රතිමා හෝ ඒ හා සමාන ඉදිකිරීම් සඳහා හා පවත්නා ගොඩනැගිල්ලක් එවැනි භාවිත සඳහා වෙනස් කරනු ලැබීම අධිකාරියට සුදුසු යැයි හැඟෙන පරිදි හා නාගරික බල ප්‍රදේශයේ ගති ලක්ෂණ වලට අනුකූල විය යුතුය.

15. යම් කිසි බිම් කොටසක් හෝ ඉදිකිරීමක් විශේෂ භාවිතයක් සඳහා වෙන් කොට නොමැති විට එහි භාවිතය එය පිහිටි කලාපයේ අවසර දී ඇති භාවිතයට අනුකූල විය යුතුය.

16. රක්ෂිතයකට හෝ සංවේදී ප්‍රදේශයකට යාබදව පිහිටා ඇති කිසියම් ස්ථානයක හෝ ඉඩම් කැබැල්ලක සංවර්ධන කටයුත්තක් සිදුකරන්නේ නම්, ඒවායේ රක්ෂිත සම්බන්ධයෙන් අදාළ ආයතනයන්හි නිර්දේශය ලබාගත යුතුය.

17. මෙම සැලසුම් ප්‍රදේශය තුල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනාදී රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීමට ප්‍රථමයෙන් අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් හා සංවර්ධන යෝජනා ලබා ගත යුතු වේ.

18. පුරාවිද්‍යා ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති හෝ අනාගතයේ ප්‍රකාශයට පත් කරනු ලබන ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීමක්, වෙනස් කිරීමක්, කඩාබිඳ දැමීමක්, විකෘති කිරීමක් හෝ

අලාභ හානියකට තුඩු දෙන කිසිදු කටයුත්තක් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය හෝ අවසරයකින් තොරව සිදුනොකළ යුතුය.

19. පුරාවිද්‍යාත්මක, පුරාණ ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම සම්බන්ධව සහ ජාතික උරුමයන් හා සම්බන්ධ සියලු ගොඩනැගිලි හා භූමි භාගයන් පවතින පරිදි සංරක්ෂණය කළ යුතු අතර, වැඩි දියුණු කිරීමක් හෝ ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමේ දී සහ නව ඉදිකිරීමක් සිදු කිරීමේ දී පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා වන පරිදි පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ සහ අදාල ආයතන වල නිර්දේශයන්ට යටත්ව සැලසුම් කල යුතුය.

20. ප්‍රදේශයේ මංසන්ධි මාර්ග දෙපස ගොඩනැගිලි සීමා, මාර්ග පළල් කිරීමේ සීමා හා රක්ෂිත තුල විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ හා සමාන ඉදිකිරීම් සඳහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් සිදු නොකරනු ලබයි.

21. රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට අපොහොසත් වන්නේ නම්, උපරිමය මීටර 500 ක දුරකින් පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය.

22. සැලැස්මේ නියමතා බල පැවැත්වෙනු ලබන දිනය වන විට, කිසියම් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කරනු ලබන භාවිතයක් එම කලාපයට නොගැළපේ නම්, එකී භාවිතය කාලය දීර්ඝ කිරීමෙන් හෝ එහි ගොඩනැගිලි කොටස් හෝ යන්ත්‍ර සූත්‍ර ව්‍යාප්ත කිරීමෙන් හෝ යාබද ඉඩම් වලින් කොටස් එකතු කිරීමෙන් හෝ කිසියම් ව්‍යාප්තියකට තුඩු දෙන ක්‍රියාකාරකම් සඳහා හෝ අවසර දෙනු නොලැබේ. තවද යෝජිත භූමිය හෝ ගොඩනැගිල්ල දිගින් දිගටම පවත්වා ගෙන යාම අහිතකර යැයි හැඟෙන්නේ නම්, එකී නොගැළපෙන භාවිතය නතර කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියට නියම කරනු ලැබිය හැකිය.

23. යම් ස්ථානයක් හෝ දේපලක් යම් විශේෂිත භාවිතයක් සඳහා නම් කර නොමැති විටක දී, කලාපීකරණ සැලැස්ම අනුව එම භාවිතය පිහිටා ඇති කලාපයේ අවසරලත් භාවිතා සඳහා කිසිදු අවහිරතාවයක් නොවිය යුතුය.

24. කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට අයත් වන්නේ නම් එම අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට හසුවන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය සපයන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මගිනි. එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය.

- සංරක්ෂණ කලාප සඳහා මෙම නියමතාවය අදාළ නොවේ.

25. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකකට අයත් වන සේ ඇත්නම්, එම බිම් කොටස එයට ප්‍රධාන ප්‍රවේශය සපයන කලාපයේ භාවිතයන් සඳහා, අදාළ පළාත් පාලන ආයතනවල එකඟතාවය මත අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ. එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් පළාත් පාලන බල ප්‍රදේශය අදාළ කරගත යුතුය.

26. යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටී ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඇතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ. යම් හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇතිවිටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය.

27. යම් කිසි දේපළක් කලාප දෙකක් හෝ වැඩි ගණනකට අයත් වේ නම්, එබඳු බිම් කට්ටියක් සංවර්ධන සැලැස්මේ අරමුණු වලට ඉතාමත් හිතකර වන කලාපයට ඇතුළත් සේ සැලකීම නීත්‍යානුකූල වනු ඇත.

28. අධිකාරියේ අනුමැතියකින් තොරව, සංරක්ෂිත ගොඩනැගිලි තුළ කිසිදු වෙනස් කිරීමක් හෝ අළුත්වැඩියාවක් සිදු නොකළ යුතුය.

29. අධිකාරිය විසින් හඳුනාගනු ලබන ප්‍රදේශ වල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය.

30. පොදු එළිමහන් උද්‍යාන, විනෝද කටයුතු අවකාශ සඳහා දැනට භාවිතා වන හා හඳුනාගෙන ඇති ප්‍රදේශවල එම කටයුතු සඳහා පමණක් අවසර දෙනු ලැබේ.

31. කිසියම් ස්ථානයක හෝ ඉඩම් කැබැල්ලකට යාබද වීථියේ ගොඩනැගිලි සීමාව හා යෝජිත ගොඩනැගිලි සීමාව මෙම සැලැස්මේ දක්වා ඇති පරිදි විය යුතුය.

32. විශේෂ ස්ථානයක ඇති පාරිසරික වටපිටාව ආරක්ෂා කිරීම හා පවත්වා ගෙන යාම සඳහා රක්ෂිත හෝ බාධක කලාප වෙන් කිරීම පිළිබඳ අවසාන තීරණය නාගරික සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් සැලසුම් කමිටුව මඟින් සිදුකරනු ලබයි.

33. සුසාන භූමියක්/ආදාහනාගාරයක් සඳහා යම්කිසි ඉඩමක් වෙන් කරනු ලබන්නේ නම් අදාළ පළාත් පාලන ආයතනයේ නිර්දේශ ලබාගත යුතුය

34. එක් බිම් කට්ටියක් තුල අනුමත භාවිතයන් සහිත ගොඩනැගිලි එකකට වඩා අවසර දෙනු ලැබේ.

35. කලාපීකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත් එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිලිබඳ තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

36. යෝජිත කලාපීකරණ සැලැස්ම තුල අනුමත භාවිතයක් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පමණක් අවසර ලබාදීම සලකා බලනු ලැබේ. නමුත් පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලබා දීම පිලිබඳව සලකා නොබැලූ අතර, භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යැයි හැඟී යන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස නියම කරනු ලැබිය හැකිය.

37. අන්තරාදායක, විෂ හා දූෂක කාරක කර්මාන්ත හෝ ව්‍යාපාර ඉදිකිරීම හෝ ව්‍යාප්ත කිරීම සඳහා අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන ආයතනයන් මඟින් අනුමැතිය/නිර්දේශය ලබා ගත යුතුය.

38. සංවර්ධන සැලැස්ම තුල හඳුනාගෙන නොමැති නමුත් පහත් බිම්, වගුරු බිම්, කුඹුරු, තෙත්බිම් හෝ ඕවිටි හෝ වෙනත් එවැනි ඉඩම් සඳහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියෙහි නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

39. පහත් බිම්, කුඹුරු ඉඩම් හා පාරිසරික සංවේදී ප්‍රදේශ ගොඩකිරීම, ඉදිකිරීම හා භාවිතයට ගැනීම සඳහා අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන ආයතනයන් මඟින් අනුමැතිය / නිර්දේශය ලබා ගත යුතුය.

40. අධිකාරිය විසින් නම් කරන විශේෂ ව්‍යාපෘති හෝ ව්‍යාපෘති ප්‍රදේශ සඳහා වන නියෝග මෙම සැලැස්මේ සඳහන් නියෝගයන් මගින් අභිබවනු ලැබේ.

41. ගොඩනැගිලි සීමාව තුල මායිම් තාප්ප ඉදිකිරීම සඳහා මාර්ගය අයත් ආයතනය සමග නිර්වන්දි ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

42. කලාපීකරණ මායිම් පිළිබඳ ගැටළු අවස්ථාවක් ඇති විට, ඒ පිළිබඳ අවසාන තීරණය ගැනීම නාගරික සංවර්ධන අධිකාරිය සතුවේ.

43. රක්ෂිත ප්‍රදේශ, විශේෂ රක්ෂිත ප්‍රදේශ සඳහා කලාප සංගුණකය අදාල නොවේ. එහිදී එම කලාප සඳහා කලාප රෙගුලාසි පමණක් වලංගු වේ.

44. යම් විශේෂ අවස්ථාවන්හි දී හෝ අනාගතයේ ඇති විය හැකි සංවර්ධන ප්‍රවනතාවයන් හේතු කොට ගෙන කලාප සංගුණකය අඩු හෝ වැඩි කිරීමේ පූර්ණ බලය නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

45. සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන "අවසර දෙනු ලබන මුළු ගෙබිම් ප්‍රමාණය" තීරණය කිරීමේ දී ගැටළු පැන නගින අවස්ථාවල ඒ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

46. යම්කිසි නීතිගත සැලසුම්, සංවර්ධන හෝ ගොඩනැගිලි රෙගුලාසි සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබාදීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතු වේ.

47. කලාපිකරණ සැලැස්මට අදාල කලාප සීමාවන් මෙම සැලැස්මේ දක්වා ඇති පරිදි විය යුතුය.

48. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන, පළාත් පාලන ආයතනය සතු මාර්ග වල ගොඩනැගිලි සීමාව සඳහන් කර නොමැති මාර්ග සඳහා, මාර්ගය මධ්‍යයේ සිට දෙපසට මාර්ගයේ පළල මෙන් ගොඩනැගිලි සීමාවක් පවත්වාගත යුතුය. එසේ පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට මීටර් 3 ට නොඅඩු විය යුතුය.

49. මාර්ග සංවර්ධන අධිකාරියේ හෝ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග සඳහා ගොඩනැගිලි සීමාව එම ආයතන වල නිර්දේශ මත තීරණය කරනු ලබයි.

50. ඉන්ධන පිරවුම්හල් සඳහා බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 1000 (පර්චස් 40) ට නොඅඩු විය යුතු අතර, මුහුණත පළල මීටර් 30 ට නොඅඩු විය යුතුය.

51. දැනට ක්‍රියාත්මක හෝ යෝජිත, රජයේ හෝ අර්ධ රාජ්‍ය ව්‍යාපෘති සඳහා, කලාප සංඥකය, බිම් කැබලි ආවරණය, සංවර්ධන කටයුත්තේ ස්වාභාවය හා ප්‍රමාණය, සංවර්ධන කටයුත්ත සිදුකරන ස්ථානය අධිකාරිය මගින් තීරණය කළ හැක.

52. සියළුම ජාත්‍යන්තර පාසැල්, අර්ධ රාජ්‍ය පාසැල්, පෞද්ගලික හා තෘතීයික අධ්‍යාපන ආයතන, ආගමික ඉගැනුම් මධ්‍යස්ථාන ආදී අධ්‍යාපනය සම්බන්ධ සංවර්ධන කටයුතු සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගත යුතුය.

53. නේවාසික කලාපය තුල සංවර්ධනය කරනු ලබන සියලුම ජාත්‍යන්තර පාසැල්, අර්ධ රාජ්‍ය පාසැල්, පෞද්ගලික තෘතීයික අධ්‍යාපන ආයතන, ආගමික ඉගැනුම් මධ්‍යස්ථාන ආදී අධ්‍යාපනය සම්බන්ධ සංවර්ධන කටයුතු සඳහා මූලික සැලසුම් නිරාකරණය ලබා ගැනීමට දින 30 පෙර, අදාල භූමිය තුළ වූ දැන්වීම් පුවරුවක් මඟින් මහජනයා දැනුවත් කිරීමට කටයුතු කල යුතුය (පවතින

විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා දැන්වීම් පුවරුව තුල නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිනය සඳහන් කළ යුතුය).

54. ආගමික මධ්‍යස්ථාන හා ආගමික ඉගැනුම් මධ්‍යස්ථාන සඳහා අවම බිම් ප්‍රමාණය ව.මී.1000 ක් (පර්චස් 40ක්) විය යුතු මෙන්ම, අදාළ ග්‍රාම නිළධාරී වසමේ ජනගහනයෙන් 33% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකී ආගමට අයත් විය යුතු අතර, ඒ සඳහා අදාල ආයතන වල නිර්දේශ ලබාගත යුතුය.

55. පාසැල්, ළමා නිවාස, වැඩිහිටි නිවාස හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී විවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් 50% ක ප්‍රමාණයක් විවෘතව තැබිය යුතුය.

56. කුකුළු ගොවිපළ, උෟරු ගොවිපළ, එළු ගොවිපළ, මත්ස්‍ය ගොවිපල, පක්ෂි ගොවිපල, මස්, මාළු වෙළඳසැල් ආදී සියළු සංවර්ධන කටයුතු සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගත යුතුය. එහිදී දින 30 ට පෙර අදාල භූමිය තුළ වූ දැන්වීම් පුවරුවක් මඟින් මහජනයා දැනුවත් කිරීමට කටයුතු කල යුතුය. (පවතින විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිනය සඳහන් කළ යුතුය).

57. සියලුම කර්මාන්ත හා සම්බන්ධ කටයුතු සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගත යුතුය.

58. ඛණිජ කැණීම් සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගත යුතුය.

59. සියලු කැණීම් කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු අදාළ ආයතනයන්හි නිර්දේශයන්ට අනුව සිදුකල යුතු අතර, එම කටයුත්ත නිම වීමෙන් පසුව එකී ආයතනයේ නිර්දේශයට අනුකූලව කැණීම් කරන ලද ස්ථාන යථා තත්ත්වයට පත් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

60. ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර 0.5 හෝ ඊට වැඩි අනුබෙදුමක් හෝ ඒකාබද්ධ කිරීමකදී මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගත යුතුය.

61. කැබලි 04 හෝ ඊට වැඩි අනුබෙදුමකදී හෝ කැබලි වල එකතුව කැබලි 04 හෝ ඊට වැඩි කැබලි ඒකාබද්ධ කිරීමකදී මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගත යුතුය.

62. මිනින්දෝරු සැලැස්මක වලංගු කාලය ලෙස සැලැස්ම පිළියෙල කරන ලද දිනයේ සිට වසර දහයක් දක්වා ඉදිරියට සලකනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හීදී නව මිනින්දෝරු සැලැස්මක් ඉල්ලීමේ බලය සැලසුම් කමිටුව සතු වේ.

63. කලාපයක් තුළ පවතින යම් භාවිතයක් පවත්නා කලාපයේ රෙගුලාසි වලට පටහැනි වුවද, අදාල භාවිතය යෝජිත කලාපය වෙත පුනස්ථාපනය කරන තෙක් දැනට පවත්නා භාවිතය එම කලාපය තුළ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් සලකා බැලිය හැක.

64. සියළුම කලාප වල සිදුකරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම්, පරිසර සංරක්ෂණ කලාපීකරණ සැලැස්ම යටතේ දක්වා ඇති නියමතා අනුව සිදුකල යුතුය.

65 කලාපීකරණ සිතියමේ පෙන්වා දී ඇති මායිම් පදනම් වී ඇත්තේ 2023 වර්ෂයේ Google Earth Decimal Degree අනුව පෙන්වා දී ඇති X හා Y ඛණ්ඩාංක පදනම් කරගෙනය.

## 7.5 සංවර්ධන කලාප නියමතා

### 7.5.1 නේවාසික කලාපය සඳහා කලාපීකරණ නියමතා

| | |
|---|---|
| **i. ප්‍රධාන කලාපය** | නේවාසික කලාපය |
| **ii. කලාප ලක්ෂණ** | මෙම කලාපය තුළ ප්‍රධාන භාවිතය නේවාසික වන අතර, ඉඩ දෙනු ලබන අනෙකුත් සියලු භාවිතයන් නේවාසික භාවිතය පවත්වාගෙන යාමට හේතු වන භාවිතයන් විය යුතුය. |
| **iii. කලාප මායිම්** | උතුරට<br>නැගෙනහිරට<br>දකුණට<br>බටහිරට<br>} අක්ෂාංශ හා දේශාංශ මඟින් දක්වා ඇත. |
| **iv. කලාප අංකය** | R1 |
| **v. කලාප සංගුණකය** | 0.5 |
| **vi. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | වගු අංක 20 හා 21 පරිදි විය යුතුයි. |
| **vii. අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | වගු අංක 20 හා 22 පරිදි විය යුතුයි. |
| **viii. විවෘත අවකාශයන් සහ උපරිම උස** | වගු අංක 21 හා 22 පරිදි විය යුතුයි. |
| **ix.** අනුබෙදීම් කල හැකි **අවම බිම් ප්‍රමාණය** | ව. මී. 250 |
| **x. අවසරලත් භාවිතාවන්** | නේවාසික කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන්ට අනුව විය යුතුයි. |
| **xi. කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | 7.4 අනුව විය යුතුයි. |

## 7.5.2 නේවාසික කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන්

| ප්‍රධාන භාවිතය | අනු අංශික භාවිතය | අනු භාවිතය | නේවාසික |
|---|---|---|---|
| 1.නේවාසික (Residential) | 1 | නිවාස | ඉඩ දෙනු ලැබේ. |
| | 2 | සහාධිපත්‍ය නිවාස සංකීර්ණ | ඉඩ දෙනු ලැබේ |
| | 3 | නිවාස සංකීර්ණ | ඉඩ දෙනු ලැබේ |
| | 4 | නිවාස ව්‍යාපෘති | ඉඩ දෙනු ලැබේ |
| | 5 | නිල නිවාස/සේවක නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 6 | සේවා නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 7 | ස්ටුඩියෝ නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 8 | ඩෝමේට්‍රි | ඉඩ දෙනු ලැබේ |
| | 9 | නේවාසිකාගාර | ඉඩ දෙනු ලැබේ |
| | 10 | දිවා සුරැකුම් මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ |
| | 11 | ගිලන් සේවා මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ |
| | 12 | වැඩිහිටි නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 13 | ළමා නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 14 | ආබාධිත පුනරුත්ථාපන නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 15 | පුනරුත්ථාපන නිවාස/ පරිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 16 | ප්‍රජා ශාලා | ඉඩ දෙනු ලැබේ |
| | 17 | නිවාඩු නිකේතන/සංචාරක බංගලා/Home stay | ඉඩ දෙනු ලැබේ |
| | 18 | ආගන්තුක නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 19 | ලැගුම් හල් | දළ මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම් |
| | 20 | තානායම් | ඉඩ දෙනු ලැබේ |
| | 21 | විශ්‍රාම ශාලා | ඉඩ දෙනු ලැබේ |
| 2. සෞඛ්‍ය ( Health) | 1 | රෝහල් | x |
| | 2 | වෛද්‍ය මධ්‍යස්ථාන (එක් වෛද්‍යවරයෙකු පමණක් සිටින) | දළ මහල් බිම වර්ග මීටර් 50 නොඉක්මවන ඉදිකිරීම් |
| | 3 | වෛද්‍ය මධ්‍යස්ථාන (වෛද්‍යවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු සිටින) | දළ මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම් |
| | 4 | සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන | දළ මහල් බිම වර්ග මීටර් 50 නොඉක්මවන ඉදිකිරීම් |

| | | | |
|---|---|---|---|
| | 5 | රසායනාගාර | x |
| | 6 | ඔසුසල් | දළ මහල් බිම වර්ග මීටර් 50 නොඉක්මවන ඉදිකිරීම් |
| | 7 | පශු වෛද්‍ය සායන | දළ මහල් බිම වර්ග මීටර් 50 නොඉක්මවන ඉදිකිරීම් හා අදාල කසළ , සංවර්ධන භූමිය තුළ කළමනාකරණය පිළිබඳ වන සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. |
| | 8 | පශු වෛද්‍ය රෝහල් | දළ මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම් හා අදාල කසළ , සංවර්ධන භූමිය තුළ කළමනාකරණය පිළිබඳ වන සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. |
| | 9 | නිරෝධායන මධ්‍යස්ථාන | ඉඩදෙනු ලැබේ |
| | 10 | ළමා හා මාතෘ /පවුල් සායන මධ්‍යස්ථාන | දළ මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම් |
| | 11 | 1 සිට 10 දක්වා භාවිතයන්ට අයත් නොවන වෙනත් වෛද්‍ය ආයතන | දල මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම් හා අදාල කසළ, සංවර්ධන භූමිය තුළ කළමනාකරණය පිළිබඳ වන සැලැස්මක් සැලසුම් කම්ටුව වෙත ඉදිරිපත් කළ යුතුය. |
| | 12 | වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 13 | සත්ත්ව සුරැකුම් මධ්‍යස්ථානය | දල මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම් (ප්‍රධාන භාවිතය නේවාසික වේ.) |
| 3. කාර්යාල සහ ආයතනික (Office & Institutional) | 1 | කාර්යාල | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 2 | වෘත්තික කාර්යාල | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 3 | කාර්යාල සංකීර්ණ | X |
| | 4 | බැංකු/රක්ෂණ මූල්‍ය ආයතන | ඉඩ දෙනු ලැබේ. |
| | 5 | 1 සිට 4 දක්වා භාවිතයන්ට අයත් නොවන වෙනත්කාර්යාල සහ ආයතනික භාවිතයන් | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| 4. වාණිජ (Commercial and services) | 1 | සාප්පු සංකීර්ණ | X |
| | 2 | සිල්ලර වෙළඳසැල් | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 3 | තොග වෙළඳසැල් | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 4 | ආංශික වෙළඳසැල් සුපිරි වෙළඳ සැල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 1000 ට නොඅඩු විය යුතුයි. |
| | 5 | විවෘත වෙළඳ සැල් | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 6 | ප්‍රදර්ශනාගාර | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 7 | අවන්හල්/ Take Away | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 8 | අවන්හල්/ Restaurants | දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 9 | උත්සව ශාලා | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 2000 ට නොඅඩු විය යුතුයි. |
| | 10 | තරු පන්ති හෝටල් | x |
| | 11 | හෝටල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 1000 ට නොඅඩු විය යුතුයි. |
| | 12 | නාගරික හෝටල් | x |
| | 13 | සමාජ ශාලා | x |

| | | | |
|---|---|---|---|
| | 14 | මොටෙල් | x |
| | 15 | කබානා හෝටල් | ඉඩ දෙනු ලැබේ. |
| | 16 | විකාශනාගාර | x |
| | 17 | ශබ්දාගාර (විකාශනාගාර නොවන) | x |
| | 18 | රූපලාවන්‍ය මධ්‍යස්ථාන / බාබර් සාප්පු | ඉඩ දෙනු ලැබේ. |
| | 19 | පාරිභෝගික සේවා මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 20 | සම්බාහන මධ්‍යස්ථාන | x |
| | 21 | ටේලර් සාප්පු | ඉඩ දෙනු ලැබේ. |
| | 22 | අවමංගල්‍ය ශාලා | ඉඩ දෙනු ලැබේ. |
| | 23 | මල් ශාලා | ඉඩ දෙනු ලැබේ. |
| | 24 | ලොන්ඩ්‍රි/ ඇඳුම් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 25 | හාඩ්වෙයාර්/ ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණුම් වෙළඳසැල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 500ට නොඅඩු විය යුතුයි. |
| | 26 | වාහන අමතර කොටස් වෙළඳසැල් | ඉඩ දෙනු ලැබේ. |
| | 27 | කුලී රථ සේවා මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 28 | වාහන සේවා මධ්‍යස්ථාන | රථ වාහන සේවා ස්ථාන ලෙස භාවිතා කරනු ලබන පවත්නා බිම් කට්ටි තුළ පමණක් දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 29 | බයිසිකල් / ත්‍රීවීල් | රථ වාහන සේවා ස්ථාන ලෙස භාවිතා කරනු ලබන පවත්නා බිම් කට්ටි තුළ පමණක් දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 30 | සැහැල්ලු වාහන | රථ වාහන සේවා ස්ථාන ලෙස භාවිතා කරනු ලබන පවත්නා බිම් කට්ටි තුළ පමණක් දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 31 | වාහන ඉන්ධන පිරවුම්හල් | x |
| | 32 | දුම්පරීක්ෂණ මධ්‍යස්ථාන | දල මහල් බිම වර්ග මීටර් 50 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 33 | ඔට්ටු ඇල්ලීමේ මධ්‍යස්ථාන | x |
| | 34 | බස් පර්යන්ත | ඉඩ දෙනු ලැබේ. |
| 5.අධ්‍යාපනික (Educational | 1 | පෙර පාසැල් / පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන | ළමුන් ප්‍රමාණය 25 වැඩි නම් අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 1000 වන අතර, ළමුන් ප්‍රමාණය 25 අඩු නම් අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 500 වේ. |
| | 2 | ප්‍රාථමික පාසැල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 3 | ද්විතියික පාසැල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු |

| | | | |
|---|---|---|---|
| | | | විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 4 | තෘතියික පාසැල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 5 | පෞද්ගලික පාසැල් / ජාත්‍යන්තර පාසැල් | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 6 | උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන (Campus) | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 7 | රාජ්‍ය / පෞද්ගලික විශ්ව විද්‍යාල | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 8 | කාර්මික විද්‍යාල / වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන / පුහුණු මධ්‍යස්ථාන | බිම් කට්ටියේ ප්‍රමාණය වර්ග මීටර් 4000 (අක්කර 01) නොඅඩු විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 9 | පෞද්ගලික උපකාරක පන්ති- වර්ග මීටර 50ට අඩු | ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 විය යුතුයි. |
| | 10 | පෞද්ගලික උපකාරක පන්ති- වර්ග මීටර 50 හා වර්ග මීටර 500 අතර | ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 විය යුතුයි. |
| | 11 | පෞද්ගලික උපකාරක පන්ති වර්ග මීටර 500ට වැඩි | x |
| | 12 | කලායතන/රංගායතන | ඉඩ දෙනු ලැබේ. |
| | 13 | අනෙකුත් අධ්‍යාපන ආයතන | x |
| | 14 | පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| 6. සමාජ හා ආගමික (Social & Religious) | 1 | ආගමික මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 2 | ආගමික අධ්‍යාපන මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 3 | කෞතුකාගාර | ඉඩ දෙනු ලැබේ. |
| | 4 | සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන | ක්‍රීඩා භූමියක් තුළ ඉදි කරන්නේ නම් දල මහල් බිම වර්ග මීටර් 150 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 5 | සුසාන භූමි / ආදාහනාගාර | ඉඩ දෙනු ලැබේ. |
| | 6 | ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන | ක්‍රීඩා භූමියක් තුළ ඉදි කරන්නේ නම් දල මහල් බිම වර්ග මීටර් 150 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 7 | ශ්‍රවනාගාර (Auditorium) | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත් විය යුතුයි. |
| | 8 | සම්මන්ත්‍රණ ශාලා | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත් විය යුතුයි. |
| 7. කර්මාන්ත සහ ගබඩා (Industrial) | 1 | වාහන එකලස්/ අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 2 | බෙදා හැරීමේ කටයුතු සඳහා වන ගබඩා | ඉඩ දෙනු ලැබේ. |
| | 3 | ගබඩා/ ගුදම් | ඉඩ දෙනු ලැබේ. |
| | 4 | සේවා කර්මාන්ත | දල මහල් බිම වර්ග මීටර් 50 නොඉක්ම විය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | 5 | ගෘහස්ත කර්මාන්ත | දල මහල් බිම වර්ග මීටර් 50 නොඉක්මවන හා අශ්ව බල 5 නොඉක්මවන කර්මාන්ත. |
| | 6 | ඇසුරුම් කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 7 | ප්‍රතිවක්‍රීකරණ කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 8 | අගය එකතු කිරීමේ කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 200 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 9 | අබලි දෑ එකතු කිරීමේ මධ්‍යස්ථාන | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 10 | බේකරි නිෂ්පාදන දර පෝරණු | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 11 | බේකරි නිෂ්පාදන විදුලි | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 12 | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 13 | උළු සහ ගඩොල් කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 14 | ලී බඩු නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 15 | ඇඹරුම්හල් | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 16 | ලියවන පට්ටල්, වැල්ඩින් වැඩපොලවල් | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 17 | දූෂ්‍ය කාරක නොවන අනෙකුත් කර්මාන්ත (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්වචනය පරිදි ) | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| | 18 | දූෂ්‍ය කාරක අනෙකුත් කර්මාන්ත (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්වචනය පරිදි ) | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 100 නොඉක්මවන ඉදිකිරීම්. |
| 8.විනෝදඋක්ම්ක (Leisure) | 1 | ගෘහස්ත ක්‍රීඩාගාර | ඉඩ දෙනු ලැබේ. |
| | 2 | විවෘත රංග භූමි | ඉඩ දෙනු ලැබේ. |
| | 3 | පුස්තකාල | ඉඩ දෙනු ලැබේ. |
| | 4 | කාය වර්ධන මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 5 | ළමා උද්‍යාන | ඉඩ දෙනු ලැබේ. |
| | 6 | විවෘත පිටිටනි | බිම් කට්ටි ආවරණය 25% නොඉක්මවන ඉදිකිරීම් හා එක් ඒකකයක් පමණක් ඉදි කරන්නේ නම් බිම් කට්ටි ආවරණය සියයට (5%) නොඉක්මවිය යුතුය. |
| | 7 | සිනමා ශාලා | ඉඩ දෙනු ලැබේ. |
| | 8 | පිහිනුම් තටාක | ඉඩ දෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | 9 | උද්‍යාන | ඉඩ දෙනු ලැබේ. |
| | 10 | විනෝදාත්මක උද්‍යාන | ඉඩ දෙනු ලැබේ. |
| 9. කෘෂිකාර්මික හා සීවර කර්මාන්තය (Agriculture & Fisheries) | 1 | බෝට්ටු ජැටි/ පාරු නවාතැන් | ඉඩ දෙනු ලැබේ. |
| | 2 | සීවර තොටුපළවල් | ඉඩ දෙනු ලැබේ. |
| | 3 | සත්ත්ව හා වගා ගොවිපලවල් | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 500 නොඉක්මවන ඉදිකිරීම්. දල මහල් බිම වර්ග මීටර් 100-500 අතර ඉදිකිරීමක් නම් හා අවශ්‍යය යෙදවුම් එම ස්ථානයේ නිෂ්පාදනය කරයි නම් අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 4000 විය යුතු අතර, එම ස්ථානයේ අවශ්‍යය යෙදවුම් නිෂ්පාදනය සිදු නොකරයි නම් පොදු හා කලාපීය රෙගුලාසි අදාල වේ. |
| | 4 | කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 500 නොඉක්මවන ඉදිකිරීම්. දල මහල් බිම වර්ග මීටර් 100-500 අතර ඉදිකිරීමක් නම් හා අවශ්‍යය යෙදවුම් එම ස්ථානයේ නිෂ්පාදනය කරයි නම් අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 4000 විය යුතු අතර, එම ස්ථානයේ අවශ්‍යය යෙදවුම් නිෂ්පාදනය සිදු නොකරයි නම් පොදු හා කලාපීය රෙගුලාසි අදාල වේ. |
| | 5 | සත්ත්ව හා බීජ අභිජනන මධ්‍යස්ථාන | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව දල මහල් බිම වර්ග මීටර් 500 නොඉක්මවන ඉදිකිරීම්. දල මහල් බිම වර්ග මීටර් 100-500 අතර ඉදිකිරීමක් නම් හා අවශ්‍යය යෙදවුම් එම ස්ථානයේ සිදු කරයි නම් අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 4000 විය යුතු අතර, එම ස්ථානයේ අවශ්‍යය යෙදවුම් නිෂ්පාදනය සිදු නොකරයි නම් පොදු හා කලාපීය රෙගුලාසි අදාල වේ. |
| | 6 | හරිතාගාර | ඉඩ දෙනු ලැබේ. |
| 10. වෙනත් (Other) | 1 | Roof ඇන්ටෙනා කුළුණු | ඉඩ දෙනු ලැබේ. |
| | 2 | ඇන්ටෙනා කුළුණු | ඉඩ දෙනු ලැබේ. |
| | 3 | සන්නිවේදන කුළුණු | ඉඩ දෙනු ලැබේ. |
| | 4 | වාහන රථගාල් | ඉඩ දෙනු ලැබේ. |
| | 5 | විදුලි උප පොලවල් | ඉඩ දෙනු ලැබේ. |
| | 6 | වැලි කැණීම්/ ඛනිජ කැණීම් /සේදීම | ඉඩ දෙනු ලැබේ. |
| | 7 | ගල් කැඩීම | ඉඩ දෙනු ලැබේ. |
| | 8 | පස් කැපීම / මැටි කැපීම | ඉඩ දෙනු ලැබේ. |
| | 9 | සනීපාරක්ෂක කටයුතු ගොඩනැගිලි / ජල පොම්පාගාර, ජල පිරිපහදු මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 10 | A.T.M මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 11 | විදුලි ආරෝපණ මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |
| | 12 | කොම්පෝස්ට් ව්‍යුහය /කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ. |

7.5.3 අධි ඝනත්ව වාණිජ කලාපය සඳහා වූ කලාපීකරණ නියමතා

| | | |
|---|---|---|
| **i.** | **ප්‍රධාන කලාපය** | වාණිජ කලාපය |
| **ii.** | **කලාප ලක්ෂණ** | මෙම කලාපය තුළ ප්‍රධාන භාවිතය වාණිජ වන අතර, ඉඩ දෙනු ලබන අනෙකුත් සියලු භාවිතයන් වාණිජ භාවිතය සම්බන්ධ වන භාවිතයන් විය යුතුය. මෙම කලාපය තුළ පිහිටි කර්මාන්තපුරය තුළ පවතින කර්මාන්ත සඳහා අදාල වන ගෙබිම් ප්‍රමාණය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව මගින් තීරණය කළ හැක. |
| **iii.** | **කලාප මායිම්** | උතුරට<br>නැගෙනහිරට<br>දකුණට<br>බටහිරට<br>} අක්ෂාංශ හා දේශාංශ මඟින් දක්වා ඇත. |
| **iv.** | **කලාප අංකය** | C1 |
| **v.** | **කලාප සංගුණකය** | 02 |
| **vi.** | **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | වගු අංක 20 හා 21 පරිදි විය යුතුයි. |
| **vii.** | **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | වගු අංක 20 හා 22 පරිදි විය යුතුයි. |
| **viii.** | **විවෘත අවකාශයන් සහ උපරිම උස** | වගු අංක 21 හා 22 පරිදි විය යුතුයි. |
| **ix.** | අනුබෙදීම් කල හැකි **අවම බිම් ප්‍රමාණය** | ව. මී.250 |
| **x.** | **අවසරලත් භාවිතාවන්** | අධි ඝනත්ව වාණිජ කලාපයේ ඉඩ දෙනු ලබන භාවිතයන්ට අනුව විය යුතුයි. |
| **xi.** | **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | 7.4 අනුව විය යුතුයි. |

## 7.5.4 අධි ඝනත්ව වාණිජ කලාපය සඳහා ඉඩදෙනු ලබන භාවිතයන්

| ප්‍රධාන භාවිතය | අනු අංශීය අනු භාවිතය | අනු භාවිතය | නේවාසික |
|---|---|---|---|
| 1. නේවාසික ( Residential) | 1 | නිවාස | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 2 | සහාධිපත්‍ය නිවාස සංකීර්ණ | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 3 | නිවාස සංකීර්ණ | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 4 | නිවාස ව්‍යාපෘති | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 5 | නිල නිවාස/සේවක නිවාස | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 6 | සේවා නිවාස | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 7 | ස්ටුඩියෝ නිවාස | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 8 | ඩෝමේට්‍රි | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 9 | නේවාසිකාගාර | කලාපයේ ප්‍රධාන භාවිතය වාණිජ වේ. |
| | 10 | දිවා සුරැකුම් මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ |
| | 11 | ගිලන් සේවා මධ්‍යස්ථාන | ඉඩ දෙනු ලැබේ |
| | 12 | වැඩිහිටි නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 13 | ළමා නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 14 | ආබාධිත පුනරුත්ථාපන නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 15 | පුනරුත්ථාපන නිවාස/ පරිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 16 | ප්‍රජා ශාලා | ඉඩ දෙනු ලැබේ |
| | 17 | නිවාඩු නිකේතන/සංචාරක බංගලා/Home stay | ඉඩ දෙනු ලැබේ |
| | 18 | ආගන්තුක නිවාස | ඉඩ දෙනු ලැබේ |
| | 19 | ලැගුම් හල් | ඉඩ දෙනු ලැබේ |
| | 20 | තානායම් | ඉඩ දෙනු ලැබේ |
| | 21 | විශ්‍රාම ශාලා | ඉඩ දෙනු ලැබේ |
| 2. සෞඛ්‍ය ( Health) | 1 | රෝහල් | අදාල කසළ, සංවර්ධන භූමිය තුළ කළමනාකරණය පිළිබඳ වන සැලැස්මක් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| | 2 | වෛද්‍ය මධ්‍යස්ථාන (එක් වෛද්‍යවරයෙකු පමණක් සිටින) | ඉඩදෙනු ලැබේ. |
| | 3 | වෛද්‍ය මධ්‍යස්ථාන (වෛද්‍යවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු සිටින) | ඉඩදෙනු ලැබේ. |
| | 4 | සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන | ඉඩදෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | 5 | රසායනාගාර | ඉඩදෙනු ලැබේ. |
| | 6 | ඔසුසල් | ඉඩදෙනු ලැබේ. |
| | 7 | පශු වෛද්‍ය සායන | අදාල කසළ, සංවර්ධන භූමිය තුළ කළමනාකරණය පිළිබඳ වන සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. |
| | 8 | පශු වෛද්‍ය රෝහල් | අදාල කසළ , සංවර්ධන භූමිය තුළ කළමනාකරණය පිළිබඳ වන සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. |
| | 9 | නිරෝධායන මධ්‍යස්ථාන | ඉඩදෙනු ලැබේ. |
| | 10 | ළමා හා මාතෘ /පවුල් සායන මධ්‍යස්ථාන | ඉඩදෙනු ලැබේ. |
